ආතර් කොනන් ඩොයිල්ගේ

# මහ රෑ ආ මාරයා

## ෂර්ලොක් හෝම්ස් කථා



චන්දන මෙන්ඩිස්

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# මහ රෑ ආ මාරයා

## ෂර්ලොක් හෝම්ස් කථා

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ
**THE RETURN OF SHERLOCK HOLMES**

සීවලි පොත්හල (පුද්ගලික) සමාගම
16, යටිනුවර වීදිය,
මහනුවර.
ටෙලි : 081 - 2224292

පරිවර්තනය
**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**
141/2, දූව පාර, බැද්දගාන, කෝට්ටේ

Reading Purpose Only . Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

# පටුන


1. අතිදක්ෂ යක්ෂයා 8
THE ADVENTURE OF THE EMPTY HOUSE

2. චාල්ස් ඔගස්ටස් මිල්වටන් 45
THE ADVENTURE OF CHARLES AUGUSTUS MILVERTON

3. අද්භූත සිදුවීමක් 78
THE ADVENTURE OF THE SIX NAPOLEONS

4. රගර් ක්‍රීඩකයාගේ අන්තර්ධානය 116
THE ADVENTURE OF THE MISSING THREE-QUARTER

5. ත්‍රී ගේබල්ස් වික්‍රමය 152
THE ADVENTURE OF THE THREE GABLES

6. ඛේදජනක සාක්ෂිය 186
THE ADVENTURE OF THE RETIRED COLOURMAN

7. මහ රෑ ආ මාරයා 217
THE ADVENTURE OF THE ABBEY GRANGE


Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com


SUNDAY EVENING EDITION

NEWS OF THE WORLD.

CONTAINS MORE NEWS THAN ANY OTHER PAPER.

H.P. SAUCE

STOP PRESS

MYSTERIOUS DISAPPEARANCE OF SHERLOCK HOLMES

Dr. WATSON ARRESTED!

# ෂර්ලොක් හෝම්ස් අභිරහස් ලෙස අතුරුදන්වීම

## මෙම අපරාධය සම්බන්ධයෙන් වොට්සන් හිරභාරයට ගැනේ!

*(විශේෂ වාර්තාකරුවකු විසිනි)*

බේකර් වීදියේ වාසය කළ සුප්‍රකට ෂර්ලොක් හෝම්ස් මහතා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ලන්ඩනයේ සෙන්ට් ජෝන්ස්වුඩ්හි ඊජිත වීථියේ පදිංචි දොස්තර වොට්සන් (එම්.ඩී) නම් මහතෙකු පොලිස් අත් අඩංගුවට පත්විය.

මෙසේ සිරභාරයට ගැනීම අප්‍රසිද්ධව සිදු කෙරිණ. චූදිතයා එම අවස්ථාවේ තම බිරිඳ සමග උදේ ආහාරය ගනිමින් සිටි බැව් අපට

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

දැනගන්නට ලැබී ඇත. තමන් පැමිණියේ කුමන කටයුත්තක් සඳහාද යන්න පොලිස් නිලධරයෝ දොස්තර වොට්සන්ට දැනුම් දුන්හ. ඔහු එයින් කලබලයට පත් නොවූ අතර, ඒ සඳහා නිකුත් කළ වරෙන්තුව තමාට පෙන්වන මෙන් පොලීසියෙන් ඉල්ලීමක් කර ඇත. එය පෙන්වූ විගස දොස්තර වොට්සන් පොලීසියට භාරවූ බැව් පැවසේ.

වෛද්‍යවරයාගේ ශල්‍යාගාරයේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා, වෙනත් වෛද්‍යවරයෙකු සොයාගැනීමට අවකාශ සැලසිය හැකි බැව් පොලීසිය දොස්තර වොට්සන්ට කියා ඇත. තමා බලාගත් රෝගියා රටින් බැහැර ගොස් ඇති නිසා, වෙනත් වෛද්‍යවරයෙකු පත්කිරීම අනවශ්‍ය බව දොස්තර වොට්සන් පවසා ඇත. චූදිතයා ගෙන් කෙරෙන ඕනෑම ප්‍රකාශයක්, ඔහුට එරෙහිව සාක්ෂි ලෙස යොදාගැනීමට හැකියාව ඇතැයි, පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ් දැනුම් දුන්නේ මෙවිටයි. ඉන්පසු දොස්තර වොට්සන් කිසිදු ප්‍රකාශයක් නොකොට නිහඬ වූ බැව් ඇලයි. අනතුරුව ඔහු බෝ වීදියේ පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලදී.

### හෝම්ස් අභිරහස

ෂර්ලොක් හෝම්ස් මහතා මෑතකදී අතුරුදන් වූ අභිරහස් ආකාරය බොහෝ දෙනාගේ කතාබහට ලක්විය. එබැවින් මේ පිළිබඳව අපේ පාඨකයන් වෙත කරුණු කිහිපයක් සිහිපත් කළ යුතුය.

මැදිවියේ පුද්ගලයෙකු වූ හෝම්ස් මහතා සෑහෙන කලක සිට බේකර් වීදියේ අංක 221B දරණ ස්ථානයේ පදිංචිව සිටියේය.

ඔහු වෘත්තියෙන් උපදේශක රහස් පරීක්ෂකවරයෙක් විය. තම වෘත්තියෙන් ඉහළම දක්ෂතා පෙන්වූ ඔහු විසඳූ ගැටලු සංඛ්‍යාව දහසකට කිට්ටු බව පැවසේ. ලොව මවිතකළ එම විසඳීම් පිළිබඳව, මෙම පුවත්පතේ පාඨකයනට මතක ඇතුවා නිසැකය. එංගලන්තයේ පමණක් නොව, යුරෝපයේ හා ඇමරිකාවේ පොලිස් ප්‍රධානීන් පුදුමයෙන් පුදුමයට පත් කරමින්, හෝම්ස් මහතා මේ අභිරහස් විසඳූ හැටි විස්මය ජනකය. ඒ සඳහා ඔහුට සහාය වී ඇත්තේ ද, ඉහත සඳහන් දොස්තර වොට්සන් ම වීම, දෛවයේ සරදමක්ද? මෙම පරීක්ෂණ සඳහා හෝම්ස් හා වොට්සන් දෙදෙනා දිවා රෑ නොබලා සංචාරවල යෙදුණු බව ද හෙළි වී ඇත. එය ද වොට්සන්ට එරෙහිව සැකයක් එල්ල වන කරුණකි. මෙම ගමන්බිමන් නිසා තම වෛද්‍ය චිකිත්සාගාරය නිසිලෙස පවත්වාගෙන යෑමට දොස්තර වොට්සන්ට නොහැකිවූ බැව් පැහැදිලිය. ඒ අනුව ඔහු මුදල් ප්‍රශ්නවලට මුහුණපාන්නට ඇති බැව් සිතා ගැනීම අපහසු නැත.

Reading Purpose Only - Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

සති දෙකකට පමණ පෙර විදේශ ගතවූ ෂර්ලොක් හෝම්ස් මහතා හදිසියේම මරණයට පත්වූ බැව් එංගලන්තයට ආරංචි විණි. මේ හදිසි මරණය අතිශයින්ම සැකසහිත එකක් බව විද්වතුන්ගේ මතයයි. අපට දැනගන්නට ලැබුණේ, හෝම්ස් හා වොට්සන් දෙදෙනා කෙටි සංචාරයක් සඳහා ස්විට්සර්ලන්තය බලා පිටත්ව ගිය බවයි. වේගයෙන් කඩා හැලෙන රයිෂන්බාක් දිය ඇල්ල අසල දී, හෝම්ස් අතුරුදන් වූ බවට විදුලිපුවතක් ලන්ඩනයට ලැබිණි. කිසිවෙකු විසින් හෝම්ස් දිය ඇල්ලෙන් පහළට තල්ලුකර දැමුවාද? එසේත් නැත්නම් ප්‍රපාතය සමීපයට ගිය ඔහු, පය ලිස්සා එයට ඇද වැටුණාද? මෙම දිය ඇල්ල අඩි දහසක් පමණ උස එකකි. බොහෝ අනතුරුවලට මුහුණ දුන්නත් අනුහවයෙන් පණ බේරාගෙන ඇති හෝම්ස්, මෙවරද දිවි ගළවාගෙන එනු ඇතැයි බොහෝ දෙනා විශ්වාස කළහ. එහෙත් එය එසේ සිදුනොවිණි.

වොට්සන්ගේ කටඋත්තරය -

ස්විට්සර්ලන්ත පොලීසියේ බලකිරීම මත, කට උත්තරයක් දීමට වොට්සන්ට සිදුවිය. ඔහු පැවසුවේ මෙම සංචාරය හදිසියේ සැලසුම් කරන ලද්දක් බවයි. එට හේතුවූයේ, හෝම්ස් ඝාතනය කිරීමේ අරමුණෙන් ඔහු හඹා ආ, මොරියාටි නම් අපරාධකාරයාගෙන් ගැළැවීමේ අරමුණ බැව්, වොට්සන් අදහස් කළේය. එම මොරියාටි පවත්වාගෙන ගිය පාතාල ලෝකයේ 'අපරාධ කණ්ඩායම' හෝම්ස් විසින් බිඳ දැමීම නිසා, ඔහුගෙන් පළිගන්නා බවට මොරියාටි දිවුරා සිටියේලු. මෙයින් තැතිගත් හෝම්ස්, වොට්සන්ගේ ආරක්ෂාව ද ලබාගෙන යුරෝපයට පැනගොස් ඇත. රයිෂන්බාක් දිය ඇල්ලට ළඟා වෙන තුරු සියල්ල සාර්ථකව සිදුවූ බව වොට්සන් පැවසීය. තමා වෙත ගෙන ආ ලියුම් කැබැල්ලක් නිසා, තමා ආපසු හෝටලයට ගිය බවත්, ආපසු පැමිණි විට තම මිත්‍රයා එහි නොසිටි බවත්, වොට්සන් තවදුරටත් කීය. මෙය විශ්වාස කළ හැකිද?

මහජන අදහස් -

වොට්සන් පොලිස් අත්අඩංගුවට පත්වීම ගැන කිසිවෙකු පුදුම නොවනු ඇත. සාධාරණත්වය හා යුක්තිය ඉෂ්ටවීම සඳහා කුමන හෝ පියවරක් ගතයුතු බව බොහෝ දෙනාගේ මතයයි. මොරියාටිට බියවී, හෝම්ස් එංගලන්තයෙන් පලා ගිය බැව් වොට්සන් කියා ඇත. අප්‍රතිහත ධෛර්යයකින් කටයුතු කරන බවට ප්‍රසිද්ධ හෝම්ස්, මේ ආකාරයෙන් සතුරෙකුට භයේ පලායාවිද? බිහිසුණු අන්තරායයන්ට

http://sherlockholmesinvestigations.blogspot.com

මුහුණ දී ඇති නිර්භය පුද්ගලයෙකු ලෙස කවුරුත් හඳුනන හෝම්ස්, මෙලෙස පැන දුවාවි යැයි වොට්සන් කියන කථාව, කෙසේ නම් විශ්වාස කළ හැකිද?

වොට්සන් තම මිත්‍රයා ගැන ලියා මුද්‍රණය කළ කථාන්තර ඇතුළත් ග්‍රන්ථ සියල්ල, පොලීසිය විසින් ඔවුන්ගේ භාරයට ගෙන ඇත. මේ සියල්ල නඩු විභාගයේදී අධිකරණය හමුවට පැමිණවීමට නියමිතයි. අපරාධකාරයින් අත්අඩංගුවට ගැනීමට, හෝම්ස් අවස්ථා කිපයකදීම රිවෝල්වරයක් එල්ල කළ බැව් අපට මතක ඇත. හෝම්ස්ගේ ඒ රිවෝල්වරය කෝ?

අන්තරායදායක අවස්ථාවල ලන්ඩනයේදී පවා, හෝම්ස් නිවසෙන් පිටවී ගියේ උණ්ඩ පිරවූ රිවෝල්වරය තබා සාක්කුවේ දමාගෙන බව වොට්සන් සඳහන් කර ඇත. එසේ නම් ස්විට්සර්ලන්තයට යද්දී හෝම්ස් තම ආයුධය ගෙන නොගියේ ඇයි? තම සතුරා වන මහාචාර්ය මොරියාටි භයානක අපරාධකාරයකු බව හෝම්ස් හොඳින් දැන සිටි කරුණකි. මොරියාටි නම් භයානක පුද්ගලයා තමා ලුහුබැඳ එන බව දැන ඇතත්, රිවෝල්වරයක් තමා ළඟ තබා නොගෙන පාළු අඩවියක සැරිසැරීමට තරම් හෝම්ස් මෝඩයෙක්ද?

වොට්සන්ගේ කට උත්තරය අනුව ඇත එන මොරියාටි දුටු හෝම්ස්ට, සතුරාට වෙඩි තැබීමට ඕනෑතරම් කල්වේලා තිබිණි. හෝම්ස් ළඟ රිවෝල්වරයක් නොතිබුණේ යැයි මොහොතකට සිතමු. එසේ නම් පාතාල ලෝකයේ අපරාධකාරයකු වූ මොරියාටි හෝම්ස්ට, වෙඩි නොතැබුවේ ඇයි? ඔහුටත් රිවෝල්වරයක් ගෙන ඒමට අමතක වූවාද? පොලීසියේ සැකය වඩාත් තීව්‍ර වන්නේ, වොට්සන් සඳහන් කළ මෙම කාරණා නිසාය.

මෙම අභිරහස පිළිබඳ පරීක්ෂණය භාරවී ඇත්තේ ස්කොට්ලන්ඩියාඩ් පොලීසියේ සුප්‍රසිද්ධ ජී. ලෙස්ට්‍රේඩ් මහතාටය. ඔහු විසින් කර ඇති නිගමන ගැන තමන්ට සෑහීමට පත්වීමට නොහැකි බැව්, නම සඳහන් කිරීමට අකමැති වෙනත් පරීක්ෂකවරු දෙදෙනෙක් පැවසූහ. මේ අතර ස්කොට්ලන්ඩ්යාඩ්' පොලීසියේ ස්ටැන්ලි හොප්කින්ස්, ටෝබියස් ග්‍රෙග්සන්, ඇතල්නි ජෝන්ස් යන පරීක්ෂකවරු ෂර්ලොක් හෝම්ස් මහතා ගැන සොයා බැලීමට ස්විට්සර්ලන්තය බලා යෑමට නියමිතය.

http://sherlockholmesinvestigations.blogspot.com

## III

# අතිදක්ෂ යක්ෂයා

"දුවයි මමයි ගෙදර එනකොට වෙලාව රෑ එකොළහයි විස්සයි. නුහ කාලෙකින් දකින්න නොලැබුණු ඥාතීන්ගෙ ගෙවල් කිහිපයකටම යන්න සිදුවුණා. ඒ නිසා අප හිතුවාට වඩා, ආපහු එන්න වෙලා ගතවුණා.

මගේ පුතා විසිත්ත කාමරය හැටියට පාවිච්චි කළේ දෙවැනි තට්ටුවේ ඉස්සරහම කාමරය. එහි ආලෝකය දැල්වී තිබුණු බව මම ජනේලයෙන් දුටුවා. පුතා ඒ වන විටත් නින්දට ගිහින් නැති නිසා, මට හිතුණා ඔහුට කථා කරන්න. මං බලාපොරොත්තු වුණේ ඔහුට ශුභ රාත්‍රියක් පතන්න."

සාක්ෂිය මදකට නැවැත්වූ මේනූත් ආර්යාව ලේන්සුවෙන් කඳුළු පිස දමාගෙන යළිත් කථාව ඇරඹුවාය.

"කිහිප වාරයක්ම දොරට තට්ටු කළා. ඒත් පිළිතුරක් ලැබුණේ නැහැ. ඊළඟට මම හැකි තරම් උස් හඬින් ඔහුගේ නම කියල කථා කළා. ඒකටත් කිසිම ප්‍රතිචාරයක් දැක්වුණේ නැහැ. ඊළඟට මගේ දුව හිල්ඩාත්, සේවිකාවත් ඇවිත් දොරට ගහමින් කෑගැහුවා. එයිනුත් පලක් නොවුණාම අපි රියැදුරා සහ තවත් සේවකයෙක් ගෙන්වලා දොර කැඩුවා. එතකොටයි මට දකින්න ලැබුණේ, ඔහු මිය ගිහින් ඇති බව......"

මේනූත් ආර්යාව මරණ පරීක්ෂණයේදී දුන් මෙම සාක්ෂිය පුවත්පත් සියල්ලකම පාහේ මුල් පිටුවේ පළවී තිබිණ.

අවුරුදු දහයකට පෙර, එනම් 1894 දී මුළු ලන්ඩනයම ඉමහත් කැළඹීමකට පත් කළ, ගරු රොනල්ඩ් ඇඩෙයාර් තරුණ මහතා සාහසික ලෙස මරා දැමීම පිළිබඳව තවමත් බොහෝ දෙනෙකුට මතක ඇතුවා නිසැකය. පෞද්ගලික හේතූන් නිසා, සමහර කරුණු හෙළිනොකොට යටපත් කිරීමට, එදා පියවර ගැනිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

එහෙත් දැන් ඒ සියල්ලම ඔබට හෙළි කිරීමට මට අවසර ලැබී ඇත.

මෙම අපරාධ පරීක්ෂණය සිත් ඇදගන්නාසුලු එකක් බව සැබෑය. එමෙන්ම මෙය හා බැඳුණු එක් සිදුවීමක් මගේ ජීවිතයේ අමතක නොවන සිදුවීමක් බවට පත්විය. ජීවිතයේ කිසිදිනෙක අත් නොවිඳි කම්පනයකට මෙන්ම විස්මයකට මා පත්වූයේ මේ පරීක්ෂණයේදීයි.

ෂර්ලොක් හෝම්ස් හා මා අතර දීර්ඝ කාලයක් තිස්සේ සමීප ඇසුරක් පැවැතිණි. ඒ නිසා අපරාධ පරීක්ෂණ ක්ෂෙත්‍රය මගේ ද සිත්ගත් විනෝදාංශයක් බවට පත්විය. පුවත්පත් මගින් හෙළිකළ නොයෙක් අපරාධ හා සංකීර්ණ ගැටලු ගැන විශේෂ අවධානයක් යොමු කිරීම මම පුරුද්දක් කොට ගත්තෙමි. හුදු විනෝදය සඳහා මේ ගැටලු සමහරක් විසඳීමට පවා මම උත්සාහ කළෙමි. එහෙත් ඒ කිසිවෙක්, කිසිවිටෙකත් සාර්ථක වූයේ නැත. මේ හැම එකකින්ම මගේ සිත් වඩාත්ම ඇදගැනීමට සමත් වූ පරීක්ෂණය වූයේ රොනල්ඩ් ඇඩෙයාර් සම්බන්ධ ඛේදවාචකයයි.

මරණ පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සාක්ෂි සියල්ල පුවත්පත්වල පළ වී තිබිණි. මෙය කවුරුන් විසින් හෝ හිතාමතාම කළ මනුෂ්‍ය ඝාතනයක් බව එයින් මම වටහා ගතිමි. රයිෂන්බාක් දියඇල්ල සමීපයේ ෂර්ලොක් හෝම්ස්ගේ මරණය සිදුවීම නිසා මුළු මහත් සමාජයටම සිදුවූ පාඩුව සිහිවුණේ එවිටයි. යුරෝපයේ සිටි අංක එකේ අපරාධ පරීක්ෂකයා වූ හෝම්ස් සිටියා නම්, මෙම ගැටලුව නිරාකරණය කිරීමට හැකිවෙන්වා නියතයි.

ඕස්ට්‍රේලියානු මහාද්වීපයේ යුවන්. විජිතයක, ආණ්ඩුකාර ධුරය දැරූ මේනූත් සාමිවරයා පාඨකයනට මතක ඇතැයි සිතමි. රොනල්ඩ් ඇඩෙයාර් යනු එම සාමිවරයාගේ දෙවැනි පුත්‍රයායි. ඔහුගේ මව - මේනූත් ආර්යාව ඇගේ ඇසක ශල්‍යකර්මයක් සඳහා ඒ දිනවල ඕස්ට්‍රේලියාවේ සිට ලන්ඩනයට පැමිණ සිටියාය. ඇය, ඇගේ පුතා වූ රොනල්ඩ් සහ දියණිය වූ හිල්ඩා තිදෙන පදිංචිව සිටියේ උද්‍යාන පටු මගේ අංක 427 දරන මන්දිරයේයි.

රොනල්ඩ් ඇඩෙයාර් තරුණයා, ඉහළ සමාජයේ මිතුරන් ආශ්‍රය කළ තැනැත්තෙකි. ඔහුට සතුරන් සිටි බවට ආරංචියක්

http://sherlockholmesinvestigations.blogspot.com

නොවීය. ඔහු දුසිරිතේ ගැළුණු පුද්ගලයෙකු යයි සිතීමට සාක්ෂි ද නොතිබිණ. මෙයට සුළු කලකට පෙර ඔහු කාස්ටෙයාර්ස් නගරයේ ඊඩිත් වුඩ්ලි මෙනෙවිය සමග විවාහ ගිවිස ගත්තේය. එහෙත් ඊට මාස කිහිපයකට පසු, දෙපක්ෂයේම එකඟත්වය අනුව මෙම විවාහ ගිවිසගැනීම ද අවලංගු කර දමන ලදී. තරුණයාට මෙයින් යම්කිසි සිත්තැවුලක් ඇතිවූ බවට ලකුණකුදු නොපෙනිණි. රොනල්ඩ් ඇඩෙයාර් ආශ්‍රය කළේ එකම මිතුරු කැළකි. ස්වභාවයෙන්ම නිහඬ තරුණයෙකු වූ ඔහු, පහසුවෙන් කැළැඹීමට පත්වන අයුරේ තැනැත්තෙකු නොවීය. එහෙත් බලාපොරොත්තු නොවූ අයුරින්, මෙම තරුණයා 1894 මාර්තු 30 වැනිදා රාත්‍රී දහයත් එකොළහයි විස්සත් අතරේ ඛේදජනක ලෙස මරණයට පත් විය.

රොනල්ඩ් ඇඩෙයාර් මුදල් ඔට්ටුවට කාඩ් ක්‍රීඩාවේ යෙදීම ප්‍රිය කළ අයෙකි. එහෙත් තමාගේ වත්කමට ලොකු හානියක් වියහැකි තරම් විශාල, මුදල් ඔට්ටු නොඇල්ලීමට ඔහු හැමවිටම ප්‍රවේශම් විය. ඔහු කාඩ් ක්‍රීඩා සමාජ කිහිපයකම, එනම් බෝල්ඩ්වින්, කැවෙන්ඩිෂ් හා බගටෙලේ ක්‍රීඩා සමාජවල සාමාජිකත්වය දැරුවේය. මරණය සිදුවූ දින රාත්‍රී ආහාරයෙන් පසු, ඔහු බගටෙලේ ක්‍රීඩා සමාජයේ දී විස්ට් ක්‍රීඩාවේ යෙදී සිට ඇත. එදා සවස් වරුවේ ද එහිම කාඩ් ක්‍රීඩා කොට ඇත. ඔහු සමග විස්ට් ක්‍රීඩාවේ යෙදුණු මිතුරන් වූයේ මරේ මහතා, සර් ජෝන් හාඩි සහ කර්නල් මොරාන් තිදෙනායි. ඔවුන්ගේ සාක්ෂි අනුව, එදා කාඩ් ක්‍රීඩාවේ දිනුම් පැරදුම් සම සමව බෙදී ගොස් ඇත. රොනල්ඩ් ඇඩෙයාර් පරාජය වූවා නම් ඒ පවුම් පහකට අඩු මුදලකි. ඉතා විශාල ධනස්කන්ධයක හිමිකරු වන ඔහුට, පවුම් පහක් යනු සැලකිල්ලට ගතයුතු මුදලක් නොවේ. සෑම දිනකම මෙම ක්‍රීඩාවේ යෙදුණු ඔහු, ඔට්ටු ඇල්ලීම ප්‍රවේශමින් කළ බව ද, බොහෝ විට ජයග්‍රහණය කළ බව ද අසන්නට ලැබිණි. සති කිහිපයකට පෙර කර්නල් මොරාන් සමග එකට ක්‍රීඩා කළ ඇඩෙයාර්, ගොඩ්ෆ්‍රි මිල්නර් සහ බැල්මොරල් සාමිවරයා ගෙන් රන් පවුම් 430 ක මුදලක් දිනා ගැනීමට සමත් වී ඇත.

". . . . එතුමා ගෙදර ආපසු ආවේ රාත්‍රී දහය පහුවුණා. ඔහු කෙළින්ම ගියේ දෙවැනි තට්ටුවට. දෙවැනි තට්ටුවේ, මහපාර

http://sherlockholmesinvestigations.blogspot.com

පැත්තට තිබෙන ඉස්සරහම කාමරය ඔහු පාවිච්චි කළේ විසිත්ත කාමරයක් ලෙස.

තරමක සීතලක් තිබුණු නිසා, මම ගිනි උදුනේ ගිනි දැල්වුවා. එයින් හුහක් දුම් පිටවෙන්න පටන්ගත් නිසා, ටික වෙලාවකින් වහන අදහසින් මම ජනෙල් පියන ඇර තැබුවා. ඊට පස්සේ මම ඒ පැත්තට ගියේ නැහැ. ආර්යාව ගෙදර ඇවිත් මට කථා කරන තුරු මට ඒ පැත්තෙන් ශබ්දයක්වත් ඇහුණේ නැහැ."

ගෘහ සේවිකාව සාක්ෂි දෙමින් පවසා තිබිණ. ඉන් අනතුරුව මෙහුත් ආර්යාව සාක්ෂි දෙමින් පැවසූ දෙයයි මා මේ කථාන්තරය මුලදී සඳහන් කළේ.

මේ අවාසනාවන්ත තරුණයා කාමරයේ මේසය අසල බිම වැටී මියගොස් සිටි බව, දොර විවෘත කළ පසු දක්නට ලැබිණ. ඔහුගේ හිසට රිවෝල්වර උණ්ඩයකින් බරපතල තුවාල සිදුවී තිබිණි. එහෙත් කාමරයේ තිබී කිසිදු ආයුධයක් සොයා ගැනීමට නොහැකි විය.

මේසය මත මුදල් නෝට්ටු හා කාසි මුවන් වෙන්ව ගොඩගසා තිබිණි. පවුම් දහයේ නෝට්ටු දෙකක් සහ පවුම් දහහතයි සිලිං දහයක රන් හා රිදී කාසි වෙන් වෙන්ව තිබී හමුවිය. මේසය මත තිබී යමක් සටහන් කළ කඩදාසියක් ද හමුවිය. එහි, ඔහු සමග කාඩ් ක්‍රීඩාවේ යෙදුණු මිතුරන් කිහිපදෙනෙකුගේ නම් හා ඒ ඉදිරියෙන් යම් යම් මුදල් ප්‍රමාණ සටහන් කර තිබිණි. මෙය මරණය සිදුවන වෙලේ, තමා දිනූ එක් මිතුරාගෙන් දිනාගත් හෝ පරාජය වූ මුදල් ප්‍රමාණ ගැන සටහනක් තැබීමට කළ උත්සාහයක් ලෙස සැලකිණි.

මෙම සිද්ධිය වඩාත් අවුල් සහගත වූයේ තවත් සියුම්ව පරීක්ෂා කිරීමේදී දක්නට ලැබුණු කරුණක් නිසයි. තරුණයා ඔහුගේ මරණයට පෙර කාමරයේ දොර ඇතුළතින් අගුළු දමාගෙන ඇත. ඔහුට එසේ කිරීමට විශේෂ හේතුවක් නොවීය. මෙය මිනීමරුවා විසින් කරන ලද්දක් ද? අපරාධය කිරීමෙන් පසු ඔහු ජනේලයෙන් පැන යන්නට ඇත. එහෙත් බිම සිට මෙම ජනේලයට උස අඩි 20කි. මිනීමරුවාට මේ තරම් උසක සිට බිමට පැනීමට සිදුවූවා විය යුතුය. මල් වලින් පිරුණු කුඩා පඳුරු සහිත මල් පාත්තියක් ජනේලය

http://sherlockholmesinvestigations.blogspot.com

කෙළින්ම පහළින් තිබිණි. කිසිවෙකු ඒ මල්පාත්තියට පැන තිබූ බවට එහි කිසිදු සලකුණක් නොවීය. එතැන සිට පාර දක්වා වැටුණු පටු තණබිම් තීරුවේද කිසිදු ආකාරයක පා සටහනක් නොවීය.

එසේ නම් තම කාමරයේ දොර ඇතුළතින් අගුළු දමාගන්නට ඇත්තේ තරුණයාමයි. එහෙත් ඔහුගේ මරණය සිදුවූයේ කෙසේද? ජනේල පඩිය මත, බිත්තියේ හෝ පොළොවේ මෘදු පසේ මොනම ලකුණක් හෝ නොතිබිණි. ලකුණක් නොසිටින සේ කිසිවෙකුට එහි ළඟාවිය හැකි ක්‍රමයක් නැත. යම් කිසිවෙකු එළියේ සිට ජනේලයෙන් වෙඩි තැබුවා යයි සිතමු. එහෙත් මේ තරම් ඈතක සිට, මරණීය තුවාල ඇතිවන සේ වෙඩි තැබීමට නම් එම තැනැත්තා දක්ෂ වෙඩික්කාරයකු විය යුතුය.

එපමණක් නොවේ. උද්‍යාන පටුමග එතරම් පාළු වීථියක් ලෙස සැලකිය නොහැක. නිවසේ සිට යාර සියයක් පමණ දුරින් කුලීරථ නැවතුම් පොළකි. එහි සිටි කිසිවෙකුට වෙඩි හඬක් අසන්නට ලැබී නැත. එහෙත් මිනිසකු වෙඩි පහරකින් මරණයට පත්වී ඇති බව සැබෑය. රිවෝල්වර උණ්ඩයෙන් හිසට සිදුවූ තුවාල අනුව එය ක්ෂණිකව සිදුවූ මරණයක් බව නිගමනය කළ හැක. මෙහි සංකීර්ණ බව වැඩිවීමට තවත් කරුණක් ඇත. එනම් මිනීමැරීමට හේතුවක් සිතාගැනීමට නොහැකි වීමයි. මා කලින් ද පැවසූ පරිදි, රොනල්ඩ් ඇඩෙයාර්ට සතුරන් කිසිවෙකු සිටි බවක් දැනගන්නට නොමැත. කාමරයේ තිබූ මුදල් හෝ අනෙක් වටිනා කිසිවක් සොරකම් කරගෙන ගොස් නොමැති බැව් පැහැදිලිව දැකිය හැකිවිය.

මෙම සියලු කරුණු මුල් සිට අගටත් අග සිට මුලටත් ගළපමින්, ගැටලුව විසඳීමට මම උත්සාහ දැරුවෙමි. දවස තිස්සේම ඒ සඳහා දැඩි වෙහෙසක් දැරුවත් එයින් සතුටුදායක ප්‍රතිඵලයක් නොලැබිණි. එහෙයින් හැන්දෑවෙද්දී මදක් ඇවිදින්නට යාම මැනවයි මම කල්පනා කළෙමි.

උද්‍යානය හරහා ඇවිද ගිය මම, අවස් වෙද්දී උද්‍යාන පටුමග, ඔක්ස්ෆඩ් වීථියට සම්බන්ධ වෙන මංසලට ළඟාවීමි. පාර දෙපස පදික වේදිකාවේ සැහෙන පිරිසක් විය. ඔවුනගේ දෑස් යොමුවී තිබුණේ ද මා දකින්නට ආ නිවසේ ජනේලය වෙතයි. අඳුරු පැහැති උපැස් යුගළක් පැළැඳ සිටි, කෙට්ටු උස පුද්ගලයෙක්,

http://sherlockholmesinvestigations.blogspot.com

මිනීමැරුම සිදුවෙන්නට ඇති ආකාරය පිළිබඳව තමාගේ මතය ඉදිරිපත් කරමින් සිටියේය. ඔහු සාමාන්‍ය ඇඳුමෙන් සැරසුණු රහස් පරීක්ෂකයෙකු වීමට බොහෝ දුරට ඉඩ ඇතැයි මට සිතිණි. ඔහුගේ මතයට සවන් යොමු කිරීමට බොහෝ දෙනෙක් උත්සාහ කළෝය. මම ද නැවතී ඒ අදහසට සවන් දුන්නෙමි. එය කිසිදු හරයක් නැති විකාර අදහසක් බව මට වැටහිණි.

තවදුරටත් එතැන නොරැඳී ඉවත්ව යාමේ අරමුණෙන් මම එක්වරම ආපසු හැරුණෙමි. මා නොදැනුවත්වම, මා පිටුපස, මා ළඟින්ම සිටි කුදු ගැසුණු, වයස්ගත පුද්ගලයෙකු හා මගේ සිරුර ගැටිණි. මෙයින් ඔහුගේ සමබරතාවය නැතිවී ගියා විය යුතුය. ඔහු විසින් රැගෙන යමින් තිබූ පොත් කිහිපයක් බිම වැටෙන අයුරු මම දුටුවෙමි. ඔහුට එම පොත් ආපසු අහුලා දීමට මම උදව් වීමි. එයින් එක් පොතක නම 'වෘක්ෂ වන්දනාව' නම් විය. මේ වයස්ගත පුද්ගලයා තමාගේ විනෝදාංශයක් වශයෙන් හෝ වෙළඳාම සඳහා දුර්ලභ පොත් එකතු කරන්නෙකු විය යුතුය. සිදුවූ හිරිහැරය ගැන මම ඔහුගෙන් සමාව අයැද සිටියෙමි. ඔහු එම පොත් අතිශයින්ම අගය කළ ඒවා විය යුතුය. මගේ නොසැලකිලිමත් බව ගැන දොස් පවරමින් ඔහු සෙනඟ අතර නොපෙනී ගියේය. ඔහුගේ කොන්ද කුදු ගැසී තිබුණු හැටිත්, මුහුණ දෙපස රැවුල සුදු පැහැ ගැන්වී තිබුණු හැටිත් මගේ මතකයේ රැඳිණි.

රොනල්ඩ් ඇඩෙයාර්ගේ ඛේදජනක මරණය සිදුවූ නිවස දැකීමට පැමිණියත්, ගැටලුව විසඳාගැනීම සඳහා මට එයින් ඇතිවූ ප්‍රයෝජනයක් නොවීය. උද්‍යාන පටුමගේ අංක 427 දරන මෙම නිවස, පාරෙන් වෙන්වූයේ මිටි තාප්පයකිනි. එම තාප්පය උඩ සවිකළ, යකඩ වලින් තැනූ ග්‍රිල් වැටක් තාප්පය දිගටම පිහිටා තිබිණි. මෙම දෙකෝම උස පොළොවේ සිට අඩි පහකට වැඩි නොවීය. මෙය නැග, ගෙවත්තට පැන ගැනීම කිසිවෙකුට අසීරු කාරියක් නොවේ. එහෙත් රොනල්ඩ් ඇඩෙයාර්ගේ කාමරයේ ජනේලය පිහිටියේ කිසිවෙකුට ළඟාවිය හැකි තැනක නොවේ. ඉතාම දක්ෂ පුද්ගලයෙකුට බිත්තිය දිගේ බඩගෑමට උදව් වියහැකි ජල නළයක් පවා එහි නොතිබිණි. ගැටලුව විසඳාගත නොහැකිව, අවුල් වූ මනසෙන් මම කෙන්සිංටන් පෙදෙස වෙත ආපසු පා නැඟුවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

මා මගේ කන්තෝරු කාමරයට ගොස් මිනිත්තු පහක් වත් ගතවන්නට නැත. කිසිවෙකු මා හමුවීම සඳහා පැමිණ ඇති බව සේවිකාව මට දැනුම් දුන්නාය. ඒ අන් කිසිවෙකු නොව කලින් මට හමුවූ, කුදු ගැසුණු, මහලු පොත් එකතු කරන්නා බව දැක මම පුදුමයට පත්වීමි. පොත් දුසිමක් වත් ඔහු දෑතේ හිරකරගෙන සිටියේය.

"මහත්තයට පුදුමත් ඇති මාව දැක්කාම?" ඔහු විමසුවේ ගොරෝසු කටහඬකිනි.

"ඔව්."

"මගේ හෘදසාක්ෂිය මට දොස් කියනවා මහත්තයෝ. ඔබතුමා අර වැටුණු පොත් ඇහිදලා දුන්නු වෙලේ, මගේ හැසිරීම ටිකක් අවිනීත වුණු බව ඇත්තයි. මං එහෙම කළේ මගේ හිතේ තරහක් ඇතිවෙලා නෙමෙයි."

"ආ. . . . ඒක පුංචි දෙයක් නෙ. ඒක නෙමෙයි ඔහේ කොහොමද මං ගැන දන්නෙ?" මම ඇසීමි.

"මං ඔබගේ අසල්වාසියෙක් නේ මහත්තයා. ඔය පල්ලිය පාරේ අන්තිම කෙළවරේ ඔබට දකින්න ලැබේවි මගේ පොත් සාප්පුව. ඔබ හමුවෙන්න ලැබීම ගැන මට හරි සතුටුයි මහත්තයා. බාග වෙලාවට ඔබත් දුර්ලභ පොත් එකතු කරන කෙනෙක් වෙන්න ඇති. මේ බලන්න මේ පොත - බ්‍රිතාන්‍යයේ පක්ෂි රාජධානිය. මේ පොත ඉතාම දුර්ලභ එකක් - ශුද්ධ වූ යුද්ධය. මේක කැටියුලස්. මේ පොත් තුනම ගන්නවා නම් හුඟක් ලාබෙට දෙන්නම් මහත්මයා. ඔබේ අර රාක්කයේ දෙවැනි තට්ටුවේ ලොකු හිඩැසක් තියෙනවා නේද මහත්මයා? එතකොට කාමරෙත් එක්ක අපිළිවෙළයි. මෙයින් පොත් පහක් අරන් දැම්මොත් ඒ ඉඩ ටික පුරවන්න පුළුවනි."

ඔහු අත දිගු කළ රාක්කය දෙසට හැරී, මම ආපසු හැරුණෙමි.

මගේ මේසය ඉදිරිපස සිනාමුසු මුහුණෙන් සිටියේ ෂර්ලොක් හෝම්ස්ය! මා වාඩිවී සිටි පුටුවෙන් ඉබේටම ඉහළට එසවුණු අයුරු මට මතක ඇත. මීළඟට දෑස් විශාල කරගෙන, කිසිවක් අදහාගත නොහැකිව, මොහොතක් හෝ දෙකක් මම මවිතයෙන් බලා සිටියෙමි. ඉන්පසු මම ජීවිතයේ පළමු හා අවසන් වතාවට ක්ලාන්ත වී බිම ඇද වැටුණෙමි!

http://sherlockholmesinvestigations.blogspot.com

අළු පැහැති මීදුමක් මගේ දෑස් ඉදිරියේ පාවී ගියාක් මෙන් මට හැඟිණ. ඉන්පසු මට සිහි එනවිට කිසිවෙකු මගේ කොලරය ලිහිල්කර ඇති අයුරුත් මට දැනිණ. දෙතොල්වල මට දැනුණේ බ්‍රැන්ඩි රසයයි. බ්‍රැන්ඩි සහිත කුඩා බෝතලයක් රැගෙන මා දෙසට පහත් වී සිටියේ ෂර්ලොක් හෝම්ස්ය.

"මගේ ආදරණීය මිත්‍රයා වොට්සන්!" ඔහු මා ඇමතුවේ මට අසා හුරුපුරුදු කටහඬිනි.

"මං ඔබෙන් දහස් වාරයක් සමාව අයැදිනවා. මං හිතුවේ නෑ මගේ රහපෑමෙන් ඔබ මෙවැනි තත්ත්වයකට පත්වේවි කියල."

මම ඔහුගේ දෑතින්ම අල්ලා ගතිමි.

"හෝම්ස්! මේ ඇත්තටම ඔබද? ඔබ තවමත් පණපිටින් කියන එක විශ්වාස කරන්නේ කොහොමද? අර මහා අගාධයෙන් ඔබට ඇත්තටම බේරිලා ගොඩ එන්න හැකිවුණා කියන එක හිතන්නවත් පුළුවන්ද?"

"ටිකක් ඉන්න වොට්සන්. මේ වගේ දේවල් සාකච්ඡා කරන්න තරම් දැන් ඔබ සාමාන්‍ය තත්ත්වයට පත්වෙලාද ඉන්නේ? මගේ මේ අනවශ්‍ය රහපෑම් නිසා ඔබේ සිත දරුණු කම්පනයකට නේද ලක්වුණේ?"

"නෑ මට මොකුත් අමාරුවක් නෑ මිත්‍රයා. ඒ වුණත් . . . . මට මගේ ඇස් දෙකෙන් දුටු දේ අදහාගන්න බෑ හෝම්ස්. දෙයියනේ! ඔබ උන්හිටිගමන් මගේ කාමරේ ඇතුළෙන් මතුවුණාම, මට මෙහෙම වුණු එකේ පුදුමයක් නෑ."

මම ඔහුගේ දෑත් තදකර අල්ලා ගතිමි. කබා අතට යටින් හෝම්ස්ගේ කෙට්ටු ශක්තිමත් දෑත් මගේ ග්‍රහණයට හසුවිය.

"මේ නම් ඔබ පණපිටින්මයි හෝම්ස්. අවතාරයක් නම් නොවෙයි. මගේ ආදරණීය මිත්‍රයා. මට මොනතරම් සන්තෝෂද ඔබ ආයෙමත් දකින්න ලැබීම ගැන. මෙහෙන් වාඩිවෙන්න. වාඩිවෙලා මට කියන්න අර බිහිසුණු ප්‍රපාතයෙන් පණ ගළවාගෙන ඔබ ගොඩට ආවෙ කොහොමද කියලා."

ඔහු මා ඉදිරියේ අසුන් ගත්තේ සිපිදු කැලැඹීමකින් තොර සන්සුන් අයුරිනි. ඔහු හැඳ සිටියේ පරණ පොත් වෙළෙන්දාගේ

http://sherlockholmesinvestigations.blogspot.com

දිරාගිය කබායයි. එහෙත් ඔහුගේ අමෙහෙක් ආම්පන්න - සුදු පැහැති කොණ්ඩය, රැවුළ හා පොත් ආදිය මේසය උඩ තිබිණ. ඔහුගේ සිරුර වෙනදාටත් වඩා කෙට්ටු වී ඇති බව මම නිරීක්ෂණය කළෙමි. එහෙත් එහි වඩාත් ක්‍රියාශීලී බවක් ද විය. එමෙන්ම මෑතකදී ඔහු යම්කිසි ශ්‍රේණී කන්ණ්ඩායමකට හෝ කරදර කම්කටොලු වලට මුහුණපා ඇති බව නිසැකය. මා එසේ පැවසුවේ හෝම්ස්ගේ මුහුණේ මතුවී තිබූ දරුණු සුදුමැලි බව නිසයි.

"කොන්ද ටිකක් දිගහැර යන්න ලැබීම ගැන මට සන්තෝෂයි වොට්සන්. උස මිනිහෙකුට තමන්ට වඩා අඩියක් මිටි අයෙක් වගේ රඟපාන්න කුදු ගැහිල ඉන්න එක සෙල්ලමක් නෙමෙයි. මගේ හිතවත් මිත්‍රයා. ඔබ ඉල්ලා සිටින්නේ, මට මුහුණපාන්න වුණු දේවල් ගැන සම්පූර්ණ විස්තරයක් කියන්න කියල. නමුත් අද රාත්‍රියේ අපට පැවරිලා තියෙන්නෙ බොහොම අවදානම්, ඒ වගේම දුෂ්කර රාජකාරියක්. ඒ කටයුත්ත ඉවර කරලම, මගේ කථාව ඔබට කිව්වට කමක් නැහැ නේද?"

"නමුත් මං වැඩිය කැමතියි ඒ කථාව දැන් අහන්න."

"හොඳයි. ඔබ එනවද මේ හැන්දෑවේ මාත් එක්ක යන්න?"

"ඔව්. ඔබ කැමැති වෙලාවක, ඔබ කැමැති තැනකට."

"අපි ආයෙමත් අර පරණ ජීවිතේටම වැටෙමු වොට්සන්. අපේ රාජකාරි පටන්ගන්න කලින් කෑම ටිකක් කාල ඉඳිමු. ඒකට ඒ හැටි වෙලාවක් ගතවෙන්නෙ නෑ. අර භයානක ප්‍රපාතය ගැන කියනවා නම්, ඒකෙන් බේරිලා එන්න මට ඒ හැටි අමාරු වුණේ නෑ. ඒ මොකද දන්නවද? මං ඒ භයානක ප්‍රපාතයට ඇද වැටුණේ නැති නිසා!"

"ඔබ ඒකට වැටුණේ නැහැ?"

"නැහැ වොට්සන්. මං කොහොමටවත් ඒකට වැටුණේ නැහැ. මං ඔබට ලියුමක් ලියා තැබුවා නේද? ඒකෙ මම සඳහන් කළේ සම්පූර්ණ ඇත්තක්.

එදා පීටර් ස්ටයිලර්ගෙන් ලැබුණු ලියුම කියවලා ඔබ කලබලයෙන් දිය ඇල්ල අසලින් පිටත්වී ආවා. ඔබ පිටත්වෙලා මඳ වෙලාවක් යනතුරු මම රයිෂන්බාක් දියඇල්ල දෙස බලාගෙන,

http://sherlockholmesinvestigations.blogspot.com



18. "මම දියඇල්ල දෙස බලාගෙන එතැනම හිටියා."

http://sherlockholmesinvestigations.blogspot.com



Reading Purpose Only

19. "මොරියාටිගේ ඇසේ තිබුණු වෛරය මට පැහැදිලිවම පෙනුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

එතැනම හිටියා. එතැනින් පිටත්වෙලා මං ආපහු එන්න හිතුවා විතරයි. මං දුටුවා ඒ පටුමග දිගේ ඉදිරියට, මහාචාර්ය මොරියාටි ඇවිදගෙන එන හැටි. ඔහු දකින්න ලැබුණාම අපරාධ පරීක්ෂණ වෘත්තියේ අවසානයට, මං ළඟාවී ඇති බව මම තේරුම් ගත්තා. මොරියාටිගේ ඇසේ තිබුණු අනුකම්පා විරහිත ස්වභාවය, කැකෑරුණු වෛරය මට පැහැදිලිවම පෙනුණා. ඔහු සමඟ වචනයක් දෙකක් කථා කරලා, ඔබට හමුවුණු අර ලියුම් කෑල්ල ලියන්න මං ඔහුගෙන් අවසර ඉල්ලා ගත්තා. ලියුම් කෑල්ල, මගේ සිගරට් අසුරනය සමඟ ගල උඩින් තියලා, මං අර පටුපාර දිගේ ඉක්මනින් ඉදිරියට ඇවිදගෙන ගියා. මං ගියේ දියඇල්ල දෙසටයි. මොරියාටි ආවා මගේ පිටුපසින්.

ඒ පටුමග කෙළවර වුණු තැනදී මං ආපහු හැරුණා. මොරියාටි මොකුත් ආයුධයක් එළියට ගත්තේ නෑ. ඔහුගේ දිගු දෑත් මා දෙසට දිගුකරගෙන, ඔහු වියරුවෙන් මෙන් මා වෙතට කඩා පැන්නා. කඩා පැනලා, මට හෙලවෙන්න බැරි විදියට ඔහුගේ දෑතින් මාව තදින් හිරකර අල්ලා ගත්තා. ඔහුගේ කෙරුම් ඔක්කොම මං එළිකර ඇති නිසා, තමන්ට ගැළවීමක් නැති බව මොරියාටි දැනගෙන හිටියා. ඔහුට කොහොමටත් ලැබෙන්නේ මරණ දඬුවම. ඒ නිසා මොරියාටි උත්සාහ කළේ මගෙන් පළිගන්න, මාවත් ඇදගෙන ප්‍රපාතයට පනින්නයි. ඔහු යක්ෂ ශක්තියෙන් වෙව්ලමින් මාව මෙල්ල කරගන්න දැඩි උත්සාහයක් දැරුවා. අපි දෙන්නා අර ලිස්සන, පටු අඩිපාරේ සෑහෙන වෙලාවක් පොර බැදුවා. "බරිත්සු" යන නමින් හඳුන්වන ජපන් මල්ලවපොර ක්‍රමයක් තියෙනවා වොට්සන්. මට ඒ මල්ලවපොර ශිල්පයේ තරමක දැනීමක් තියෙනවා. ඒක මීට කලින් කිහිප වාරයක්ම මට බොහොම ප්‍රයෝජනවත් වෙලා තියෙනවා.

මොරියාටි මාවත් ඇදගෙන ප්‍රපාතය දෙසට බරවෙනතුරු මං ඉවසීමෙන් හිටියා. එළෙහට ඔහු තම සම්පූර්ණ බරම යොදලා උත්සාහ කළේ මාව වට්ටන්නයි. නමුත් බරිත්සු ශිල්පයේ පිහිටෙන්, මොරියාටිගේ ග්‍රහණයෙන් ලිස්සා යාමට මට හැකිවුණා. මාව අතහැරෙද්දී ඔහුට බැරිවුණා තමන්ගේ ශරීරය සමබරව තියාගන්න. මහා භයානක විදියට පිළාප කියමින් ඔහු අර ප්‍රපාතයට ඇදගෙන වැටුණා. ඔහු පහළට ගිය අයුරු මම මදක් ඉදිරියට නැමී බැලුවා.

http//sherlockholmesinvestigations.blogspot.com

අඩි සිය ගණනක් පහළ පාතාලයට ඇද වැටුණු ඔහු, ගල් පර්වතයක වැදිලා, එතැනින් ජලාශයට විසිවුණා."

හෝම්ස් කළ විස්තරයට මා සවන් දුන්නේ ඉමහත් විස්මයට මෙන්ම සංත්‍රාසයට ද පත්වයි.

"ඒ වුණත් අර අඩියටහන්? දෙන්නාම පහළට වැටුණු තාලෙට, මඩවූ පොළොවේ තිබූ අඩිඅටහන් මගේ ඇස් දෙකෙන්ම මං දැක්කා නේ?"

"ඒක වුණේ මෙහෙමයි. මහාචාර්යවරයා කිහිපුණු ප්‍රපාතය තුළ නොපෙනී යද්දී, වැදගත් කරුණක් මට එක් ක්ෂණයකින් සිහිවුණා. මා සමග ඇති වෛරය නිසා, මාව මරා දමන බවට දිවුරා ඇති අපරාධ කරුවන් ගණනාවක් ඉන්නවා; මොරියාටි ඉන් එක් අයෙක් පමණයි. මං මගේ පණ ගළවාගත් බව ආරංචි වුණොත් ඊළඟට මොකක්ද වෙන්නේ? තමන්ගේ නායකයාගේ මරණය ගැන උන් අනිවාර්යයෙන්ම මගෙන් පළිගන්නවා. උන් ඔක්කොම මහ භයානක මිනිස්සු. එකෙකුට බැරිවුණොත් තවත් එකෙක් මාව මරාදමන බව සිකුරුයි. නමුත් මමත් මේ ඩොලාවේ මියගියා කියන ආරංචිය පැතිර ගියොත් මොකක්ද වෙන්නේ? අර අපරාධකාරයින් මා ගැන අමතක කර, උන්ගේ දරුණු වැඩ පිළිවෙළ නැවත පටං ගන්නවා. එතකොට පහුවෙලා හරි ඔවුන්ව අල්ලා ගන්න මට අවස්ථාවක් සලසාගන්න පුළුවනි. ඊට පස්සේ මට ලොවට ප්‍රකාශ කරන්න පුළුවනි, මං ජීවතුන් අතර ඉන්නා බව. මේ හැම දෙයක්ම මගේ හිතට එන්න ගතවුණේ එක් නිමේෂයයි. මං හිතන්නේ මට මේ ටික කල්පනා වෙලා ඉවර වෙන කොටත්, මොරියාටි රයිෂන්බාක් ජලාශයේ පතුලට කිඳාබහින්න වැටුණා ඇති.

ඊළඟට මම හොඳට පරීක්ෂා කරල බැලුවා ඒ පර්වතයේ තිබුණු බෑවුම කොහොමද කියල. වොට්සන්, ඔබ පසුකාලයක පුවත්පතකට ලියා තිබූ ලිපිය මං පසුව කියෙව්වා. ඔබේ ඒ විස්තරයේ තිබුණේ ඒ බෑවුම, කිසිකෙනෙකුට අඩියක් තියා ඉහළට නගින්න බැරි, ගල් වලින් තැනුණු ප්‍රාකාරයක් ලෙසයි. ඇත්තෙන්ම ඒක වැරැදියි. පර්වත බෑවුමේ තැනින් තැන, යන්තමට අඩිය තියන්න පුළුවන්, කඩතොලු වීම්, පිපිරි යාම් හා ගැට්ටි තිබුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

මොරියාටි සමග අගාධයට ඇදවැටී මා මරණයට පත්වූ බව ලොවට පෙන්වන්න, මට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් තිබුණා. එයින් එකක්, මගේ වම්පසින් තිබූ ගිරිශිඛරයේ පිහිට ලබාගැනීම. ඒක මුදුනට නැගලා අනෙක් පැත්තෙන් බැස ගියා නම් ඒත් හරි. නමුත් ඒ ඉහළට නැගීම බොහොමත්ම අපහසු අතිදුෂ්කර කාර්යයක්. අනෙක් ක්‍රමය පා සලකුණු කිසිවක් ඉතිරි නොවෙන්න, අර පටුමග දිගේම ආපසු ඒමයි. නමුත් එතැන තිබුණු මඩ සහිත පොළොවේ හැටියට, පා සලකුණු සටහන් වෙන එක අනිවාර්යයෙන්ම සිදුවෙනවා. එවිට මට කළ හැකි තවත් දෙයක් තිබුණා. ඒක මම මීට ඉස්සරත් කර තිබෙන දෙයක්. ඒ තමයි පාවහන් දෙක ඉස්සරහ පිටිපස්සට සිටින සේ පැළඳගෙන ඇවිදගෙන ඒම. නමුත් ඒකෙන් පා සටහන් කට්ටලු තුනක් ඇතිවුණාම, එතැන මොකක් හරි ප්‍රයෝගයක් සිදුවුණු බවට සැක හිතන්න ඉඩ තියෙනවා. ඒ හැමදෙයක් ගැනම හිතුවාම මට ඉතිරි වෙන්නේ එක විකල්පයයි. කොයිතරම් දුෂ්කර මාර්ගයක් වුණත් ගල්පර්වත බිත්තිය දිගේ ඉහළට නැගීමයි ඒ.

මුළු ප්‍රදේශයම දෙදරවමින්, දෝංකාර දෙමින්, ඇසුණේ රයිෂන්බාක් දියඇල්ලේ දියකඳ පහළට කඩා හැලෙන බිහිසුණු ශබ්දයයි. මම නොයෙකුත් විකාර මනස්ගාත හිතේ මවාගන්න කෙනෙකු නොවන බව ඔබ දන්නවා නේ වොට්සන්. නමුත් විශ්වාස කරන්න. එදා ඒ වෙලාවෙ නම් මට අර දරුණු අගාධය තුළින් අහන්න ලැබුණේ, මහාචාර්ය මොරියාටිගේ බිහිසුණු විලාපයයි. ඒ අගාධය තුළට පනින්න කියලා ඔහු මාව කැඳෙව්වා වගෙයි මට තේරුණේ.

පර්වත බිත්තියේ ඉහළට නැගීම ජීවිතයත් මරණයත් අතර සටනක් වගේ වුණා. යන්තම්ට අඩියක් තියන්න පුළුවන් ගැටිති හෝ කඩතොලු මත කකුල තියල, තෙත් පර්වතය අල්ලා ගෙන මම ඉහළට නැග්ගේ ඉතාම හෙමින්. ගල් පර්වතය මත තැනින් තැන වැවී තිබුණු කුඩා තණ පඳුරක් හෝ වල් පැළෑටියක් අල්ලා ගන්න සමහර විටෙක මට හැකිවුණා. ඒව අල්ලනකොටම අතට ගැලවී ආවෙ වරක් දෙවරක් නොවෙයි. ඒ හැම වතාවකම මට හිතුණේ මං ඉවරයි කියල. කකුල ලිස්සල ගියා නම් අනිවාර්යයෙන්ම ඒක කෙළවර වෙන්නේ මරණයෙන්. කොහොම වුණත් බොහොම අමාරුවෙන් මං ඉහළටම නැගුණා. අන්තිමට මට හැකිවුණා

http://sherlockholmesinvestigations.blogspot.com

පර්වතයේ ඇතුළට නෙරාගිය, නොගැඹුරු ගුහාවක් වගේ තැනකට තැගගන්න. මේක අඩි කිහිපයක් පර්වතය ඇතුළට හැරුණු කපොල්ලක් වගේ තැනක්. තරමක ඉඩක් තිබුණු එය, කොළපාට පාසිවලින් වැසී තිබුණා. පහළ කිසිවෙකුට නොපෙනෙන අයුරින් සැඟවිලා ඉන්න මං යොදා ගත්තෙ එතැනයි. ඔබත්, ඔබට පස්සෙ ආව අනෙක් රහස් පරීක්ෂකයිනුත්, මොරියාටි සමග මා පොරබැදූ තැන පරීක්ෂා කරන හැටි මම දුටුවා. ඉතා සානුකම්පිත ලෙස, එහෙත් අදක්ෂ අයුරින් මගේ මරණයට ලොවුණු හැටි ගැන තීරණවලට එද්දි, මං කඳු මුදුනෙ සැඟවිලා ඒ සාකච්ඡා වලට සවන් දීගෙනයි සිටියේ.

ඔබ හැමදෙනාම අවසානයේ වැරදි නිගමනයකට ඇවිත්, ආපසු හෝටලය වෙත පිටත්වී ගියා. අන්න එතකොටයි මං තීරණය කළේ පහළට බසින්න. මං හිතුවේ දැන් මම තනියම; ඒ නිසා කළයුතු දෙයක් කරන්න කාලය හරි කියලයි. ඒත් සිද්ධවුණේ මං කිසිසේත් බලාපොරොත්තු නොවුණු දෙයක්.

කඳු මුදුනේ සිට විශාල ගල් කැබැල්ලක් පහළට වැටුණේ මං හිටි තැනින්මයි. එය පහළට හෙළිදී, අගාධය තුළ නොපෙනී ගියා. එක් මොහොතකට මට හිතුණේ මේක අහම්බෙන් වුණු දෙයක් කියලයි. මං ඉදිරියට නැමී කඳුමුදුන දෙස බැලුවේ, එතරම් උවමනාවකින් නෙමෙයි. එතකොට මං දුටුවා, මටත් අඩි ගණනක් ඉහළින් කඳුමුදුනේ සිටි මිනිහෙකුගේ හිස. පසුබිමෙන් තිබුණේ හිස් අහස නිසා මට ඔහුගේ හිස පැහැදිලිව පෙනුණා. ගල පහළට පෙරළීගෙන ආවේ ඔහුගේ හපන්කමකින් බව මට තේරුණා. ඒ මොහොතේම ඔහු තවත් විශාල ගල් කුට්ටියක් පහළට පෙරළුවා. එය මං රැඳී සිටි තැන වැටුණේ මහා හඬක් නංවමින්. එය සිද්ධවුණේ මගේ හිසට අඩියක් අමණ දුරින්. මෙයින් එක දෙයක් පැහැදිලි වුණා. මොරියාටි මා හමුවෙන්න ඇවිත් තියෙන්නේ තනිවම නෙමෙයි. ඔහුගේ බොහොම බිහිසුණු ආධාරකාරයෙක් කඳු මුදුනේ සිට හැමදෙයක්ම බලාගෙන ඉඳල තියෙනවා. තරමක් දුර සිට වුණත්, මොරියාටි මරණයට පත්වුණු හැටිත්, මං දිවි ගලවාගත් හැටිත් මේ බිහිසුණු පුද්ගලයා දකින්න ඇති. ඔහු බොහොම ඉවසීමෙන් බලාගෙන ඉඳල, මං ගිය තැනට වඩා ඉහළ තැනකට නැඟුණේ, මහාචාර්යතුමාට බැරිවුණු රාජකාරිය ඔහු ඉටුකරන්න.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ ගැන මං තවතවත් කල්පනා කර කර හිටියෙ නැහැ ඩොට්සන්. මං දැක්කා මේ භයානක තැනැත්තාගේ මුහුණ මං හිටි තැනට යොමුවෙන හැටි. ඒ බැල්මේ හැටියට තවත් විශාල ගලක් මගේ ඔලුවට එල්ල වෙන එක නියතයි. මං හැකි ඉක්මනින් ආයෙමත් පහළට බහින්න පටන් ගත්තා. පහළට බැසීම, ඉහළ නැගීමට වඩා සියගුණයක් අමාරු වුණා. ඒ වුණත් ඒ ගැන හිත හිත ඉන්න මට වෙලාවක් තිබුණෙ නැහැ! තවත් විශාල ගලක් මගේ කන ළඟින් "රූං" ගාගෙන පහළට ගියා. ඒ, මං ගල් බිත්තියේ ඉදිරියට නෙරා තිබූ ගැටිත්තක දැනෙන එල්ලී සිටියදී. කඳු බෑවුමේ භාගයක් පමණ පහළට බැස්සාට පස්සේ, එතැන සිට මං බැස්සා නෙමෙයි, පහළට ලිස්සා ගියා කිව්වොත් නිවැරදියි. දෙවියන්ගේ පිහිටෙන් මං යළිත් අර පටු අඩිපාර මතට ආවේ ඇඟපුරා සීරීම් හා ලේ ගලන තුවාල සහිතවයි. ඒ වහාම මං දුවන්න පටන් ගත්තා. කන්ද උඩින් අඳුරේම මං දිව ගියා. ඊට පස්සේ වරින් වර නැවතී විවේක ගනිමින්, ගම්මාන පහු කරමින් එක දිගට පැය ගණන් ගමන් කළා. සතියක් ගතවෙද්දී මට හැකිවුණා ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයට ළඟාවෙන්න. ඒ, මේ ලෝකයේ කිසිකෙනෙක් මට අත්වුණු ඉරණම මොකක්ද කියල දන්නෙ නැහැ කියන විශ්වාසයත් ඇතිව.

මගේ ඉරණම ගැන ඇත්ත, එක් පුද්ගලයෙක් දැනගෙන හිටියා. ඒ තමයි මගේ අයියා මයික්‍රොෆ්ට්. මේ ගැන ඔබට නොදැන්නුවාට මං ඔබෙන් යළිත් සමාව අයැද සිටිනවා ඩොට්සන්. මට උවමනා වුණේ ඇත්ත වශයෙන්ම මා මියගිය බව පාතාල ලෝකයට ඒත්තු ගන්වන්නයි. මා ජීවතුන් අතර සිටින බව ඔබ දැන හිටියා නම්? එහෙනම් ස්ථිර වශයෙන්ම මා මියගිය බව ඒත්තු ගැන්වෙන ලිපියක්, ඒ වගේ හැඟීම් බර ලිපියක්, ඔබ අතෙන් ලියවෙන්නෙ නෑ ඩොට්සන්. ඔබට ලිපියක් ලියලා සත්‍යය දැනුම්දෙන අදහසින්, පහුගිය අවුරුදු තුන ඇතුළතදී මං කී වාරයක් පෑන අතට ගත්ත ඇද්ද? නමුත් ඒ හැම විටකම, මගේ හිතේ චකිතයක් ඇතිවුණා. මා ගැන ඔබේ හිතේ ඇති සොහොයුරු පෙම නිසා, මා සොයා ඇවිත් හෝ වෙනයම් ක්‍රමයකින් රහස එළිවේවි යයි මං භයවුණා.

අද හවස ඔබේ අතින් මා ළඟ තිබුණු පොත් ටික බිමට පෙරළුණු වෙලාවේ මං අනෙක් පැත්තට හැරුණෙත් ඒ නිසා. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

වෙලාවෙ යන්තමින් හෝ මගේ අනන්‍යතාවය ඔබ දැනගත්තා නම් ඔබ මහත් කැළැඹීමකට පත්වෙනවා වොට්සන්. ඊළඟට ඔබ මවිතයට පත්වී පළකරන හැඟීම් වලින්, ඒ අවට සිටි සැහෙන දෙනෙකුට මා හඳුනාගන්න ඉඩ ලැබෙන්න තිබුණා. එහෙම වුණානම් වෙන්නේ ආයේ හදන්න බැරි පාඩුවක්.

එදා මගේ සත්‍ය තත්ත්වය මම මයික්‍රොෆ්ට හෙළිකළා. ඒ මොකද මගේ වියදමට අවශ්‍ය මුදල් ලබාගත්තේ ඔහුගෙන්. මොරියාටිගේ මරණයෙන් පස්සේ ලන්ඩනයේ තිබුණු මහා නඩු විභාගය, මං හිතූ තරම් සාර්ථක අයුරින් සිදුවුණේ නැහැ. ඒ කල්ලියේ දරුණුම සාමාජිකයන් දෙදෙනෙක් පොලිසියට අහුනොවී පැනගත්තා. ඔවුන් මගේ පරම හතුරන් දෙදෙනෙක්. ඉතින් මං තීරණය කළා ටික කාලයකට හරි එංගලන්තයට නැවිත් විදේශයක කාලය ගතකරලා එන්න.

අවුරුදු දෙකක පමණ කාලයක් මං ගත කළේ ටිබෙට් රටේ. එහි තැන් තැන්වල සංචාරය කරමින් මං කාලය ගෙවුවා. ටිබෙට් රටේ නායක දලයි ලාමා සමඟ, ලාසා නගරයේ මම දින කිහිපයක් ගතකළා. ඔබ පුවත්පත් වල කියෙව්වාද දේශගවේෂණ චාරිකා වල යෙදුණු සීගර්සන් නම් නෝර්වීජියානු ජාතිකයෙක් ගැන? ඒත් ඔබට මොහොතකට වත් හිතෙන්න නැහැ, සීගර්සන් නමින් රටින් රට ගිය දේශගවේෂකයා ඔබේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් බව.

ඊට පස්සේ මං පර්සියාවට ගියා, මක්කම නරඹන්න ගියා. ඒ වගේම කෙටි, එහෙත් විනෝදජනක කාලයක් ගත කළා, සුඩානයේ ඛාර්තූම් නුවර. එහිදී මට සුඩානයේ පාලක කලීපා හමුවුණා. ඔහු සමග කළ සාකච්ඡා වලදී දැනගන්න ලැබුණු කාරණා ගැන, මම අපේ විදේශ ලේකම්ට දන්වා එව්වා ඇති.

ඊට පස්සේ මං ආවේ ප්‍රංශයට. දකුණු ප්‍රංශයේ මොන්ට් පෙලියර් නගරයේ රසායනාගාරයක පර්යේෂණ කරමින් මං මාස කිහිපයක්ම ගතකළා. ඔබ දන්නවානේ මං ඉතාම ප්‍රිය කරන්නේ කාබනික රසායන විද්‍යාවට බව. ගල් අඟුරු තාර ආසවනය කිරීමෙන් ලබාගත හැකි රසායනික සංයෝග පිළිබඳව සොයා බලමින් මං පර්යේෂණ ගණනාවක යෙදුණා. මගේ මේ පර්යේෂණ කටයුතු සාර්ථකව නිමකරන කාලෙදී තමයි, මට එක් විශේෂ කරුණක්

http://sherlockholmesinvestigations.blogspot.com

දැනගන්න ලැබුණේ. ඒ තමයි මගේ පරම හතුරන් දෙදෙනාගෙන් ලන්ඩනයේ තවමත් ඉතිරිව ඉන්නේ එක් අයෙක් පමණක් බව.

ඉතින් මං බොහොම සතුටින් ආපසු ලන්ඩනයට ඒම සැලසුම් කරමින් හිටියා. මේ අතරෙදි තමයි මට උද්‍යාන පටුමගේ බේදවාචකය ගැන අහන්න ලැබුණෙ. ඒකෙන් මං ලන්ඩන් එන ගමන ඉක්මන් වුණා.

මං මෙහේ ආව ඉහාම කෙළින්ම ගියේ බේකර් වීථියේ අපේ නිවහනට. මියගියා කියා හිතාහිටි මාව පණපිටින් දැක්කාම, හඩ්සන් මහත්මියට පිස්සු නොහැදුණා විතරයි වොට්සන්. මගේ කාමරයත්, එහි ලියකියවිලි, බඩු බාහිරාදිය සියල්ලත්, ඒ විදියටම ආරක්ෂා කර තබන්න, අයියා - මයික්‍රොෆ්ට් පියවර ගෙන තිබුණා. ඉතින් වොට්සන් දවල් දෙක වෙද්දි මං මගේ පරණ කාමරේ, පරණ හාන්සි පුටුවේ සුපුරුදු ලෙස විවේකීව සිටියා. අඩුවකට තිබුණේ ඔබ එහි නොසිටීම පමණයි. නැමදාමත් ඔබ සැරසූ අනෙක් හාන්සි පුටුවේ, මගේ හිත මිත්‍රයා වොට්සන් හිටියා නම්, චිත්‍රය කොයිතරම් සම්පූර්ණද කියල හිතාමිනුයි මා සිටියේ."

අප්‍රේල් මාසයේ සන්ධ්‍යාවක, මා පුදුමයෙන් පුදුමයට පත් කළ හෝම්ස්ගේ අපූරු කථාන්තරය නිම වූයේ එලෙසයි. මගේ කල්‍යාණ මිත්‍රයා යළිත් කිසිදිනෙක දැකීමට මම බලාපොරොත්තුව නොසිටියෙමි. මගේ දැසින්ම එවෙලේ ඔහු නොදුටුවා නම් මා මේ කථාව කිසිවිටෙකත් විශ්වාස නොකරන්නු ඇත. මගේ බිරිඳගේ අකල් මරණය නිසා මා කාලය ගත කළේ දැඩි ශෝකයකින් බව හෝම්ස් වටහා ගත්තේය.

"මගේ හිතවත් මිත්‍රයා. හිතේ දුක් අමතක කරන්න හොඳම ක්‍රමය මොකක් හරි ප්‍රයෝජනවත් වැඩක යෙදීමයි. අපි දෙන්නා අද රෑට සම්පූර්ණ කළයුතු විශාල වැඩ කොටසක් තියෙනවා. ඒක සාර්ථක ලෙස නිමකරන්න හැකිවුණොත් ඔව්. එහෙනම් මේ පොළෝ තලය මත යහපත් මිනිසෙකු විසින් ඉටු කළයුතු කාර්ය භාරය අප නිසි ලෙස ඉටු කළා වෙනවා."

"මොකක්ද මේ කටයුත්ත හෝම්ස්? මං කැමතියි ඒ ගැන විස්තර ටිකක් දැනගන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"හෙට එළිවෙන්න කලින් ඒ පිළිබඳව ඔබට අහන්නත් දකින්නත් ලැබේවි. පසුගිය අවුරුදු තුනක කාලය ගැන කතාබහ කරන්න අපට මොන තරමක් දේවල් තියෙනවද? ඊ. නවයහමාර වනතුරු අපි ඒ ගැන කථාකරමු. නවයහමාරට අපි පිටත්වෙලා යමු මේ රාජකාරියට – ඒ පාළු නිවසේ අභිරහස විසඳීමට."

නියමිත වේලාවට අපි කුඩා අශ්ව කරත්තයක නැගී පිටත් වී ගියෙමු. රිවෝල්වරය ද සාක්කුවේ දමාගෙන මම හෝම්ස් අසලින් වාඩිවී සිටියෙමි. යළිත් වික්‍රමාන්විත ගමනක් යෙදෙන්නට අවස්ථාව ලැබීම ගැන මා සිටියේ හදපිරි සතුටෙනි. හෝම්ස් නිහඬය. විටෙක මඟ දෙපස පහන්කූඩුවලින් එනු ආලෝකය ඔහුගේ මුහුණට වැටේ. දෙතොල් එකට තදකරගෙන, නළල රැළි කරගෙන ඔහු ගැඹුරු කල්පනාවකට වැටී ඇති සැටි මම දිටිමි. අපේ ඉලක්කය වූයේ, ලන්ඩන් පාතාල ලෝකයේ කුමන මෘගයාදැයි මා දැන සිටියේ නැත. එහෙත් මේ ශූර දඩයක්කාරයා ඒ සඳහා කුරුමානම් ගන්නා අයුරින්, පාතාලයේ මෘගයා හඹායන එකෙකු බව හොඳින් වටහා ගතිමි.

මා සිතා සිටියේ අපේ ගමන බේකර් වීථිය දක්වා සිදුවෙතැයි කියාය. එහෙත් කැවෙන්ඩිෂ් චතුරශ්‍රය කෙළවරදී රිය නැවැත්වීමට, හෝම්ස් රියැදුරාට නියම කළේය. ඉන්පසුව අපි අශ්ව කරත්තයෙන් බැස ඉදිරියට ගියෙමු. ඉදිරියට තැබූ සෑම පියවරක් පාසාම වටපිට බලමින් සුපරීක්ෂාකාරී වීමට හෝම්ස් අමතක නොකෙළේය. අපට හොරෙන් කිසිවෙකු පිටුපසින් ලුහුබඳින බව සැකහැර දැනගැනීමට ද ඔහු පරෙස්සම් විය. අප ගමන් කළේ, මා කිසිදාක ගමන් කොට නොතිබූ රහස් මඟක බව දක්නට ලැබිණ. ගොඩනැගිලි අතරින් වැටුණු පටුමාවත් දිගේ ගමන් කරමින්, පාරක් නොතිබුණු කඩපිල් මතින් වෙනත් පටු මාවත් වලට වැටෙමින් අපි අඳුරේම ඉදිරියට ගියෙමු. ලන්ඩනයේ කෙටි පාරවල් ගැන හෝම්ස්ට තිබුණේ විශේෂඥ දැනුමකි. මෙසේ ඉදිරියට ගොස්, මැන්චෙස්ටර් වීථියට වැටී එය දිගේ ටික දුරක් ගොස් බ්ලැන්ඩ්ෆර්ඩ් වීථියට පිවිසුණෙමු. එතැනින් දක්නට ලැබුණු හරස් පාරක ගමන් කොට, පැරණි ගේට්ටුවකින් ඇතුළුවී, විශාල නිවසක පිටුපස ගෙවත්තට පිවිසුණෙමු. සාක්කුවෙන්

http://sherlockholmesinvestigations.blogspot.com

ගත් යතුරකින් හෝම්ස් එහි දොර විවෘත කළේය. අප දෙදෙනා නිවසට ඇතුළු වූ පසු හෝම්ස් දොර වසා දැම්මේය.

නිවස ඝන අන්ධකාරයෙන් වැසී තිබිණි. එය පාළු නිවසක් බව මම වටහාගතිමි. නිවසේ බිත්ති අලංකාර කිරීමට අලවා තිබූ කඩදාසි දැන් කීතු කීතු වලට ඉරීගොස්ය. අඳුරේ මට කිසිවක් පැහැදිලිව දැක ගැනීම අපහසු විය. මගේ අතින් අල්ලා ගත් හෝම්ස්, විශාල සාලයේ ඉදිරියටම මා ගෙන ගියේය. ඉදිරි දොරට ඉහළින් වීදුරු කවුළුවකි. නිවස ඉදිරිපස වීථියේ දල්වා තිබූ පහන් කණු වලින් නිකුත් වූ එළියෙන් බිඳක්, එම වීදුරුව හරහා සාලය ඉදිරිපසට ලැබිණ. එය ද කුණුමැදිරි එළියකි. සාලයේ දෙපස, බිත්ති වලට සමීපව පැවැතියේ ඝන අඳුරකි. ජනෙල් වීදුරු ඝනකම් දූවිලි තට්ටු වලින් වැසුණු ගමන්ය.

"ඔබ දන්නවද අපි මේ ඉන්නේ කොහේද කියල?"

"සැකයක් නෑ මේ බේකර් වීථිය."

මා කීවේ ජනෙල් වීදුරුව තුළින් බලමිනි.

"හරියට හරි. අපි මේ ඉන්නේ අපේ නිවහනට හරියටම ඉදිරියෙන් තිබෙන කැම්ඩන් මන්දිරයේ."

"මොකටද අපි මෙතැනට ආවේ?"

"මොකටද දන්නවද? මෙතැනට ආවම අපේ සුන්දර නේවාසිකාගාරය ඉතාම අලංකාරව දර්ශනය වෙනවා. ඔය ජනෙල් වීදුරුවට තවත් ටිකක් ළං වෙලා, හොඳින් අපේ නිවහන දිහා බලන්න වොට්සන්. ඔබ ලියූ අර සුරංගනා කථා රාශියකට මුල්වුණු තැන පෙනෙනවද? මං අවුරුදු තුනක කාලයක් ඔබේ ආශ්‍රයෙන් ඈත්වෙලා හිටි බව ඇත්තයි. ඒ වුණත් ඔබ මවිතයට පත් කිරීමට මට තිබූ ඒ දක්ෂතාවය තවමත් තියෙනවද කියල අපි බලමු."

මම තවත් ඉදිරියට ළංවී පාර පැත්තට දිස්වෙන සේ තිබූ හෝම්ස්ගේ කාමරයේ ජනෙල් වීදුරුව දෙස බැලීමි. ජනෙල් තිරය ඉවත් කොට තිබූ අතර, කාමරය තුළ දැල්වුණේ දීප්තිමත් පහනකි. ඊළඟ මොහොතේ මගේ නෙත ගැටුණු දර්ශනයෙන් මවිතයට පත් වී මට කෑගැසිණ. කාමරයේ හාන්සි පුටුවේ වාඩිවී සිටි අයෙකුගේ සෙවණැල්ල ඉතා අලංකාර ලෙස ජනෙල් වීදුරුව මතට වැටී

http://sherlockholmesinvestigations.blogspot.com

තිබිණ. එම පුද්ගලයා නිසැකවම ෂර්ලොක් හෝම්ස් බව හඳුනාගත හැකි විය. ඔහුගේ අංගෝපාංග, සෙවණැල්ලේ මනාව දිස්විය. පුළුල් නළල් තලය, සෘජු නාසය, හතරැස් පුළුල් උරහිස් ආදිය කොතරම් ජීවමාන ලෙස දැකගත හැකිවී ද යත්, හෝම්ස් ඇත්ත වශයෙන්ම මා ළඟ සිටීදැයි මම ඔහුගේ අතින් අල්ලා බැලීමි. ඔහුට සිනා පහළ විය.

"ඇයි වොට්සන්?"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! ඒක ඉතාම අලංකාර විධියට සම්පූර්ණ කළ වැඩක් හෝම්ස්."

"හරියට මං එහෙමයි නේද?"

"මට දිවුරන්න පුළුවන්කම තිබුණා ඒ ඔබය කියලා."

"එහි ගෞරවය හිමිවන්නේ ප්‍රංශයේ ග්‍රෙනොබල් හි ඔස්කා මියුනියර් මහත්මයාටයි. එය ඉටි වලින් තැනූ, ශරීරයේ උඩුකය ප්‍රතිමාවක්. මේක නිම කරන්න ඔහුට දින කීපයක් ගතවුණා. අනෙක් හරිය මම අද හැන්දෑවෙ බේකර් වීථියට ආ වෙලාවෙ සකස් කළා."

"නමුත් මොන අරමුණකින්ද ඔබ ඒක කළේ?"

"ඒ මොකටද දන්නවද වොට්සන්? මං කැමතියි එක්තරා මහත්වරු කීපදෙනෙක්, මම මේ වෙලාවේ අපේ නිවහනේ කාමරේ ඉන්නවා කියල හිතාගන්නවා නම්."

"ඔබ හිතන්නේ කවුරු හරි අපේ කාමර දිහා සෝදිසියෙන් බලා ඉන්නවා කියලද"

"ඔවුන් අනිවාර්යයෙන්ම සෝදිසියෙනුයි ඉන්නෙ. ඒ බව මං හොඳාකාරවම දන්නවා."

"කවුද ඒ මිනිස්සු?"

"මගේ පරණ හතුරෝ වොට්සන්. අර රයිෂන්බාක් දියඇල්ල ළඟ ජලාශය පතුලෙ, සාමදානයේ සැතපෙන නායකතුමාගේ ගෝලයො. මං කලින් ඔබට කිව්ව දේ මතක නේද? මම පණපිටින් ඉන්න බව දන්නේ ඔවුන් පමණයි. කොයි තරම් කාලයක් ගිහිල්ලා හරි මම ආපහු බේකර් වීථියේ නිවහනට එන බව උන් දැනගෙන

http://sherlockholmesinvestigations.blogspot.com

හිටියා. ඒ නිසා එදා ඉඳලම උන් මා ගැන සෝදිසියෙනුයි හිටියෙ. අද උදේ මං නිවසට ආව හැටි උන් දුටුවා."

"ඔබ කොහොමද දන්නෙ?"

"කොහොමද? මං ජනේලයෙන් එළිය බැලූ ගමන් හඳුනා ගත්තා, උන් මුරට රඳවපු පුද්ගලයා. ආකර් නම් මේ තැනැත්තා ඇත්තෙන්ම අහිංසකයෙක්. පරණ තාලේ යුදෙව් අත් වයලීනයක් තියාගෙන, ඒක වාදනය කරමින් කීයක් හරි උපයා ගන්නවා. ඒක වාදනයට මිනිහා හරි දක්ෂයෙක්. ඔහු ගැන නම් මගේ තැකීමක් නෑ. නමුත් ඔහුව එතැන රැඳවීමට කටයුතු කළ, ඉතා භයානක පුද්ගලයා ගැන නම් මගේ විශේෂ සැලකීමක් තියෙනවා. ඒ තමයි මොරියාටිගේ කල්‍යාණ මිත්‍රයා. කඳු මුදුනේ සිට මගේ හිසට ගල් පෙරළූ, දැනට ලන්ඩනයේ ඉන්න අතිශයින්ම භයානක අපරාධකාරයා. අපි මේ රෑ ලුහුබඳින්නේ ඔහුවයි වොට්සන්. අප ඔහු පිටුපස එළවාගෙන එන බව ඔහු තවමත් දන්නෙ නෑ."

මගේ මිත්‍රයාගේ සැලැසුම් දැන් ක්‍රම ක්‍රමයෙන් මට පැහැදිලි වෙමින් ඇත. අප ගැන ඔත්තු බලන පිරිසක් සිටී. ඔවුන්ගේ වැඩ කටයුතු ගැන ඔත්තු බැලීමට දැන් අපට අවස්ථාව සැලසී ඇත. අපව ලුහු බඳින්නන්, ලුහුබැඳ යාමට මීළඟට අපට ඉඩ සැලසෙනු නොඅනුමානය. බේකර් වීථියේ අපේ නිවහනේ ජනේලයෙන් හෝම්ස්ගේ පිළිරුවේ සෙවණැල්ල තවත් දිස්වේ. මේ තබා ඇත්තේ අපරාධකාරයා ගෙන්වා ගැනීම සඳහා ඇමකි. ඔහු අපේ ග්‍රහණයට ගැනීමට දඩයක්කරුවන් සේ අපි මෙසේ සැඟවී බලා සිටින්නෙමු.

අඳුරේ සැඟවී සැහෙන වේලාවක් අපි නිහඬව බලා සිටියෙමු. අප ඉදිරියෙන් පාරේ, පදික වේදිකාවේ, ඔබ මොබ ගමන් කළ පුද්ගලයෝ රාශියකි. ඔවුන්ගේ ඡායාවන් දෙස අපේ අවධානය යොමු කරගෙන සිටියෙමු.

එය වේගයෙන් සුළං හමාගිය අන්ධකාර රාත්‍රියක් විය. කුණාටු සුළඟ වීථිය පිසගෙන ඉදිරියට හමා ගියේ, එයට උරුම හඬ රාව ප්‍රතිරාව නංවමිනි. වැහිකබා වලින් මුළු සිරුරම ආවරණය කරගත් ජනයා වේගයෙන් එහා මෙහා ගියෝය. මේ අතර එක මුහුණ කිහිපවරක්ම දක්නට ලැබුණාදැයි විටෙක මට සිතිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

ෂර්ලොක් හෝම්ස් නම් පිළිමයක් සේ නිශ්චලව, දැඩි අවධානයකින් වීථිය දෙස නෙත් හෙළාගෙන සිටියේය. අප සිටි තැනට මදක් ඈතින් පාර අයිනේ රැඳී සිටි පුද්ගලයින් දෙදෙනෙකු මගේ දෙනෙතට හසුවිය. නිවසක දොරටුව අසලට වී ඔවුන් සිටියේ වෙගයෙන් හමා එන සුළඟෙන් ආවරණය වීමට මෙනි. ඒ ගැන හෝම්ස්ගේ අවධානය යොමුකරවීමට මම උත්සාහ කළෙමි. එහෙත් නොඉවසිලිමත් බවක් පළකළ මගේ මිත්‍රයා ඒ ගැන උනන්දුවක් දැක්වූයේ නැත. ඔහු බලාපොරොත්තුවන අයුරින් කටයුතු සිදුවෙන බවක් නොපෙනේ. මැදියම් රැය ළං වෙද්දී, හෝම්ස් කාමරයේ ඉහළ පහළ ඇවිදීමට පටන් ගත්තේ තම කැළඹිලි ගතිය පෙන්වමිනි. මා ඔහුට යමක් පැවසීමට සූදානම් වූවා පමණි ඇතිත්, අපේ නිවහනේ ජනෙල් වීදුරුව මත වැටී තිබූ හෝම්ස්ගේ හෙවණැල්ල වෙනස් පැත්තකට හැරිණි.

"හෙවණැල්ල මෙහෙට පිටිපස්ස හැරෙව්වා හෝම්ස්."

"ඇත්තෙන්ම ඒක හෙලවුණා. මං ඒ තරම් මෝඩයෙක්ද වොට්සන්? යුරෝපයේ ඉන්න අංක එකේ කෛරාටික තක්කඩියා අල්ල ගන්නයි අපි උත්සාහ දරන්නේ. උන් පඹයෙකුට රැවටේවි කියල අපට හිතන්න පුළුවන්ද? දැන් අපි මේ කාමරේ පැය දෙකක් ගතකළා. හඩ්සන් මහත්මිය ඇගේ ඡායාව ජනෙල් වීදුරුවට නොවැටෙන අයුරින්, මගේ ප්‍රතිමාව පැය කාලෙන් කාලට නොයෙක් ඉරියව් වලට සකස් කළා. . . . . ආන්!"

එක්වරම හුස්මක් ඉහළට ඇදගත් හෝම්ස්, කථාව නවත්වා පාරේ දුටු යමක් වෙත දැඩි අවධානයක් යොමු කළේය.

පාර සම්පූර්ණයෙන්ම පාළුවට ගොසිනි. කුණාටුවෙන් ආවරණය වීමට ගෙයක දොරකඩ සැඟවුණු දෙදෙනා දැන් එතැන නොමැත. පාරේ අඳුරු හා නිසල බව නොවෙනස්ය. තම උගුරෙන් නැඟුණු හඬක් යටපත් කළ හෝම්ස්, මා කාමරයේ මුල්ලකට ඇදගෙන ගියේය. මගේ මිත්‍රයා අතිශය කැළැඹීමට පත්ව ඇත. ඒ බව ඔහුගේ ස්පර්ශයෙන්ම මට හැඟිණ. එහෙත් බේකර් වීථිය තවමත් පෙර මෙන්ම නිශ්චලය.

එක්වරම මට යම්කිසි ශබ්දයක් ඇසිණි. ඒ බේකර් වීථිය දෙසින් නොවේ. ඒ ශබ්දය නම් අප සැඟවී සිටි නිවසේම පිටුපසිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

දොරක් විවෘත වී යළිත් එය වසා දැමිණි. නිසැකවම කිසිවෙකු මේ ගෙට ඇතුළුවූවා විය යුතුය. ඒ කවුද?

මොහොතකට පසු කිසිවෙකු බරාදය දිගේ ඉදිරියට ඇවිද එන අඩි ශබ්දය අපට අසන්නට ලැබිණි. නිශ්ශබ්දව පැවතිය යුතු නිවසේ අඩි ශබ්දයක්! හෝම්ස් සහ මම කාමරයේ අඳුරුම මුල්ලක සැඟවුණෙමු. මගේ අත සාක්කුවේ තිබූ රිවෝල්වරය අල්ලා ගත් ගමන්ය.

ගෙට ඇතුළු වී ඉදිරියට ආ පුද්ගලයා අප සිටි විශාල සාලයට ඇතුළුවිය. දෙකට නැමී ශරීරය වකුටු කරගත් ඔහු, අඩියෙන් අඩිය ජනෙල් වීදුරුව දෙසට ළංවීමට පටන් ගත්තේය. ඔහු ඉතා ප්‍රවේසමෙන් පා තැබුවේ අවදානමක් බලාපොරොත්තුව සිටි අයුරෙනි. දැන් ඔහු අපට යාර තුනක් පමණ දුරිනි. ඔහු කොයි මොහොතේ හෝ අප වෙත කඩා පනිනු ඇතැයි මම විශ්වාස කළෙමි. මම ඊට සූදානම් වීමි. එහෙත් ඔහු අප පසුකරගෙන ඉදිරියට ගියේය. අප එහි සැඟවී සිටි බව ඔහු නොදන්නා අයුරකි. ජනේලය වෙත ගිය ඔහු, ජනෙල් වීදුරුව අඟල් හයක් පමණ ඉහළට ඔසවා, තම මුහුණ එතැනට ළං කළේය. වීථියේ ආලෝකය ඔහුගේ මුහුණට වැටිණි. දුටු දසුනෙන් ඔහු අතිශයින් සතුටට පත්වූ බව ඔහුගේ ප්‍රීතියෙන් දිදුලන දෑසින් මම වටහා ගතිමි. ඔහු තරමක් වයසට ගිය පුද්ගලයෙකි. හිස ඉදිරියෙන් අඩක් පමණ තට්ටය පෑදීම නිසා නළලේ පුළුල් බවක් දිස්විය. උල් වූ ඉහින් නාසයක් ද තැනින් තැන සුදු වූ විශාල උඩුරැවුළ ද කැපී පෙනෙන ලකුණු ලෙස මම දුටුවෙමි. මුහුණ සැහෙන තරමට රැළි වැටී තිබිණි.

අත තිබූ සැරයටියක් වැනි දඬුක් ඔහු බිම අතහැරියේය. එහෙත් එයින් නැඟුණේ ලෝහ කූරක් බිම වැටෙද්දී නැගෙන ශබ්දයයි.

මීළඟට තම කබා සාක්කුවට අත දැමූ ඔහු විශාල පොදියක් එළියට ගත්තේය. එය විවෘත කළ අමුත්තා යම්කිසි කටයුත්තක වහ වහා නිරත වීමට පටන් ගත්තේය. එය අවසන් වූයේ ලෝහ දුන්නක් වැනි යමක් නියම තැනට වැටුණු පසු නැගෙන 'ක්ලික්' හඬක් නංවමිනි.

මෙතෙක් වෙලා බිම, දණගසාගෙන සිටි අමුත්තා එතැනින් නැගිට්ටේය. ඔහු අතේ තිබුණේ කුමක්දැයි, මට දැකගත හැකිවූයේ

http://sherlockholmesinvestigations.blogspot.com

එවිටයි. එය අමුතුම හැඩයක් ගත් ගිනිඅවියකි. එහි බඳ විවෘත කළ ඔහු, උණ්ඩ පුරවා ගිනිඅවිය සූදානම් කරගත්තේය. මීළඟට තුවක්කු බටයේ කට, විවෘත කළ ජනේලය තුළින් එළියට දැමූ ඔහු, තම ඉලක්කය ගන්නට පටන් ගත්තේය. ඒ, පාරෙන් එහා පැත්තේ අපේ නිවහනේ, ජනෙල් වීදුරුවට වැටී තිබුණු ෂර්ලොක් හෝම්ස්ගේ හෙවණැල්ල වෙතයි. තත්පර කිහිපයක් නිසල වූ ඔහු ගිනිඅවිය ග්‍රහණයට තදකරගෙනම කොක්ක ගැස්සූ අයුරු මම දුටුවෙමි. යම් විශේෂිත ආකාරයක වෙඩි හඬක් සමග ඈත ජනේලයක, වීදුරු කුඩුවී ඇද හැළෙන ශබ්දය අපට ඇසන්නට ලැබිණි.

ඒ මොහොතේම හෝම්ස් කොටියෙකු මෙන් වෙඩික්කාරයා වෙත කඩා පැන්නේය. ඔහුගේ බෙල්ලෙන්ම අල්ලා ගෙන අමුත්තා උඩුබැලි අතට බිම පෙරළා දැමූ හෝම්ස්, අමුත්තාට සෙලවීමට වත් නොහැකි වන සේ තම ග්‍රහණය දැඩි කළේය. එහෙත් වහා ක්‍රියාත්මක වන ව්‍යාඝ්‍රයෙකු මෙන් මහළු වූ වෙඩික්කාරයා, මෙවර හෝම්ස්ගේ බොටුවෙන් තදින් අල්ලා ගත්තේය. මම වහාම අත තිබූ රිවෝල්වරයේ මිටෙන් වෙඩික්කාරයාගේ හිසට මරු පහරක් එල්ල කළෙමි. එයින් ඔහු බිම ඇද වැටිණි. මම ඔහුගේ ශරීරය මතට පැන්නෙමි. මගේ මිත්‍රයා නළාවක් පිඹීමට පටන් ගත්තේය. නිවස තුළට දිව එන කිහිප දෙනෙකුගේ පාවහන් ගැටෙන හඬ ඇසිණි. නිල ඇඳුමෙන් සැරසුණු පොලිස් භටයෝ දෙදෙනෙක් ද සාමාන්‍ය ඇඳුමෙන් සැරසුණු රහස් පරීක්ෂකයෙක් ද අප සිටි සාලයට ඇ ා වැදුණහ.

"ඔය ලෙස්ට්‍රේඩ්ද?"

"ඔව් හෝම්ස් මහත්මයා. ඔබ පවරා තිබූ රාජකාරිය මම ම භාරගත්තා. ඔබ ආයෙමත් ලන්ඩනයේ දකින්නට ලැබීම මොන තරම් සතුටක්ද?"

"මං හිතන්නේ ඔබට නිල නොවන උදව් අවශ්‍ය වෙලා තියෙනවා ලෙස්ට්‍රේඩ්. අවුරුද්දක් ඇතුළත විසඳාගන්න බැරිවුණු අභිරහස් මිනීමැරුම් ගණන තුනක් කිව්වාම සුළුපටු නෑ නේද? ඒ වුණත් මොලසි අභිරහස ඔබ සාර්ථක ලෙස විසඳුවා."

පොලිස් භටයන් දෙදෙනාගේ ග්‍රහණයට හිරවූ සිරකරුවා අපහසුවෙන් මෙන් හුස්ම ගැනීමට පටන් ගත්තේය. පාරේ ඇවිදගිය

http://sherlockholmesinvestigations.blogspot.com

රස්තියාදු කරුවෝ කිහිප දෙනෙක් ජනේලය දෙසට ළං වූහ. හෝම්ස් ජනේලය වසා තිරය පහත ඇම්මේය. ලෙස්ට්‍රේඩ් ඉටිපන්දම් දෙකක් දැල්වූ අතර පොලිස් භටයෝ ඔවුන්ගේ ලන්තෑරුම් දැල්වූහ. අපේ සිරකරුවා දෙස මට පැහැදිලි ලෙස බලාගත හැකිවූයේ එවිටයි.

අප දෙසට හැරී තිබුණේ භයානක අපරාධකරුවෙකුටම උරුම මුහුණකි. ඔහුට තිබුණේ චින්තකයෙකුගේ පුළුල් නළල් තලයකි. ඔහුගේ කුරිරු නිල් පැහැති දෑස් නම්, කිසිවෙකුටත් පහසුවෙන් අමතක කළ නොහැකි දරුණු ඒවා විය. ඔහු හෝම්ස් දෙස බලා සිටියේ කෝපයෙන් වෙවුලමින්, අතිශයින්ම පුදුමයට පත් බැල්මෙනි.

"උඹ මහා යක්ෂයෙක්! අතිදක්ෂ යක්ෂයෙක්!"

"අහා කර්නල්! ජර්ණ නාට්‍යවල කථාවක් තියෙනවානේ දීර්ඝ ගමනක් අවසන් වෙන්නේ ප්‍රේමවන්තයින් හමුවීමෙන් කියල. අපි දෙන්නත් ඒ වගේ. එදා ඈත දුරක, අර රයිෂන්බාක් දියඇල්ල ළඟ පර්වතය මුදුනෙන් ඔබ මගේ හිසට ගල් පෙරළමින් සිටියා නොවැ? ඉතින් බොහොම කාලෙකට පස්සෙ ඔබ දකින්න ලැබීමත් සන්තෝෂයක්."

අතිදක්ෂ යක්ෂයා." කර්නල්ට කිව හැකි වූයේ එපමණකි.

"කෝ මට ඔබව හඳුන්වා දෙන්නත් බැරිවුණා. මහත්වරුනි. මේ තමා කර්නල් සෙබස්ටියන් මොරාන්. අපේ මහරැජිනගේ ඉන්දියන් යුද හමුදාවේ කර්නල් වරයෙක්. අපේ පෙරදිග අධිරාජ්‍යයේ දරුණුම, බිහිසුණුම සතුන් දඩයම් කිරීම පිළිබඳ දක්ෂතම පුද්ගලයා.

මගේ විශ්වාසයේ හැටියට ඔබ ඉන්දියාවේ මිනීකන ව්‍යාඝ්‍රයින් අතිවිශාල සංඛ්‍යාවක් දඩයම් කර තබා තිබෙන වාර්තාව, තවමත් කවුරුවත් බිඳ දමා නැහැ. එහෙම නේද කර්නල්?"

එයට කර්නල් වරයාගෙන් පිළිතුරක් නොලැබිණි. බිහිසුණු වන මෘගයෙකුගේ වැනි දෑස්වලිනුත්, විශාල උඩු රැවුලෙනුත් ඔහු ද කෝප වූ ව්‍යාඝ්‍රයෙකු මෙන් දිස්විය.

"මගේ බොහොම සරල යුද්ධෝපක්‍රමය මගින්, මේ වගේ පළපුරුදු දඩයක්කාරයෙක් අල්ලා ගන්න ලැබීම ගැන මට පුදුමත් හිතෙනවා. මේ විදියේ උපක්‍රම ඔබට බොහොම හුරු පුරුදු ඇති කර්නල් මොරාන්. -

http://sherlockholmesinvestigations.blogspot.com



35. "උඹ මහා යක්ෂයෙක්! අතිදක්ෂ යක්ෂයෙක්!"

http://sherlockholmesinvestigations.blogspot.com

ඇමක් හැටියට ගහක් යටින් ඹළු පැටියෙක් බැඳ තබලා, ව්‍යාඝ්‍රයා එනතුරු, රයිෆලයත් අරගෙන ගහ උඩ රැක සිටීම ඔබට අමුතු දෙයක් නෙමෙයි නේද? මේ පාළු ගේ තමයි මගේ ගහ. ඔබ තමයි ව්‍යාඝ්‍රයා. ඒ කාලෙ ඔබ සමහර විට අමතර රයිෆල් කීපයක් සූදානමින් තියාගෙන ඉන්න ඇති. ඒ කියන්නේ හදිසියේ ව්‍යාඝ්‍රයෝ කිහිප දෙනෙක් ආවොත් වෙඩි තියන්න. නැත්නම් ඉලක්කය වැරැදුණොත් ප්‍රයෝජනයට ගන්න. මේතනත් ඒ විදියමයි. මේ තමයි මගේ අමතර රයිෆල්." හෝම්ස් පැවසුවේ අප දෙසට අත දිගු කරමිනි.

කෝපාවිෂ්ටව සිටි කර්නල් මොරාන්, කැගසමින් හෝම්ස් දෙසට කඩා පැනීමට උත්සාහ කළේය. එහෙත් පොලිස් භටයන් දෙදෙනාගේ දැඩි ග්‍රහණයෙන් ඔහුට ගැලවීමක් නොවීය. ඔහුගේ මුහුණේ මතුවූයේ අතිශය බිහිසුණු පෙනුමකි.

"ඇත්තමයි. මං බලාපොරොත්තු නොවූ විදියේ පියවරකුත් ඔබේ වැඩ පිළිවෙළේ තිබුණු බව මං යටහත්ව පිළිගන්නවා කර්නල්. මං කොහොමටවත් හිතුවෙ නෑ, මේ පාළු නිවසේ, මේ ඉස්සරහ කාමරයම ඔබත් ඔබේ රාජකාරි කටයුතු සඳහා යොදා ගනීවි කියල. ඒක හැරුණාම අනික් හැමදෙයක්ම සිදුවුණේ මං බලාපොරොත්තු වුණු විදියටමයි."

කර්නල් මොරාන්, ලෙස්ට්‍රේඩ් අමතා කථා කිරීමට පටන් ගත්තේය.

"මාව අත්අඩංගුවට ගන්න ඔහේට හේතුවක් තියෙන්නත් පුළුවන්, නැතිවෙන්නත් පුළුවන්. ඒවා කොහොම වුණත් මේ පිස්සු මිනිහෙකුගේ පිස්සු දෙඩවිලි වලට මාව භාජනය කරන්නෙ ඇයි? නීතියේ හැටියට මාව භාරයට ගන්නා නම් ඉතුරු ටිකත් නීතියේ හැටියටම කරන්න."

"ඔව් ඒක හැබෑවයි. හෝම්ස් මහත්මයා අප පිටත්වෙලා යන්න කලින් ඔබට කියන්න මොනවා හරි තියෙනවද?"

කර්නල් මොරාන්ගේ ග්‍රහණයෙන් මිදී බිම වැටී තිබුණු රයිෆලය හෝම්ස් පරීක්ෂා කරමින් සිටියේය.

"ඉතාම බල සම්පන්න, ඒ වගේම සුවිශේෂ ආයුධයක්. බොහොම නිශ්ශබ්දව ක්‍රියා කරන එහෙත් විශ්වාසය තැබිය හැකි

http://sherlockholmesinvestigations.blogspot.com

හිතිඅවියක්. මහාචාර්ය මොරියාටිගේ ඇණවුමක් අනුව මේක නිෂ්පාදනය කළේ ජර්මන් ජාතික අන්ධ කාර්මිකයා - ෆොන් හර්ඩර්. මං ඔහු ගැනත් දන්නවා. මෙවැනි ආයුධයක් තිබෙන බව මං අවුරුදු ගණනක් තිස්සේ දැනගිටියා. ඒත් ඒක අතින් අල්ලා බලාගන්න ඉඩක් ලැබුණේ අදයි. ලෙස්ට්‍රේඩ් මං කැමතියි, මේ ආයුධය ගැනත්, මේකෙ උණ්ඩ ගැනත් ඔබ විශේෂ අවධානයක් යොමු කරනවා නම්."

"අප ගැන සම්පූර්ණ විශ්වාසය තියන්න හෝම්ස් මහත්මයා. අපි ඒ ගැන හොඳින් බලාගන්නම්. වෙන මොනවද ඔබට කියන්න තියෙන්නෙ?"

ලෙස්ට්‍රේඩ් ඇසුවේ සිරකරුවා සමග නිවසෙන් පිටවී යාම සඳහා දොරටුව වෙත යමින්.

"ලෙස්ට්‍රේඩ්, ඔබ මොහුට විරුද්ධව ඉදිරිපත් කරන චෝදනාව මොකක්ද? මං අනිවා ඒකත් දැනගන්න කැමතියි."

"චෝදනාව මොකක්ද? ඇයි ෂර්ලොක් හෝම්ස් මහත්තයව ඝාතනය කරන්න තැත් කිරීම?"

"ඒක එච්චර හරි මදි ලෙස්ට්‍රේඩ්. මේ සම්බන්ධයෙන් මගේ නම කොහොමටවත් සඳහන් කරන්න උවමනා නෑ. මේ දරුණු අපරාධකාරයා අල්ලා ගැනීමේ සම්පූර්ණ ගෞරවය ලැබෙන්නේ ඔබට. ඔව්. ඒ ගෞරවය ඔබට පමණයි. ඔබේ උපායශීලී, සූක්ෂ්ම ක්‍රියාමාර්ගයකින් ඔහු අත්අඩංගුවට ගැනීම ගැන මගේ සුභපැතුම් පිළිගන්න."

"එතකොට අපි මේ අල්ල ගත්ත මිනිහා කළ වැරැද්ද මොකක්ද හෝම්ස් මහත්මයා? මොකකටද ඔහුව උවමනා වෙලා තියෙන්නෙ?"

"ඔහු තමා, ඔබේ මුළු පොලිස් හමුදාවම පහුගිය ටිකේ හොයමින් සිටි අපරාධකාරයා. උද්‍යාන පටුමගේ අංක 427 දරන නිවස ඉදිරිපිට ගොඩනැගිල්ලකට වෙලා, වායුබල රයිෆලයකින්, ගරු රොනල්ඩ් ඇඩෙයාර්ගේ හිසට වෙඩිතබා මරාදැමූ මිනීමරුවා!

අපටත් යන්න වෙලාව හරි වොට්සන්. බිඳුණු වීදුරු ජනේලයකින් ගේ ඇතුළට හමා එන අධික සීතල සුළඟ ඔබට ඉවසා සිටින්න පුළුවන්ද වොට්සන්? එහෙම නම් යමු මගේ කාමරේට.

http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම ප්‍රයෝජනවත් කථාන්තරයක් අහලා ඔබට විනෝදාස්වාදයක් ලබන්න පුළුවනි."

මයික්‍රොෆ්ට් හෝම්ස්ගේ මෙහෙයවීම යටතේ හඩ්සන් මහත්මිය විසින් අපේ කාමර කිසිදු වෙනසක් නොකොට, ඒ හැටියෙන්ම ආරක්ෂා කොට තිබිණි. කාමර වල එදා දක්නට නොතිබුණු පිරිසිදු බවක් මෙදා ඇති බව සැබෑය. එහෙත් පරණ සලකුණු බොහොමයක් ඒ අයුරින්ම ඉතිරිව තිබිණ. රසායන ද්‍රව්‍ය ගබඩා කොට කාමරය මුල්ලේ වූ මේසයේ මතුපිට, අම්ල වර්ග වලින් පිළිස්සුණු ගමන්මය. පුවත්පත් වලින් වැදගත් තොරතුරු කපා අලවා, හෝම්ස් නිතර සකස් කළ 'ස්ක්‍රැප්' පොත්, දැවැන්ත පොත් රාක්කයක තැන්පත් කොට තිබිණ. නොයෙක් විස්තර අඩංගු කෝෂ ග්‍රන්ථ, පයිප්ප රාක්කය තියමින තැන්වලම විය. එහි ඇතුළුවෙද්දී අප පිළිගැනීමට කාමරය තුළ දෙදෙනෙක් සිටියහ. හඩ්සන් මහත්මිය ඉදිරියට ආවේ දීප්තිමත් සිනහුවකින් මුව සරසාගෙනයි. අනෙක් පුද්ගලයා ෂර්ලොක් හෝම්ස්ගේ, ඉටිවලින් තැනූ පිළිමයයි. හෝම්ස්ගේ පැරණි පිට කබායක් දවටා තිබුණු මෙය, මගේ මිත්‍රයාට සෑම අයුරකින්ම සමාන වන සේ ඉතා අනාර්ඝ ලෙස නිමකළ එකකි.

"හඩ්සන් මහත්මිය. මං දුන්නු උපදෙස් ඔබ නියම ආකාරයෙන් පිළිපැද්දා."

"ඔබ කිව් ආකාරයට, පිළිරුව තිබුණු හැටි වෙනස් කරන්න, මම ගියේ බිම දණගාගෙන."

"විශිෂ්ටයි. ඔබ ඒ කටයුත්ත ඉතාම හොඳින් ඉටු කළා. මුණිස්සම විසිවුණේ කොහේටද කියල ඔබ දැක්කද?"

"ඔව් මහත්මයා. ඔබේ අලංකාර පිළිමය ඒ මුණිස්සම නිසා අපරාදේ පළුදු වුණා. මුණිස්සම හිසේ වැදිලා හිස විනිවිද ගිහිං අනෙක් පැත්තේ බිත්තියේ වැදී බිම වැටුණා. බුමුතුරුණ උඩ තිබී මං එය අහුලා ගත්තා. මෙන්න ඒක."

"රිවෝල්වර සඳහා යොදාගන්නා බොහොම සැහැල්ලු මුනිස්සමක් වොට්සන්. පෙනෙනවා නේද මිනිහගේ දක්ෂකම? කවුද හිතන්නේ මේ තරම් දුරක ඉඳන්, අධිබල රයිෆලයකින් මේ වගේ දෙයක් කළ හැකියි කියල. ඉතින් හඩ්සන් මහත්මිය, ඔබෙන් ලැබුණු

http://sherlockholmesinvestigations.blogspot.com

සහයෝගය ගැන මං බොහොම කෘතඥ වෙනවා. වොට්සන්. දැන් ඉතින් මං කැමතියි ඔබ ඔබේ පරණ ආසනයේම ටිකක් වාඩිවෙනවා නම්. කාරණා කිහිපයක්ම තියෙනවා ඔබ සමග සාකච්ඡා කරන්න." එසේ පැවසූ හෝම්ස් ඉදිරියට ගොස්, ඉටි පිළිමයේ උණ්ඩය වැදී පළුදු වූ තැන පරීක්ෂා කොට බැලුවේය.

"දඩයක්කාරයා නාකි වුණත්, දෑත්වල කිසිම වෙව්ලීමක් නෑ. ස්නායු හොඳට සන්සුන්. ඇස්වල සූක්ෂ්ම පෙනීම යන්තමින්වත් අඩුවෙලා නෑ." හෝම්ස් කීවේ සිනාසෙමිනි.

"මුනිස්සම ගියේ පිටුපසෙන් ඇතුළුවෙලා මොළය විනිවිද ගිහිං. ඔහු තමා ඉන්දියාවේ හිටි අංක එකේ වෙඩික්කාරයා. ලන්ඩනයේ නම් මං හිතන්නේ ඔහුට වඩා දක්ෂ අය කීප දෙනෙක් ඉන්නවා. ඔබ ඔහු ගැන මීට කලින් අහල තියෙනවද වොට්සන්?"

"නෑ. මං අහල නෑ."

"අන්න බලන්න. ඔවුන් ලබන ප්‍රසිද්ධියේ හැටි එහෙම තමා. මගේ මතකය හරි නම් ඔබ මහාචාර්ය මොරියාටි ගැන අහල තිබුණෙත් නෑ. ඔය පොත් රාක්කයේ තිබෙන චරිතාපදාන විශ්ව කෝෂය අරගන්න."

පුටුවේ පිටුපසට හේත්තු වුණු හෝම්ස් පිටු පෙරළුවේ සුරුට්ටුවෙන් දුම් රැළි පිටකරමිනි.

"'M' අකුරෙන් නම තියෙන සුවිශේෂ පුද්ගලයින් රැසක්ම ඉන්නවා මගේ චරිතාපදාන එකතුවේ.

මොරියාටිම මදෑ මුළු M අකුරම විශේෂ එකක් කරන්න. ඊළඟට ඉන්නවා විෂ යෝදා මිනීමරු මෝගන්. විශ්වාස කළ නොහැකි තරම් පුදුමාකාර මතකයක් තිබුණු මෙරිඩිව්. ඊළඟට මැතිව්ස්. මිනිහ තමයි චාරිං ක්‍රොස් දුම්රිය පොළේදී මගේ රදනක දතක් ගැලැව්වා යන්න කක්කට අහරක් එල්ල කළ එකා, . . . . ආ . . . . ඊළඟට මේ ඉන්නේ . . . . අද රාත්‍රියේ අපට හමුවුණු මිත්‍රයා."

ඔහු එම පොත මගේ අතට දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

## මොරාන්, කර්නල් සෙබස්තියන්.

රැකියාවක් නොකරයි. අවසන් වරට රැකියාව කළේ බැංගලෝර්හි පළමුවැනි පුරෝගාමී රෙජිමේන්තුවෙයි. උපන 1840. කලක් පර්සියාවේ බ්‍රිතාන්‍ය තානාපති ධුරය දැරූ ශ්‍රීමත් ඔගස්ටස් මොරාන්ගේ පුත්‍රයා. අධ්‍යාපනය ලැබුවේ ඊටන් උසස් පාඨශාලාවේ හා ඔක්ස්ෆඩ් විශ්ව විද්‍යාලයේ. ඇෆ්ගනිස්ථානය, කාබුල් හා ජොවාකි මහ සටන්වලදී බ්‍රිතාන්‍ය හමුදාවල පෙරමුණේ සටන් කළේය. ඔහු විසින් ලියා ඇති පොත්පත් "බටහිර හිමාලයේ රුදුරු දඩකිම" (1881), "ගන වන මැද තුන්මසක්" (1884). පදිංචිය - කොන්ඩියුට් වීථිය. සාමාජිකත්වය දරන ක්‍රීඩා සමාජ - ඇංග්ලෝ ඉන්ඩියන්, ටැන්කවිල් හා බගටෙලේ කාඩ් ක්‍රීඩා සමාජ.

එහි පැත්තකින් හෝම්ස්ගේ අත් අකුරෙන් මෙසේ සටහන් කොට තිබිණි.

"ලන්ඩනයේ සිටින අංක දෙකට භයානකම මිනිසා."

"මේක හරි පුදුමයක් නේ! මිනිහ ජීවිතේ අරඹල තියෙන්නේ බොහොම නිර්භීත, අවංක හමුදා නිලධරයෙක් හැටියට."

මම පොත වසමින් පැවසුවෙමි.

"ඔබේ කතාවේ ඇත්තක් තියෙනවා වොට්සන්. එක්තරා කාලයක් දක්වා ඔහු ඉතා හොඳින් ඒ විධියට කටයුතු කළා. ඔහු ඉතාම නිර්භය නොසැලෙන පුද්ගලයෙක්. ඔහු වෙඩිකාපු, මිනීකන ව්‍යාඝ්‍රයෙක් අල්ලන්න, කාණුවක් දිගේ බඩගාගෙන ඉදිරියට ගිය හැටි ගැන, තවමත් ඉන්දියාවේ මිනිස්සු කතා වෙනවා. ඔබ දැකලා ඇති වොට්සන්, සමහර ගස් තියෙනවා, යම්කිසි කාලයක් යනතුරු ඉතාම අලංකාර විධියට අතු විහිදමින් හැදෙනවා. ඊට පස්සේ අර අලංකාර බව මොකුත් නැතිවෙන විධියට අතු ලියලමින් අස්වාභාවික අයුරින් මෝරනවා. මනුෂ්‍යයින් අතරත් මෙන්න මේ දේ බොහෝවිට දකින්න ලැබෙනවා. මේ ආකාරයට මිනිස්සු එක පාරටම හොඳ හෝ නරක පැත්තට හැරෙන්නෙ ඇයි කියන එක ගැන, මං මානව විද්‍යාත්මක මතයක් ඉදිරිපත් කර තියෙනවා. මගේ මතය නම් මේකට හේතුව පුද්ගලයාගේ මුතුන් මිත්තන්ගෙන් උරුමවුණු ගුණාංගවල ක්ෂණික උද්දීපනයක් ඇතිවීම."

"ඒක ටිකක් විශ්වාස කරන්න අමාරුයි."

http://sherlockholmesinvestigations.blogspot.com



41. ලන්ඩනයේ සිටින අංක 2 ට භයානකම මිනිහා......."

http://sherlockholmesinvestigations.blogspot.com

"කොහොම වුණත් කර්නල් මොරාන් වැරැදි මාර්ගයට හැරුණා. ඔහුගේ කල්ක්‍රියාව ගැන ප්‍රසිද්ධ නොවුණත්, ඔහුට ඉන්දියාවේ රැඳී ඉන්න බැරි තරමට තත්ත්වය අයහපත් වුණා. ඔහු හමුදාවෙන් විශ්‍රාම අරගෙන එංගලන්තයට ආපසු ආවා. මෙහේදිත් ඔහුගේ නම ඇඳුණේ මැරවර වැඩවලටයි. මෙන්න මේ කාලෙ තමා මොරියාටි, තමන්ගේ කල්ලියට මොරාන්ව බඳවා ගත්තේ.

ඔහු මොරියාටිගේ ගෝලයින් අතර ප්‍රධාන තැනක් දැරුවා. මොරියාටි, කර්නල්ට ඉහළ වැටුපක් ගෙව්වා. නමුත් ඔහුට කරන්න භාරදුන්නේ, සාමාන්‍ය අපරාධකරුවකුට කිරීමට අපහසු, ඉහළ පෙළේ අපරාධයක් හෝ දෙකක් පමණයි. 1887 දී සිදු වූ ලෞඩර් මහත්මියගේ මරණය ගැන සමහර විට ඔබට මතක ඇති? නැ? මට හොඳටම විශ්වාසයි! ඒක මොරාන්ගේ වැඩක්. නමුත් කිසිදෙයක් ඔප්පු කරන්න බැරිවුණා. ඔහු ඒක කළේ ඉතාම සූක්ෂ්ම අයුරින්. ඒ මොකද මොරියාටි කල්ලිය බිඳු දැමීමෙන් පසුව වත්, ඒ මිනීමැරුමට සෙබස්තියන් මොරාන් සම්බන්ධ බව තහවුරු කරන්න සාක්ෂි හොයාගන්න බැරිවුණා.

ඔබට මතකද වොට්සන් මං එදා ඔබේ චිකිත්සාගාරයට ඇවිත් ජනෙල් වසා දැමූ හැටි? වායුරයිෆල් වලින් එන වෙඩි පහරක් ගැනයි මං ප්‍රවේශම් වෙන්න හදන්නෙ, කියා මං එදා ඔබට කිව්වෙ? ඒ වෙලාවෙ ඒකෙ වැදගත්කම ඔබට වැටහෙන්න නැහැ. නමුත් මේ දරුණු ආයුධයේ බිහිසුණු කම ගැන මං දැන හිටියා. එම රයිෆලය ක්‍රියාත්මක කරන්නේ ලෝකෙ ඉන්න දක්ෂම වෙඩික්කාරයා බවත් මං දැන හිටියා. අපි ස්විට්සර්ලන්තයේ සංචාරය කරද්දී ඔහු මොරියාටිත් සමග අපේ පිටු පසින්ම ආවා. කිසිම සැකයක් නෑ, එදා අර කඳු මුදුනේ ඉඳල මගේ හිසට ගල් පෙරළුවෙත් ඔහු.

සෙබස්තියන් මොරාන් ලන්ඩන් නගරයේ නිදහසේ ජීවත් වෙනතුරු, මගේ ජීවිතේ ගැන කිසි විශ්වාසයක් තියන්න බැරි බවත් මං දැන හිටියා. රෑ දවල් දෙකේම මං පිටුපස ඔත්තු කාරයෝ එන බවත්, කොයි වෙලාවක හරි ඔහු මට ප්‍රහාරයක් එල්ල කරන බවත් මං අවබෝධ කරගත්තා. මට මොකක්ද කරන්න ඉතිරි වෙලා තිබුණෙ? ඔහු දුටු හැටියෙම වෙඩි තියන්න මට අයිතියක් නෑ. . එහෙම කළොත් මට විරුද්ධව මිනීමැරීමේ චෝදනාව

http://sherlockholmesinvestigations.blogspot.com

එල්ල වේවි. ඒ හින්දා මම ලන්ඩනයේ සිදුවෙන අපරාධ ගැන පුවත්පත්වල පළවෙන තොරතුරු පිළිබඳව හොඳ අවධානයකින් සිටියා. ටිකක් කල්ගතවෙලා හරි ඔහුව අල්ලා ගන්න මට අවස්ථාවක් ලැබෙන බව මම දැනහිටියා.

රොනල්ඩ් ඇඩෙයාර්ගේ මරණය සිදුවුණේ මේ අතරෙදියි. කර්නල් මොරාන් ගැන මං දැන සිටි තොරතුරු අනුව මේක ඔහුගේ වැඩක් බව මං පැහැදිලිව තේරුම් ගත්තා. ඇඩෙයාර් තරුණයා සමග මොරාන් කාඩ් ක්‍රීඩාවෙ යෙදුණා. ක්‍රීඩා සමාජයේ සිට ඔහු පසුපස ඇවිත්, ජනේලයෙන් වෙඩි තබා තරුණයා මරා දැම්මා. ඒ ගැන කිසිම සැකයක් නෑ. මුණිස්සම් වල සාක්ෂියම ඇති මිනිහගේ බෙල්ලට තොණ්ඩුව වැටෙන්න.

මං වහාම පිටත්වෙලා ආව ලන්ඩනයට. ඔහුගේ ඔත්තුකාරයා මාව දැක්කා. මේ ආරංචිය වහාම ඔහු කර්නල්ට දෙන බව මං දැනහිටියා. තමන් අපරාධයක් කළ සැණින් ෂර්ලොක් හෝම්ස් ලන්ඩනයට ආවෙ මොකද කියන එක තේරුම් ගන්න මොරාන්ට අපහසු වෙන්නෙ නැහැ. ඔහු දැඩි භීතියකට පත්වෙන්න ඇති. හැකි වහාම මාව මේ දර්ශනයෙන් ඉවත් කර දමන්න ඔහු පියවර ගන්නා බව මං දැනගත්තා. ඔහු මේ සඳහා තමන්ගේ ප්‍රබල රයිෆලය යොදා ගන්න බව මං විශ්වාස කළා. ඔහුට ඉලක්කය සඳහා යොදාගත හැකි රූපයක් ජනෙල් වීදුරුවට වැටෙන්න සලස්වලා, පොලීසියේ හටයනුත් කල්තියාම සූදානම් කර තබා, මං ඔහුට මුහුණ දුන්නා. ඔබ අර කුණාටුවෙන් ආවරණය වෙන්න දොරකඩක හිටි පුද්ගලයින් දෙන්දෙනෙකු ගැන කිව්වා නේද? ඒ තමයි අර පොලිස් හටයන් දෙදෙනා. හැම දෙයක්ම නිරීක්ෂණය කරන්න ඉතාම හොඳයි කියලා හිතල් මං තැනක් තෝරා ගත්තා. කර්නල් මොරාන් මට ප්‍රහාරය එල්ල කරන්නත් එතැනම තෝරාගත්තා. ඉතින් හිතවත් මිත්‍රයා. ඔබට තවමත් නොපැහැදිලි තැනක් තියෙනවද?"

"ඔව්. රොනල්ඩ් ඇඩෙයාර් මරාදමන්න මොරාන් තීරණය කළේ ඇයි?"

"මේක ගැන මට ස්ථිරයටම කියන්න බෑ. මට යමක් අනුමාන කරන්න පුළුවනි."

http://sherlockholmesinvestigations.blogspot.com

කර්නල් මොරාන් සහ ඇඩෙයාර් දෙදෙනා කාඩ් ක්‍රීඩාවෙන් හවුලේ විශාල මුදලක් දිනාගත්තා. කිසිම සැකයක් නෑ, මොරාන් ක්‍රීඩාවෙදි සැහෙන්න වංචා කරන්න ඇති. ඔහු කාඩ් ක්‍රීඩාවෙදි වංචා කරන බව මං බොහොම කාලයක් සිට දැන සිටි දෙයක්. මං හිතන්නේ රොනල්ඩ් ඇඩෙයාර් මේ කරුණ පැහැදිලිවම තේරුම් ගත්තා. ඔහු මේ ගැන පෞද්ගලිකවම මොරාන්ට කථා කර තර්ජනය කරන්න ඇති - "කාඩ් ක්‍රීඩා සමාජ වලින් ඉවත් වී යන්න. නැත්නම් ඔක්කොම හොර එළිකරනවා." කියල. තමන්ට වඩා හුඟක් වයසින් වැඩි, සුප්‍රසිද්ධ මිනිහෙක් කළ වංචාවන් එක්වරම එළිකර, ඔහුව අපකීර්තියට පත්කරන්න ඇඩෙයාර් තරුණයාට හිතෙන්න නැහැ.

කාඩ් ක්‍රීඩා සමාජ වලින් ඉවත් වෙලා යන්න වුණොත් කර්නල් මොරාන් විනාසයි. ඒ මොකද ඔහු ජීවත්වුණේ සූදුවෙදි වංචා කර උපයා ගත්ත මුදලින්. මොරාන් ඒ නිසා ඇඩෙයාර්ව මරා දැම්මා. මේ වෙලාවේ තරුණයා, මිත්‍රයන්ගේ නම් ලියා, මුදල් වෙන්කරමින් සිටියේ, ඔවුන්ගෙන් වංචනිකව දිනාගත් මුදල් ආපහු දීමේ අදහසින්. සහකාරයා වංචාවෙන් ඒ මුදල් දිනාගත්තට, ඒවා තමන් ළඟ තබාගන්නවත් ඇඩෙයාර් කැමතිවෙන්න නැහැ. මවත් සොහොයුරියත් එක්වරම කාමරයට ඇවිත් මේ ගැන ප්‍රශ්න කරන්න ඉඩ තියෙන නිසා තමයි ඔහු ඇතුළෙන් දොර අගුළු දමා ගත්තේ. හරිද?"

"ඔබ නිවැරදි බවට සැකයක් නෑ."

"හරි හෝ වැරදි හෝ කර්නල් මොරාන්ගෙන් මීට පස්සේ අපට කරදරයක් හිටින්නේ නෑ. ෆොන් හර්ඩර්ගේ සුවිශේෂ වායුරයිෆලය, ස්කොට්ලන්ඩ්යාඩ් හි අපරාධ කෞතුකාගාරයට එකතු වේවි. ලන්ඩන් නගරයේ මතුවෙන ගැටලු ගැන යළිත් හිත යොදවන්න ෂර්ලොක් හෝම්ස් මහත්මයාටත් නිදහස ලැබෙනවා."



http://sherlockholmesinvestigations.blogspot.com

# චාල්ස්
# ඔගස්ටස් මිල්වටන්

Peading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# චාල්ස් ඔගස්ටස් මිල්වටන්

ෂර්ලොක් හෝම්ස්ටත් මටත් කිසිදිනෙක මුහුණපාන්නට නොලැබුණු ආකාරයේ, ඉතාම සුවිශේෂ අත්දැකීමක් වූ මෙය සිදුවී, දැන් අවුරුදු ගණනක් ගතවී ඇත. කෙසේ වෙතත් මෙය ඉදිරිපත් කිරීම පිණිස, ඊට අදාළ පුද්ගලයින්ගේ නියම නම්, ගම්, සැහවීමට සිදුවීම ගැන පාඨක ඔබෙන් සමාව අයැදිමි.

ශීත සෘතුවේ හිම වැටීගෙන එන හැන්දෑවක, අපි දෙදෙනා ලන්ඩන් නගරයේ සුපුරුදු සක්මන සඳහා පිටත්ව ගියෙමු. අප ආපසු පැමිණෙන විට සවස හය පමණ වී තිබිණ. හෝම්ස් පහන් දැල්විය. අප හමුවීමට පැමිණි අමුත්තෙකු, තම ආගන්තුක පත්‍රය මේසය මත තබා ගොස් තිබිණ. එදෙස බැල්මක් හෙළූ හෝම්ස්, තම පිළිකුල හඟවන ශබ්දයක් පිටකොට, එය බිමට විසි කළේය. මම එය අහුලාගෙන කියවා බැලීමි.

චාල්ස් ඔගස්ටස් මිල්වටන්
ඇපල්ඩෝ ටවර්ස්,
හැම්ස්ටෙඩ්.

නියෝජිත

"කවුද මේ මිනිහා?" මම ඇසීමි.

"මේ තමයි ලන්ඩනයේ ඉන්න එපාම කරපු මිනිහා." පැවසූ හෝම්ස්, ගිනි උදුන ඉදිරිපිට අසුන්ගෙන, දෙපා ඒ දෙසට දිගු කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Point



47. "ලන්ඩනයේ ඉන්න එපාකරපු ම මිනිහා චාල්ස් ඔගස්ටස් මිල්වටන්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔය කාඩ්පතේ අනෙක් පැත්තේ මොනවත් ලියල තියෙනවාද බලන්න වොට්සන්."

"සවස 6.30ට නැවත පැමිණෙමි.

සී. ඒ. එම්."

"හ්ම්. ඒකටත් එහෙනම් වෙලාව හරි. වොට්සන්, ඔබ සත්ත්ව උද්‍යානයට ගිය වෙලාවක, ඒහී සර්පයන් දිහා බලාගෙන ඉන්නකොට, මොන වගේ හැඟීමක්ද ඇතිවෙන්නේ? කුරිරු ඇස් දෙකක් තියෙන, සෙවල සහිත ඇඟෙන් බිම බඩගාන, විෂ සහිත, පිළිකුල් සහගත සර්පයෝ? මිල්වටන් කිව්වාම මටත් ඇතිවෙන්නෙ අන්න ඒ හැඟීම. මගේ මේ රැකියාවේදී මට මිනීමරුවෝ පනස් දෙනෙකු පමණ හමුවෙලා තියෙනවා. ඒත් මේ මිනිහට මගේ හිතේ ඇතිවුණු තරම් පිළිකුලක් ඒ එක්කෙනෙක් ගැනවත් මට දැනුණෙ නෑ. ඒ වුණත් මට ඔහුත් එක්ක ගනුදෙනු නොකර ඉන්නත් බෑ. ඇත්තම කියනවා නම්, ඔහු මෙහේ ඉන්නෙ මගේ ආරාධනාව නිසා."

"ඉතින් කවුද ඔය මිනිහා?"

"ම්ං මෙහෙම කියන්නම් වොට්සන්. මිල්වටන් තමා මනුස්සයින්ව ප්‍රාණ ඇපකාරයින්ගේ තත්ත්වයට පත්කරලා, ඔවුන්ගේ රහස් එළිනොකරන්න, කප්පම් ඉල්ලන රජ්ජුරුවෝ! ඔය මිනිහට අහුවෙන ගෑනුන්ට මිනිසුන්ට දෙවියන්ගෙම පිහිට තමා. බොහොම ලස්සන හිනාවක් දාගෙන, සාන්තුවරයෙක් වගේ කථා කරමින්, මනුස්සයින්ව අන්තිම සතේට යනකං සූරාගෙන කනවා. හරියට අන්තිම ලේ බින්දුව එනකං බෙල්ල මිරිකනවා වගේ.

ඒ වැඩේට මිල්වටන් බොහොම දක්ෂයි. මොනවා හරි සාධාරණ රස්සාවක් කළා නම් මිනිහට හොඳට දියුණු වෙන්න තිබුණා. මිනිහගෙ වැඩ පිළිවෙළ මෙහෙමයි.

හොඳට සල්ලි තියෙන සුප්‍රසිද්ධ, වැදගත් පුද්ගලයින්ගේ රහස් අඩංගු, පෞද්ගලික ලියුම්, රහස් ලියවිලි ආදියට, ලොකු මුදලක් ගෙවන්න එයා සූදානම් කියන කාරණය එයා ප්‍රසිද්ධ කරනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම වෙලාවට තමන්ගේ ස්වාමිපුරුෂයාගේ හෝ ස්වාමියාගේ, මේ වගේ රහස් ලියුම් හොරකම් කරගෙන එන්නෙ ඒ වලව්වල සේවක සේවිකාවෝ. සමහර වෙලාවට ඒ හැදගත් පවුල්වල නෝනලාගේ ආදරය, විශ්වාසය දිනාගන්න හැකිවුණු, තක්කඩින් ළඟත් මේ වගේ ලියුම් තියෙනවා. මිල්වටන් ඒ වගේ ලියුම් විශාල ගණන් වලට මිලට ගන්නවා. මං දන්නවා ලොකු වලව්වක සේවකයෙකුට එක ලියුමක් සඳහා ඔහු ගෙව්වා රන්පවුම් හත්සියයක්. ඒ ලියුමෙ දිග කොපමණද දන්නවද? පේළි දෙකයි. මොකද අන්තිමට වුණේ? ඒ ප්‍රභූ පවුල කඩාකප්පල් වී විනාශවෙලා ගියා.

මේ වගේ රහස් ලියවිලි ඔක්කොම මිලට ගන්නේ මිල්වටන්. මේ ලන්ඩන් නගරයේ සිය ගණනක් මනුස්සයෝ ඉන්නවා, මිල්වටන් කියන නම ඇහුණු ගමන් ශරීරය හිරිවැටිලා යනවා. කිසිකෙනෙකුට කියන්න බෑ, මිල්වටන් කවදා කොයි වෙලේ තමන්ව බෙල්ලෙන් හිරකරාවිද කියල. ඒ මොකද මිනිහට ඕන තරම් සල්ලි තියෙනවා. ඒ වගේම කපටියි. කිසිම කලබලයක් නෑ. මිනිහට ලැබුණු හොඳම තුරුම්පුවක් ගහන්නෙ නැතුව, ඒකට හොඳම වෙලාව එනතුරු අවුරුදු ගණනක් බලා ඉඳීවි. ඒකට අදාළ අපරාධයින්ගෙන්, ගත්ත පුළුවන් ලොකුම කප්පම ගැනීමට හැකිවෙනතෙක්, ඒ විධියට බලා ඉන්න ඔහු සූදානම්. මං ඔබට කිව්වා නේද ඔහු තමයි මේ ලන්ඩනයේ ඉන්න එපාම කරපු මිනිහ කියල. එක පාරම පිහියෙන් ඇණල මිනිහෙක් මරා දමන මිනීමරුවෙක් එක්ක, මෙයාව කොහොමද අපි සංසන්දනය කරන්නෙ? මිනිස්සුන්ගෙ ආත්මය දඬු අඬුවකින් හිරකර, ටිකෙන් ටික අඹරවමින්, ක්‍රමානුකූලව ආත්මයට වධ දෙමින් තමයි, ඔහු සල්ලි හම්බකරන්නේ."

මේ තරම් සිත් වේදනාවෙන් හා කැළැඹුණු සිතෙන් මගේ මිත්‍රයා කථා කරනු මට අසන්නට ලැබී තිබුණේ කලාතුරකිනි.

"හොඳයි. ඇයි ඔහුට විරුද්ධව නීති මගින් ක්‍රියාකරන්න බැරි?"

"නීති පොතේ හැටියට පුළුවනි. ඒත් ප්‍රායෝගිකව ඒක කරන්න බෑ. මේ ගැන පොලිසියට පැමිණිලි කර, නඩු විභාගයකින් පස්සේ, කාන්තාවකට පුළුවනි, ඔහු මාස ගණනකට හිරේ යවන්න. ඒත් ඇති වැඩේ මොකක්ද? එතකොට ඔහු ඇගේ රහස් ඔක්කොම

http://sherlockholmesinvestigations.blogspot.com

එළිකරලා ඇගේ පවුල කඩාකප්පල් කරල ඉවරයි. ඔහු සූක්ෂ්ම විධියට ගොදුරු කරගන්න පුද්ගලයින් කවුරුවත්, මිල්වටන්ට විරුද්ධව පියවර ගන්න භයයි. ඔහු යම් දවසක සම්පූර්ණයෙන්ම අහිංසක පුද්ගලයෙකුගෙන් කප්පම් ඉල්ලුවොත්? අන්න එදාට අපට ඔහුව අල්ලාගන්න පුළුවනි. නමුත් මිල්වටන් කියන්නේ හිවලෙක් වගේ කපටියෙක්. වැරැදි විධියට එක අඩියක් තියන්නෙ නෑ. අපි ඔහුව කොටුකරගන්න වෙන මොනවා හරි ක්‍රමයක් හොයාගන්න ඕන වොට්සන්."

"ඉතින් මොකටද ඔහුට මෙහේ එන්න කිව්වෙ?"

"ඉතාම ප්‍රසිද්ධ තරුණ කාන්තාවක්, ඇගේ බොහොම දුක්බර ප්‍රශ්නය මට භාරදුන්නා. ඇය තමයි ඊවා බ්ලැක්වෙල් ආර්යාව. මෑත කාලයේ රට පුරා ප්‍රසිද්ධියට පත්වූ රූපසුන්දරිය ඇයයි. ඇය ඩෝවකෝට් ආදිපාදවරයා සමග විවාහ ගිවිසගත්තා. ඒ විවාහ මංගල්‍ය උත්සවයට තිබෙන්නේ හරියටම තව සති දෙකයි. මේ මිල්වටන් කියන තක්කඩියා ළඟ තියෙනවා, ඇය කලකට පෙර, වැඩිපුර කල්පනා නොකොට ලියූ ලියුම් කිහිපයක්. මොනවත් බරපතල කාරණා අඩංගු ඒවා නොවේයි. නමුත් මේ විවාහය කඩාබිඳ දමන්න, ඒ ලියුම් හොඳටම සෑහේවි. මිල්වටන්ට විශාල මුදලක් වහාම නොගෙව්වොත්, ඔහු ලියුම් ටික ආදිපාදවරයාට යවනවාලු. මිල්වටන් හමුවෙලා, මේක හැකිතරම් සතුටුදායක විධියකට විසඳගන්න එක ඇය මට භාරදීලයි තියෙන්නෙ."

ඒ මොහොතේ පහළ වීථියේ රථයක් නවත්වන හඬ ඇසිණ. එය ඉතා අලංකාර විශාල අශ්ව කරත්තයකි. සේවකයෙක් පැමිණ දොර විවෘත කළේය. අනර්ඝ ඇඳුම් පැළඳුම් වලින් සැරසුණු පුද්ගලයෙක් රථයෙන් බැස්සේය. ස්වල්ප වේලාවකින් ඔහු අපේ විසිත්ත කාමරයට ඇතුළුවිය.

චාල්ස් ඔගස්ටස් මිල්වටන් වයස අවුරුදු පනහක් පමණ වූ පුද්ගලයෙකු විය. ශරීර ප්‍රමාණයෙන් එතරම් උස මහත නොවූ ඔහු සතු වූයේ, තට්ටය පෑදුණු විශාල හිසකි. ඔහුගේ රත්රන් උපැස් යුවළ පිටිපස වූයේ, අනුකම්පා විරහිත කුරිරු නෙත් යුවලකි. කෙසේ වෙතත් දෙතොලේ රැඳී තිබුණේ කිසි විටෙකත් නොමැකෙන සට කපට සිනහවකි.

http://sherlockholmesinvestigations.blogspot.com

මිල්වටන්ගේ කතාබහ කුඩා දරුවෙකුගේ මෙන් අහිංසක විලාසයක් ගත්තේය. ඔහු අතට අතදී ආචාර කිරීමට ෂර්ලොක් හෝම්ස්ට දකුණත දිගු කළේය. එහෙත් හෝම්ස්ගෙන් ඊට ලැබුණේ බලාපොරොත්තු නොවූ ප්‍රතිචාරයකි. හෝම්ස් තම සුරත මිල්වටන් වෙත දිගු කළේ නැත. හෝම්ස්ගේ මුහුණේ මතුවූයේ සුහදශීලී බවක් වත් ආචාරශීලී බවක් වත් නොවේ. මෙය තමාට තේරුම් ගැනීමට අපහසු බවක් හඟවමින් මිල්වටන් දෙඋර හැකිළුවේය. මුහුණේ තිබූ සිනාව උපහාසාත්මක එකක් වන අයුරින් කටේ දෙකෙළවර දෙපසට ඇදිණි. අනතුරුව ඔහු තම කබාය ඉවත්කොට, එය ප්‍රවේශමෙන් නමා තුබා, පුටුවේ හිඳගත්තේය.

"මේ මහත්තයා . . . ?"

මිල්වටන් ඇසුවේ මා දෙසට අත දිගු කරමිනි.

"මේක රහස් සාකච්ඡාවක් නේද? මේ මහත්මයා මෙතැන හිටියට කමක් නැද්ද?"

"කමක් නෑ. වොට්සන් දොස්තර මහත්මයයි මමයි හවුලේ තමයි මේ අපරාධ පරීක්ෂණ කටයුතු කරන්නේ."

"බොහොම හොඳයි හෝම්ස් මහත්මයා. මං මේ කිව්වේ ඔබේ අනුග්‍රාහකයාගේ වැඩි හොඳටයි. මේක බොහොම සියුම්, රහසිගත කාරණයක් නේ . . . ."

"වොට්සන් මහත්මයා දැනටම ඒ ගැන දන්නවා."

"හොඳයි එහෙනම් අපි කෙළින්ම කාරණේට බහිමු. ඔබ කියන්නේ ඔබ ඊවා බ්ලැක්වෙල් ආර්යාව වෙනුවෙන් පෙනී ඉන්නවා කියල නේ. මගේ කොන්දේසි, මිල ගණන් වලට ඇය කැමැතිද?"

"මොනවද ඔබේ කොන්දේසි? මිල ගණන්?"

"රන් පවුම් හත්දාහයි."

"ඒක නොගෙව්වොත්?"

"මගේ හිතවත් මහත්මයා. ඒ මුදල නොගෙව්වොත් ලැබෙන ප්‍රතිඵලය ඔබට කියන්න මට හිතට අමාරුයි. 14 වැනි දා වෙනකොට මගේ අතට මුදල් නොලැබුණොත් 18 වැනිදාට විවාහ මංගල්‍යය පැවැත්වෙන එකක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් මඳ වේලාවක් කල්පනා කළේය.

"මට පෙනෙන හැටියට ඔබ හිතාගෙන ඉන්නෙ, මේ ලියුම් බොහොම රහසිගත, කෙනෙකු ලැජ්ජාවට පත්විය හැකි ඒවා කියල වගෙයි. මගේ අනුග්‍රාහිකාව මං දෙන උපදෙස් පිළිඅරගෙන ඒ විධියට ක්‍රියා කරන බවට සැකයක් නෑ. මං ඇයට කියනවා, ඇගේ අනාගත ස්වාමිපුරුෂයාට තමන්ගේ අතීතය ඔක්කොම හෙළිකරන්න කියල. ඔහු ඒවා අමතක කර ඇයට සමාව දෙන බවට සැකයක් නෑ." හෝම්ස් කීය.

"ඒ කථාවෙන් තේරෙන්නෙ, ඔබ ඩෝව්කෝර්ට් ආදිපාදතුමාගේ පිළිවෙළ හරිහැටි නොදන්නා බව."

"මොනවද ලියුම් වල ඔය හැටි වරදක් වෙන්න පුළුවන් දේවල් තියෙන්නෙ?"

"ඒවා අලංකාරයි. ඉතාම අලංකාරයි! රසවත් අයුරින්, සිත්ගන්නා අයුරින් යමක් ලියන්නා මේ තරුණියට තියෙන්නේ පුදුම දක්ෂකමක්. ඒ වුණාට මං ඔබට සහතික වෙන්නම්. ලේඛන කලාවේ ඇයට තියෙන දක්ෂකම ආදිපාදතුමා නම් අගය කරන එකක් නෑ.

හොඳයි. ඔබ කියන්නේ මේ ලියුම් කීපයකට රත්පවුම් හත්දාහක් දෙන එක මෝඩ විධියට මුදල් නාස්ති කිරීමක් කියල නේද? ඒකට කමක් නෑ. මං මේ ලියුම් ටික ආදිපාදතුමාට භාරදෙන්නම්."

මිල්වටන් පැවසුවේ අසුනෙන් නැගිට තම කබාය අතට ගනිමිනි.

හෝම්ස් දැඩිලෙස ක්‍රෝධයට පත් විය.

"ඔහොම ඉන්නවා ටිකක්. ඔහේ කලබල වෙනවා වැඩියි. මේ වගේ සියුම් කාරණයක්, අපකීර්තිමත් සිද්ධියක් බවට පත්වෙන එක අපි වළක්වන්න ඕනෙ," හෝම්ස් කීය.

"මං දැනගත්තා හෝම්ස් මහත්මයා. මං දැනගත්තා මේකෙ වැදගත්කම ඔබට වැටහෙන බව." මිල්වටන් පැවසුවේ සන්තෝෂයෙනි.

"ඒ වුණත් ඔබට කියන්න මිල්වටන් මහත්මයා, මේ ඊවා ආර්යාව ධනවත් තරුණියක් නෙමෙයි. පවුම් හත්දාහක් තියා

http://sherlockholmesinvestigations.blogspot.com

පවුම් දෙදාහක් ගෙවන්නත් ඇයට අමාරුයි. හත්දාහක් කියන්නේ හිතන්නවත් පුළුවන් ගණනක් නොවෙයි. ඒ නිසා මම ඔබට ආයාචනය කර සිටිනවා ඔබේ ගණන ටිකක් අඩු කරන්න කියලා. මං කියන්නම් මිල්වටන් මහත්මයා සාධාරණ ගණනක්. ඒ මුදලට ලියුම් ටික මට දෙන්න. ඔබටූ ඒ ලියුම් වලට ගන්න පුළුවන් වැඩිම මුදල ඒක බව මට විශ්වාසයි."

මිල්වටන්ගේ මුහුණේ මතුවූයේ කපටි සිනහවකි. මහා විහිළුවක් අසන්නට ලැබුණු විටෙක මෙන් ඔහුගේ දෙනෙත් බැබළෙන්නට පටන් ගත්තේය.

"ඊවා ආර්යාවට ඒ තරම් මුදල් හදල් නැති කෙනෙක් කියල ඔබ කිව් කථාවට මං එකඟවෙනවා. ඒ වගේම අපි මතක තබාගත යුතු කරුණක් තිබෙනවා. මේ තරුණ කාන්තාවගේ හැදෑහිතවතුන්, යාළු මිත්‍රයින්, ඇය වෙනුවෙන් යම්කිසි පරිත්‍යාගයක් කළ හැකි කාලයක් මේක. ඇයට මඟුල් වලට දෙන්න ඕන තෑගි මොනවද කියල තීරණය කරගැනීම ඔවුනට හරිම අමාරු වේවි. මේ ලන්ඩනය පුරා තිබෙන බටර් දිසි, ඉටිපන්දම් සවිකුරුන පිත්තල ස්ටෑන්ඩ් දෙන්නෙ මොන එකකටද? මං සහතික කරලා කියන්නම්. ඊවා ආර්යාව මේ හැම එකකටම වඩා බොහොම කැමැති වේවි ඇගේ ලියුම් මිටිය ලැබෙනවා නම්."

"එය කිරීමට පුළුවන් කමක් නෑ." හෝම්ස් කීවේ තීරණාත්මක අයුරෙනි.

"අනේ දෙවියනේ මොන තරම් අවාසනාවක්ද!" මිල්වටන් පැවසුවේ සාක්කුවේ තිබූ පොදියක් ලෙස පිම්බී තිබුණු සටහන් පොතක් එළියට අදිමිනි.

"තරුණ නෝනලා එහෙම දේකට උත්සාහ නොදරන එක හරිම කණගාටුදායක දෙයක්. ඒකෙන් තේරෙන්නේ මෙහෙම ප්‍රශ්නයකදී වැඩ කළයුතු පිළිවෙළ ගැන ඔවුනට හරි උපදෙසක් කාගෙන්වත් ලැබිල නැති බවයි. මේ බලන්න."

ඔහු ලිපියක් ඉහළට ඔසවා, එහි ලිපි ශීර්ෂය මුද්‍රිත කොටස අපට පෙන්නුවේය. එහි තිබුණේ යම් ප්‍රභූ පරපුරක නිල ලාංඡනයයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ලියුම අයිති . . . . . ඔව්, සාගා-වෙලාවට ඒ නම දැන්ම හෙළිකරන එක සාධාරණ නැහැ කියන්න පුළුවනි. මං එය හෙට උදේ වනතුරු කල් දමන්නම්. නමුත් හෙට උදේට මේක ඒ නෝනා මහත්මයාගේ ස්වාමිපුරුෂයා අතට පත්වෙනවා. එහෙම කරන්න හේතුව මොකක්ද? ඒ නෝනා ළඟ තියෙන දියමන්ති කිහිපයක් විකුණා, මට සුළු මුදලක් ගෙවන්න තියෙන අපහසු කම. මොන තරම් කණගාටුවට කරුණක්ද?"

ඔබට සමහරවිට මතක ඇති, අර කර්නල් ඩෝකිං සහ ගරු මයිල්ස් මෙනෙවිය සමඟ තිබුණු විවාහ ගිවිසුම හිටිහැටියේ අවලංගු කර දැමූ සිද්ධිය. මඟුල් ගෙදරට දවස් දෙකක් තිබියදී "මෝනිං පෝස්ට්" පුවත්පතේ ඒ ගැන කුඩා ඡේදයක් පළවුණා. ඔබ විශ්වාස කරන එකක් නෑ මහත්මයා. පවුම් පන්දාස් දෙසීයක් ගෙවාගන්න බැරිකමෙනුයි ඒ මඟුල කඩාකප්පල් වුණේ. හරි පව් නේද? ඉතින් ඔබ වැනි බුද්ධිමත් මිනිහෙක්, මේ වගේ වැදගත් ප්‍රශ්නෙකදී මුදල් හෙට්ටු කරන එක හිතන්නත් පුදුමයි. අමතක කරන්න එපා. ඔබ පරදුවට තියන්නෙ, ඔබේ අනුග්‍රාහකයාගේ ගෞරවය සහ මුළු අනාගතයම!"

"මං මේ කියන්නෙ සම්පූර්ණ ඇත්තයි. මිල්වර්ටන් මහත්මයා. ඔය තරම් විශාල මුදලක් මේ හදිසියේ ඇයට හොයාගන්න පුළුවන් කමක් නෑ. ඇගේ මුළු අනාගතයම අඳුරු කර දමන්න එපා. ඇය දෙන්න කැමැති මුදල භාරගෙන ඔය ප්‍රශ්නය විසඳන්න මහත්මයා. එතැනත් සෑහෙන මුදලක් තියෙනවා. ඇගේ අනාගතය විනාශකර දැම්මා කියල, ඔබට ලැබෙන ලාභ ප්‍රයෝජනය මොකක්ද?"

"ඔන්න හෝම්ස් මහත්මයා ඔබම වැරදුණු තැන. මේ රහස එළිකළොත් මට ලැබෙන ලාභ ප්‍රයෝජනය ඉතාම විශාලයි. වෙනත් වෙනත් පුද්ගලයින් සම්බන්ධවුණු මේ වගේම කාරණා අටක්, දහයක් මා ළඟ තියෙනවා. ඒවා දළ ලා වැඩෙමින් මෝරමිනුයි තියෙන්නෙ. නියම කාලෙ ආවම මට පුළුවනි, ඊවා ආර්යාවට අත්වුණු ඉරණම ගැන ප්‍රචාරයක් දෙන්න. එතකොට අර මං කිව් හත්අට දෙනාට මොනවද හිතෙන්නෙ? ඒගොල්ලන්ට තේරේවි මං ඉල්ලන මුදල වහාම ගෙවල ඒක විසඳාගැනීම ඉතාම ඥානාන්විතයි කියල. ඔබට තේරෙනවා නේද මගේ තර්කය?"

http://sherlockholmesinvestigations.blogspot.com



55. “අල්ල ගන්න චොටසන් ඔය මිනිහව.”

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් එක්වරම පුටුවෙන් ඉවතට පැන්නේය.

"අල්ලගන්න වොට්සන් ඔය මිනිහව! යන්න දෙන්න එපා. දෙන්න මහත්මයා ඔහේගෙ ඔය විශාල පොත මෙහාට!"

ක්ෂණිකව පුටුවෙන් ඉවතට පැනගත් මිල්වටන්, කාමරයේ බිත්තිය අසලට දිවගොස් එයට පිට දී සිටගත්තේය. මීළඟට ඔහු කබා සාක්කුවෙන් විශාල රිවෝල්වරයක් එළියට ගෙන, එය අප දෙදෙනාට එල්ල කළේය.

"හෝම්ස් මහත්මයා! හෝම්ස් මහත්මයා! මං හිතුවා ඔබ වෙන කවුරු හරි නොකළ තාලෙ වැඩක් කරාවි කියල. මේ විධියට වැඩ කරන්න බොහොම දෙන්නෙක් මීට කලින් උත්සාහ කරල තියෙනවා. ඒත් ඇතිවුණු ප්‍රයෝජනයක් නෑ.

මං ඔබට සහතික වෙන්නම්, මේ මොහොතේ මා ළඟ දරුණු ආයුධ ගණනාවක් තියෙනවා. ඒ හැම එකක්ම පාවිච්චි කරන්න මං සූදානම්. මගේ ආත්මාරක්ෂාවට මං ආයුධයක් පාවිච්චි කළාට, නීතිය මට එරෙහි වෙන්නෙ නෑ. ඒ නැතත්, ඔය තරම් වටිනා කමක් ඇති ලියුම්, මං යන එන තැන අරං යාවි කියල ඔබ හිතනවද? එහෙනම් ඔබට වැරදිලා. ඒ වගේ මෝඩකම් මං කරන්නෙ නෑ. එහෙනම් මහත්වරුනි මං යන්නම්. මට තියෙනවා අද හැන්දෑවෙ අවසන් කළයුතු සම්මුඛ සාකච්ඡාවක් දෙකක්."

අඩියක් ඉදිරියට තබා තම කබාය අතට ගත් මිල්වටන්, රිවෝල්වරය අප දෙසට එල්ල කරගෙනම, දොර දෙසට ගමන් කළේය. ඔහු වෙත දමා ගැසීමේ අදහසින් මම පුටුවක් එසවීමි. එසේ නොකරන ලෙසට හෝම්ස් සංඥා කළෙන් මම පුටුව ආපසු දැමීමි. අපට හිස නමා ආචාර කොට, මිල්වටන් කාමරයෙන් පිටවූයේ සිනාමුසු මුහුණෙනි. මොහොතකට පසු, ඔහු තරප්පුව බැසයන හඬත්, අශ්ව කරත්තය ගමන් අරඹන ශබ්දයත් අපට අසන්නට ලැබිණි.

ගිනි උදුන අසල වාඩිවූ හෝම්ස් දැල්වෙන ගිනි අඟුරු දෙස නෙත් හෙළාගෙන කල්පනාවක වෙළුණේය. පැය භාගයක් පමණ පිළිමයක් මෙන් නිසලව සිටි ඔහු, එක් වචනයක්වත් කථා කළේ නැත. ඉන්පසු යම් තීරණයකට එළඹි පුද්ගලයෙකු මෙන් අසුනෙන් නැගිට තම කාමරයට ගියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ස්වල්ප වේලාවකට පසු ඔහු කාමරයෙන් එළියට ආවේ වෙස්මාරු කරගෙනයි. තරුණ, කඩවසම් කාර්මිකයෙකුගේ පෙනුම ඔහු ලබා සිටියේය. නිකටේ යටි රැවුලක්ද අලවා ගෙන සිටි ඔහු ඇවිද්දේ, අතමිට සරු තරුණයෙකුගේ ගමන් විලාසයෙනි. නිවසෙන් පිටත්වී යාමට පෙර ඔහු පයිප්පය ද දල්වා ගත්තේය.

"මට ටිකක් වෙලා ගතවේවි වොට්සන්." හෝම්ස් පැවසුවේ අඳුරේ නොපෙනී යාමට පෙරයි.

ඔහු චාල්ස් ඔගස්ටස් මිල්වටන්ට එරෙහිව සටන දියත් කළ බව මම එයින් වටහා ගතිමි. එහෙත් එම සටන, මෙවැනි පුදුමාකාර ගමන් මඟකට පිවිසේවි යයි මම කිසිසේත් නොසිතුවෙමි.

දින කිහිපයක් තිස්සේම හෝම්ස් මෙම ඇඳුමෙන් සැරසී නොයෙක් වේලාවන්හි නිවසෙන් පිටවී ගියේය. තමා හැම්ස්ටෙඩ් බලා ගිය බවත්, කාලය ප්‍රයෝජනවත් ලෙස ගත කළ බවත් හැරෙන්නට ගැටලුව පිළිබඳ කිසිවක් ඔහු පැවසුවේ නැත. අවසානයේ එක් සැන්දෑවක ඔහු නිවසට ඇමිණියේ, හැම්ස්ටෙඩ් වෙත ගිය අන්තිම ගමනත් සාර්ථක ලෙස නිම කළ බව කියමිනි.

එදා සුළි සුළඟක් මෙන් වේගවත්ව සුළං හැමූ, අඳුරු සැන්දෑවක් විය. ගිනිඋදුන ඉදිරිපිට වාඩිවූ මගේ මිත්‍රයා, වෙස්වලා ගැනීමට යොදාගත් රැවුළ හා බොරු කොණ්ඩය ගලවා දැම්මේය. අනතුරුව ඔහු නොනවත්වා සිනාසීමට පටන් ගත්තේ හදපිරි සැහැල්ලු බවකිනි.

"වොට්සන්. ඔබ කියන්නේ මං ජීවිතේටම කසාද බඳින එකක් නැහැ කියල නේද?"

"ඇත්ත! ඔබ නම් කිසි දවසක කසාද බඳින්නෙ නැ. ඒක මට හොඳටම විශ්වාසයි."

"එහෙනම් මෙන්න අහගන්න මිත්‍රයා. මං අද හැන්දෑවෙ විවාහ ගිවිස ගත්තා."

"මොනවා? විශ්වාස කරන්නත් අමාරුයි. මගේ හිතවත් මිත්‍රයා. පිළිගන්න මගේ ශුභ පැතුම්. ඉතින් කවුරු එක්කද, ඔබ විවාහ ගිවිස ගත්තේ?"

"මිල්වටන්ගේ ගෙදර වැඩට ඉන්න ගෘහසේවිකාව එක්ක."

http://sherlockholmesinvestigations.blogspot.com

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ මොනවා හෝම්ස්?"

"මට තොරතුරු රාශියක් එක් රැස් කරගන්න සිදුවුණා වොට්සන්."

"ඒ වුණත් ඔබ බොහොම දුරදිග ගිහින් වැඩියි නේ."

"එහෙම නොකර බැරිවුණා. මම තරුණ ජලනල කාර්මිකයෙක්. නම එස්කොට්. හොඳට සල්ලි බාග තියෙනවා. හැමදාම හැන්දෑවට මං ඇය එක්ක ඇවිදින්න ගියා. ඇයත් එක්ක හොඳට කතාබහ කළා. දෙයියනේ අපි කථාකළ තරමක්, කොහොම හරි, මට හොයාගන්න උවමනා වුණු කාරණා ටික මං හොයා ගත්තා. දැන් මම දන්නවා මිල්වර්ටන්ගේ ගේදර පිළිවෙළ, තොරතුරු ඔක්කොම, අන්තිම තුලටම."

"ඒ වුණත් අර ගෑනු ළමයා හෝම්ස්?"

"ඒකට කරන්න දෙයක් නෑ වොට්සන්. අපි ක්‍රීඩා කරන්නේ මහා විශාල ඔට්ටුවක් අල්ලලා අතේ තියෙන තුරුම්පු මොනවා වුණත්, ඉතාම ප්‍රවේශමින් ක්‍රීඩා කරලා ඒවායින් වැඩිම ප්‍රයෝජනයක් ගන්න ඕනෑ. අද හරිම සොඳුරු රාත්‍රියක් නේද?"

"මොනවා? ඔබ කැමතිද මේ කාලගුණයට?"

"මගේ සැලැස්මට මේක කදිමට ගැළපෙනවා. වොට්සන් ඔබ දන්නවද? අද රෑට මං මිල්වර්ටන්ගේ ගේ බිඳිනවා!"

"දෙයියෝ සාක්කි!" මට කියැවිණි. මගේ ඇඟ එක්වරම සීතල වී ගියේය. මෙවැනි අවදානම් කටයුත්තක ප්‍රතිඵල මට එක්වරම අවබෝධ විය. හොරෙක් නිවසුට ඇතුළුවෙද්දී ගෙහිමියාට අසුවෙන සැටි; ගරු බුහුමන් ලැබෙන වෘත්තියෙක යෙදී සිට එය අවමානයෙන් කෙළවර වෙන සැටි; මේ සියල්ලම මැවී පෙනිණ.

"දෙවියන්ගෙ නාමයෙන් කල්පනා කරල බලන්න හෝම්ස්. වැරැදි වැඩක් නේද ඔබ කරන්න හදන්නෙ?"

"මගේ හිතවත් මිත්‍රයා. මං හැම අතකටම කල්පනා කරල බැලුවා. බොහොම දුරදිග කල්පනා කරන්නෙ නැතුව, යමක් කරන්න මං තීරණයක් ගන්නෙත් නෑ. වෙන ගතහැකි කුමන හෝ මඟකින් මේක ඉටුකරගන්න පුළුවන් නම්, මේ දේ කරන්නෙත් නෑ. අපි

http://sherlockholmesinvestigations.blogspot.com

මේක ගැන සාධාරණව හිතා බලමු. නීතිය පැත්තෙන් බැලුවොත්, මේ කටයුත්ත අපරාධයක් බව ඇත්තයි. නමුත් යුක්තියේ නාමයෙන් වැරැදි වැඩක් නොවෙයි. ඔහුගේ ගේ බිඳලා හොරෙන් ඇතුළුවෙනවා කියන්නේ, ඔහුගේ රහස් අඩංගු අර සාක්කු දිනපොත බලෙන් පැහැර ගැනීම වගේම වැඩක්. ඊට වඩා බරපතල එකක් කියන්න බෑ. එදා ඔබ සූදානම් වුණේ ඒ වැඩේට මට උදව් කරන්න."

මම මොහොතක් කල්පනා කර බැලීමි.

"ඔව්. ඒක යුක්තිසහගත වැඩක් බවට මම එකඟවෙනවා. අපේ අරමුණ, නීතිවිරෝධී ලෙස ඔහු හංගාගෙන ඉන්න ලිපි කිහිපයක් සොරකම් කරගැනීම පමණයි."

"හරියට හරි වොට්සන්. මානුෂික හේතූන් මත සාධාරණ ක්‍රියාවක්. මෙතැනදී මට හිතන්න තියෙන්නේ පෞද්ගලික අවදානම ගැන පමණයි. බොහොම භයානක ලෙස අමාරුවේ වැටුණු කාන්තාවක් ආධාර ඉල්ලමින් ඉන්නේ. ඉතින් පසුබට නොවී එහා උදව් කිරීම මහත්වරුන් හැටියට අපේ යුතුකම."

"ඔබට මුහුණපාන්න වෙන්නේ බොහොම අවදානම් තත්ත්වයකට."

"ඔව්. මේ කටයුත්තෙදී ඒ අවදානම තියෙනවා. අර ලියුම් ආපසු ගන්න, වෙන කිසිම විධියක් ඇත්තෙත් නෑ. ඇයට මේ වෙලාවේ අවශ්‍ය මුදල් ඉල්ලාගන්න කෙනෙක් ඇත්තෙත් නැහැ. හෙට තමයි අන්තිම දවස. මේ කාලකණ්ණි මිනිහා ඔහුගේ වචනය වෙනස් කරන්නෙ නෑ. සල්ලි නොදුන්නොත් ඔහු ඇගේ මුළු අනාගතයම අඳුරු කරාවි. එක්කෝ මං ඇයගේ මුළු අනාගතයම විනාශ වෙන්න ඉඩ හරින්න ඕන. නැත්නම් මගේ අන්තිම තුරුම්පුව ක්‍රීඩාකරන්න ඕන. වොට්සන්, දැන් මේක මිල්වටන් හා මා අතර පෞද්ගලික තරඟයක් — ද්වන්ධ සටනක් බවට පත්වෙලා. පළමුවැනි වටයේ ජය ලැබුණේ ඔහුට බව ඔබ දුටුවා. නමුත් මට දැන් මේක අවසානය දක්වා සටන් කරන්න සිදුවෙලා. ඒ සටන සඳහා මගේ ආත්ම ගෞරවය සහ කීර්ති නාමය පරදුවට තබන්න සිදුවෙලා."

"ඔය වැඩේ මගේ හිතට නම් අල්ලන්නෙ නෑ හෝම්ස්. නමුත් මටත් තේරෙනවා, ඔය දේ ඇරෙන්න මේකට වෙනත් විසඳීමක්

http://sherlockholmesinvestigations.blogspot.com

නැති බව. කොයි වෙලාවටද අපි මේ වැඩේ පටන් ගන්නෙ?" මම ඇසීමි.

"මේ වැඩේට ඔබ එන්න එපා වොට්සන්."

"ඒ කියන්නේ ඔබට තනියම යන්න මගෙන් ඉඩ ලැබෙන්නෙත් නෑ." මම කීවෙමි.

"ඔබට කොහොමටවත් තනියම යන්න මම ඉඩදෙන්නෙ නෑ හෝම්ස්. මං ඔබට සහතික කර කියන්නම්. මාව එකක් නොගියොත්? මං එහෙනම් වහාම කුලී රියක නැගිලා යනවා පොලිස් මූලස්ථානයට. ගිහිං කියනවා, අන්න අහවල් ගේ බිඳලා ගෙට ඇතුළුවෙන්න හොරෙක් සූදානම්. වහාම ඔහුව හිරභාරයට ගන්න කියලා."

"ඔබ ඇවිත් මට කර දෙන්න පුළුවන් උදව්වක් මෙතන නෑ වොට්සන්."

"කොහොමද දන්නෙ? මොකකින් මොකක් වේවිද කියල, ඔබ කොහොමද හරියටම කියන්නෙ? මං තීරණය කරල ඉවරයි. ඔබට විතරක් නෙමෙයි අනික් මිනිස්සුන්ටත් ආත්ම ගෞරවය හා කීර්ති නාමය කියන ඒවා තියෙනවා." මම තදින් කීවෙමි.

හෝම්ස්ගේ මුහුණේ තරමක් කැළැඹීමට පත් ස්වභාවයක් මතුවිය. ටික වේලාවක් යද්දී ඔහුගේ නළලේ රැළි වැටුණු ගතිය නැතිවී ගියේය. මගේ පිටට තට්ටු කරමින් ඔහු මා ඇමතුවේය.

"හොඳයි, හොඳයි මිත්‍රයා, අපි ඒක ඔබ කැමැති විධියට කරමු. අපි දැන් අවුරුදු ගණනාවක් එකට මේ නිවහනේ කාලය ගතකළා. අපි දෙන්නට හිරගෙදරත් එකම හිරකුඩුවක ලගින්න සිද්ධවුණොත් ඒකත් අපූරුයි. එහෙම නේද? මේක ඔබට කිව්වට කමක් නෑ වොට්සන්. මට ඉස්සර හිතිල තියෙනවා, මං අපරාධකාරයෙක් වුණා නම්, බොහොම දක්ෂ විධියට ඒ වෘත්තියෙ යෙදෙන්න තිබුණා කියල. ඔන්න ඒ පැත්තට යොමුවෙන්න මගේ ජීවිතේටම එක් අවස්ථාවක් ලැබුණා. බලන්න මේක."

හෝම්ස් ලාච්චුවෙන් ඉවතට ගත්තේ හම් පසුම්බියක ඇසිරූ, දිලිසෙන ලෝහ උපකරණ කිහිපයකි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ තියෙන්නේ ඉතාම නවීන ගෙවල් බිඳීමේ උපකරණ කට්ටලයක්. මේකෙ තියෙනවා, නිකල් ආලේපිත ජනෙල් අරින තියන, දියමන්ති තුඩක් සහිත වීදුරු කපන උපකරණය, ඕනෑම අගුලක් අරින්න පුළුවන් හොර යතුරු. කාර්මික දියුණුවත් සමග නිෂ්පාදනය වුණු ශක්තිමත් දොරගුළු ඕනෑම එකක් විවෘත කළ හැකි උපකරණ මෙතැන තියෙනවා. ඊළඟට මගේ ආවරණය කළ හැකි කුඩා ලන්තෑරුම. එතකොට සියලු දේම සම්පූර්ණයි. වොට්සන් ඔබ ළඟ තියෙනවාද ශබ්දය නොනැගෙන ලෙස අඩිය තියන්න පුළුවන් පාවහන් යුගලක්?"

"මා ළඟ තියෙනවා රබර් අඩිය සහිත ටෙනිස් සපත්තු කුට්ටමක්."

"විශිෂ්ටයි! ඊළඟට මුහුණු ආවරණය කරගැනීමට වෙස්මුහුණු?"

"කළුපාට සේද රෙදි කැබැල්ලක් කපලා වෙස්මුහුණු දෙකක් හදන්නම්."

"මට පෙනෙන්නේ මේ වගේ හොර වැඩවලට සූදානම් විය යුතු ආකාරය ගැන දැනුමක් ඔබගේ උපතින්ම පිහිටලා වගෙයි. බොහොම හොඳයි. එහෙනම් මුහුණු ආවරණ දෙකක් ඒ විදියට සකස් කරගන්න. පිටත්වෙන්න කලින් අපි රෑ කෑම කාල ඉමු. දැන් වෙලාව නවයහමාරයි. රෑ එකොළහට අපි පිටත්වෙමු. අපි චර්චරෝ දක්වා කුලී රියකින් යමු. එතැන ඉඳන් ඇපල්ඩෝර් ටවර්ස් වලට ළඟයි. පයින් ගියොත් පැය කාලයි. මැදියම් රෑ වෙන්න කලින් වැඩ පටන්ගමු. මිල්වටන් හරියට රෑ දහයමාරට නිදාගන්න ඇඳට යනවාලු. ඔහු බොහොම තදින් නින්ද යන කෙනෙක්. අපි වාසනාවන්ත නම් ඊවා ආර්යාවගෙ ලියුම් පොදියත් අරගෙන, රෑ දෙක වෙද්දි අපට ආපහු එන්න පුළුවනි."

රාත්‍රියේ පැවැත්වෙන නාට්‍ය දර්ශනයක් නැරඹීමට යන අය අඳින ඇඳුම් වලින් අපි සැරසුණෙමු. ඔක්ස්ෆර්ඩ් වීථියෙන් කුලී රියකට නැඟුණු අපි, හැම්ස්ටෙඩ් වලදී රියෙන් බැස, එය ආපසු යැව්වෙමු. එම පෙදෙසේ පැවැතියේ අධික ශීතලකි. අපේ තිබූ සනකම් ලොම් කබා හැඳගෙන, ඇපල්ඩෝර් ටවර්ස් වෙත පා ගමන ඇරඹුවෙමු.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේක බොහොම ප්‍රවේශමෙන් කළයුතු කටයුත්තක්. මිල්වටන්ගෙ නිදන කාමරේට අල්ලපු කාමරේ තමයි ඔහුගෙ කන්තෝරු කාමරේ. ඔහුගේ වැදගත්, රහස් ලියවිලි හැම එකක්ම තියෙන්නේ කන්තෝරු කාමරයේ තියෙන යකඩ සේප්පුවේ. ඒ වගේම ඔහු බොහොම තදින් නින්ද යන කෙනෙක්. අගතාගෙන් - ඒ කියන්නේ මගේ පෙම්වතියගෙන් තමයි මං විස්තර දැනගත්තේ. ඇය කියනවා, සේවක සේවිකාවන් අතර තියෙන විහිළුවක්ලු, මිල්වටන්ට නින්ද ගියාම මොන විධියකින්වත් නැගිට්ටවන්න බැහැ කියන එක. ඔහුට ඉන්නවා පෞද්ගලික ලේකම් කෙනෙක්. මේ ලේකම් මිල්වටන් වෙනුවෙන් බොහොම කැපවීමෙන් සේවය කරනවා. දවල් දවසට ඔහු කන්තෝරු කාමරයෙන් එක මොහොතකටවත් එළියට එන්නේ නෑ. ඒ හින්දා තමයි අපට මේ වැඩේට මහ රෑ යන්න සිද්ධවුණේ.

ඊළඟට මිල්වටන්ට ඉන්නවා බොහොම දරුණු, මිනීකන වර්ගයේ බල්ලෙක්. ඒ කාලෙට උං ගෙයින් පිටත සැරිසරමිනුයි ඉන්නෙ. නමුත් පහුගිය දවස්වල, මට එහේ ගැවසෙන්න හැකිවෙන්න, අගතා බල්ලාව කූඩුවේ දමලා අගුළු දමලයි තිබුණේ. අදත් ඇය බල්ලා කූඩුවට දමාවී, අපට බේරිලා දුවන්න හැකිවෙන්න. මෙන්න අපි ආවා මිල්වටන්ගෙ ගේ ළඟටම. මේ අනෙක් ගෙවල් වලින් වෙන්වෙලා වත්ත මැද්දෙ තියෙන ගෙය. දැන් අපි ගේට්ටුවෙන් පැනලා ඔය මල් පඳුරු තියෙන පැත්තට යමු. ඔක්කොටම ඉස්සර වෙලා අපි මුහුණු ආවරණය කරගෙන ඉඳිමු. ඔබට පෙනෙනවා නේද. එකම ජනේලයකින් වත් කිසිම එළියක් පෙනෙන්න නැහැ. අපි හිතූ විධියටමයි ඔක්කොම."

කළු පැහැති මුහුණු ආවරණ පැළැඳ ගත් පසු, අප දෙදෙනාටම ලැබුණේ බිහිසුණු පෙනුමකි. නිවසේ එක් පාර්ශවයක් දිගටම තිබුණේ බිමට ගඩොල් ඇල්ලූ විවෘත වැරැන්ඩාවකි. එයට විවෘත වන දොරවල් දෙකක් ද ජනේල කිහිපයක් ද විය.

"අර තියෙන්නෙ මිනිහගෙ නිදන කාමරේ." හෝම්ස් මගේ කනට කෙඳුරුවේය.

"මේ දොරෙන් ඇතුළුවුණොත් අපි කෙළින්ම යන්නේ එයාගෙ කන්තෝරු කාමරයට. ඒක තමයි අප යා යුතු හොඳම මාර්ගය

http://sherlockholmesinvestigations.blogspot.com

එකම ප්‍රශ්නය ඒක යතුරෙන් පමණක් නොමෙයි, ඇතුළු පැත්තෙන් සොයිබ වලිනුත් වහලා. ඒ නිසා ඒ දොර අරින්න උත්සාහ කළොත් ලොකු ශබ්දයක් පිටවෙවී. අපි මේ පැත්තෙන් යමු. නිවස ඇතුළත මල් ගස් වවා තිබෙන ගෙළයනක් තිබෙනවා. ඒකෙන් විසිත්ත කාමරයට ඇතුළුවෙන්න පුළුවනි."

මල් වවා තිබූ ඇතුළත ගෙළයනේ දොර වසා තිබිණි. දොර අගුළ කිට්ටුවෙන් වීදුරුවේ රවුමක් කැපූ හෝම්ස්, ඒ තුළින් අතදමා, යතුර කරකවා, දොර හැරගත්තේය. අප ඇතුළු වූ වහාම ඔහු ඒ දොර වසා දැම්මේය. දැන් අපි නීතිය ඉදිරියේ හොරුන් බවට පත්ව සිටිමු.

ඇතුළත ගෙළයනේ තිබුණේ දැඩි උණුසුම් බවකි. එමෙන්ම නොයෙක් අතර්ස මල් හා පඳුරු වලින් නැඟුණු සුගන්ධයෙන් හුස්ම ගැනීම පවා අපහසු විය. හෝම්ස් මගේ අතින් ඇදගෙන, මල්පඳුරු අතරින් නිවසේ වෙතත් පැත්තකට ගමන් ගත්තේය. අන්ධකාරයේ පවා දැකීමට, හෝම්ස් සතුව තිබුණේ සුවිශේෂ දෘෂ්ටියකි. මට කිසිවක් දැකගත නොහැකි වූ නිසා, ඔහු මගේ අතින් අල්ලාගෙනම ඉදිරියට ගියේය. මීළඟට ඔහු ඉතා ප්‍රවේශමෙන් තවත් දොරක් විවෘත කළේය. මගේ අතින් අල්ලාගෙනම එතැනින් ඇතුළුවිය.

අපි පිවිසියේ ඉතා විශාල කාමරයකට බව අඳුරේම වුවත් මට හැඟිණි. කිසිවෙකු මෙහි සුරුට්ටුවක් උරමින් සිට ඇත්තේ ස්වල්ප වේලාවකට පෙරයි. සුරුට්ටු දුමේ ගඳ තදින්ම නාසයට දැනිණි. ලී බඩු අතපත ගාමින් මඟ සොයාගත් හෝම්ස්, තවත් දොරක් අසලට ගියේය. ඔහු එය විවෘත කළේ ඉතාමත් ප්‍රවේශමිනි. අනතුරුව එයින් ඇතුළුවී, මා ද කැඳවාගෙන ඉතා ප්‍රවේශමෙන් දොර වැසීය. මම දෑත් දෙපසට දිගුකොට බැලීමි. බිත්තිවල එල්ලා තිබූ කබා කිහිපයක් මගේ අත්වලට හසුවිය. අප සිටින්නේ බරාඳයක බව මම එයින් තේරුම් ගතිමි. බරාඳය අවසන් වූ තැන තිබූ ඊළඟ දොර ද මගේ මිත්‍රයා විවෘත කළේය. යම්කිසි දෙයක් එක්වරම අප වෙත කඩා පැන්නේය. මම භීතියෙන් ගල් ගැසුණෙමි. එහෙත් ඒ බළලෙකු බව දැනගත් අනු මගේ භීතිය පහව ගියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

අප අන්තිමට ඇතුළු වූ කාමරයේ උදුනක ගිනිඅඟුරු දිලිසෙමින් තිබිණි. එම කාමරයේ ද දුම්පානය කරන්නෙකුගේ දුම්වැටි වලින් නිකුත් වෙන ගඳක් ඇති බව මම තේරුම් ගතිමි. පාවහනෙන් කිසිදු ශබ්දයක් නොනැඟෙන සේ හෝම්ස් එයට ඇතුළු වූයේ පාඇඟිලි වලින් අඩිය තබමිනි. මා පැමිණෙන තුරු එතැන රැඳී සිටි ඔහු, මා ඇතුළුවූ වහාම ඒ දොර ද වසාදැම්මේය. දැන් අප සිටින්නේ මිල්වටන්ගේ කන්තෝරු කාමරයේයි. එහි ඈත කෙළවරේ දොරටුවක් ඇති බව හඟවන දොර රෙද්දකි. ඔහුගේ නිදන කාමරයට ඇතුළුවන දොරටුව එතැන වියයුතුය.

ගිනි උදුනේ දැල්වුණු ගින්දරෙන් කාමරය තුළ සතුටුදායක ආලෝකයක් පැවැතිණි. කාමරයේ විදුලි පහන දැල්විය හැකිවන සේ සුවිච්චයක් තිබෙනු දුටුවෙමි. එහෙත් විදුලි පහන දල්වා ගැනීම ප්‍රවේශම් සහිත නොවේ. ගිනි උදුනට එහා පැත්තේ, පොළොව දක්වා වැටෙන ඝන තිරයකින් ආවරණය කළ කොටසකි. ඊට මෙහා පැත්තේ වැසූ දොරටුවකි. වැරැන්ඩාව හා සම්බන්ධ වූයේ මේ දොරටුවයි.

කාමරය මැද ලියනමේසයකි. එතැන වාඩිවීම සඳහා රතු හම් කවරයකින් අලංකාර කළ, කරකැවිය හැකි පුටුවක් විය. අනෙක් පැත්තේ විශාල පොත් රාක්කයකි. ඒ මත ඇතීන් දෙවඟනගේ කිරිගරුඬ පිළිමයකි. පොත් රාක්කයත් බිත්තියත් අතර උස, කොළ පැහැති යකඩ සේප්පුවක් ඇති බව මම දුටුවෙමි. ඒ දෙස හොඳින් බැලූ හෝම්ස් කාමරය හරහා ගමන් කොට, නිදන කාමරයේ දොර අසලට පා නැඟුවේය. ඒ දෙසට හිස පහත් කළ ඔහු, මිල්වටන්ගේ නිදන කාමරය දෙසින් නැඟෙන ශබ්දය කුමක්දැයි විමසිල්ලෙන් සවන් දුන්නේය. ඒ තුළින් කිසිදු ශබ්දයක් නොනැඟිණි.

හදිසියක් වුවහොත් කාමරයෙන් එළියට පැනගැනීම සඳහා කාමරයෙන් කෙළින්ම වැරැන්ඩාවට යා හැකි දොර විවෘත කර තැබීම හොඳ බව මට කල්පනා විය. මම දොර වෙත ගොස් එය ඇරීම සඳහා අගුළු පරීක්ෂා කර බැලීමි. පුදුමයකි! එය කිසිදු ආකාරයකින් අගුළු දමා නොමැත. මවිතයට පත්වූ මම හෝම්ස්ගේ අතින් අල්ලා, ඒ බව ඔහුට ද පෙන්වීමි. මා මෙන්ම ඔහු ද එයින් අතිශය පුදුමයට පත්විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක නම් එච්චර හොඳ ලකුණක් නෙමෙයි වොට්සන්. මේක කොහොම වුණු දෙයක්ද කියල මට තේරුම් ගන්න බෑ. කොහොම වුණත් ඔය ගැන හිත හිත, නාස්ති කරන්න අපට කාල වේලාවක් නෑ."

මගේ කනට කොඳුරා කිව් ඔහු, තම රාජකාරියට සූදානම් විය.

"මගෙන් මොකක්වත් උදව්වක් ඕනෙද?"

"ඔව් වොට්සන්. ඔය දොර ළඟින්ම ඉන්න. පිටින් කවුරු හරි එන අඩි ශබ්දයක් ඇහුණොත් ඉක්මනට ඇතුළෙන් අගුළු දමන්න. ඊට පස්සේ අපි මෙහේට ආව පාරෙන්ම පැනල යමු. කවුරුත් එන්නෙ අනෙක් පැත්තෙන් නම්, අපේ වැඩෙත් සම්පූර්ණ නම් ඔය දොරෙන් පිටවෙමු. වැඩේ සම්පූර්ණ නැත්නම් ඔන තිර රෙදි පිටිපස්සේ හැංගෙමු. ඔබට තේරුණාද?"

එය තේරුම් ගත් බව හැඟවීමට හිස සොලවා, මම දොර අසලින් සිටගත්තෙමි. මගේ සිතේ මුලින් තිබූ අධික භය, දැන් සැහෙන තරම් පහව් ගොසිනි. දැන් මගේ හිතට දැනුණේ ප්‍රීතිය මුසු සංත්‍රාසයකි. නීතිය ආරක්ෂා කිරීමට අපි මෙතෙක් කලක් කටයුතු කළෙමු. එහෙත් දැන් අපි නීතිවිරෝධී කටයුතු වල යෙදෙමින් සිටිමු. එහෙත් මෙය අපේ ආත්මලාභය තකා කරන්නක් නොවේ. අපේ එකම අරමුණ පාපිෂ්ඨයකු වූ අපේ විරුද්ධවාදියා පරාජය කිරීමයි. මෙය, ඒ සඳහා ආත්ම ගෞරවය පරදුවට තබා කරන වීරක්‍රියාවක් නොවේද? එය පසක් වෙද්දී මගේ සිතට අපමණ සැනසීමක් මෙන්ම සතුටක් ද දැනිණි.

භාරදූර ශල්‍යකර්මයක යෙදෙන ශල්‍ය වෛද්‍යවරයෙකු, ඒ සඳහා තම සැත්කම් උපකරණ තෝරා ගැනීමේ නියෙදෙන්නාක් මෙන්, හෝම්ස් තම උපකරණ කට්ටලය පරීක්ෂා කළේය. හොරුන්ට විවෘත කළ නොහැකි යයි පවසන යකඩ සේප්පු විවෘත කිරීමට, හෝම්ස්ට තිබුණේ සුවිශේෂ හැකියාවකි. විනෝදාංශයක යෙදෙන්නාක් මෙන් ඔහු එයින් අපමණ ආස්වාදයක් ලැබුවේය. වැදගත් නෝනාවරුන්ගේ හා ප්‍රභූවරියන්ගේ රහස් රැසක් සමග කීර්ති නාමය, මේ කොළ සහ රන්වන් පැහැගත් මකරා, උගේ කටේ සඟවාගෙන සිටී. ඌ

http://sherlockholmesinvestigations.blogspot.com

සමග සටන් කොට ඒවා මකර කටෙන් ගලවා ගැනීමටයි හෝම්ස් දැන් සටන් වදින්නේ.

පිට කබාය ගලවා පුටුවක් මත දැමූ හෝම්ස් කමිසයේ අත් ඉහළට නමා ගත්තේය. ඉන්පසු තම උපකරණ කට්ටලයෙන් ලෝහ විදින බුරුම කටු දෙකක්, නිසනක් හා හොර යතුරු කැරැල්ලක් එළියට ගත්තේය. එළියට පැනගැනීම සඳහා තිබූ දොරටුව මැදින් හිටගෙන, අනෙක් දොරටු දෙස සුපරීක්ෂාකාරී ලෙස බලමින් මම සූදානමින් සිටියෙමි. හදිසියකදී වහා ක්‍රියාත්මක වීමට මා සූදානම්ය. එහෙත් අපට යම් බාධා කිරීමක් සිදුවුණොත්, මා ක්ෂණිකව කළ යුත්තේ කුමක්ද යන්න මට එතරම් පැහැදිලි නොවීය.

පැය භාගයක් තිස්සේ හෝම්ස් නොනවත්වාම තම කටයුත්තේ යෙදුණේය. එක් උපකරණයක් ආපසු තබමින් ඒ වෙනුවට තවෙකක් තෝරා ගනිමින්, ඔහු ක්‍රියා කළේ පුහුණුව ලැබූ කාර්මිකයෙකු පරිද්දෙනි. අන්තිමේදී මට "ක්ලික්" හඬක් අසන්නට ලැබිණි. ඒ සමගම යකඩ සේප්පුවේ දොර දුන්නකින් තදකොට තිබුණාක් මෙන් විවෘත විය.

එය තුළ තිබූ පැකට්ටු රාශිය මගේ දෑසින්ම මම දුටුවෙමි. එම පැකට්ටු නූල් වලින් ගැටගසා, මුද්‍රා තබා, පිටතින් යම් යම් දේ ලියා තිබිණි. හෝම්ස් එයින් එකක් අතට ගෙන පරීක්ෂා කරද්දී, මම ඔහුට ළංවූයෙමි. උදුනේ දැල්වුණු ගින්දරේ එළියෙන් පැකට්ටුවේ සටහන් කොට තිබූ දේ කියවීමට අපහසු විය. සාක්කු ලන්තෑරුම ඔහු එළියට ගත්තේ විදුලි පහන දැල්වීම අවදානම් යයි සිතුණු නිසා විය යුතුය. එහෙත් එස්වරම ගල්ගැසුණාක් මෙන් නිසල වූ හෝම්ස් යම් ශබ්දයකට දෙසවන් යොමු කළේය. ඔහුට යම්කිසි ශබ්දයක් ඇසෙන්නට ඇත. ඊළඟට එක් ක්ෂණයකින් හෝම්ස් යකඩ සේප්පුවේ දොර අඩවන් කළේය. තම කබාය අතට ගෙන, උපකරණ කට්ටලයද සාක්කුවේ දමාගෙන ඔහු තිරය පිටිපස සැඟවුණේ, මට ද විගසින් එසේ කරන මෙන් සංඥා කරමිනි.

මා ඔහු සිටි තැන සැඟවී ගත්තා පමණි. මගේ මිත්‍රයා සතු වූ සියුම් සංවේදී ඉන්ද්‍රියනට යම් අන්තරායදායක බවක් හැඟුණේ තත්පර කිහිපයකට පෙරයි. මඳ වේලාවකින් එය මට ද ඇසිණ. නිවසේ කොතැනකින් හෝ යම් ශබ්දයක් පිටවිය. දොරක

http://sherlockholmesinvestigations.blogspot.com

වසා දැමෙන හඬක් ඈතින් ඇසිණි. ඉන්පසු පැහැදිලිව හඳුනාගත නොහැකි සියුම් ශබ්ද කිහිපයකි. මීළඟට අසන්නට ලැබුණේ අප සිටි දෙසට ඇවිද එන්නෙකුගේ අඩි ශබ්දයයි. එය බරාඳය දෙසිනි. දොර අසලදී එය මොහොතකට නැවැතිණි. දොර විවෘත විය. කිසිවෙකු කාමරයේ විදුලි පහන දැල්වූයේය. තිරයෙන් පිටුපස සිටි අපට කිසිත් නොපෙනිණ. දොර යළිත් වසා දමන හඬ ඇසිණි.

සැර දුමක් පිටවූ සුරුට්ටුවක් දල්වා ගත් කිසිවෙක් කාමරයේ ඉහළ පහළ ඇවිදීමට පටන් ගත්තේය. ඒ අපට යාර කිහිපයක් ඉදිරියෙනි. පුටුවක් පිටුපසට අදින හඬ සමඟ ඉහළ පහළ යන අඩි ශබ්දය නැවැතිණ. ඊට පසු ඇසුණේ යතුරකින් අගුළක් විවෘත වෙන හඬ සහ කඩදාසි දිග හැරෙන ශබ්දයයි. ඝන තිරරෙද්ද පිටුපස සැඟවී සිටියත් සිදුවන්නේ කුමක්දැයි බැලීමට මගේ සිතේ බියක් තිබිණ. දැන් සියල්ල සන්සුන්ය. ඒ නිසා තිර රෙද්ද දෙකට බෙදී තිබුණු තැනින් එය යන්තමින් මෑත්කොට එබී බැලුවෙමි. එම අවසරයෙන් හෝම්ස් ද මගේ හිසට ඉහළින් නෙත යොමු කළේය.

අප ඉදිරියේම, ඉතා ළඟින් මිල්වර්ටන් අපට පිටුපස හරවාගෙන වාඩිවී සිටියේය. අත දිගුකළා නම් අපට ඔහු ඇල්ලීමට වුවද හැකියාව තිබිණ. මිල්වර්ටන් නින්දට යන්නට ඇතැයි අප විසින් කළ නිගමනය සම්පූර්ණයෙන්ම වැරදි එකක් බව දැන් පැහැදිලිය. ඔහු නිදන කාමරය පැත්තේ වත් ගොස් නැත. ඔහු සිට ඇත්තේ නිවසේ ඈත කෙළවරේ පිහිටි බිලියඩ් කාමරයට වී සුරුට්ටුවක් උරමිනි. අපේ දර්ශන පථයේ මැදින්ම වූයේ මිල්වර්ටන්ගේ තැනින් තැන තට්ටය පෑදුණු, තැනින් තැන කොණ්ඩය පුදුවුණු හිසය. රතු හම් කවරය යෙදූ පුටුවේ වාඩිවී සිටි ඔහු, දෙපා ඉදිරියට දිගු කරගෙන සිටියේය. කටේ පැත්තක, දල්වාගෙන සිටි කළු පැහැති දිග සුරුට්ටුවකි. වටිනා ඇඳුමකින් සැරසී සිටි ඔහුගේ අතේ, නීතිමය කටයුතුවලදී ප්‍රයෝජනයට ගන්නා ආකාරයේ ලියවිල්ලකි. කටින් දුම් වළලු පිට කරමින් මිල්වර්ටන් එම ලියවිල්ල කියවූයේ දැඩි උනන්දුවකිනි. ඔහු එතැනින් නැගිටින ලකුණකුදු නොතිබිණ.

හෝම්ස් මගේ අත තදින් අල්ලා, සෙමින් සෙලෙව්වේය. ඒ, මෙම තත්ත්වය ඔහුට ප්‍රශ්නයක් නොවන බවට සංඥාවකි. එහෙත් මා සිටි තැනට හොඳින් දර්ශනය වූ එක් දෙයක් හෝම්ස් දැන සිටියාදැයි මම නොදනිමි. එනම් යකඩ සේප්පුවේ දොර පියන

http://sherlockholmesinvestigations.blogspot.com

හොඳින් තදවෙන සේ වසා නොමැති බවයි. දැන් කොයි මොහොතේ හෝ මිල්වටන් මේ බව දකිනු නොඅනුමානය. ඔහු එය දුටුවහොත් අප විසින් ගතයුතු පියවර කුමක්ද? මම එක් ක්ෂණයකින් එය තීරණය කළෙමි. මිල්වටන් එය දුටු බව හැඟුණොත්, අප සැඟවී සිටි තැනින් එළියට පැන, මගේ විශාල කළු කබාය මිල්වටන්ගේ හිස වැසෙන සේ දමා, ඔහුට සෙලවීමටවත් නොහැකිවන සේ තදින් බදා අල්ලා ගන්නෙමි. එවිට ඉතිරි වැඩකටයුතු සියල්ල හෝම්ස් විසින් ඉටුකරනු ඇත.

එහෙත් මිල්වටන් හිස ඔසවා යකඩ පෙට්ටිය දෙස එක්වරක් හෝ බැලුවේ නැත. ඔහු තමා අත වූ ලියවිල්ල මහත් උනන්දුවෙන්, පේළියෙන් පේළිය, පිටුවෙන් පිටුව, කියවාගෙන ගියේය. මෙය නීතිඥයෙකු විසින් සකසන ලද යම්කිසි නීතිමය ලියවිල්ලක් විය යුතුය. මෙය කියවා අවසන් වූ පසු, ඔහු මෙතැනින් නැඟිට කාමරයෙන් ඉවතට යනු ඇත. එහෙත් ලියවිල්ල අවසන් වීමටත් පෙර සිදුවූයේ නොසිතූ දෙයකි.

තම ඔරලෝසුව දෙස බලමින් මිල්වටන් වේලාව පරීක්ෂා කරමින් සිටි ආකාරය, මම කිහිපවරක්ම දුටුවෙමි. වරක් ඔහු පුටුවෙන් නැඟිට, ඉවතට යාමටත් සිතා, යළිත් අසුන්ගත්තේ නොඉවසිලිමත් ස්වභාවයකිනි. එහෙත් ඔහු කිසිවෙකු හමුවීම සඳහා, මේ අරුම පුදුම වේලාව යොදාගත් බව මට කිසිවිටෙකත් නොසිතිණි. එවැන්නක් ඇති බව මට හැඟුණේ වැරැන්ඩාව දෙසින් අඩි ශබ්දයක් ඇසුණු විටයි. ලියකියවිලි පසෙකින් තැබූ මිල්වටන්, තම අසුනේ සැලුව වාඩිවිය. කිසිවෙකු ඉතා සෙමින් දොරට තට්ටුකරන හඬ ඇසිණි. මිල්වටන් නැඟිට දොර විවෘත කළේය.

"ආ. . . . ඔබ ආවද? ඔබ පැය භාගයක් විතර ප්‍රමාදයි නේ."

දොරේ අගුළු නොදමා විවෘතව තැබීමට හේතුව කුමක්දැයි දැන් අපට තේරුම් ගත හැකි විය.

කාන්තාවකගේ දිග ගවොමක රැළි එකට ගැටෙද්දී නැඟෙන හඬට සමාන හඬක් ඇසිණි. මිල්වටන් ආපසු ඇවිත් වාඩිවෙනතුරු, මම තිරරෙද්දි අතර විවරය වසා දැමීමි. නමුත් ඔහු අසුනේ වාඩි වූ

http://sherlockholmesinvestigations.blogspot.com



69. "ආ...... ඔබ ආවද? පැය බාගයක් විතර ප්‍රමාදයි නේ."

http://sherlockholmesinvestigations.blogspot.com

පසු සිටින්නේ අපට පිටුපස හරවාගෙනයි. ඒ නිසා යළිත් නිරරෙදි මැත්කොට බැලීමි.

ඔහු ඉදිරිපසින් වාඩිවී සිටි පුද්ගලයා විදුලි පහනේ දීප්තිමත් ආලෝකයෙන් අපට දැකගත හැකි විය. ඒ උස කෙට්ටු තරුණ කාන්තාවකි. ඇය, කළු පැහැති විනිවිද පෙනෙන වෙල් රෙදි කැබැල්ලකින්, මුහුණ ආවරණය කරගෙන සිටියාය. මුහුණේ පහළ කොටස හා නිකට වැසෙන සේ, හිස වටා බැඳ තිබූ රෙදි කඩකි. ඇය වේගයෙන් හුස්ම ඉහළ පහළ හෙළූ අයුරින් යම් කැළඹීමකට පත්ව සිටි බව අපි තේරුම් ගත්තෙමු. එහෙත් මිල්වටන් නම් කටේ පැත්තක සුරුට්ටුවක් ගසාගෙන, කිසිම ගණනකට නැති අයුරක් පෙන්වීය.

"මට සැනසිල්ලේ නිදාගන්න තිබුණු කාලයෙන් පැය කිහිපයකුත්, ඔබට වෙන් කරන්න සිදුවුණා ළමයා. මං හිතනවා ඒ කාලය, මට ප්‍රයෝජනවත් වෙන විධියට ඔබ කටයුතු කරාවී කියල. ඔබට වෙනින් වෙලාවක මෙහේ එන්න විධියක්ම නැද්ද?"

කාන්තාව හිස සෙලෙව්වාය.

"ඔබට එන්න පිළිවෙළක් නැත්නම් වෙන මොනවා කරන්නද? ඔය ආදිපාදවරිය මහ ආඩම්බරකාරියක් නේ. එයාට යස පාඩමක් උගන්වන්න දැන් හොඳ වෙලාව. අනේ දෙවියනේ! ඇයි මේ ඔබ වෙවුලන්නේ? ඕව ගණන් ගන්න එපා. දැන් අපි මේ ගනුදෙනුවට බහිමු."

මිල්වටන් ලාච්චුවක් විවෘත කොට කුඩා සටහන් පොතක් ඉවතට ගත්තේය.

"ඔය ළමයා කියන්නේ ඇල්බට් ආදිපාදවරිය ලියූ රහස් ලියුම් පහක්, ඔහේ ළඟ තියෙනවා කියල නේ. ඔහේ කැමැතියි ඒක විකුණන්න. මං කැමතියි ඒක මිළට ගන්න. එතැනට එනතුරු ඔක්කොම පැහැදිලියි. දැන් අපට තියෙන්නේ, මේකට සාධාරණ මිලක් නියම කර ගන්නයි. එහෙම නේද?

ඔක්කෝටම ඉස්සර වෙලා මං ඒ ලියුම් පරීක්ෂා කරල බලන්න ඕන. ඒවා බොහොම වැදගත් රහසිගත ඒවා නම් . . . . දෙයියන්ටම ඔප්පු වෙච්චාවේ! . . . . මේ . . . .මේ . . . . ඔබද?"

http://sherlockholmesinvestigations.blogspot.com

මුහුණ වසාගෙන සිටි කළු මේල්ලපොට ඉවත් කළ කාන්තාව, වචනයකුදු නොදොඩා, මුහුණෙන් අඩක් වැසෙන සේ බැඳ තිබූ රෙදිකඩ පහත හෙළුවාය. අපට දක්නට ලැබුණේ, ඉතාමත් රූමත් තරුණ කාන්තාවකගේ මුහුණයි. එහෙත් ඇගේ දැස් වෛරයෙන් දිදුලන බවත්, මුවහට නැඟී තිබුණේ විගරු සිනාවක් බවත් අපි දුටුවෙමු.

"ඔව් මං තමයි. උඹේ හපන්කම නිසා මුළු ජීවිතේම විනාශවුණු මම!"

මිල්වටන් සිනහවක් නැගීමට උත්සාහ කළේය. ඔහුගේ කටහඬේ තරමක භීතියක් පළවූ බව අපට ඇසිණි.

"ඔබ කටයුතු කළේ මහා හිතුවක්කාර විදියට නේ. කෝ මං කිව්ව දෙයක් ඇහුවයැ? මට කරන්න තිබුණු තරකම් වැඩේට ඔබ මාව තල්ලු කළා. හොඳයි නැද්ද? මං මැස්සෙකුටවත් හිරිහැරයක් කරන්න කැමැති කෙනෙක් නෙමෙයි. මේ ඇත්තමයි. කොයි මිනිහත් ජීවත් වෙන්න මොකක් හරි රක්ෂාවක් කරන්න උවමනා නේ. මේක මගේ රස්සාව. ඉතින් මං මොනවා කරන්නද? අර ලියුම් ටික වෙනුවෙන් මං ඔබෙන් ඉල්ලුවේ, ඔබට ගෙවන්න බැරිතරම් මහ විශාල මුදලක් නෙමෙයි. නමුත් ඔබ ඒක ගෙව්වෙ නෑ."

"ඒ හින්දා උඹ ඒක මගේ ස්වාමිපුරුෂයාට යැව්වා. මේ ලෝකෙ ජීවත්වුණු උතුම් රත්තරන් මනුස්සයා. මං ඔහුගේ සපත්තුවල හුල් ගැට ගහන්නවත් නොවටිනා ගෑහැනියක්. අන්තිමට මොකද වුණේ? ඒ වේදනාව ඔහුගේ රත්තරන් හදවතට දරාගන්න බැරිවුණා. දෙවියනේ! ඔහු ඒකෙන්ම මියගියා.

අර දොරෙන් ඇතුළුවෙලා මං මේ කාමරයට ආව ඒ රාත්‍රිය උඹට මතකද? මං උඹේ දෙපා ළඟ වැඳ වැටිලා උඹට යාච්ඤා කළා, උඹට මතකද? මං උඹෙන් ඉල්ලා හිටියේ ඒ දේ කරන්න එපා කියලයි. නමුත් උඹ මට හිනාවුණා. ඔය දැන් හිනාවෙන්න හදනවා වගේ හිනාවුණා. ඒ වුණාට උඹේ බියගුළු හදවතට පුළුවන් කමක් නැහැ වගෙයි දෙතොල් වෙව්ලන එක නවත්වාගන්න. උඹ කවදාවත් හිතුවේ නෑ නේද මාව ආයෙත් මේ විදියට දකින්න ලැබේවි කියල. එදා තමා මං තීරණයක් ගත්තා, ඇවිත් උඹව හමුවෙන්න. ඔව්. කාටවත් නොදැනෙන්න, තනියම, මුහුණට මුහුණ

http://sherlockholmesinvestigations.blogspot.com

හමුවෙන්න. ඉතින්, මොනවද චාල්ස් මිල්වටන් උඹට නිදහසට කියන්න තියෙන්නේ?"

"ඔහේ හිතන්න එපා මේ විදියට මාව භයකරන්න පුළුවන් වෙවි කියල. මට තියෙන්නේ විකක් හයියෙන් කෑගහන්න විතරයි. මගේ සේවකයො ඇවිත් ඔබව අල්ලා ගනීවි. ඔහේට තරහ ගිය එක ස්වාභාවිකයි. ඒ නිසා මං නිකං ඉන්නවා. දැන් වහාම මේ කාමරයෙන් පිටවෙලා යන්න. මං‍ත් එතකොට පාඩුවේ ඉන්නම්."

එහෙත් කාන්තාව නොසැලී, එලෙසම සිටියාය. ඇගේ දෑත් තිබුණේ සළුවකින් ආවරණය වූ පපුව ප්‍රදේශයේයි. එහෙත් ඇගේ සිහින් දෙතොලේ තිබූ භයංකර සිනාවේ නම් වෙනසක් නොවීය.

"චාල්ස් මිල්වටන් උඹ මගේ ජීවිතේ විනාශ කළා වගේ තවත් ජීවිත විනාශ කරන්න මං උඹට ඉඩ තියන්නේ නෑ. භයානක විෂ සහිත සතෙකුගෙන් මං මේ ලෝකය බේරාගන්නවා. ඉඳා! කාපන් බල්ලා මේක! කාපං මේකත්! මේකත් . . . . .මේකත්!"

එසේ කියමින් තම පපු පෙදෙසේ සඟවා ගෙන තිබූ රිවෝල්වරයක් අතට ගත් ඇය, එය මිල්වටන් දෙසට එල්ලකොට, නොනවත්වාම වෙඩි පිට වෙඩි තිබ්බා කිරීමට පටන් ගත්තාය. ඇගේ අවිය හා ඔහු අතර වූයේ අඩි දෙකක දුරකි. ඔහුට වෙඩි පහර එල්ල වෙද්දී, මිල්වටන් එයින් වැළැකීමට තැත් කළත් ඊට ඉඩක් නොලැබිණි.

"හැතිරී! උඹ මාව විනාශ කළා" යයි කෑගැසූ මිල්වටන් බිම ඇද වැටී නිසල විය. ඔහුගේ සිරුරේ යම්කිසි චලනයක් තිබේදැයි මොහොතක් බලා සිටි කාන්තාව, ආපසු හැරී වහා පිටත්ව ගියාය.

මේ මිනිසාගේ ජීවිතය බේරා ගැනීමට අපට කිසිම හැකියාවක් නොතිබිණ. මිල්වටන් බිම ඇදවැටෙද්දීත්, කාන්තාව තම රිවෝල්වරයෙන් නොනවත්වා වෙඩි තබද්දීත්, ඔහු බේරාගැනීම සඳහා ඒ දෙසට පැනීමට මම තැත් කළෙමි. එහෙත් හෝම්ස් මගේ දෑත් දැඩිව අල්ලා ගත්තේය.

ඔහුගේ දැඩි ග්‍රහණයේ තේරුම මම වටහා ගතිමි. මෙය අපට අදාළ ප්‍රශ්නයක් නොවන බවත්, දුෂ්ට ක්‍රියාවල යෙදුණු පාපිෂ්ඨ පුද්ගලයාට ඊට සුදුසු දඬුවම ලැබුණු බවත් මම තේරුම් ගතිමි.

http://sherlockholmesinvestigations.blogspot.com



73. "ඉඳා! කාපන් බල්ලා මේක!"

http://sherlockholmesinvestigations.blogspot.com

කාන්තාව කාමරයෙන් පිටවුවා පමණි. හෝම්ස් ඉදිරියට පැන එම දොර යතුරු දැම්මේය. ගේ ඇතුළෙන් කිහිප දෙනෙකුගේ කටහඬවල් ද කලබල වූ සේවකයන්ගේ අඩි ශබ්ද ද අපට අසන්නට ලැබිණි. රිවෝල්වරයේ වෙඩි ශබ්ද වලට ගෙදර සියල්ලන්ම අවදි වී ඇති සැටියකි.

සුපුරුදු සන්සුන් ගමනෙන් යකඩ සේප්පුව වෙත ගිය හෝම්ස්, එහි තිබූ ලිපිගොනු, ලියකියවිලි දෑත් පුරවා ඉවතට ගත්තේය. ඒ සියල්ල ඔහු ගිනිඋදුනේ ගිනිමැලයට පුජා කළේය. පිරී තිබුණු යකඩ සේප්පුව හිස්වනතුරු කිහිපවරක්ම එසේ කරද්දී, ගිනිමැලය බුර බුරා ඇවිළෙන්නට විය. කිසිවෙකු දොරට තට්ටු කරමින් එය විවෘත කිරීමට තැත් කළේය. මිල්වර්ටන්ට මරණයේ පණිවුඩය ගෙන ආ ලිපිය, ලේ දහරා ගලායමින් මේසය උඩ තිබිණ. හෝම්ස් එයද ගිනි උදුනට දැම්මේය. මීළඟට ඊටත වැරැන්ඩාවට විවෘත වන දොර යතුරෙන් විවෘත කරගෙන අපි එළියට පැන ගතිමු. දැන් මෙහෙන් යමු වොට්සන්. අපට අර පැත්තේ තාප්පෙ උඩින් පැන ගත හැකි."

ඒ තරම් ඉක්මනින් අනතුරු ඇඟවීමක් පැතිර ගියාද යන්න විශ්වාස කිරීමටත් අපහසුය. තාප්පය දෙසට දුවගිය මම ආපසු හැරී බැලුවෙමි. මට පෙනුණේ මුළු නිවසම හොඳින් ආලෝකමත් වී ඇති බවයි. ඉදිරිපස දොර විවෘතව තිබිණි. කිහිප දෙනෙක් එයින් එළියට පැන ගත්හ. මුළු ගෙවත්තම සෙනගෙන් පිරී තිබිණි. ඔවුහු මහත් කලබලයෙන් කෑකෝ ගසමින් සිටියහ. අප වැරැන්ඩාවෙන් මතු වී තාප්පය දෙසට දුවයද්දී "අල්ලාපියව්" යනුවෙන් එකෙක් කෑගසනු අසන්නට ලැබිණ.

මෙම ගෙවත්තේ පිහිටීම ගැන හෝම්ස්ට මහා දැනුමක් තිබිණ. ඔහු කුඩා ගස් හා පඳුරු අතරින් ඉදිරියට දුවද්දී, මම ද ඔහු අසලින්ම හැකි වේගයෙන් පැන දිව්වෙමි. එකෙක් හතිදමමින් අප ලුහුබැඳ එන හඬ ඇසේ. මීළඟට අපේ මග හරහා ඇත්තේ අඩි හයක් උස තාප්පයකි. තාප්පයේ මුදුන අල්ලාගෙන වේගයෙන් එය උඩට පැනගත් හෝම්ස්, මොහොතකින් අනෙක් පැත්තට පැන ගත්තේය. මම ද ඔහු අනුගමනය කරමින් තාප්පය උඩට නැගගත්තෙමි. එහෙත් මා ලුහුබැඳ ආ තැනැත්තා මගේ එක් කකුලකින් අල්ලා ගත්තේය. මම තාප්පයේ එල්ලීගෙනම අනෙක්

http://sherlockholmesinvestigations2.blogspot.com

කකුලෙන් ඔහුට පහරක් එල්ල කළෙමි. ඔහු ඉවතට විසිවී ගියේය. මා හෝම්ස් සිටි පැත්තේ බිමට ඇද වැටිණි.

මා මුහුණින් අතට ඇද වැටුණේ හඳුරු කිහිපයක් උඩටයි. හෝම්ස්ගේ උදව්වෙන් මට නැගිටීමට හැකිවිය. ඉන්පසු ඉදිරියේ තිබූ ගෙවතු හා මුඩුබිම් හරහා අපි දිවගියෙමු. අප නොනැවතී හැතැක්ම දෙකක්වත් දුවන්නට ඇති බව මගේ විශ්වාසයයි. හති දමමින් නැවතුණු මගේ මිත්‍රයා මඳක් කන්දුන්නේය. කිසිවෙකු අප පසුපස එළවා ගෙන එන හඬක් නොඇසිය.

* * *

පසුදා උදෑසන, උදේ ආහාරය ද ගෙන, අපි පයිප්ප දල්වාගෙන විසිත්ත කාමරයේ සිටියෙමු. ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ රහස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ් අප හමුවීමට පැමිණියේය.

"සුභ උදෑසනක් හෝම්ස් මහත්මයා. ඔබතුමාට මේ දවස්වල හුඟක් වැඩ රාජකාරි එහෙම තියෙනවාද?"

"ඒ හැටි රාජකාරියක් නෑ ලෙස්ට්‍රේඩ්. ඔබට කියන්න යමක් තියෙනවා නම් අපට අසාගෙන ඉන්න පුළුවනි."

"ඊයේ රෑ හැම්ස්ටෙඩ්වල සිදුවුණු ඉතාම සුවිශේෂ අපරාධයක් පරීක්ෂණයට උදව් ඉල්ලන්නයි මං මේ ආවෙ."

"අනේ හැබෑට? මොකක්ද ඒ අපරාධෙ?"

"මිනීමැරුමක් මහත්මයා. මහ පුදුමාකාර මිනිමැරුමක්. ඔබතුමාට මා සමග හැම්ස්ටෙඩ්හි ඇපල්ඩෝ ටවර්ස් නිවසට ඇවිත් උපදෙසක් දෙන්න පුළුවන් නම්, මං ඉතාමත් අගේ කොට සලකනවා. මං දන්නවා ඔබතුමා මේ වගේ ගැටලු සහගත අපරාධ නිරාකරණය කිරීමට ලොකු උනන්දුවක් දක්වන බව.

මේක සාමාන්‍ය මිනීමැරුමක් නෙමෙයි මහත්මයා. මිල්වටන් මහත්මයා ගැන, අපි සෑහෙන කාලෙක ඉඳන් ඇහැ ගහගෙනයි හිටියේ. පිට කෙනෙකුට කියන්න එපා. මිනිහා මහා පාපිෂ්ඨ පුද්ගලයෙක්. ඔහු ළඟ තිබුණා නොයෙක් නොයෙක් අයගේ රහස් ලියවිලි අඩංගු ලිපිගොනු රාශියක්. මිනීමරුවෝ ඒ ලියවිලි ඔක්කොම ගිනිතියලා විනාශ කරලා. වටිනා කියන කිසිම දෙයක් හොරකම්

http://sherlockholmesinvestigations.blogspot.com

කරගෙන ගිහිනුත් නැ. මේ අපරාධකාරයෝ, සමාජයේ බොහොම වැදගත් තනතුරු දරන ඉහළ පෙළේ අය බව පැහැදිලියි. ඔවුන්ගේ පෞද්ගලික රහස් එළිවේවි කියන භයට තමයි මේ දේ කරන්න ඇත්තෙ."

"අපරාධකාරයො? ඒ කියන්නේ කීපදෙනෙක්ම හවුල් වෙලාද මිනීමැරුමට?"

"ඔව්. උන් දෙන්නෙක් ඉඳල තියෙනවා. උන් අල්ලා ගන්න ඔන්න මෙන්න කියලා තියෙද්දී පැන ගිහින්. ඔවුන් දෙදෙනාගේම අඩි සටහන් ගෙවත්තේ හොඳට පැහැදිලිව සටහන් වෙලා තියෙනවා. මට හොඳටම විශ්වාසයි උන්ට බේරෙන්න ලැබෙන්නේ නැ. අපට පුළුවනි බොහොම පහසුවෙන් උන් අල්ලාගන්න."

"කොහොමද ඔවුන්ගේ හැඩහුරුකම්?"

"පළවෙනි මිනිහා බොහොම ක්‍රියාශීලී උස එකෙක්. දෙවැන්නා තාප්පයට උඩින් පනින්න හදද්දී, උද්‍යානයේ සේවකයාට අහුවෙන්න ගිහිං තියෙනවා. ඒත් පොර බැදීමෙන් පස්සේ ඔහුත් පැන ගිහිං. ඔහු මධ්‍යම ප්‍රමාණයේ ශරීරයක් ඇති, ශක්තිමත් කෙනෙක්ලු. හක්කේ කෙළවර මඳක් හතරැස්. බෙල්ල මහත, උඩුරැවුලක් තිබුණු කෙනෙක්. මුහුණ වැහෙන්න කළු රෙදි කැල්ලක් බැඳගෙන හිටියාලු.

"කෙනෙක්ව හඳුනාගන්න තරම් ඔක ඒ තරම් පැහැදිලි විස්තරයක් නෙමෙයි නේ ලෙස්ට්‍රේඩ්. බලන්න ඔය කියන විස්තරේ අපේ වොට්සන්ටත් කදිමට ගැළපෙනවා!"

"හැබෑමයි. වොට්සන් මහත්මයාගෙ පෙනුමත් ඒ වගෙයි නේද?"

"කොහොම වුණත් ඔය කාරණය සම්බන්ධයෙන් ඔබට උදව් කරන්න මට බෑ ලෙස්ට්‍රේඩ්. හේතුව, මං ඔය මිල්වර්ටන් ගැන දැන හිටියා. ඔහු ලන්ඩනයේ ජීවත්වුණු භයානකම මිනිහෙක්. සමහර අපරාධකාරයො ඉන්නවා. ඔවුන්ව නීතියේ රැහැණට හසුකරගන්න අමාරුයි. එහෙම අයට බොහොම වෙලාවට, නිසි දඬුවම් පෞද්ගලිකවම ලැබෙනවා."

"නැ, නැ. කතාකරල වැඩක් නැ ලෙස්ට්‍රේඩ්. මේ වැඩේට අත නොගහන්න මං තීරණය කරල ඉවරයි. මෙතැනදී මගේ අනුකම්පාව හිමිවෙන්නේ අපරාධකාරයාට."

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් දවස තිස්සේම ගැඹුරු කල්පනාවක වෙළී හුන්නේය. අපි දහවල් ආහාරය ගනිමින් සිටියෙමු. දුන්නකින් ක්‍රියාත්මක වූවාක් මෙන් ඔහු එක්වරම උඩ පැන්නේය.

"දෙයියෝ සාක්කි වොට්සන්. දැන් මට මතකයි. ඔබේ හිස්වැස්මත් අරගෙන මාත් එක්ක එන්න."

අපි බේකර් වීථිය ඔක්ස්ෆඩ් වීථිය පසුකොට රීජන්ට් වටරවුම දක්වා පැමිණියෙමු. සාප්පුවක වූ විශාල වීදුරු කවුළුවක, ඡායාරූප රාශියක් ප්‍රදර්ශනය සඳහා තබා තිබිණි. ඒ සියල්ලක්ම සමාජයේ ඉහළ තරාතිරම් වල තරුණ නෝනාවරුන්ගේ ඡායාරූපයි.

හෝම්ස්ගේ දෑස් යොමු වූයේ කුමන ඡායාරූපය දෙසට දැයි මම විමසිලිමත් වීමි. දියමන්ති වලින් තැනූ කුඩා ඔටුන්නක් පැළැඳ සිටි ඇය හඳුනාගැනීමට මට අපහසු නොවීය. කලින්දා රාත්‍රියේ අප දුටු තරුණ කාන්තාව ඇයයි. ඇය විවාහ වී සිටි සුප්‍රසිද්ධ ප්‍රභූවරයා මෙන්ම ඊට අදාළ නාන්ත්‍රිකයාගේ නම ද එහි සඳහන් විය. එය දුටු මම මවිතයට පත්වීමි. මා දෙස බැල්මක් හෙළූ හෝම්ස් සිය දබරැඟිල්ල නාසයට පහළින් දෙතොල් හරහා තැබුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

# අද්භූත සිදුවීමක්

Reading Purpose Only - Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# අද්භූත සිදුවීමක්

ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ් මහතා, සැන්දෑ වේලාවන්හි අපේ නිවසට ගොඩවැදීම අමුතු සිදුවීමක් නොවේ. මේ ගමන් වලින්, පොලිස් මූලස්ථානයේ සිදුවන පරීක්ෂණ සහ අදාළ අපරාධ පිළිබඳව දැනගැනීමට හෝම්ස්ට අවස්ථාව සැලසිණ. තමා යෙදෙන පරීක්ෂණය ගැන පැවසීමෙන් ලෙස්ට්‍රේඩ්ට ඇතිවූ වාසිය ද සුළුපටු නොවීය. ඔහුගේ ගැටලු වලට සවන් යොමුකිරීමට, මගේ මිත්‍රයා හැමවිටම සූදානමින් සිටියේය. තමන් සතුව තිබූ පුළුල් දැනුම සහ පළපුරුද්ද නිසා, පොලිස් නිලධරයාට ප්‍රයෝජනවත් වන උපදෙස් ලබාදීමට හෝම්ස් අමතක නොකළේය.

මා මේ කියන දිනය ද ලෙස්ට්‍රේඩ් අපේ නිවහනට පැමිණි දිනයකි. සැන්දෑවේ කාලගුණය සහ පුවත්පත් වල සඳහන් දේ ගැන කතාකරමින් සිටි ඔහු එක්වරම නිශ්ශබ්ද විය. දල්වා ගත් සුරුට්ටුවෙන් දුම් පිටකරමින් කල්පනා කළා මිස, අපට කිසිවක් කීමට ඔහු උත්සාහ නොකෙළේය. ඔහුට ගැටලුවක් මතුවී ඇති බව අපි වටහා ගත්තෙමු.

"මොකක්ද ලෙස්ට්‍රේඩ් ප්‍රශ්නෙ? බැරෑරුම් ප්‍රශ්නයක්ද?" හෝම්ස් ඇසීය.

"ආ. . . . නෑ . . . . හෝම්ස් මහත්මයා. ඒ තරම් වැදගත් එකක් නෙමෙයි."

"එහෙනම් කියමු බලන්න."

ලෙස්ට්‍රේඩ්ට හිනා පහළවිය.

"ඔබට බොරු කියන්නෙ මොකටද හෝම්ස් මහත්මයා. මගේ හිතට අවුල් සහගත දෙයක් ඇතුළුවී තිබෙන බව ඇත්තයි. නමුත් ඒක මහ පිස්සු විකාර සිදුවීමක්. ඒ නිසා ඔබට ඒ ගැන කරදර

http://sherlockholmesinvestigations.blogspot.com

කරන්න මං හිතුවෙ නෑ. අනෙක් අතට බලාගෙන ගියාම ඒක සුළු දෙයක් වුණත්, ඒකෙ මහ අරුම පුදුම බවකුත් තියෙනවා. ඔබතුමා වඩාත් කැමැති අසාමාන්‍ය දේට නේ. ඒ නිසා මං හිතන්නේ ඔබට ඒක වැදගත් වේවි. කොහොම වුණත් මට නම් හිතෙන්නේ මේක දොස්තර වොට්සන්ගේ ක්ෂෙත්‍රයට අයිති වෙන දෙයක්."

"එහෙනම් මොකක් හරි රෝගයක් සම්බන්ධ එකක්ද?" මම ඇසුවෙමි.

"මානසික රෝගයක් කිව්ව හැකි. පුදුමාකාර මානසික රෝගයක්. ඔබට හිතන්න පුළුවන්ද ප්‍රංශයේ සිටි නැපෝලියන් අධිරාජ්‍යා සමග වෛරයෙන් පසුවෙන කෙනෙක්, අද දවසේ ජීවතුන් අතර ඉන්නවා කියලා? නිකං නෙමෙයි, නැපෝලියන්ගේ ප්‍රතිමාවක් දැක්ක ගමන් විනාශ කරන කෙනෙක්."

"ඕක මගේ අපරාධ පරීක්ෂණ ක්ෂෙත්‍රයට අයිති වෙන්නෙ නෑ." පැවසූ හෝම්ස් යළිත් වරක් හාන්සි පුටුවේ වැතිරුණේය.

"අන්න හරි. ඒක තමයි මාත් කිව්වෙ. මිනිහා අනුන්ගෙ ගෙවල් වලට හොරෙන් ඇතුළුවෙලා, අනුන්ට අයිති නැපෝලියන් පිළිම විනාශ කර දමනවා. අන්න එතකොටයි දොස්තර මහත්මයගෙ රාජකාරිය ඉවර වෙලා පොලීසියෙ රාජකාරී පටන් ගන්නෙ."

"ගෙවල් බිඳලා, පිළිම බිඳිනවා? හැබෑට? එහෙනම් මේකෙ යම් සිත් ඇදගන්නා බවකුත් තියෙනවා. කියන්න බලන්න විස්තර."

හෝම්ස්ගේ කුතුහලය යළිත් මතුවිය.

තම සටහන් පොත අතට ගත් ලෙස්ට්‍රේඩ්, මතකය අවදිකර ගැනීම සඳහා මුලින් එය කියවා බැලුවේය.

"පළමුවැනි සිද්ධිය වාර්තා වුණේ දවස් හතරකට කලින්. කෙනිංටන් පාරේ මෝස් හඩ්සන් මහත්මයාට අයිති සාප්පුවක් තියෙනවා. ඒක ඡායාරූප, සිතුවම් සහ ප්‍රතිමා, අලෙවිය සඳහා තබා ඇති තැනක්. මේ කියන වෙලාවෙ එහි වෙළඳ සහායකයා, එක මොහොතකට සාප්පුව ඇතුළට ගිහින් තිබෙනවා. ඔහුට ඇහුණාලු යමක් පොළොවේ ගහන මහා ශබ්දයක්. එළියට දුවගෙන ඇවිත් බැලුවාමයි දකින්න ලැබුණේ. අනෙක් ප්‍රතිමා සමග තියලා

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණු, පැරිස් බදාමයෙන් තැනූ නැපෝලියන් ප්‍රතිමාවක්, කුඩෙකුඩු වෙන්න සාප්පුව ඉදිරිපිටම පොළොවේ ගහලා! ඔහු වහාම සාප්පුවෙන් එළියට ඇවිත් පාර දිහා බලල තියෙනවා. පාරේ ගිය කිහිප දෙනෙක්ම කිව්වලු, මිනිහෙක් සාප්පුවෙන් එළියට ඇවිත් පැන දුවපු බව. නමුත් ඔය කියන තක්කඩියාව, දැකගන්නවත්, අඳුනගන්නවත් වෙළඳ සහායකයාට ඉඩක් ලැබිල නෑ. ඔවුන් හිතල තියෙන්නේ, මේක ඔය කාලෙන් කාලෙට සිදුවෙන, තේරුමක් නැති විනාශකාරී වැඩක් වෙන්න ඇති කියලා ඔවුන් මේ ක්‍රියාව ගැන පාරේ රාජකාරියේ යෙදිල හිටි පොලිස් භටයාටත් පැමිණිලි කරල තියෙනවා. මේ පිළිමය ඒ තරම් වටිනා එකක් නොවෙයි. සිලිං කිහිපයකට මිල කරල තිබුණු එකක්ලු. ඒ නිසා තවදුරටත් පරීක්ෂණ පැවැත්වීම වැඩක් නෑ කියා ඒක අත්හැර දැම්මාලු. නමුත් මේකෙ දෙවැනි සිදුවීම වුණේ ඉතා සුවිශේෂ ආකාරයකට. එය සිදුවුණේ ඊයේ රාත්‍රියේ.

දොස්තර බානිකොට් නම් වෛද්‍යවරයෙක් පදිංචි වෙලා ඉන්නවා කෙනිංටන් පාරෙම. ඒ, මෝර්ස් හඩ්සන්ලගෙ සාප්පුවට යාර දෙකුත් සීයක් දුරින්. දොස්තර බානිකොට් කියන්නේ තේම්ස් ගඟට දකුණේ ඉන්න දක්ෂම වෛද්‍යවරයෙක්. ඔහු ඉතා සුප්‍රසිද්ධ කෙනෙක්. ඔහු පදිංචිව ඉන්නෙත්, ඔහුගේ ප්‍රධාන චිකිත්සාගාරය තියෙන්නෙත් කෙනිංටන් පාරේ. ඒ සමගම ඔහුට අයත් ශාඛා චිකිත්සාගාරයක් තිබෙනවා, නිවසට හැතැක්ම දෙකක් දුරින්, පහළ බ්‍රික්ස්ටන් පාරේ. මේ වෛද්‍යවරයා, නැපෝලියන් අධිරාජ්‍යා ප්‍රිය කරන කෙනෙක්. ඔහුගේ ගෙදර නැපෝලියන් ගැන ලියවුණු පොත්පත්, පින්තූර, ප්‍රතිමා, සිහිවටන ආදී දේ රාශියක් තිබෙනවා. නැහෙන කාලෙකට ඉස්සර වෙලා, මේ දොස්තර මහත්මයා නැපෝලියන්ගෙ ප්‍රතිමා දෙකක් මිලට ගත්තා. සුප්‍රසිද්ධ ප්‍රංශ ප්‍රතිමා ශිල්පියෙක් වන ඩෙවින්ගේ නිර්මාණයකට අනුව තැනූ මේ පිළිම දෙක මිලට ගත්තේ මෝර්ස් හඩ්සන් සාප්පුවෙන්මයි. මෙයින් එකක් ඔහු තමන්ගේ ගෙදර විසිත්ත කාමරයේ තැබුවා. අනෙක පහළ බ්‍රික්ස්ටන් පාරේ චිකිත්සාගාරයේ ගිනි උදුන් පඩිය මත තැබුවා.

අද උදේ පාන්දර ඔහුට දකින්න ලැබුණු දෙයින් වෛද්‍ය බානිකොට් මවිතයට පත්වුණා. ඊයේ රාත්‍රී ඔහුගේ ගේ බිඳලා. වෙනත් බඩු කිසිවක් හොරකම් කරලා නැහැ. නමුත් නැපෝලියන්

http://sherlockholmesinvestigations.blogspot.com

පිළිමය අරගෙන. ඒකත් නිවසෙන් එළියට ගෙනැත්, ගෙවත්ත අසල තාප්පයේ ගහලා, කැලි කැලි වලට කුඩුකරලා."

"මේක හරිම අපූරු සිදුවීමක් නෙ." පැවසූ හෝම්ස් දෑත් පිරිමැද්දේ මහත් සන්තෝෂයට පත්වයි.

"මං දැනගත්තා හෝම්ස් මහත්මයා මේ වගේ කථා අහන්න හරිම කැමැති බව. ඔහොම ඉන්නූ, කථාව තව ඉවර නෑ. වෛද්‍යවරයා ලෙඩුන් බැලීම සඳහා ඔහුගේ අනෙක් චිකිත්සාගාරයට ආවෙ දවල් දොළහට. ඔහුට ඇතිවුණු පුදුමය ඔබට හිතාගන්න පුළුවන්ද? ඊයේ රාත්‍රි එහි ජනෙල් ඇරගෙන චිකිත්සාගාරයට ඇතුළු වූ කෙනෙක්, එහි තිබූ පිළිමය එතැනම බිම ගහල කුඩු කරලා. මේක කළ අපරාධකාරයා හෝ පිස්සුව හොයන්න කිසිම හෝඩුවාවක් ලැබුණෙ නෑ. ඔන්න ඕකයි හෝම්ස් මහත්මයා සිද්ධිය."

"මේක නම් මහා අද්භූත සිදුවීමක්. වෛද්‍ය බාර්නිකොට්ට අයත්ව තිබී බිඳ දැමූ පිළිම දෙකත්, මෝර්ස් හඩ්සන් සාප්පුවේ තිබී බිඳ දැමුණු එකත්, එකම මෝස්තරයේ හෝ අච්චුවේ පිළිමද?"

"එකම අච්චුවකින් සෑදූ සම්පූර්ණයෙන්ම එක හා සමාන පිළිම."

"මිනිහෙක් මේ විදියට කටයුතු කරන්නේ නැපෝලියන් සමග වෛරයකින් නොවන බව ඒකෙන් අපට හිතාගන්න පුළුවනි. මේ ලන්ඩන් නගරයේ නැපෝලියන් පිළිම කී දාහක් නම් තියෙනවා ඇත්ද? ඒ නිසා, එකම වර්ගයේ පිළිම තුනක්ම හොයාගෙන ගිහිං, වෛරය ඇති පුද්ගලයෙක් තමුන්ගෙ පළිගැනීම පටන් ගත්තා කියල හිතන්න අමාරුයි."

"මටත් හිතුණෙ ඒකම තමයි හෝම්ස් මහත්මයා. නමුත් අනෙක් අතට මෙහෙම දෙයකුත් තියෙනවා. ලන්ඩන් නගරයේ මේ ප්‍රදේශයේ ප්‍රතිමා වෙළඳාම කරන්නේ මෝර්ස් හඩ්සන්ලා පමණයි. අනෙක පහුගිය අවුරුදු ගණනාවකටම ඔවුන්ගේ සාප්පුවේ අලෙවි කළේ, මේ නැපෝලියන් ප්‍රතිමා තුන පමණක්ම ලු. ලන්ඩන් නගරය පුරා දහස් ගණනක් පිළිම තියෙන බව ඇත්තයි. නමුත් මේ පැත්තේ ඉන්නා අන්තවාදී මිනිහෙක්, තමන්ගේ ව්‍යාපාරය මේ පිළිම තුන විනාශ කරමින් පටන් ගත්තා වෙන්න පුළුවනි. වොට්සන් මහත්මයා මොකක්ද ඒ ගැන ඔබට හිතෙන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මේක මහ බරපතල මානසික රෝගයක්. ප්‍රංශයේ මානසික වෛද්‍ය විශේෂඥවරු මේ තත්ත්වය හඳුන්වන්නේ "අයිඩී පික්සී" නම් රෝගාබාධය ලෙස. මේ පුද්ගලයා නැපෝලියන් ගැන බොහොම ගැඹුරට හදාරලා, ඔහු ගැන වෛරයක් ඇතිකරගත් කෙනෙක් වෙන්න පුළුවනි. එහෙමත් නැත්නම්, බ්‍රිතාන්‍යය හා ප්‍රංශය අතර පැවැති මහ සටන්වලදී, නැපෝලියන්ගේ හමුදා වලින් තමන්ගේ පවුල්වලට වුණු හානිය නිසා, නැපෝලියන් සමග වෛරයක් ඇති කරගත් පුද්ගලයෙක් වෙන්නත් පුළුවනි. වෛරය නිසා ඇතිවන චිත්ත විකෘතිය, බරපතල මානසික රෝගයක් බවට පරිවර්තනය වෙනවා. එවැනි තත්ත්වයක් යටතේ, කෙනෙක් මේ වගේ පිස්සු, විකාර, වැඩවල යෙදෙන්න ඉඩ තියෙනවා."

"එහෙම කියල ඕක පැහැදිලි කරන්න බෑ මගේ හිතවත් වොට්සන්. ඔබ කියන්නේ ඔය පුද්ගලයාට "අයිඩී පික්සී" නම් මානසික රෝගය කියලා. නමුත් කොයිතරම් බරපතල ලෙස රෝගය වැළඳිලා තිබුණත්, පිළිම තියෙන්නේ කොහේද කියල කොහොමද ඔහු හොයා ගත්තේ?"

"හොඳයි ඔබ කොහොමද මේ තත්ත්වය පහදල දෙන්නේ?"

"ඒක පහදා දෙන්න මං උත්සාහ කරන්නේ නෑ. මං කරන්නේ ඒ මහත්මයාගේ ක්‍රියා පිළිවෙලේ යම්කිසි අද්භූත ආකාරයක් ඇති බව නිරීක්ෂණය කිරීම පමණයි. බලන්න ඔහු වෛද්‍ය බාර්නිකොට්ගේ ගෙදර තිබුණු පිළිමයට මොකද කළේ? ඒක බිඳින්න ගෙයින් එළියට අරගෙන ආවා. ඒ මොකද පවුලේ අයට ඒ ශබ්දය නිසා ඇහැරෙයි කියල හිතලා. නමුත් එවැනි අවදානමක් නොතිබුණු චිකිත්සාගාරයේදී, පිළිමය බිඳ දැම්මේ එතැනමයි. මේක මහා අද්භූත මෙන්ම විකාර සිදුවීමක් වගෙයි පෙනෙන්නෙ. ඒ වුණත් මගේ හොඳම පරීක්ෂණ සමහරක් පටන් ගත්තෙත් විකාර සිදුවීම් හැටියට. ඒ හින්දා, කිසිවක් නොසලකා අත්හැර දැමිය යුතු එකක් කියල, මට එක්වරම කියන්න බැහැ. ඔබට මතකද වොට්සන් අපි මුහුණ දුන් ඇබර්නෙට් පවුලේ බිහිසුණු අත්දැකීම? ඒකට මගේ අවධානය යොමුවුණේ කොහොමද? ඉතා උණුසුම් දවසක, බටර් පෝච්චිය තුළ දියවී ගිය බටර් ඇතුළට, පාර්ස්ලි ඉත්තක් කිඳාබැස ගිය ආකාරය නේද? ඒ හින්දා ලෙස්ට්‍රේඩ්, ඔය ප්‍රතිමා තුනක් බිඳ

http://sherlockholmesinvestigations.blogspot.com

දැම්මේ සිද්ධිය, මට හිතාවෙලා අමතක කර දමන්න පුළුවන් කමක් නැහැ. ඔය හා බැඳුණු හැම අලුත් සිදුවීමක්ම, මට නොකඩවා දැනුම් දිය හැකි නම්, මං ඔබට කෘතඥ වෙනවා."

අලුත් සිදුවීමක් ඇසීමට මගේ මිත්‍රයා දැඩි බලාපොරොත්තුවකින් සිටියේය. මේ කාරණයට අදාළ ඊළඟ සිදුවීම, අපට ඉතා ඉක්මනින් අසන්නට ලැබිණි. එපමණක් නොව එහි, නොසිතූ විරූ ඛේදජනක බවක් ද අඩංගු වී තිබිණි. පසුවදා උදයේ මා ඇඳුම් අඳිමින් සිටියදී, කිසිවෙකු මගේ දොරට තට්ටු කරනු අසන්නට ලැබිණි. මගේ මිත්‍ර හෝම්ස් දොර ඇරගෙන කාමරය තුළට ආවේ විදුලි පුවතක් ද අතැතිවයි.

"ඔන්න අහගන්න වොට්සන්. මට මේ දැන් ලැබුණු විදුලි පුවත.

*"කෙන්සිංටන්හි පිට් වීථියේ අංක 131 වෙත වහාම එන්න.*

*ලෙස්ට්‍රේඩ්."*

"මොකක් සම්බන්ධයෙන්ද?"

"මොකක්ද කියන්න බෑ. ඕනෑම දෙයක් විය හැකියි. නමුත් මට හිතෙනවා, මේක අර පිළිම බිඳ දැම්ම සම්බන්ධ සිදුවීමක් කියලා. එහෙම නම් පිළිම විනාශ කරන අපේ මිත්‍රයා ලන්ඩනයේ වෙනත් ප්‍රදේශයක රාජකාරි පටන් අරගෙන වගෙයි. ඔන්න වොට්සන් කෑම මේසෙ උඩ කෝපි සූදානම්ව තියෙනවා. පහළ දොරටුව ළඟ කුලීරියක් සූදානමින් තියෙනවා."

පැය භාගයක් ගතවෙද්දී, අපි පිට් වීථියට ළඟාවීමු. එය, බොහෝ කලබලකාරීව දවස ගෙවුණු ලන්ඩනයේ, ප්‍රධාන මාර්ගයට යාබදව පිහිටි නිසල ප්‍රදේශයක් විය. කිසිවෙකුගේත් සිත් ඇද නොගන්නා තට්ටු නිවාස පේළියක, අංක 131 පිහිටා තිබිණි. අපේ කුලීරියට එහි ළඟාවීමට මඳ වේලාවක් ගතවිය. නිවස ඉදිරියේ පිහිටි යකඩ වැටට පිටින් රැස්වූ විශාල සෙනගකි. මවිතයට පත් හෝම්ස්ගේ දෙතොල් අතරින් සිහුරුහඬක් පිටවිය.

"දෙයියෝ සාක්කි! මෙදා පැරේ නම් වැඩේ ටිකක් බරපතල වෙලා වගෙයි. අඩුම ගණනේ කාව හරි මරන්න උත්සාහයක් වත්

http://sherlockholmesinvestigations.blogspot.com

දරල ඇති. ලන්ඩනයේ පණිවුඩ ගෙනයන කොල්ලෙකුත් එතැන නැවතිලා බලාගෙන ඉන්නවා නේද? ඒ තරම් සුළුදෙයක් නම් එයින් කොල්ලෙක් ඔතැන නැවතී බලාගෙන ඉන්නෙ නෑ. අනික ඔහු කොන්ද නමාගෙන, බෙල්ල ඉදිරියට දිගුකරගෙනයි ඉන්නේ. ඒකෙන් කියන්න පුළුවනි, මොකක් හරි බිහිසුණු සිදුවීමක් වෙලා ඇති කියල. මේ මොකද වොට්සන්? ඉහළ තරප්පු වල වතුර පිරිලා ගලා බහිනවා. අනෙක් ඒවා වියළියි. කමක් නෑ. අර ජනේලය ළඟ ලෙස්ට්‍රේඩ් ඉන්නේ. අහමු විස්තර ඔහුගෙන්."

පොලිස් නිලධරයා අප පිළිගත්තේ කැළැඹුණු මුහුණෙනි. ඔහු අප විසිත්ත කාමරයට කැඳවා ගෙන ගියේය. ප්ලැනල් පිටකබායකින් සැරසුණු, අපිරිසිදු පෙනුමක් තිබූ වයස්ගත පුද්ගලයෙක්, එහි වේගයෙන් ඉහළ පහළ ඇවිදිමින් සිටියේය. අතිශයින් කැළැඹීමට පත්ව සිටි ඔහු, මධ්‍යම ප්‍රවෘත්ති ජාලයේ හොරේස් හාකර් මහතා ලෙස අපට හඳුන්වා දෙන ලදී. ලෙස්ට්‍රේඩ් කථාව පටන් ගත්තේය.

"මෙන්න හෝම්ස් මහත්මයා, අර නැපෝලියන් ප්‍රතිමා පිළිබඳ කලබලේ ආයෙමත් පටන් අරගෙන. ඔබ ඊයේ රෑ මට කිව්ව නේ මේ ගැන උනන්දුවක් දක්වනව කියල. ඉතින් මං තීරණය කළා ඔබව මෙහාට කැඳවන්න. ඒ මොකද මේ සැරේ වැඩේ, වඩාත් බැරෑරුම් මුහුණුවරක් අරගෙන."

"ඇයි මොකක්ද වෙලා තියෙන්නෙ?"

"මිනීමැරුමක්! හරියටම මොකක්ද සිද්ධවුණේ කියල හාකර් මහත්මයා මේ මහත්වරුන්ට විස්තර කර දෙන්න."

හොරේස් හාකර් මහතා ශෝකාකූල මුහුණෙන් යුතුව කථාව ඇරඹුවේය.

"මේක මහා පුදුමාකාර සිදුවීමක් මහත්මයා. මගේ මුළු ජීවිතේටම මං කළේ ප්‍රවෘත්ති හොයලා වාර්තා කිරීමයි. දැන් අති විශේෂ සිදුවීමක් මගේ ගෙදරම වෙලා. ඒකෙන් මගේ ඔළුව සම්පූර්ණයෙන්ම අවුල් වෙලයි ඉන්නේ. කොයිතරමක් මගේ හිතට ඒක බලපාලද කිව්වොත්, සිද්ධිය ඔබට තේරුම් කර දෙන්න, වචන දෙකක් ගළපා ගන්න මට බෑ. මං පුවත්පත් වාර්තාකාරයෙක් හැටියට මෙතැනට ආව නම්? එහෙනම් මෙලහකට මං සම්මුඛ

http://sherlockholmesinvestigations.blogspot.com

සාකච්ඡා පවත්වලා, තොරතුරු රාශියක් එක් රැස් කරගෙන. ඊළඟට මේ වෙලාව වෙද්දි හවස් පිරුවේ පත්තර හැම එකකටම, තීරු දෙකක විශේෂ වාර්තාවක් සපයලත් ඉවරයි. දැන් මට සිද්ධවෙලා තියෙන්නේ, ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති දෙයක්, අනෙක් මිනිසුන්ට නිකම්ම හෙළිකරන්න. ඒකෙන් ප්‍රයෝජන ගන්න මට හැකියාවක් නෑ. ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං ඔබේ නම අහල තියෙනවා. මේ අද්භූත වැඩේ මොකක්ද කියලා ඔබට තේරුම් කරන්න පුළුවන් නම් ලොකු උදව්වක්."

ඔහුගේ දීර්ඝ කථාවට සවන්දීමේ බලාපොරොත්තුවෙන් හෝම්ස් පුටුවක වාඩිවිය.

"දැන් පෙනෙන විදියට මේ මුළුකොටම කලබල වලට හේතුව විසිත්ත කාමරයේ ලස්සනට තියන්න, මං මිලට ගත්තු නැපෝලියන් ප්‍රතිමාව වගෙයි. මං ඒක අරගෙන දැන් මාස හතරක් වුණා. මං ඒක ගත්තේ හයිස්ට්‍රීට් දුම්රියපොළට කිට්ටුව තිබෙන හාඩිං සහෝදරයෝ සාප්පුවෙන්. මට ඒයට වියදම් වුණේ සුළු මුදලයි.

මගේ පත්තර රස්සාවේ ලිවීමේ කටයුතු වැඩිහරියක්ම කරන්නේ රාත්‍රී කාලයට. සමහර දවස්වලට පාන්දර වෙනතුරු, මං ලිවීමේ වැඩ කරනවා. මං ඒ කටයුතු කරන්නේ මේ ගෙදර උඩතට්ටුවේ, පිටිපස්සේ හරියේ කාමරයක. අද පාන්දරට එළිවෙන්න තුනට විතර, මට පහළ තට්ටුවෙන් ශබ්දයක් ඇහුණා. මං නිශ්ශබ්දව තවත් සවන් දීගෙන හිටියා. ඒත් ආයෙ කිසිම ශබ්දයක් ඇහුණේ නැහැ. ඒ නිසා මං හිතුවා, මුලින් ඇහුණු ශබ්දෙ ඇහෙන්න ඇත්තෙ මේ ගෙදරට පිටතින් කියල. ඊට මිනිත්තු පහකට පස්සේ මට එක්වරම අහන්න ලැබුණේ භයානක විලාපයක්. හෝම්ස් මහත්මයා. මගේ ජීවිතේටම ඒ වගේ බිහිසුණු කෑගැහිල්ලක් මං අහල නෑ. ඊට පස්සෙ මගේ ජීවිතේ හැමදාමත් ඒ ශබ්දෙ මගේ කන්වල රැව් පිළිරැව් දේවි. මිනිත්තුවක් දෙකක් යනතුරු මං හිටියේ භයෙන් ගල්ගැහිලා වගේ. ඊට පස්සේ මම පහළ තට්ටුවට ගිහිං බලන්න තීරණය කළා. ගිනිඅඟුරු අල්ලන යකඩ අඬුවක් අරගෙන මං පහළ තට්ටුවට බැස්සා. මේ විසිත්ත කාමරයට ඇතුළුවෙද්දිම මං දැක්කා ජනේලය ඇරදමා ඇති බැව්. ප්‍රතිමාව තිබුණු තැනින් හොරකම් කරගෙන ගොස් ඇති බව එවේලේම පෙනුණා. බදාමයෙන් සෑදූ

http://sherlockholmesinvestigations.blogspot.com



"මගේ ජීවිතේටම ඒ වගේ බිහිසුණු කෑගැහිල්ලක් මං
ලා නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

මේ වගේ නොවටිනා දෙයක් මොනා එකකට අරගෙන ගියාද කියල මට තේරුම් ගන්න බැරිවුණා.

ඉතින් ඊළඟට මම ඉස්සරහ දොර ඇරගෙන ගෙයින් එළියට බැස්සා. මං කළුවරේම ඉස්සරහට අඩියක් දෙකක් තියලා බලන්නයි ගියේ. දෙයියෝ සාක්කි! තව ටිකෙන් පය පැටලිලා මං ඇද වැටෙන්නෙ මළමිනියක් උඩට! මම එළියත් අරගෙන එන්න ගේ ඇතුළට දිව්වා. එළිය ගෙනැත් බලන කොටයි දැක්කෙ, අසරණ මනුස්සයෙක් වැටිල ඉන්නවා. උගුරේ කැපුම් තුවාලයක්. එතැන බිම ලේ ගලලා, ලේ විලක් වගේ. ඔහු උඩුබැලි අතට වැටිලා හිටියේ කට ඇරගෙන. දණහිස් උඩට නිටින සේ කකුල් බාගෙට නමාගෙන. මේ බියකරු දර්ශනය මට හීනෙනුත් පෙනේවි මහත්මයා. මගේ ළඟ තිබුණු පොලිස් නළාව එළියට ඇදලා අරගෙන, ඒක හයියෙන් පිඹින්න මට හැකිවුණා. එච්චරයි! මං දන්නේ එච්චරයි! මං ක්ලාන්ත වුණා. ඊට පස්සේ මං දුටුවේ මා විසිත්ත කාමරයට ගෙනැත්; පොලිස් භටයෙක් මා ළඟ බලා ඉන්න හැටි."

"කවුද මේ මැරුම්කෑව පුද්ගලයා?" හෝම්ස් ඇසීය.

"ඔහු කවුද කියල හඳුනාගන්න විදියක් නැ." ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේය.

"මිනීකාමරේදි ඔබට මළසිරුර බලන්න පුළුවනි. ඔහු කවුද කියන එක ගැන මේ අක්වාත් අපට තීරණයකට ඒමට හැකිවුණේ නැහැ. ඔහු අවුරුදු තිහක් පමණ වයසැති, උස, ශක්තිමත් පුද්ගලයෙක්. අව්වට දුඹුරුපැහැ ගැන්වුණු සමක් තියෙන්නේ. ඇඳුම් පැළැඳුම් වලින් නම් දුප්පතෙකු වගෙයි. ඒත් කම්කරුවෙකුගේ පෙනුමක් නැහැ. එතැනට එකතු වී තිබුණු ලේ ගොඩේ තිබිල අපට පිහියක් හම්බවුණා. නැමිය හැකි තලයක් සහිත එකක්. එහි මිට, හරක් අඟකින් සෑදූ එකක්. මේ පුද්ගලයාට මරණීය තුවාල සිදු කළේ මේ ආයුධයෙන්ද, නැත්නම් මිනීමරුවාට අයත් වෙනත් එකකින්ද කියන්න අපි දන්නේ නැ. ඔහුගේ ඇඳුම්වල, පුද්ගලයා හඳුනාගත හැකි නමක් හෝ වෙනත් සලකුණක් නැහැ. සාක්කුවේ තිබී හමුවුණා, ඇපල් ගෙඩියක්, නූල් කැබැල්ලක්, සිලිමකට විකුණන ලන්ඩන් නගරයේ සිතියමක් සහ ඡායාරූපයක්. මෙන්න ඒ ඡායාරූපය."

http://sherlockholmesinvestigations.blogspot.com

එය කුඩා කැමරාවකින් ගනු ලැබූ ඡායාරූපයකි. එයින් දැක්වුණේ වානර මුහුණකට සමාන අවලක්ෂණ මුහුණක් තිබූ පුද්ගලයෙකි. ඔහුගේ ඇහිබැම ඉතා ගොරෝසු වූ අතර මුහුණේ පහළ කොටස ඉදිරියට නෙරා ඒම නිසා, ඔහුට බැබුන් වඳුරෙකුගේ පෙනුම ලැබී තිබිණ.

"නැපෝලියන් පිළිමයට මොකද වුණේ?"

හෝම්ස් ඇසුවේ ඡායාරූපය හොඳින් පරීක්ෂා කළ පසුයි.

"ඔබ මෙහේට එන්න මොහොතකට කලින්, අපට ඒ ගැනත් ආරංචියක් ලැබුණා. කැම්ඩන් හෞස් පාරේ, පාළු ගෙයක මිදුලේ, එය බිම ගසා කුඩුකර තිබී හමුවුණාලු. මං ඒ ගැන පරීක්ෂා කරන්න යන්නයි හදන්නේ. ඔබත් එනවාද?"

"ඇත්තෙන්ම ඔව්. මටත් ඒක ටිකක් බලන්න ඕනෙ." පැවසූ හෝම්ස් විසිත්ත කාමරයේ බුමුතුරුණු හා ජනේලය පරීක්ෂා කර බැලුවේය.

"ගෙට ඇතුළුවුණු පුද්ගලයා එක්කෝ බොහොම උස කෙනෙක්. එහෙමත් නැත්නම් බොහොම ක්‍රියාශීලී කෙනෙක්. බිම ඉඳගෙන මේ ජනෙල් පඩියට නැගලා, ජනේල පියන ඇරගන්න එක ඒ තරම් පහසු කාර්යයක් නොමෙයි. ආපසු බිමට පනින එක නම් පහසු වැඩක්. ඔබේ පිළිමයේ කැලි බලන්න අපි යන්නයි හදන්නේ හාකර් මහත්මයා. ඔබත් එනවද අපත් සමග යන්න?"

පුවත්පත් වාර්තාකරුවා මේ වනවිට ලියන මේසට වාඩි වී යමක් ලිවීමට උත්සාහ දරමින් සිටියේය.

"මේ ගැන වාර්තාවක් ලියාල, මේකෙන් යම්කිසි ප්‍රයෝජනයක් ගන්න මම උත්සාහ කරල බලන්න ඕන මහත්මයා. හවස පත්තරවල පළමුවැනි මුද්‍රණයේ මේ ගැන වාර්තාවක් පළවෙලා ඇති. ඒකෙ සැකයක් නෑ. මගේ වාසනාව ඒ වගේ තමයි!

ඔබට මතකද අර ඩොන්කැස්ටර් ප්‍රේක්ෂකාගාරයේ ඉහළ තට්ටුවක් බිමට කඩාගෙන වැටුණු දවස? එදා ඒ වෙලාවෙ එතන ඉඳපු එකම පුවත්පත් වාර්තාකාරයා මමයි. නමුත් අන්තිමට සිද්ධිය ගැන කිසිම වාර්තාවක් පළනොවුණේ අපේ පුවත්පතේ විතරයි. ඒ මොකද, සිද්ධියෙන් තදබල කම්පනයකට පත්වුණු මට කිසිදෙයක්

http://sherlockholmesinvestigations.blogspot.com

ලියාගන්න බැරිවුණා. දැන් මගේ ගෙදර දොරකඩම මිනීමැරුමක් වෙලා. ඒක ගැන වාර්තාවක් අපේ පත්තරේට යවාගන්න මං ප්‍රමාද වැඩියි."

ඔහුට තම රාජකාරියේ නිරත වීමට ඉඩ සලසා, අපි එතැනින් පිටත් වී ගියෙමු.

නැපෝලියන් පිළිමය විනාශ වී ඇත අස් පොළොවේ ගසා තිබුණේ, එය සොරකම් කළ නිවසට යාර සියයක් පමණ දුරකිනි. අවට විසිරී තිබුණු කැබැලි කිහිපයක්ම අහුලා ගත් හෝම්ස්, ඒවා පරීක්ෂා කර බැලුවේය. ඔහුගේ මුහුණේ පහළ වූ හැඟීම් වලින්, යම්කිසි හෝඩුවාවක් හෝම්ස්ට ලැබී ඇති බව මම වටහා ගතිමි.

"හෝම්ස් මහත්මයා! ඔබට කොහොමද හිතෙන්නෙ?"

"මේ අභිරහස විසඳන එක නම් අපට බොහොම දුර යන්න වෙන ගමනක්. ඒ වුණත් . . . . ඔව් ඒ වුණත් අපට පරීක්ෂණ කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා සුළු සුළු හෝඩුවාවන් නැතුවා නොවෙයි. අපට කිසිත් වටිනාකමක් නැති මේ පිළිම, අපරාධකාරයාට නම් මනුෂ්‍ය ජීවිතයකට වඩා වටිනවා. ඒක එකක්. අනෙක් කාරණාව, ඔහු පිළිමය ගේ ඇතුළේම බිඳ දැමුවේ නැහැ. ගෙයින් එළියට ආ තැනම බිඳ දැමුවෙත් නැහැ. ඔහුගේ එකම අරමුණ නැපෝලියන්ගේ පිළිම විනාශ කිරීම නම්, ගෙයින් එළියට බැස්ස ගමන් ඔහුට ඒ දේ කිරීමට තිබුණා."

"නමුත් අපට මෙහෙම හිතන්න බැරිද හෝම්ස් මහත්මයා? මේ තවත් මිනිහෙක් ගෙයි දොරටුව ළඟදී හමුවුණාම ඔහු කලබල වුණා. තමන් පිටුපස්සේ කවුරු හරි ලුහුබඳිවි කියල ඔහු භයවුණා. ඊළඟට කළ යුතු දේ ඔහුට එක්වරම හිතාගන්න බැරිවෙන්න ඇති?"

"ඔව්, ඒකත් වෙන්න පුළුවනි. ඒ වුණත් මං කැමැතියි තවත් වැදගත් කරුණක් ගැන ඔබේ අවධානය යොමුකරන්න. පිළිමය බිඳ දැමීම සඳහා ඔහු මේ තෝරාගෙන තිබෙන නිවස හා මිදුල ගැන ඔබට මොකුත් විශේෂයක් හිතෙන්නෙ නැද්ද?"

ලෙස්ට්‍රේඩ් වටපිට බැලුවේය.

"මේක පාළු ලොක්. 'මිදුලෙදී ඒ කටයුත්ත කරන්න, කාගෙන්වත් අවහිරයක් නැති තැනක් ඔහු තෝරාගත්තා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් ඒක හරි. නමුත් බලන්න මෙතැනට එන්න කලින්, පාරේ ඒ හරියෙම තවත් පාර් ගෙයක් තියෙනවා. ඇයි ඔහු එතැනට නොගියේ? පිළිමය අරගෙන ඉදිරියට යන හැම යාරයකදීම ඔහු අවදානමකට මුහුණ පානවා. කවුරු හරි ඉස්සරහට හමුවෙන්න පුළුවන්."

"මට නම් තේරුම් ගන්න අමාරුයි හෝම්ස් මහත්මයා."

හෝම්ස් ඒ අසලම වූ වීදි ලාම්පුව දෙසට අත දිගු කළේය.

"මේ පහනේ ආලෝකයෙන්, තමන් කරන වැඩේ ගැන පැහැදිලිව බලාගන්න, ඔහුට හැකියාව ලැබෙනවා. අර පාරගේ ළඟදී ඒක ලැබෙන්නේ නෑ."

"හැබෑමයි! ඒක සම්පූර්ණ ඇත්ත. දැනුයි මට මතක් වෙන්නෙ. අර බානිකොට් දොස්තර මහත්මයාගෙ නිවසෙන් එළියට අරගෙන ආව ප්‍රතිමාව, පොළොවේ ගහල තිබුණේ වෛද්‍යවරයාගේ එළියේ දැල්වෙන පහනට කිට්ටුවෙන්. ඉතින් හෝම්ස් මහත්මයා, මේ කාරණාව සම්බන්ධයෙන් අප ගතයුතු පියවර කුමක්ද?"

"ගන්න ඕන පියවර තමයි, ඔය කාරණාව හොඳින් මතක තියා ගැනීම. පස්සේ අවශ්‍ය වුණොත් ප්‍රයෝජනයට ගැනීම සඳහා, මොළයේ ගබඩා කරගත යුතුයි. පසුවෙලා අපට යමක් හොයාගන්න ලැබෙන්න පුළුවනි, ඒ කාරණාව සම්බන්ධ දෙයක්. ලෙස්ට්‍රේඩ් දැන් මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"හෝම්ස් මහත්මයා, මේ ප්‍රශ්නය විසඳීමට අප ගතයුතු ප්‍රධාන පියවර හැටියට මට හිතෙන්නේ එක දෙයයි. ඒ තමයි මියගිය තැනැත්තා හඳුනාගැනීම. ඒක ඒ හැටි අමාරුවෙන්න බෑ. ඔහු කවුද, ඔහු ආශ්‍රය කරන පුද්ගලයින් කවුද කියල හොයාගත්තොත් ඔන්න එතකොට අපි පරීක්ෂණය පටන් ගැනීමට සුදුසු තැනකට පැමිණෙනවා. ඊළඟට අපට හොයලා බලන්න පුළුවන්, මියගිය තැනැත්තාට ඊයේ රාත්‍රියේ පිට් වීදියේ කරන්න තිබුණු රාජකාරිය මොකක්ද? කාට හමුවෙන්නද ඔහු ගියේ? කියන ඒවා. එතකොට අපට තීරණය කරන්න පුළුවන් වේවි හොරේස් හාකර් මහත්මයාගේ ගේ දොරකඩ ඔහු මරා දැමුවේ කවුරු අතින්ද කියන එක. ඔබට එහෙම හිතෙන්නේ නැද්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"සැකයක් නෑ. හොඳ ක්‍රමයක්. නමුත් මම මේ පරීක්ෂණය අරඹන්නේ ඔය ආකාරයට නොවෙයි."

"එහෙනම් මොන ආකාරයටද?"

"නැහැ ලෙස්ට්‍රේඩ්. මගේ වැඩපිළිවෙළ ගැන කියන්න ගිහිං, ඔබේ ක්‍රමය අවුල් කරන්න මං කැමැති නැහැ. මං හිතන්නේ ඔබ, ඔබේ ක්‍රමයට කිරීම වඩා හොඳයි. මං මගේ ක්‍රමයට හොයන්නම්. තොරතුරු හෙළිවෙද්දී අපි දෙන්නා ඒවා හුවමාරු කරගමු."

"බොහොම හොඳයි." ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේය.

"තව එකක් ලෙස්ට්‍රේඩ්. ඔබ හොරේස් හාකර් මහත්මයාගේ නිවසට ආපහු යනවා නම්, ඔබට ඔහු හමුවේවි. මේ සිද්ධිය ගැන මගේ අදහසත් ඔහුට කියන්න. මෙන්න මේකයි මගේ අදහස. නැපෝලියන් අධිරාජයා ගැන පැසවන වෛරයක් ඇති, භයානක මිනීමරු පිස්සෙක් තමයි මේ අපරාධය සිදුකරල තියෙන්නෙ. හාකර්ගේ පුවත්පත් වාර්තාවට ඒ තොරතුරු ප්‍රයෝජනවත් වේවි."

ලෙස්ට්‍රේඩ් හෝම්ස් දෙස බලා සිටියේ පුදුමයෙනි.

"හෝම්ස් මහත්මයා. ඔබ ඇත්තටම එහෙම දෙයක් විශ්වාස කරනවද?"

"මං විශ්වාස කරනවද? බාග වේලාවට මං එහෙම දෙයක් විශ්වාස නොකරනවා වෙන්නත් පුළුවන්. නමුත් හොරේස් හාකර් මහත්මයා ආරංචිය ඒ පිළිවෙළට අහන්න කැමැති වේවි. මධ්‍යම ප්‍රවෘත්ති ජාලයෙන් පුවත් දැනගන්න අයත් ඒ ආරංචිය කියවන්න සතුටුවේවි.

දැන් ඉතින් වොට්සන්, අද දවසේ අප විසින් නිමකළ යුතු සංකීර්ණ වැඩ කටයුතු රාශියක් තියෙනවා. ලෙස්ට්‍රේඩ් ඔබට අද හැන්දෑවෙ මා හමුවෙන්න, බේකර් වීථියට පැමිණෙන්න පුළුවන්ද? මියගිය තැනැත්තාගේ සාක්කුවේ තිබුණු මේ ඡායාරූපය එතෙක් මා ළඟ තබාගන්නම්. මගේ හිතේ කාරණා කිහිපයක්ම මතුවෙනවා. මගේ ඒ සිතුවිලි දාමය නිවැරදි එකක් බව ඔප්පු වුණොත්, මට ඔබේ උදව් අවශ්‍ය වෙන්න ඉඩ තියෙනවා. ලෙස්ට්‍රේඩ් එහෙම වුණොත් මගේ උදව්වට අද රෑට ඔබට එන්න හැකිවේවිද? ඔබවත් හවුල්

http://sherlockholmesinvestigations.blogspot.com

කරගෙන ගවේෂණාත්මක චාරිකාවක යෙදෙන්න මට සිදුවෙන්න පුළුවනි. එහෙත් ඔබට ජය හා සුභ දවසක්!"

ලෙස්ට්‍රේඩ් සවස් වරුවේ ඒමට පොරොන්දු වී පිටත්වී ගියේය.

"වොට්සන් අපි ඉස්සර වෙලාම යමු, මේ පිළිමය මිලදී ගත් හාඩිං සහෝදරයෝ සාප්පුවට."

අපට ඇවිද යාමට තිබුණේ යාර කිහිපයක් පමණි.

"හාඩිං මහත්මයා අද උදේ වරුවේ සාප්පුවට එන්නේ නැහැ. හවස් වරුවේ නම් එවි. මොනවද ඔබට අපෙන් කෙරෙන්න ඕනෑ?" වෙළඳ සහායකයා ඇසුවේය.

"මේ ආයතනයෙන් විකිණූ දේවල් ගැන යම් තොරතුරක් දැනගන්න අපට හාඩිං මහත්මයා හමුවෙන්නයි උවමනා. නැත්නම් ඔබට හැකිවේවිද ඒ උදව්ව කරන්න?"

"මමත් මේ ආයතනයේ රක්ෂාවට ආවෙ ළඟදියි මහත්මයා. ඔබට තොරතුරු කිසිවක් ලබාදෙන්න මට හැකියාවක් නෑ. කරුණාකරල හාඩිං මහත්මයාගෙන්ම අහන්න."

බලාපොරොත්තු කඩවීම නිසා හෝම්ස්ගේ මුහුණ වෙනස් විය.

"හැමදෙයක්ම දිගින් දිගටම අපි බලාපොරොත්තු වෙන ආකාරයටම ඉටුවෙන්නෙ නෑ වොට්සන්. හාඩිං මහත්මයා ආපහු එන්නෙ හවස්වරුවෙ නම්, අපිත් හවස් වරුවෙ ඇවිත් බලමු. ඔබට පෙනෙනවා ඇති, මං මේ උත්සාහ කරන්නේ, මේ පිළිම, වෙළෙන්දන්ට ලැබුණේ කොහෙන්ද කියල හොයාගන්නයි. මේ වගේ අරුම පුදුම ඉරණමක් ඒවට අත්වෙන්නෙ කොහොමද කියල, එතකොට අපට හොයාගන්න පුළුවනි. දැන් අපි කෙනිංටන් පාරේ මෝස් හඩ්සන්ල ළඟට ගිහිං බලමු."

පැයක් ගතවෙද්දී එතැනට යාමට අපට හැකිවිය. තරබාරු, මිටි සිරුරක් තිබූ මෝස් හඩ්සන් ඉක්මන් කේන්තිකාරයකු බව අපි තේරුම් ගත්තෙමු.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් මහත්මයා. මගේ මේ සාප්පුවේ විකිණීමට තබා තිබුණු පිළිමය තමයි, කවුද චණ්ඩියෙක් අරගෙන පොළොවේ ගහල තියෙන්නේ. හොර තක්කඩීන්ට, චණ්ඩීන්ට මේ විටියට මහ දවාලේ ඇවිත් අපේ බඩු පොළොවේ ගහල යන්න පුළුවන් තත්ත්වයක් නේ දැන් තියෙන්නේ. අපි ආදායම් බදු ගෙවනවා; වරිපණම් ගෙවනවා. ඒත් අපට ලැබෙන ආරක්ෂාව මොකක්ද? ඔව් මහත්මයා. බාර්නිකොට් දොස්තර මහත්මයටත් ඒ පිළිම දෙක විකිණුවේ මම තමයි. මෙහෙම දේවල් වෙන්න ඉඩ හැරලා, පොලීසිය නිශ්ශබ්ද වෙලා ඉන්න එක නින්දා සහගතයි, මහත්මයා. මේක වෙන්නෙ හේතුවද ඔබ ඇහුවෙ? මේක මං කියන්නේ විප්ලවවාදී කුමන්ත්‍රණකරුවන්ගේ වැඩක්. ඔව්. ඔව්. ඔය ජනරජයක් පිහිටුවන්න ඕනෙයි කියන සමාජවාදී කල්ලියක් තියෙනවා නේ. උන්ගෙ වැඩක්. මේ විටියේ ප්‍රතිමා විනාශ කරන වැඩ කරන්න උවමනා වෙන කාටද?

මං මේ පිළිම මිලට ගත්තෙ කොහෙන්ද කියලද ඇහුවෙ? ඒක මේ ප්‍රශ්නයට අදාළ වෙන්නෙ කොහොමද කියලා මට නම් තේරුම් ගන්න බෑ. හොඳයි ඔබට දැනගන්න ඕනෙම නම් කියන්නම්. ස්ටෙප්නි හි, පල්ලිය පාරේ ගෙල්ඩර් සහ සමාගමෙන් තමයි ගත්තේ. ඔව්. ඔවුන් බොහොම කාලයක් - අවුරුදු විස්සක් තිස්සේ මේ ද්‍රව්‍ය විකුණන ප්‍රසිද්ධ ආයතනයක්. මා ළඟ තිබුණු පිළිම ගණනද? පිළිම තුනයි. දොස්තර මහත්මයට විකිණු දෙකයි, මා ළඟ තිබුණු එකයි.

මේ පින්තූරයේ ඉන්න එක්කෙනා හඳුනනවාද කියලද ඇහුවෙ? නෑ මහත්මයා. මේ වගේ කෙනෙක් මං අඳුනන්නෙ නෑ. ආ. . . . ඔහොම ඉන්න බලන්න. . . . . හරි දැන් මට මතකයි. මේ බෙපෝ නේ. මේ මිනිහා ඉතාලි ජාතිකයෙක්. මේ සාප්පුවේ වැඩට මං යොදවාගෙන තියෙනවා. මං මිනිහට කුලිය ගෙව්වෙ වැඩ කරපු කෑලි ගණනට. පිළිම නෙළන වැඩ, කැටයම් වැඩ කරන්න ඔහුට පිළිවන්. පින්තූර රාමු කරන ඒවා ආදී නොයෙක් සුළු සුළු වැඩත් මිනිහා කරනවා. ඔය මිනිහා මෙහෙන් අස්වෙලා ගියේ ගිය සතියේ. ඊට පස්සේ දකින්නවත් ලැබුණේ නෑ. ඔහු පදිංචි කොහේද කියලවත්, රස්සාවකට ගියේ කොහේටද කියලවත් මං දන්නේ නෑ මහත්මයා. මෙහේ වැඩකරද්දී ද? නෑ මහත්මයා මට නම් ඔහුගෙන් කරදරයක්

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණේ නෑ. හොඳ වැඩකාරයෙක්. පිළිම බිඳ දමන එකට දවස් දෙකකට ඉස්සර වෙලයි, ඔහු මෙහෙන් ගියේ."

අපි ඔහුගෙන් සමුගෙන පිටත්වී ආවෙමු.

"අපට ඊට වැඩි දෙයක් මෝර්ස් හඩ්සන්ගෙන් බලාපොරොත්තු වෙන්න බෑ. එතකොට මේ බෙපෝ කියන මිනිහා පොදු සාධකයක් හැටියට අපට තැන් දෙකකදීම දකින්න ලැබෙනවා. කෙනිංටන් වලදීත් කෙන්සිංටන් වලදීත්. ඒ නිසා කාරණය පැහැදිලි කරගන්න, තවත් හැතැක්ම දහයක දුරක් ගමන් කරන්න වෙන එක පාඩුවක් නෑ. නමුත් වොට්සන් අපි ඉස්සර වෙලා ගිහිං බලමු, ස්ටෙප්නිවල ගෙල්ඩර් සහ සමාගමට. එතැනින් මොනවා හරි ප්‍රයෝජනවත් යමක් දැනගන්න ලැබුණොත් ඒක පුදුමයක්."

ලන්ඩනයේ නොයෙකුත් ව්‍යාපාර සඳහා ප්‍රසිද්ධව තිබූ පෙදෙස් අපි පසුකර ගියෙමු. මෝස්තර ඇඳුම් පැළඳුම් සඳහා වූ පෙදෙස, හෝටල් පෙදෙස, නාට්‍ය ශාලා, වෙළඳ ශාලා, නාවික ආදී පෙදෙස් පසුකොට, අවසානයේ තේම්ස් ගං ඉවුරේ පිහිටි මුඩුක්කු නිවාස පෙදෙසට පැමිණියෙමු. යුරෝපයේ නොයෙක් රටවලින් දුප්පත්කම නිසා, රැකියාවන් සොයාගෙන ලන්ඩනයට පැමිණි සංක්‍රමණිකයන් ජීවත්වූයේ මෙම ප්‍රදේශයේය.

ප්‍රතිමා කර්මාන්තය සඳහා යොදාගෙන තිබුණේ කලකට පෙර ධනවත් ව්‍යාපාරිකයෙකුට අයත්ව තිබූ විශාල නිවසකි. එළිමහනේ සෑහෙන තරම් විශාල බිම් කඩක ගලෙන් හා සිමෙන්තියෙන් ස්මාරක නිමවෙමින් තිබිණි. ගොඩනැගිල්ල ඇතුළත, විශාල ශාලාවක කම්කරුවෝ පනස්දෙනෙක් පමණ විවිධ කාර්යවල නිරත වී සිටියහ. කැටයම් කිරීම, පිළිම හෙළීම, ලෝහ වාත්තු වැඩ ආදී කටයුතුවල ඔවුන් යෙදී සිටියේ, උස මහත ජර්මන් ජාතික කළමනාකරුවෙකුගේ අධීක්ෂණය යටතේයි. ආචාරශීලීව අප පිළිගත් ඔහු, හෝම්ස්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේය.

"ඔබට දැනගන්න උවමනා නැපෝලියන්ගේ කුමන මෝස්තරයේ පිළිමය ගැනද? ආ . . . . ඩෙවින්ගේ සිරිගරුඬෙන් නිර්මාණය කළ පිළිමයේ අනුරූ ගැන? ඔහොම ඉන්න. මං ඒ තොරතුරු අඩංගු පොත පරීක්ෂා කරලා කියන්නම්.

http://sherlockholmesinvestigations.blogspot.com

මුල් අච්චුවෙන් අපි පැරිස් බදාම පිළිම ගණනාවක් හදල තියෙනවා. මොන දවස්වල හැදූ පිළිම ගැනද ඔබ අහන්නේ? ආ . . . . . එක වරකදී සෑදූ පිළිම හයක්? . . . . හරි මේ තියෙන්නේ. ඒ පිළිම හයෙන් තුනක් මිලට ගෙන තිබෙන්නේ මෝර්ස් හඩ්සන්, කෙන්සිංටන්හි හාඩිං සහෝදරයෝ ලොකු පිළිම තුනයි. ඒ අවුරුද්දකට කලින්."

"මහත්මයා ඒ පිළිමවල, ඔබ ඒ අච්චුවෙන්ම තැනූ අනෙක් පිළිමවලට වඩා වෙනසක් තියෙනවද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා. ඒ පිළිම හයේ වීතරක් වෙනසක් වෙන්න කිසිම හේතුවක් නැහැ. අපි හැම එකකටම යොදාගන්නේ එකම සංයුතියේ පැරිස් බදාමයක්."

"යම්කිසි කෙනෙක් මේ පිළිම ම තෝරාගෙන, ඒවා පොළොවේ ගහල විනාශ කරන්න හේතුවක් ඔබට හිතාගන්න පුළුවන්ද?"

"පිළිම බිම ගහල බිඳින්න?" ජර්මන් ජාතිකයා ඇසුවේ සිනාසෙමිනි.

"මට නම් එහෙම දේකට හේතුවක් හිතාගන්නත් අපහසුයි මහත්මයා."

"ඔබ කොහොමද මේවා අලෙවි කළේ?"

"තොග ගණනේ විකුණන නිසා, අපි දුන්නේ එකක් සිලිං හය ගණනේ. සිල්ලර වෙළඳුන් විකුණන විට සිලිං දොළහකට හෝ ඊට වැඩි ගණනකට විකුණනවා."

"මේවා හදන ක්‍රමය ගැන අපට යමක් කිව්වොත් . . . ."

"වෙච්චින්ගේ කිරිගරුඬ පිළිමයේ මුහුණ දෙපැත්තෙන් සෑදූ අච්චු දෙකක් තිබෙනවා. මේ දෙකට වෙන වෙනම පැරිස් බදාම මිශ්‍රණය දමනවා. ඊළඟට එම භාග දෙක එකට සම්බන්ධ කිරීමෙනුයි සම්පූර්ණ පිළිමය හදන්නේ. ඔම් කටයුතු වලට යොදාගන්නෙද? ඉතාලි ජාතික කම්කරුවො තමයි සාමාන්‍යයෙන් මේ වැඩවල යෙදෙන්නේ. ඒ වැඩ කටයුතු හැම එකක්ම කරන්නේ මේ ශාලාවෙමයි. පිළිමයේ භාගදෙක එකට සම්බන්ධ කළාට පස්සේ, අර බරාඳයේ තිබෙන මේසය උඩ තබනවා ඒවා වියළීමට. ඊට පස්සේ ගබඩාවට යවනවා. පිළිම නිෂ්පාදනය ගැන මට කියන්න පුළුවන් එපමණයි."

http://sherlockholmesinvestigations.blogspot.com



97. "මේ පුද්ගලයා මෙහේ සේවය කළ කෙනෙක්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙන්න මේ පුද්ගලයා මෙහෙන් සේවය කළ කෙනෙක්ද?" හෝම්ස් ඔහු සතුව තිබූ ඡායාරූපය කළමනාකරුවාට පෙන්වීය. එය දුටු විගස ඔහුගේ මුහුණ කෝපයෙන් රතු විය.

"ඔය හොර තක්කඩියද? ඔව් මහත්මයා මං ඔහුව හොඳට අඳුනනවා. මේ ආයතනය බොහොම වැදගත් විධියට කටයුතු කරන තැනක්. මෙහේට පොලීසියෙන් ආවේ එකම වතාවයි. ඒක සිද්ධ වුණේ ඔය තක්කඩියා නිසා. දැන් ඒක සිද්ධවෙලා අවුරුද්දකට වැඩියි. මිනිහා මොකක් හරි අණ්ඩුවකදී තවත් ඉතාලි කාරයෙකුට පිහියෙන් ඇනලා. පොලීසිය ඔහුව සොයමින් මෙහේට ආවා. මෙහේදියි ඔහුව හිරභාරයට ගත්තේ. මිනිහගේ මුල නම බෙපෝ. ඔහුගේ වාසගම මොකක්ද කියලා මං කිසිදාක දැනගෙන හිටියේ නෑ. ඔය වගේ මුහුණක් තියෙන යක්ෂයෙකුට රස්සාවක් දීපු වැරැද්දට මටත් යස දඬුවමක් ලැබුණේ. ඌ වැඩට නම් හරි දක්ෂයෙක්. මෙහේ වැඩ කළ හොඳම කිහිප දෙනාගෙන් කෙනෙක්."

"පිහි ඇනුමට ඔහුට ලැබුණු දඬුවම මොකක්ද කියලා ඔබට දැනගන්න ලැබුණද?"

"පිහි ඇනුම් පාර කෑව ඉතාලි ජාතිකයා නොමැරී බේරුණා. බෙපෝ අවුරුද්දකට හිරේ ගියා. දැන් නම් හිරෙන් නිදහස් වෙලත් ඇති. හැබැයි රස්සාවක් ඉල්ලාගෙන මේ පැත්තට නම් ආවෙ නෑ. ඔබට ඔහු ගැන තවත් තොරතුරු දැනගන්න ඕනෙ නම් පුළුවනි. බෙපෝගේ ඥාති සහෝදරයෙක් මෙහේ වැඩ කරනවා. ඔහු කියාවි බෙපෝ ඉන්නේ කොහේද කියලා."

"එපා එපා මහත්මයා." හෝම්ස් එක්වරම කීය.

"මං බෙපෝ ගැන හොයා බැලූ බව වත් මේ ඥාති සොහොයුරාට හෙළිකරන්න එපා. එක වචනයක් වත් කියන්න එපා. මං ඔබට ආයාචනය කර සිටිනවා. මේක මහා බරපතල කරුණක්. මේ පිළිම අලෙවිය ගැන ඔබ ලෙජර් පොත් පරීක්ෂා කළ වෙලාවෙ මං දැක්කා, එහි සඳහන් දිනය පහුගිය අවුරුද්දේ ජූනි මාසේ තුන්වැනිදා බව. බෙපෝ හිරභාරයට ගත්ත දිනය කවදාද කියල ඔබට කියන්න පුළුවන්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"කම්කරු පඩි ලැයිස්තුව බලලා මට ඒක කියන්න පුළුවනි. . . . ඔව්. ඔහුට අපි අන්තිමට පඩි ගෙවලා තියෙන්නේ මැයි 20 වැනිදා."

"ඔබට බොහොම ස්තූතියි මහත්මයා. අපි ඔබට තවත් කරදර කරන්නේ නෑ. මං ඔබෙන් යළිත් වරක් ඉල්ලා සිටිනවා මේ ගැන එක වචනයක්වත් බෙපෝර්ගේ අද්‍යාත්ම සොහොයුරාට කියන්න එපා."

දහවල් ආහාරය සඳහා අප අවන්හලකට ගොඩ වැදෙන විට ඉර අවරගිරට යාමටත් පටන්ගෙන තිබිණි. අවන්හලේ දොරටුව අසල, පුවත්පත් අලෙවි නියෝජිතයෙකුගේ විශාල දැන්වීමක් විය.

## "කෙන්සිංටන්හි භීෂණයක් උන්මත්තකයෙකු විසින් කළ මිනීමැරුමක්."

එම පුවත්පතක් හෝම්ස් මිලට ගත්තේය. හොරේස් හාකර් මහතා ඔහුගේ වාර්තාව පුවත්පතේ පළකරවා ගැනීමට සමත් වී ඇති බැව් අපි දුටුවෙමු. සිද්ධිය පිළිබඳව පාඨක සිත් කලඹවන ආකාරයේ විචිත්‍රවත් විස්තරයක් එහි පළවී තිබිණ. ලූනු ගම්මිරිස් රාක්කයට පුවත්පත හේත්තු කළ හෝම්ස්, කෑම ගන්නා අතරේම ප්‍රවෘත්ති වාර්තාව කියවා බැලීමට යුහුසුළු විය.

"මේක හරිම අලංකාරයි . . . . මේ ටිකත් අහගන්නකෝ වොට්සන්."

. . . . . *විශේෂඥ රහස් පරීක්ෂකයෙකු වන ෂර්ලොක් හෝම්ස් මහතාත්, පළපුරුදු පොලිස් නිලධරයකු වන ලෙස්ට්‍රේඩ් මහතාත් මේ පිළිබඳව එකම අවසන් නිගමනයකට පැමිණ ඇති බැව් ඇසීමෙන් සතුටකි. ඛේදජනක ලෙස අවසන් වූ මෙම බිහිසුණු ක්‍රියාව උන්මත්තකයෙකුගේ අතින් සිදුවූවක් මිස, සැලසුම් සහගතව කරන ලද මනුෂ්‍ය ඝාතනයක් නොවන බව දෙදෙනාගේම මතයයි. මෙවැනි අපරාධයකට හේතුව, මානසික විකෘතිය මිස වෙනත් කිසිදු කරුණක් විය නොහැක."*

http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන් පත්තරකාරයො කියන්නෙ ඉතාම වටිනා මිනිසුන් කොටසක්. එකම දේ, ඔබ දැන සිටිය යුතුයි ඔවුන්ගෙන් එම සේවය ලබාගත යුත්තේ කුමන අයුරෙන්ද කියලා. ඔබ කෑම කාල අවසන්වුණු ගමන් අපි කෙන්සිංටන් වලට ගිහින් බලමු. හාඩිං සාප්පුවේ අයිතිකාරයට කියන්නට තියෙන්නේ මොනවද කියල අහමු."

ඔහු බුද්ධිමත් කඩිසර පුද්ගලයෙකු විය. අපට දැනගැනීමට අවශ්‍ය ඕනෑම තොරතුරක් පැවසීමට ඔහු කැමැත්තෙන් සිටියේය.

"ඔව් මහත්මයා, අද හවස පත්තරේ තිබුණු පුවෘත්තිය මං කියෙව්වා. හොරේස් හාකර් මහත්මයා අපේ ගනුදෙනු කාරයෙක්. මේ පිළිමය අපි ඔහුට විකුණුවේ මාස කිහිපයකට කලින්. අපි ගෙල්ඩර් සහ සමාගමෙන් මේ වර්ගයේ පිළිම තුනක් ඇණවුම් කළා. ඒ ඔක්කොම විකිණී ගියා. කාටද?

අපේ බිල්පොත් බැලුවොත් මට ඒක කියන්න පුළුවනි. . . . මේ තියෙන්නේ. එකක් මං ඔබට කලින් කිව්වා වගේ හාකර් මහත්මයාට. ඊළඟට ජෝසයියා බ්‍රවුන් මහත්තයා, ලැම්බර්නම් මැදුර, ලැම්බර්නම් වේල්, චිස්වික්. අනික් පිළිමය විකුණලා තියෙන්නේ . . . . . ඔව්. සැන්ඩ්ෆෝඩ් මහතා, ලෝවර් ග්‍රෝව් පාර, රීඩිං.

නෑ මහත්මයා. ඔබතුමා පෙන්වන ඡායාරූපයේ පුද්ගලයා නම් මං කවදාවත් දැකල නෑ. මේ වගේ මුහුණක් වරක් දැක්කොත් ලේසියට අමතක වෙන්නෙ නෑ නේද මහත්මයා. කලාතුරකින් දකින්න ලැබෙන, ඒ තරමටම විරූපී මුහුණක්. අපේ සේවක මණ්ඩලයේ ඉතාලි ජාතික සේවකයො ඉන්නවද කියලද ඇහුවෙ? ඔව් මහත්මයා. කීප දෙනෙක්ම ඉන්නවා. සමහරු කම්කරුවෝ. සමහරු ආයතනය පිරිසිදු කරන අය. ඔබ හිතන්න ඇති හරි. ඔවුනට උවමනාවක් තියෙනවා නම් බිල්පොත් පෙරළා යමක් බලාගන්න බැරිකමක් නෑ. බිල්පොත් කාටවත් අල්ලන්න බැරි විධියට යතුරු දමන ලාච්චුවක තබන්න විශේෂ හේතුවක් නෑ. ඔව් ඔව්. මේක මහා පුදුමාකාර සිදුවීමක්. ඔබතුමාගේ පරීක්ෂණ වලින් මොනවා හරි දැනගන්න ලැබුණොත්, මටත් දන්වන්න."

හාඩිං මහතා සමඟ සාකච්ඡාව පැවැත්වෙන අතරතුර, හෝම්ස් කරුණු කිහිපයක්ම සටහන් කරගන්නා අයුරු මම දුටුවෙමි. එයින්

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු අතිශය සතුටට පත්වූ බවක් පෙනුණත්, ඒ ගැන කිසිත් සඳහන් නොකෙළේය.

"අපි හිතුවට වඩා නුඹාක් ප්‍රමාද වුණා වොට්සන්. ලෙස්ට්‍රේඩ්ට හවස හය වෙනකොට එන්න කිව්වට, අපට ඒ වෙලාවට බේකර් වීථියට යාගන්න බැරි වේවි."

අප එහි ළඟාවෙද්දී ලෙස්ට්‍රේඩ් අපේ නිවහනට පැමිණ සිටියේය. ඔහු මහත් නොඉවසිල්ලෙන් අපේ විසිත්ත කාමරයේ ඉහළ පහළ ඇවිදිමින් සිටියේය. සවස් වරුවේ අලුතෙන් ධමක් සොයා ගැනීමට ඔහු සමත් වී ඇති බැව් නිසැකය. ඒ බව ලෙස්ට්‍රේඩ්ගේ සාඩම්බර මුහුණෙන් ප්‍රකාශ විය.

"ඉතින් ෂර්ලොක් හෝම්ස් මහත්මයා? කොහොමද ඔබේ වැඩකටයුතු සාර්ථක වුණාද?"

"අද දවස අපට බොහොම අව්වෙකී එකක් වුණා. කාලය සම්පූර්ණයෙන්ම අපතේ ගියා කියන්නත් බෑ. අපි දෙන්නා ගියා අර, ප්‍රතිමා සිල්ලරට සහ තොග විකුණන අලෙවි කළ වෙළඳුන් හමුවෙන්න. මේ හැම පිළිමයක්ම නිෂ්පාදනය කළ තැන සිට ඉදිරියට ගිය පිළිවෙළ මට කියන්න පුළුවනි."

"පිළිම?" ලෙස්ට්‍රේඩ් උස් හඬින් ඇසුවේ සිනා පිරුණු මුහුණෙනි.

"හොඳයි හොඳයි. ඔබ පරීක්ෂණය කරගෙන යන්නේ, ඔබටම විශේෂ ආකාරයකට නේ. මං ඒවාසේ අඩුපාඩු පෙන්වා දෙන්න හදන එක වැරැද්දියි. නමුත් මං හිතනවා අද ඔබ කළාට වඩා විශාල වැඩ කොටසක් මගේ අතින් සිදුවුණා කියල. ඔබ දන්නවද හෝම්ස් මහත්මයා, අර මියගිය මනුෂ්සයා හඳුනාගැනීමට මට හැකි වුණා."

"බොරු?"

"බොරු නෙමෙයි. ඇත්තමයි. එපමණක්ද? මේ මිනීමැරීමට හේතුවත් මං හොයාගත්තා."

"විශිෂ්ටයි ලෙස්ට්‍රේඩ්!"

"අපේ ඉන්නවා හිල් කියලා පොලිස් පරීක්ෂකවරයෙක්. මිනිහා මේ ඉතාලිකාරයින් පදිංචි ජනාවාසය ගැන හොඳට දන්නවා. මේ

http://sherlockholmesinvestigations.blogspot.com

මියගිය තැනැත්තාගේ කරේ කතෝලික ආගමික ලාංඡනයක් සහිත මාලයක් තිබුණා. ඊට අමතරව ඔහුගේ සමේ වර්ණයත් ටිකක් විශේෂ එකක්. මේ කාරණා දෙකෙන් මම නිගමනය කළා, මේ පුද්ගලයා දකුණු ඉතාලියෙන් මෙහේට සංක්‍රමණය වූ පුද්ගලයෙක් කියලා. පොලිස් පරීක්ෂක හිල් මළසිරුර දුටු ගමන්ම ඔහුව හඳුනාගත්තා.

මිනිහාගේ නම පිට්‍රෝ වෙනුසි. ඔහු නේපල්ස් නගරයේ කෙනෙක්. ඔහු ලන්ඩනය තුළ ක්‍රියාත්මක වූ අංක එකේ මිනීමරුවෙක්. වෙනුසි ඉතාලියේ මාෆියා සංවිධානයේ නියෝජිතයෙක්ලු. ඔබ දන්නවනේ මාෆියා ව්‍යාපාරය, රහස් දේශපාලන මැරවර කල්ලියක් බව. ඔවුන්ගේ නඩු තීන්දු කෙළවර වෙන්නේ මරණ දඬුවමෙන්. දැන් ඔබට පෙනෙනවා ඇත්ද, සියල්ලම ක්‍රමක්‍රමයෙන් පැහැදිලි වෙන ආකාරය. අනෙක් පුද්ගලයාත් බොහෝ විට ඉතාලි ජාතිකයෙක් වෙන්න ඇති. නිසැකවම මිනීමරුවාත් මාෆියාවට සම්බන්ධයි. ඔහු රහස් සංගමයේ නීති උල්ලංඝණය කරන්න ඇති. මාෆියාවෙන් මොකද කළේ? පිට්‍රෝ වෙනුසිව එව්වා අර පුද්ගලයාව මරා දමන්න. අර සාක්කුවේ තිබුණු ඡායාරූපය අරගෙන එන්න ඇත්තෙ වෙනුසි ඔහු හඳුනන්නෙ නැති නිසා, ඔහුව හඳුනාගැනීමට උදව් කරගන්න. එදා රාත්‍රියේ වෙනුසි ආවා අර තැනැත්තා පසුපසින්. ඒ පුද්ගලයා ගෙදරකට ඇතුළුවෙන හැටි වෙනුසි දකිනවා. ඔහු එළියේ රැඳී ඉඳලා, අර තැනැත්තා එළියට එනකොට අල්ලා ගන්නවා. නමුත් එතැනදී ඇතිවෙන සටනේදී පිහිපාර කාල මියයන්න වෙන්නේ පිට්‍රෝ වෙනුසිටමයි. ඒ පැහැදිලි කිරීම කොහොමද ෂර්ලොක් හෝම්ස් මහත්තයා?"

ලෙස්ට්‍රේඩ්ගේ හසන්කම අගය කරමින් හෝම්ස් අත්පොළසන් දුන්නේය.

"විශිෂ්ටයි ලෙස්ට්‍රේඩ් විශිෂ්ටයි! නමුත් අර පිළිම විනාශ කිරීම මෙතැනට සම්බන්ධ වෙන්නෙ කොහොමද කියලා ඔබ පැහැදිලි කළේ නෑ නේවැ?"

"පිළිම? ඔය පිළිම ගැන අදහස ඔබේ ඔලුවෙන් කොහොමටවත් අයින් කරගන්න බැරිද මහත්මයා? පිළිම බිඳ දැමීම සුළු දෙයක්නේ. ඔය වගේ දේකට මිනිහෙකුට දෙන්න පුළුවන් ලොකුම දඬුවම

http://sherlockholmesinvestigations.blogspot.com

හයමාසෙකට හිරගෙට යැවීම පමණයි, හෝම්ස් මහත්මයා. අපි මෙතැනදී අපේ සම්පූර්ණ අවධානය යොමුකරන්න ඕන, මිනීමැරුම ගැන! ඔබට කියන්න, මේකට සම්බන්ධ කරුණු හැම එකක්ම සොයාගත හැකි නූල්පොටවල් දැන් මගේ අතේ තියෙනවා."

"එතකොට ඊළඟ පියවර මොකක්ද?"

"ඒක බොහොම සරලයි. හිල් සමඟ මම ඉතාලි කාරයින්ගේ ජනාවාසයට යනවා. ඡායාරූපයේ ඉන්න පුද්ගලයාව හොයාගන්නවා. මිනීමැරීමේ චෝදනාවට ඔහුව අත්අඩංගුවට ගන්නවා. එච්චරයි. ඔබත් එනවද මා එක්ක යන්න?"

"මට එන්න හැකියක් නෑ ලෙස්ට්‍රේඩ්. මං හිතනවා, අප බලාපොරොත්තුවෙන ඉලක්කයට, ඔබේ ක්‍රමයට වඩා සරල ක්‍රමයකට ළංවෙන්න මට පුළුවනි. මට ඒ ගැන සහතික වෙන්න බෑ. නමුත් බොහොම වෙලාවට ඒක හරියන්න ඉඩ තියෙනවා. ලෙස්ට්‍රේඩ් එනවාද අද රෑට අපිත් එක්ක යන්න? ඔහුව අල්ලාගන්න මං ඔබට උදව් වෙන්නම්."

"ඉතාලි ජනාවාසයටද?"

"නෑ. මං හිතන්නේ ඔහුව අල්ලා ගැනීම සඳහා චිස්වික් වඩාත් යෝග්‍ය තැනක් වේවි. ලෙස්ට්‍රේඩ් මං ඔබට පොරොන්දු වෙනවා. අද රෑට මා සමග චිස්වික් යන්න ආවොත්, හෙට මං ඔබ සමග ඉතාලි ජනාවාසයට යන්න එනවා. එක දවසක ප්‍රමාදය නිසා ඔබට සිදුවිය හැකි පාඩුවක් නෑ. මොකද කියන්නෙ? කැමැතියි? බොහොම හොඳයි.

මං හිතන්නේ දැන් අපි පැය කිහිපයක නින්දක් ලබාගත්තොත් කොයි එකටත් හොඳයි. ඒ මොකද මං මෙහෙන් පිටත් වෙන්න බලාපොරොත්තු වෙන්නේ රෑ එකොළහට. බොහෝවිට අපට හෙට පාන්දර වෙනතුරු ආපහු එන්න ලැබෙන එකක් නෑ. ලෙස්ට්‍රේඩ් මං ඔබට ඇරයුම් කරනවා, අප එක්ක රාත්‍රී ආහාරය ගන්න කියා. ඊට පස්සේ, පිටත්වෙන වේලාව එනතුරු ඔබට සෝපාවේ හාන්සිවෙන්න පුළුවනි. ඒ අතරේ වොට්සන් ඔබට වැඩක් තියෙනවා. ශීඝ්‍රගාමී පණිවුඩකාරයෙක් ගෙන්වා ගැනීමට දුරකථන පණිවුඩයක් දෙන්න. මට යැවිය යුතු ලිපියක් තියෙනවා. ඒක මේ දැන් වහාම යැවිය යුතුයි."

http://sherlockholmesinvestigations.blogspot.com

නිතර ප්‍රයෝජනයට නොගන්නා ලී බඩු, පැරණි දිනපතා පුවත්පත් ආදිය ගබඩාකර තිබූ කුඩා කාමරයක්, නිවසේ අප පදිංචි මහලට ඉහළ මහලේ තිබිණි. එයට වී පරණ පුවත්පත් පෙරළා බලමින් හෝම්ස් හවස්වරුව ගත කළේය. එනැතින් පහළට බැස එද්දී මගේ මිත්‍රයාගේ දෑසේ ජයග්‍රහණය සලකුණු වී තිබෙනු මම දුටුවෙමි. එහෙත් ඔහු මට වත් ලෙස්ට්‍රේඩ්ට වත් එකදු වචනයක් පැවසුවේ නැත.

හෝම්ස් මෙම පරීක්ෂණය අඩියෙන් අඩිය ඉදිරියට ගිය ආකාරය මම නිරීක්ෂණය කළෙමි. එහෙත් අපගේ අවසන් ඉලක්කය කුමක්දැයි, පැහැදිලිව තේරුම් ගැනීමට මට හැකියාවක් නොතිබිණි. කෙසේ වෙතත් මෙම භයානක අපරාධකරු, තම ප්‍රහාරය මීළඟට එල්ල කරන්නේ, නැපෝලියන් ප්‍රතිමා මිලට ගත් පුද්ගලයින් දෙදෙනාගේ නිවාස වෙත බව හෝම්ස්ගේ අදහසයි. එයින් එකක් පිහිටා ඇත්තේ චිස්වික් ප්‍රදේශයේ බව මම සිහි කළෙමි. අප චිස්වික් බලා යන ගමනේ අරමුණ, අපරාධකරු ගෙවල් බිඳුමේ යෙදෙද්දීම අල්ලා ගැනීම විය යුතුය. එදින සවස පුවත්පතේ සඳහන් කර තිබුණේ මෙය උන්මත්තකයෙකුගේ ක්‍රියාවක් බව හෝම්ස් - ලෙස්ට්‍රේඩ් දෙදෙනාම විශ්වාස කරන බවයි. අපරාධකරුවා නොමඟ යැවීමට, මගේ මිත්‍රයා ක්‍රියාකොට ඇත්තේ කොපමණ දක්ෂ අයුරින්ද? දැන් අපරාධකරු තම කටයුත්තට නිර්භයව ඉදිරිපත්වනු නොඅනුමානය.

"වොට්සන් අද අපි යන්නේ භයානක ගමනක්. අද මමත් ආයුධයක් ගත්තා. ඔබ, ඔබේ රිවෝල්වරය සාක්කුවේ දමාගන්න අමතක කරන්න එපා!"

හෝම්ස් අනතුරු ඇඟවූයේ අපි ගමනට සූදානම් වෙද්දීයි.

"රෝද හතරේ ලොකු අශ්වකරත්තයක් එනවා හරියට එකොළහට. අපි ඒකෙන් යමු."

නියමිත වේලාවට පැමිණි රථයේ නැගී, අපි චිස්වික් දෙසට පිටත් වී ගියෙමු. රාත්‍රියේ පැවැතියේ ඝන අන්ධකාරයකි. හැමර්ස්මිත් පාලම පසුකොට මඳ දුරක් ගිය පසු, පාළු ස්ථානයක රිය නැවැත්වීමට හෝම්ස් අණ කළේය. අප කැඳවන තුරු රථය නවතාගෙන රැඳී සිටීමට රියැදුරාට උපදෙස් දෙන ලදී. සැහෙන දුරක් අපි

http://sherlockholmesinvestigations.blogspot.com

ඉදිරියට ඇවිද ගියෙමු. මහ දෙපස කුඩා ඉඩම් කැබලිවල නිවාස වෙන් වෙන් වශයෙන් තනා තිබූ පෙදෙසක් අපට හමුවිය. වීථියේ දැල්වුණු පහන්වල එළියෙන් නිවාස වල නම් පිළිබඳව පරීක්ෂා කරමින් අපි ඉදිරියට ගියෙමු.

"හරි. මේ ගේට්ටු කණුවේ තියෙන්නේ "ලැබර්නම් විලා" කියල පුවරුවක්. ගෙදර මිනිස්සු ඔක්කොම නින්දට ගිහින් වගෙයි. ගෙදර සැමතැනම එළිය නිවල."

"නමුත් සාලයේ පහනක් තවමත් දැල්වෙනව වගේ නේද?" මම ඇසීමි.

"ඔව්. ඒකෙන් වැටෙන්නේ දුර්වල එළියක් පමණයි. ගෙදරට එන පාර යන්තමින් හරි බලාගන්න ඒ පහන දැල්වී තිබෙන එක හොඳයි. වත්තයි මහපාරයි වෙන්කරල තියන ඔය ලැලි වැට පිටිපස්සෙ හොඳටම අඳුරුයි. අපි වත්ත ඇතුළෙ ඒ අඳුරෙ හැංගෙමු.

මට හිතෙන්නෙ සෑහෙන වෙලාවක් අපට මෙතැන රස්තියාදු වෙන්න සිදුවෙනවා. ඒ ගැන මට කණගාටුයි. මේ වෙලාවෙ වැස්සක් නොවහින එක අපේ වාසනාවක්. මෙතැන කාලය ගතකරද්දී, දුම්වැටියක් දල්වා ගන්නවත්, ඔබට ඉඩදෙන්න මට හැකියාවක් නෑ. අපි මේ තරම් කරදර වුණත් මේ ගමනේ සාර්ථකත්වයට තියෙන්නේ සියේට තිස්හතක ඉඩක් පමණයි."

කෙසේ වෙතත් හෝම්ස් අපට පැවසූ තරම් දීර්ඝ වෙලාවක් එහි රැඳී සිටීමට අපට සිදුවූයේ නැත. එම කාලය බලාපොරොත්තු නොවූ අයුරින් එක්වරම අවසන් විය.

කිසිවෙකු පැමිණි බව හැඟවීමට කිසිම ආකාරයක ශබ්දයක් නොනැඟිණි. එහෙත් එක්වරම, ගෙළයන් ඉදිරිපස වූ ගේට්ටුව සෙමින් විවෘත විය. කෙට්ටු සිරුරක් ඇති පුද්ගලයෙකුගේ අඳුරු ඡායාවක්, ගෙවත්ත හරහා නිවස දෙසට වැටුණු මාවත දිගේ ගමන් කරනු අපි දුටුවෙමු. ශබ්දයක් නොනගා ඔහු වේගයෙන් ඉදිරියට ගියේ වානරයෙකු මෙන් ක්‍රියාශීලී විලසිනි. මීළඟට ඔහු නිවස ඉදිරිපස වූ විශාල අඳුරු පැතැති සෙවණැල්ලේ අතුරුදන් විය. ඉන්පසු සෑහෙන වෙලාවක්, ඔහු පිළිබඳ හෝඩුවාවක් නොමැතිව බලා සිටීමට අපට සිදුවිය. සන්ත්‍රාසයට පත්ව සිටි අප බලා සිටියේ, කොයි මොහොතේ ඔහු අඳුරු සෙවණැල්ලෙ මැදින් මතුවේදෝයි ආතයෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

මීළඟට අපට "ක්‍රීක් ක්‍රීක්" හඬක් නිවස දෙසින් ඇසිණි. ඒ, ජනේලයක් විවෘත කිරීමට ඔහු උත්සාහ දැරූ හඬයි. එම ශබ්දය අවසන් වූ පසු යළිත් දිගු නිශ්ශබ්දතාවයකි. හොරා ගෙට ඇතුළු වූවා විය යුතුය. නිවස ඇතුළත දැල්වූ, අඳුරු කළ ලන්තෑරුමක කණාමැදිරි ආලෝකය, ජනෙල් වීදුරුව තුළින් අපි දුටුවෙමු. ඔහු සෙවූ දේ නිවස තුළ නොමැති අයුරකි. අඳුරු කළ ලන්තෑරුමේ එළිය මීළඟට තවත් කාමර දෙකකින් ද දිස්විය.

"දැන් අපි යමු අර ඇරලා තියෙන ජනේලය ළඟට. ඔහු ජනේලයෙන් එළියට පනිද්දීම අල්ල ගමු!" ලෙස්ට්‍රේඩ් කොඳුරා කීවේය.

එහෙත් අප ප්‍රමාද වූවා වැඩිය. අප සැඟවී සිටි තැනින් නැගී සිටීමටත් පෙර ඔහු නිවසෙන් එළියට පැන්නේය. අඳුරු සෙවණැල්ලෙන් එළියට එද්දී සුදු පැහැති කිසියම් දෙයක්, ඔහු දැතින් ඔසවාගෙන එන ආකාරය අපි දුටුවෙමු. එළිය වැටී තිබුණු ගෙවත්තේ වටාපිටාව දෙස ඔහු හෙළුවේ පරීක්ෂණාත්මක තියුණු බැල්මකි. වීථිය සම්පූර්ණයෙන්ම නිසලය. එයින්ම ඔහු සෑහීමට පත්වූ බවක් පෙනිණ. අපට පිටුපස හරවා සිටගත් ඔහු නැමී අතේ තිබූ දේ බිම තැබුවේය. ඊළඟ මොහොතේ අපට අසන්නට ලැබුණේ යම්කිසිවකට මිටියකින් සියුම්ව පහර දෙන්නාක් වැනි හඬකි.

තමා යෙදී සිටි කාර්යය කෙරෙහි ඔහු දැඩි අවධානයක් යොමුකර සිටියේය. එය කොතෙක් ද යත්, තණබිම උඩින් අප ඔහු දෙසට පා නැඟූ හඬවත් ඔහුට නොඇසිණි. මීළඟට හෝම්ස් එක්වරම අමුත්තා වෙත කඩා පැන්නේ, ගොදුරක් වෙත පනින ව්‍යාඝ්‍රයකු විලසිනි. එක් ක්ෂණයකින් ලෙස්ට්‍රේඩ් සහ මම, සොරාට සෙලවීමටවත් නොහැකි වන සේ, ඔහුගේ අත්දෙක දැඩිව ග්‍රහණය කරගත්තෙමු. ලෙස්ට්‍රේඩ් සතුව තිබූ විලංගු වහා ක්‍රියාත්මක විය. සිරකරුවාගේ මුහුණට ආලෝකය වැටෙද්දී අපට ඔහු හඳුනාගැනීමට හැකිවිය. ඒ කෝපයෙන් වියරු වූ මුහුණ, අප ඡායාරූපයේ දුටු මුහුණ මය.

එහෙත් හෝම්ස්ගේ සිත් ඇදගැනීමට සමත් වූයේ, අල්ලාගත් සිරකරුවා නොවේ. මගේ මිත්‍රයා මහත් විමසිල්ලෙන් පරීක්ෂා කරමින් සිටියේ, සොරා නිවසෙන් එළියට ගෙන ආ නැපෝලියන් ප්‍රතිමාවයි. මෙය ඒ වනවිටත් කුඩා කැබලිවලට බිඳ දමා තිබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ හැම පැරිස් බදාම කැබැල්ලක්ම හෝම්ස් ආලෝකයට අල්ලා හොඳින් පරීක්ෂා කලේය. එහෙත් ඒ හැම කැබැල්ලක්ම අනෙකකට වඩා වෙනස් වූ අයුරක් නොපෙනිණ. ඔහුගේ පරීක්ෂණය අවසන් වෙද්දී නිවසේ පහන් දැල්විණි. නිවසේ දොර හැරගෙන අප වෙත පැමිණියේ, විනෝදකාමී ස්වභාවයක් පළකළ තරබාරු මිටි මහත්මයෙකි.

"මේ ජෝසයියා බ්‍රවුන් මහත්මයාද?" ඒ ඇසුවේ හෝම්ස්ය.

"ඔව් මහත්මයා. ඔබ නම් ෂර්ලොක් හෝම්ස් මහත්මයා. කිසි සැකයක් නෑ.

ඔබ ශීඝ්‍රගාමී පණිවුඩ කරුවකු අතේ එවූ ලියුම මට ලැබුණා. ඔබ දී තිබුණු උපදෙස් හැම එකක්ම මං ඒ විදියටම අනුගමනය කළා. අපි ඇතුළෙ කාමර වලට වෙලා දොරවල් අගුළු දාගෙනයි බලාගෙන හිටියෙ. තක්කඩියාව ඔබට අල්ලාගන්න ලැබීම ගැන මට සන්තෝෂයි. මහත්වරුනි, කවුරුත් එන්න මගේ ගෙදරට. ඇවිත් මොනව හරි කිල යන්න."

කෙසේ වෙතත් තමා සිරකරුවා පොලිස් මූලස්ථානය වෙත ගෙන යෑමට ලෙස්ට්‍රේඩ් සිටියේ නොඉවසිල්ලෙනි. මිනිත්තු කිහිපයක් ඇතුළත, අප පැමිණි කුලීරිය එතැනට කැඳවා ගතිමු. මඳ වේලාවක් ගතවෙද්දී අපි සිව්දෙනාම ආපසු ලන්ඩනය බලා පිටත්වීමු.

අප ඇසූ කිසිදු ප්‍රශ්නයකට සිරකරුවා පිළිතුරක් දුන්නේ නැත. ඔහු අප දෙස හෙළුවේ කෝපයෙන් ගිනිගෙන දැවෙන බැල්මකි. වරක් මගේ අත ඔහු දෙසට ළං වෙද්දී, ඔහු කට ඇරගෙන මා හපා කෑමට කඩාපැන්නේ, බඩගිනි වූ වෘකයකු ලෙසයි.

"ලෙස්ට්‍රේඩ් ඔහුව සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරනතුරු අපි පොලිස් ස්ථානයේ රැඳී සිටිමු වොට්සන්. ඊට පස්සේ අපේ වැඩකටයුතු වලින් හුඟක් හරිය ඉවරයි."

"ඔහු ඇඳුම් අතරේ හංගා ගෙන තිබිල අපට හම්බ වුණේ මේ දේවල් විතරයි මහත්මයා. මේ පිහිය සහ සිලිං කිහිපයක මුදලක්."

ඒ පිහිය සම් ආවරණයක් යෙදූ, දිගු මුවහත් තලයක් සහිත පිහියකි. එහි මිටේ, වියළී ගිය අලුත් ලේ පැල්ලම් සැහෙන තරම් තිබෙන අයුරු අපට දක්නට ලැබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ප්‍රශ්නයක් වෙන්නෙ නෑ හෝම්ස් මහත්තයා." ලෙස්ට්‍රේඩ් පැවසුවේ අප ඔහුගෙන් සමුගනිද්දීය.

"හිල් අඳුනනවා මේ ඉතාලි පිරිස ඔක්කොම. මිනිහ කියාවි මොහුගේ නම මොකක්ද කියලා. මං උපකල්පනය කළා නේ මේක මාෆියාවෙන් කරවූ මිනීමැරුමක් කියලා. බලන්න ඒක හරියන්නෙ නැද්ද කියලා. ඒ කොහොම වුණත් මං ඔබට ණයගැතියි මහත්මයා, ඔහුව අල්ලා දුන් එකට. ඔබ ඒ වැඩේ කළේ කොහොමද කියන එක ගැන නම් මට තවමත් කිසිදෙයක් තේරුම් ගන්න බෑ."

"ඒ ඔක්කොම ඔබට තේරුම් කර දෙන්න තිබුණා. නමුත් ඒකට රෑ වුණා වැඩියි ලෙස්ට්‍රේඩ්. ඇරත් මේ සම්බන්ධයෙන් මං තවමත් විසඳලා අවසන් නොකළ කාරණාක් හෝ දෙකක් තිබෙනවා. මේ වගේ ගැටලු, අපි අන්තිම කෙළවර දක්වාම ලිහල අවසන් කළයුතු ඒවා. එහෙම නොකොළොත් ඒක ලොකු අඩුපාඩුවක්. ඒ නිසා හෙට හැන්දෑවෙ හය වෙනකොට, ඔබට යළිත් වරක් අපේ නිවහනට එන්න පුළුවන් නම් හොඳයි. ඒ මොකද, මේ අභිරහස මොකක්ද කියලා, ඔබ තවමත් හරිහැටි තේරුම්ගෙන නැති බව මට එතකොට පහදා දෙන්න පුළුවනි. මේක අපරාධ ඉතිහාසයේ අද්විතීය සිද්ධියක් වෙන බවට කිසිම සැකයක් නෑ. වොට්සන් මගේ මේ පුංචි ගැටලු ගැන තවත් කථාන්තර ලියන්න මං ඔබට ඉඩ දුන්නොත්, මේකත් ඔබේ පිටු අතරට එකතුවෙන බව මට සහතිකයි."

පසුවදා සැන්දෑවේ ලෙස්ට්‍රේඩ් අපේ නිවහනට පැමිණියේය. සිරකරුවා පිළිබඳ තවත් තොරතුරු ඔහුට දැනගන්නට ලැබී තිබිණි.

"හෝම්ස් මහත්තයා, ඔහුගේ මුල් නම බෙපෝ. වාසගම මොකක්ද කියල කිසිකෙනෙක් දන්නෙ නෑ. ඉතාලි සංක්‍රමණික ප්‍රජාව ඔහු ගැන හොඳින් දන්නවා. ඔවුන් බෙපෝව සලකන්නේ කිසිම වැඩකට නැති, හොර තක්කඩියෙකු ලෙසයි. ඔහු ප්‍රතිමා නිර්මාණ කලාවේ දක්ෂයෙක්ලු. කාලයක් ඒ රැකියාව කරගෙන, අවංක මිනිහෙක් හැටියට ජීවත්වෙලා තියෙනවා. නමුත් පසුව ඔහු වැරදි මඟකට වැටී ඇති බවයි අහන්න ලැබුණෙ. දෙපාරක්ම හිරේ ගිහින් තියෙනවා. එක සැරයක් හොරකමකට. දෙවැනි සැරේ තවත් ඉතාලි කාරයෙකුට පිහියෙන් ඇනල. ඔහුට ඉතා හොඳින් ඉංග්‍රීසි

http://sherlockholmesinvestigations.blogspot.com

කථාකරන්න පුළුවනි. ඔහු පිළිම බිඳීමට හේතුව නම් කිසි කෙනෙක් දන්නෙ නෑ. ඒ ගැන අහන ප්‍රශ්න වලට ඔහු කිසි උත්තරයක් දෙන්නෙත් නෑ. නමුත් පොලිසියට දැනගැනීමට හැකිවුණා, ඔහු කාලයක් ගෙල්ඩර් සහ සමාගමේ සේවය කරල තිබෙන බව. ඒ නිසා මේ පිළිම බාග වෙලාවට ඔහුයේ දෑතින්ම හැදූ ඒවා වෙන්නත් පිළිවන්."

මේ තොරතුරු බොහොමයක් අප කලින් ද දැන සිටි ඒවා විය. ලෙස්ට්‍රේඩ් අසතුටු කිරීමට කැමැති නොවූ හෝම්ස්, ඒවාට නිහඬව සවන් දුන්නේය. එහෙත් හෝම්ස්ගේ කල්පනාව යොමුවී තිබුණේ වෙනතකට බව, මම මඳ වෙලාවක් යද්දී දුටුවෙමි. යම්කිසි සිදුවීමක් බලාපොරොත්තුවෙන් මගේ මිත්‍රයා සිටියේ නොඉවසිල්ලෙනි. මගේ නිගමනය නිවැරදි බව හඟවමින්, මිනිත්තු කිහිපයකට පසු අපේ සීනුව නාද විය.

කිසිවෙකු අපේ තරප්පු පෙළ නැග උඩුමහලට එන අඩි ශබ්දය අසන්නට ලැබිණි. රතු පැහැ ගැන්වුණු මුහුණක් සහ ඉදුණු රැවුලක් ඇති වයස්ගත මහත්මයෙකු අපේ විසිත්ත කාමරය තුළට පිවිසුණේය. ඔහුගේ අතේ පැරණි තාලේ බෑගයක් විය. ඔහු එය මේසය මත තැබුවේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා මෙතැන ඉන්නවද?"

සිනාවක් පෑ මගේ මිත්‍රයා හිස නමා ආචාර කළේය.

"රීඩිං නගරයේ සැන්ඩිෆෝඩ් මහත්මයා ඔබ නේද?"

"ඔව් මහත්මයා. මං ටිකක් ප්‍රමාද වුණා. ඒ ගැන කණගාටුයි. දුම්රිය ප්‍රමාද වුණා මහත්මයා. ඔබ මට ලියල එවල තිබුණා, මා ළඟ තිබෙන පිළිමයක් ගැන?"

"හරියට හරි."

"මේ තියෙන්නේ ඔබේ ලියුම . . . .ඔබ ඒකෙ කියනවා . . . . . *ඩෙවින්ගේ නැපෝලියන් ප්‍රතිමාවේ අනුරුවක් සොයමින් සිටිමි. ඔබ ළඟ ඇති එම ප්‍රතිමාව මට ලබාදිය හැකි නම්, පවුම් දහයක් ගෙවීමට මම සූදානම් . . . .*"

ඒක හරිද මහත්මයා?

http://sherlockholmesinvestigations.blogspot.com

"සත්තකින්ම ඔව්."

"ඔබේ ලියුම ලැබුණාම මං හරිම පුදුමයකට පත්වුණා. මා ළඟ එවැන්නක් තිබෙන බව ඔබ දැනගත්තේ කොහොමද කියල මට හිතාගන්නවත් බැරිවුණා."

"ඔව්, ඔබ පුදුම වෙන්න ඇති. නමුත් හාඩිං සහෝදරයින්ගේ සාප්පුවෙන්, මට දැනගැනීමට හැකිවුණා, පිළිමයක් ඔබට විකිණුු බව. ඔබේ ලිපිනය මට ලබා දුන්නේ ඒ සාප්පුවෙන්."

"හැබැට? මං ඒකට ගෙවූ මුදල කීයද කියලා ඔවුන් ඔබට කිව්වද?"

"අනේ නෑ."

"මහත්මයා මං පොහොසතෙක් නොවුණත් අවංක කෙනෙක්. මං ඒකට ගෙව්වේ සිලිං පහළොවයි. ඔබෙන් පවුම් දහයක් අරගන්න කලින් මං ඒක කියල හිටින්න ඕන."

"ඔබේ අවංකකම ගැන, මං ඔබට ගෞරව කරනවා සැන්ඩිෆෝඩ් මහත්මයා. ඒ වුණත් මං පවුම් දහයක් ගෙවනවා කිව්වොත් ඒකෙ වෙනසක් කරන්නෙ නෑ."

"ඔබ ඉතාම ත්‍යාගශීලීයි හෝම්ස් මහත්මයා. මෙන්න ඔබ ගේන්න කිව් විදියට මං ඒ පිළිමය අරගෙන ආවා. මේ තියෙන්නෙ!"

පැවසූ ඔහු මල්ල හැර, එය තුළ තිබූ පිළිමය එළියට ගෙන, එය මේසය මත තැබීය. මෙතෙක් කිහිප වතාවක්ම, කැබලි ලෙස අප දුටු එය, සම්පූර්ණ නොබිඳුණු පිළිමයක් ලෙස මුල්වරට දුටුවෙමු.

හෝම්ස් ඔහුගේ සාක්කුවෙන් කඩදාසියක් හා පවුම් දහයේ නෝට්ටුවක් එළියට ගත්තේය.

"සැන්ඩිෆෝඩ් මහත්මයා, මං බොහොම ක්‍රමානුකූලව වැඩ කරන කෙනෙක්. ඒ නිසා ඔබ සන්තකයේ තිබූ මේ ප්‍රතිමාව පිළිබඳව අයිතිවාසිකම් සියල්ලම, මා වෙතට පවරනවා කියල ලියන්න. ඊළඟට මේ සාක්ෂිකාරයින් ඉදිරිපිටදී ඒකට අත්සන් තබන්න. අපි කිසි කෙනෙක් දන්නෙ නෑ මේ වගේ වෙළඳාම් පස්සේ මොන අතකට හැරේද කියලා.

http://sherlockholmesinvestigations.blogspot.com

අන්න හරි. බොහොම ස්තුතියි. සැන්ඩිෆෝර්ඩ් මහත්මයා. මෙන්න මං ඔබට පොරොන්දු වූ පවුම් දහයේ මුදල. එහෙනම් ඔබට ශුභ සන්ධ්‍යාවක් මහත්මයා."

අපේ අමුත්තා පිටත්වී ගියේය. හෝම්ස් ඊළඟට කිරීමට සැරෙන්නේ කුමක්දැයි අපි බලා සිටියෙමු. මුලින්ම ඔහු පිරිසිදු සුදු රෙද්දක් ගෙන, එය මේසය මත එළීය. ඉන්පසු අලුතෙන්ම මිලට ගත් ප්‍රතිමාව ඒ මැදින් තබන ලදී. ඊළඟට ලෝහ ආයුධයක් අතට ගත් හෝම්ස්, එක්වරම පිළිමයේ හිසට වේගවත් පහරක් එල්ල කළේය. පිළිමය කැබැලි කිහිපයකට බිඳිණි. අනතුරුව එම කැබැලි හෝම්ස් ඉතා උනන්දුවෙන් පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. ඊළඟ මොහොතේ ඔහු නැගිට්ටේ ජයග්‍රාහී හඬක් නංවමිනි. පිළිමයෙන් බිඳුනු බදාම කැබැල්ලක් අතට ගත් ඔහු, එය අප දෙසට හැරෙව්වේය. පුඩිමක් මැද රැඳවූ ප්ලම් ගෙඩියක් මෙන්, බදාම කැබැල්ල මත කළු පැහැයෙන් දිලිසෙන කුඩා බෝලයක් විය.

"මහත්වරුනි, ඔබට ඉතාම විශිෂ්ට දෙයක් ප්‍රදර්ශනය කිරීමට, දෙන්න මට අවසර! මේ තමයි බෝගියාස්හි සුප්‍රසිද්ධ කළු මුතු ඇටය!"

ලෙස්ට්‍රේඩ් සහ මම තුෂ්නිම්භූත වී බලා සිටියෙමු. ඊළඟට අප දෙදෙනා අත්පොළසන් දීමට පටන් ගත්තේ නිරායාසයෙනි. ඒ කදිමට අවසන් වූ නාටකයකින් මහත් සතුටට පත් ප්‍රේක්ෂකයින් තම හැඟීම් නළුවන් වෙත පළකරන අයුරෙනි. හෝම්ස්ගේ සුදුමැලි මුහුණ රතු විය. ඔහු හිස නමා අපට ප්‍රතිආචාර දැක්වූයේ ප්‍රේක්ෂකයන්ගේ ආචාරය නිහතමානීව පිළිගන්නා නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා ලෙසයි. තර්ක-විතර්ක වල යෙදෙන මිනිස් යන්ත්‍රයක් බඳු හෝම්ස්, මිනිස් ගුණාංග වලින් සැදුණු හැඟීම්බර කෙනෙකු බවට පත්වන්නේ එවැනි මොහොතකයි.

"ඔව් මහත්වරුනි, ලෝකයේ දැනට තිබෙන සුප්‍රසිද්ධම මුතු ඇටය මේකයි. ඩැක්‍රේ හෝටලයේ කොලෝනාහි රාජකුමාරයාගේ නිදන කාමරයේදී අතුරුදන් වූ මේ මුතු ඇටය, ගෙල්ඩර් සහ සමාගමෙන් සෑදූ පිළිම හයෙන් අන්තිම පිළිමයේ තිබී සොයා ගැනීමට හැකිවීම මගේ භාග්‍යයක්.

http://sherlockholmesinvestigations.blogspot.com

ලෙස්ට්‍රේඩ් ඔබට මතකද මේ ඉතා වටිනා මාණික්‍යය අතුරුදන් වීමෙන් ඇතිවුණු මහා කලබැගෑනිය? ඊළඟට ලන්ඩන් පොලීසිය එය සොයාගන්නට දැඩි උත්සාහයක යෙදී, ඒ හැම එකක්ම අසාර්ථක වූ හැටි? මේක හොයා දෙන්න කියලා මගෙනුත් ඉල්ලා හිටියා. නමුත් ඒ ගැන කිසිම කරුණක් හෙළිකරගන්න මමත් අසමත් වුණා. මෙය අතුරුදන්වීම ගැන සැකය යොමුවුණේ රජකුමාරියගේ සේවිකාව වෙතයි. ඇය ඉතාලි ජාතික තරුණියක්. ඇයගේ සහෝදරයෙක් ලන්ඩනයේ වාසය කරන බවත් දැනගන්න ලැබුණා. නමුත් ඔවුන් දෙදෙනා අතර කිසිම සම්බන්ධයක් තිබූ බව ඔප්පු කිරීමට අප සමත්වුණේ නැහැ.

ඒ සේවිකාවගේ නම ලුක්රේෂියා වෙනුසි. මට කිසිම සැකයක් නෑ, දින දෙකකට පෙර මියගිය පියෙට්‍රෝ වෙනුසි ඇගේ සොහොයුරා. මං මගේ පරණ ලියකියවිලි හා පුවත්පත් වල දිනවකවානු පරීක්ෂා කර බැලුවා. මුතුඇටය හෝටලයේදී අතුරුදන්වෙලා තියෙන්නේ බෙපෝ අත්අඩංගුවට ගන්න දින දෙකකට කලින්. ඒ අර පිහියා ඇනුමෙන් පස්සේ. අත්අඩංගුවට ගැනීම සිදුවෙද්දී මේ නැපෝලියන් ප්‍රතිමා නිෂ්පාදනය වෙමිනුයි තිබුණේ. දැන් ඔබට පෙනෙනවාද මේ සිදුවීම් වුණු අනු පිළිවෙළ?

ලුක්රේෂියා වෙනුසි හෝටල් කාමරයෙන් මුතු ඇටය හොරකම් කළා. ඇය ඒක පියෙට්‍රෝ වෙනුසිට ලැබෙන්න සැලැස්සුවා. ඊළඟට මුතුඇටය බෙපෝ අතට පත්වුණා. එක්කෝ ඔහු මුතුඇටය පියෙට්‍රෝගෙන් හොරකම් කළා, නැත්නම් ඔහු පියෙට්‍රෝගේ විශ්වාසවන්ත මිතුරා වෙන්නත් ඇති. එහෙමත් නැත්නම් ඔහු පියෙට්‍රෝ හා ලුක්රේෂියා අතර පණිවුඩ හුවමාරු කළ පුද්ගලයා වෙන්නත් පුළුවනි. ඒ කවුරු වුණත් බෙපෝ ළඟ මැණික තිබුණා.

පොලීසිය ඔහු ලුහුබැඳ එද්දිත් මැණික ඔහු ළඟ. පොලීසියෙන් එළවාගෙන එද්දී ඔහු එහාම ආවා තමන් රැකියාව කළ කර්මාන්ත ශාලාවට. ඔහු දන්නවා මේ වටිනා දේ හංගන්න ඕන. ඔහුට ඒ සඳහා තියෙන්නේ මිනිත්තු කිහිපයයි. නැත්නම් පොලීසියෙන් ඔහුව සෝදිසි කළාම මේක අහුවෙනවා. පැරිස් බදාමයෙන් නිම කළ නැපෝලියන් ප්‍රතිමා හයක්, බඩාදයේ තබා තිබුණා වියළීම සඳහා. ඉන් එකක් තවමත් තෙත, මෘදු බදාම. බෙපෝ දක්ෂ වැඩකාරයෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු එක් ක්ෂණයකින් තෙත පිළිමයේ සිදුරක් හදල, මැණික ඇතුළට දමලා, සිදුර බදාම ටිකකින් වැහුවා. ඒක මැණික හැංගීමට විශිෂ්ට තැනක්. කිසිකෙනෙකුට හොයන්න බෑ.

නමුත් ඊළඟට මොකක්ද සිදුවුණේ? පොලීසියෙන් අත්අඩංගුවට ගත් බෙපෝ අවුරුද්දකට හිරේට නියම වුණා. මේ අතරේ පිළිම හය ලන්ඩන් නගරයේ විවිධ පෙදෙස්වලට විකිණී ගියා. එළියෙන් බලා ඔහුට කියන්න බැහැ මැණික හංගලා තියෙන්නේ මොන පිළිමයේද කියලා. පිළිමය සොලවීමෙන්වත් එය කියන්න බැහැ. ඒ මොකද මැණික පැරිස් බදාමයට තදින් හිරවී සිටින නිසා. ඒ නිසා මැණික තියෙනවාද බලන්න ඔහුට පිළිම කඩාබිඳ දමන්න සිදුවුණා.

නමුත් බෙපෝ අධෛර්යයට පත්වුණේ නැහැ. ඔහු මැණික ගැන සෝදිසිය ඉතා දක්ෂ ලෙස නොකඩවා කරගෙන ගියා. ගෙල්ඩර් ආයතනයේ සේවය කළ ඔහුගේ ඥාති සොහොයුරාගේ මාර්ගයෙන් බෙපෝ හොයාගත්තා පිළිම හය විකුණලා තිබෙන්නේ කුමන තැන්වලටද යන්න. ඊළඟට මෝර්ස් හඩ්සන් ආයතනයේ රැකියාවක් ලබාගෙන, ඔවුනට ලැබුණු පිළිම තුන විකුණුවේ කාටද යන්නත් හොයා ගත්තා. මැණික ඒ එකකවත් තිබුණේ නැහැ. ඊළඟට තවත් ඉතාලි ජාතිකයෙකුගේ උදව්වෙන් හාඩිං සමාගමේ පිළිම තුන මිලට ගත් අය ගැනත් තොරතුරු සොයාගත්තා. පළමුවැනි එක හාකර් ළඟ. බෙපෝ එතැනට යද්දී ඔහුගේ ආධාරකාරයා පිටුපසින් ආවා. මැණික නැතිකිරීම ගැන පියට්‍රෝ, බෙපෝට චෝදනා කරන්න ඇති. එතැනදී ඇතිවුණු සණ්ඩුවේදී බෙපෝ අනෙකාට පිහියෙන් ඇන්නා."

"පියට්‍රෝ ආධාරකාරයා නම් ඇයි බෙපෝගේ ඡායාරූපයක් පියට්‍රෝගේ සාක්කුවේ තිබුණේ?"

"හිරගෙදර අවුරුද්දක් ඉඳල ආව බෙපෝ බාගවෙලාවට ඉතාලි ජනාවාසය පැත්තෙ යන්න නැහැ. කොහොම හරි ඔහු පියට්‍රෝව මගහරින්න ඇති. ඡායාරූපය මිනිසුන්ට පෙන්වමින්, බෙපෝ ඉන්න තැනක් හොයන්න පියට්‍රෝ උත්සාහ කරන්න ඇති. පැහැදිලිව පෙනෙන කරුණ එයයි.

මිනීමැරුම සිදුවුණාට පස්සෙ බෙපෝ තමන්ගේ ගවේෂණ කටයුතු, තවත් ඉක්මන් කරනවා මිස කල් දමන එකක් නැහැ

http://sherlockholmesinvestigations.blogspot.com

කියලා මං නිගමනය කළා. ඔහු හිතුවුණා පොලිසිය ඔහුගේ රහස හෙළිකර ගනීවි කියාල. ඒ නිසා ඔහු තීරණය කරන්න ඇති, වඩාත් ඉක්මන් වීම නුවණට හුරුයි කියන එක. හාකර්ගේ නිවසේ තිබුණු පිළිමය බිඳලා, ඔහු මුතු ඇටය සොයාගත්තද නැද්ද කියන එක මං හරියටම දැන හිටියෙ නෑ. මෙතනදී ඔහු හොයන්නේ මුතු ඇටයක්ද මොකක්ද කියන එකවත් මං හරිහැටි දැන හිටියෙ නෑ. නමුත් ඔහු යමක් හොයන බව නම් මං තේරුම් ගත්තා. ඒ මොකද ඔහු අඳුරේම පිළිමය බිඳ දමන්නේ නැතිව, හොඳින් එළිය තිබුණු ගෙයක් ළඟට එය ඔසවාගෙන ගොස් තිබුණු නිසා.

හාකර් ළඟ තිබුණු පිළිමය, පිළිම තුනෙන් එකක් නිසයි මං ඔබට කිව්වේ, ඔහු විස්වික් වලට ඒමට තියෙන්නේ 33%ක ඉඩක් පමණයි කියලා. හාකර්ගේ පිළිමයේ තිබි මුතුඇටය ඔහුට හමු නොවුණා නම්, ඔහු ඊළඟට එන්නේ විස්වික් වලට. ඒ මොකද, ඒක ලන්ඩන් නගරයට සමීප නැති නිසා. මං එහි නිවැසියන්ට දැනුම් දුන්නා, සිදුවීමට ඉඩ ඇති දෙයත්, ප්‍රවේශම් වියයුතු ආකාරයත්. ඒ තවත් ඛේදජනක සිදුවීමක් වීමට ඇති ඉඩ වළක්වන්න. ඉතිං අපි විස්වික් වලට ගියා. සතුටුදායක ප්‍රතිඵල ලබා ගත්තා. මේ වනවිට මං හොඳින් දැනහිටියා අප සොයමින් යන්නේ බෝර්ගියා මුතු ඇටය බව. මැරුම් කෑ පියෙට්‍රෝ වෙනුපි මේ සිද්ධින් එකට සම්බන්ධ කළ පුරුක වුණා. ඉතුරු වෙලා තිබුණේ එක පිළිමයයි. ඉතිං මුතු ඇටය එහි තිබිය යුතුමයි. මං ඒක නිසා පිළිමය මිලට ගත්තේ ඔබ ඉදිරිපිට."

"හෝම්ස් මහත්තයා. ඔබ මහ සංකීර්ණ ගැටලු දක්ෂ ලෙස විසඳූ අවස්ථා ගණනාවක් මං දැක තිබෙනවා. ඒත් මේ තරම් විශිෂ්ට ලෙස විසඳූ පරීක්ෂණයක් ගැන මට මතක් කරන්නවත් බෑ. ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසියේ අපි ඔබේ හපන්කම් ගැන ඊර්ෂ්‍යාවක් නැහැ මහත්මයා. අපි ඔබ ගැන ආඩම්බරයි. ඔබ හෙට අපේ පොලිස් මූලස්ථානයට ආවොත්, කනිෂ්ඨම පොලිස් භටයාගේ සිට, ඉහළම පොලිස් නිලධරයාට යනතුරු, හැමදෙනෙක්ම අතිශයින් සතුටුවේවි, ඔබට අත්ට අත දීලා මිත්‍රත්වය පළ කරන්න අවස්ථාවක් ලැබෙනවා නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම ස්තූතියි ලෙස්ට්‍රේඩ්, බොහොම ස්තූතියි." තමාගේ සේවය අගය කිරීම ගැන සංවේදී බවක් දැක්වූ හෝම්ස්ගේ සිත වෙන කවරදාටත් වඩා සසල වී ඇතිබැව් මම වටහා ගතිමි.

"මුතු ඇටය යකඩ සේප්පුවේ තැන්පත් කරන්න වොට්සන්. ඊළඟට කොන්ක් - සිංගල්ටන් හොර නෝට්ටු සිද්ධියට අදාළ ලියකියවිලි එළියට ගන්න. එහෙනම් ඔබට ආයුබෝවන් ලෙස්ට්‍රේඩ්. ඔබේ රාජකාරියේ ගැටලු පැන නැඟුණොත් මෙහේ එන්න. ඔබට එය විසඳීමට උපදෙසක් හෝ දෙකක් දෙන්න මං ඕනෑම විටෙක සූදානම්."

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# රගර් ක්‍රීඩකයාගේ කථාන්තරය

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



# රගර් ක්‍රීඩකයාගේ කථාන්තරය

"මා බලාපොරොත්තුවෙන් සිටින්න. මහා අවාසනාවන්ත සිදුවීමක්. දකුණේ විං ත්‍රී ක්වෝටර් අතුරුදන් වී ඇත. හෙට නැතුවම බැහැ. ඕවටන්"

පැටලිලි සහගත පණිවුඩ රැගත් විදුලි පුවත්, බේකර් වීථියේ අපේ නිවහනට ලැබී ඇත්තේ වරක් දෙවරක් නොවේ. එහෙත් අවුරුදු හත අටකට පෙර, පෙබරවාරි මාසයේ අඳුරු උදෑසනක ලැබුණු මේ විදුලි පුවත, තේරුම් ගැනීමට ඉතා අසීරු වූ එකක් ලෙස මට මතක ඇත. එය එවා තිබුණේ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් නමටයි. එහි තේරුම කුමක්දැයි වටහා ගැනීමට පැය කාලක් තිස්සේ බලවත් උත්සාහයක් දැරීමට මගේ මිත්‍රයාට සිදුවිය.

"මේක එවන්න භාරදුන්නු කාර්යාලය ලෙස සඳහන් වෙලා තියෙන්නේ ලන්ඩනයේ ස්ට්‍රෑන්ඩ් තැපැල්හල. එවලා තියෙන්නේ උදේ දහයයි තිස් හයට." හෝම්ස් කීවේ විදුලි පුවත තවත් වාරයක් පරීක්ෂා කර බලමිනි.

"මේක එවන වෙලාවෙ ඕවුටන් මහත්මයා, බොහොම ලොකු මානසික කැළඹීමකට පත්වෙලා හිටි බව පැහැදිලියි. ඒ නිසාම ඔහු යොදලා තියෙන්නෙ එකකට එකක් නොගැළපෙන වාක්‍ය. කමක් නෑ. මම ටයිම්ස් පත්තරේ ටිකක් පෙරළලා බලල ඉවර වෙද්දි ඔහු මෙහේට ඒවි. මේ දවස්වල කාලය ගතවෙලා යන්නෙ කිසිම පරීක්ෂණයක් නැතුව හේ බොට්ටන්. ඒ නිසා කොයිතරම් සුළු ගැටලුවක් වුණත් කමක් නෑ, ලැබෙනව නම් ලොකු සතුටක්."

මෑත කාලයේ අප වෙත විසඳීම සඳහා ගැටලු ලැබුණේ මඳ වශයෙනි. මෙවැනි අක්‍රිය කාල පරිච්ඡේද මා සිතේ ඇති කළේ දැඩි භීතියකි. මගේ මිත්‍රයාගේ මොළය ඉතා අසාමාන්‍ය අයුරින් වේගවත්ව ක්‍රියාකරන එකකි. එම ක්‍රියාකාරිත්වය සඳහා ඉන්ධන ලෙස

http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රමාණවත් තරම් ගැටලු නොලැබුණහොත්, ඇතිවෙන ප්‍රතිඵල භයානක බව මම දන සිටියෙමි. ඒ නිසා මේ මවටත් කවුරු හෝ වේවා මම ඔහුට සිතෙන් ආශිර්වාද කළෙමි.

අප බලාපොරොත්තු වූ ලෙසම ඔහු ප්‍රමාද නොවී අපේ නිවහනට පැමිණියේය. ඔහුගේ ආගන්තුක පතේ මෙසේ සඳහන්ව තිබිණි.

සිරිල් ඕවර්ටන්
ත්‍රිත්ව විද්‍යාලය,
කේම්බ්‍රිජ්.

අපේ විසිත්ත කාමරයට පැමිණි තරුණයා යෝධයෙකු මෙන් උස මහත, මාංශපේශි මනාව වැඩුණු පුද්ගලයෙකු විය. එහෙත් ඔහුගේ මුහුණෙන් පළවූයේ, බරපතල සිත් කැළඹීමක ලකුණුයි. කාමරයට ඇතුළුවූ ඔහු අප දෙදෙනාගේම මුහුණු දෙස විමසිල්ලෙන් බැලුවේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා?"

මගේ මිත්‍රයා හිස නමා ආචාර කළේ, ඒ තමා බව හඟවමිනි.

"මං ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ අපරාධ පරීක්ෂණ අංශයටත් ගියා හෝම්ස් මහත්මයා. මට හමුවුණා, පොලිස් පරීක්ෂක ස්ටැන්ලි හොප්කින්ස්. ඔහු මට උපදෙසක් දුන්නා ඇවිත් ඔබව හමුවෙන්න කියල. ඔහු කියනවා ඔහුට පෙනෙන විධියට, මේක පොලීසියෙන් කළ යුතු පරීක්ෂණයකට වඩා, ඔබ විසඳන තාලේ ගැටලුවක්ලු."

"කරුණාකරල මෙහෙන් වාඩිවෙන්න, මහත්මයා. මට කියන්න ඔබ මුහුණදී තිබෙන ප්‍රශ්නය මොකක්ද, කියල."

"මහා අද්භූත සිදුවීමක් හෝම්ස් මහත්මයා. ඉතාමත් පුදුමාකාරයි. මට පුදුම මගේ කොණ්ඩෙ සුදු නොවී, තවමත් කළුවට ඉතිරි වෙලා තියෙන්නෙ කොහොමද කියලා. කිසිම සැකයක් නෑ, ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් ගැන ඔබ අහල ඇති. එහෙම නේද. අපේ මුළු කණ්ඩායමම ක්‍රියාත්මක වෙන්නෙ ඔහු වටා. ඔහු තමයි අපේ කණ්ඩායමේ ඉස්අරහ පෙරෝදය. කණ්ඩායමේ ජීවය ඔහුයි. ගොඩ්ෆ්‍රිව කණ්ඩායමේ රඳවාගන්න, වෙන කොල්ලො දෙන්නෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

අයින් කරන්න වුණත් මං සූදානම්. අපේ කණ්ඩායමේ තුන් ඉරියව්වේම කැපී පෙනෙන ක්‍රීඩකයා ඔහුයි. දක්ෂකමින් ගොඩ්ෆ්‍රිට කිට්ටුවෙන්න පුළුවන් කිසිකෙනෙක් නෑ. ඒ වගේමයි ඔහුගේ තිබෙන නොසැලෙන භාවය. මොන තර්ජනයක් එල්ල කරන ප්‍රබලම කණ්ඩායමක් ඉදිරියේ වුණත්, ගොඩ්ෆ්‍රි නෙමෙයි භය වෙන්නෙ. අපේ ක්‍රීඩකයන් පීඩනයකට යට නොවී, නිර්භයව තියා ගන්න පුළුවන් ඔහුට පමණයි. දැන් මං මොකක්ද කළ යුත්තේ, හෝම්ස් මහත්මයා? මුවර්හවුස් නම් ඉන්නවා, පළමු වැනි අතිරේක ක්‍රීඩකයා. නමුත් ඔහුව පුහුණු කරලා තියෙන්නෙ පසුපෙළ ප්‍රහාරක ක්‍රීඩකයෙක් හැටියට. බිම තැබූ පන්දුව පා පහරක් මගින් ඉහළින් යවන්න ඔහු දක්ෂයෙක් බව ඇත්තයි. ඒ වුණත් පන්දුව එන මාවත නිශ්චය කිරීම අතින් මුවර්හවුස් හොඳ මදි. ඊට වඩා දිවීම. මිනිහගෙ දිවීම නම් අන්තිම දුර්වලයි. ඔක්ස්ෆඩ් කණ්ඩායමේ මෝටන් හරි ජොන්සන් හරි, මුවර්හවුස් පස්සෙන් එළවා ගිහින් බොහොම ලෙහෙසියෙන් ඔහුව අල්ලා ගනීවි. ස්ටිවන්සන්ගේ දිවීම නම් බොහොම වේගවත්. හැබැයි මීටර විසිපහේ සීමාවේ ඉඳල ඈතට යන්න පන්දුව එල්ල කරන්න, ඔහුට හැකියාවක් නෑ. ඒ වැඩේ හරියට කරන්න බැරි කෙනෙකුට, දිවීමේ වේගය නිසාම කණ්ඩායමට ගන්න එක ලොකු පාඩුවක්. වැඩක් නෑ හෝම්ස් මහත්මයා. ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් හොයාගන්න බැරිවුණොත් නම් අපි ඉවරයි."

මෙම දීර්ඝ කථාවට මගේ මිත්‍රයා සවන් දීගෙන සිටියේ ඉමහත් විස්මයට පත්වයි. තරුණයා කථා කළේ දැඩි උද්වේගයකිනි. ඔහු තම හැඟීම් අවධාරණය කළේ, තම මිට මොලොවා ගත් දකුණතෙන් වරින්වර තමාගේම දණහිසට වේගවත් ප්‍රහාර එල්ල කරගැනීමෙනි. අපේ අමුත්තා නිහඬ වූ පසු හෝම්ස් පොත් රාක්කය වෙත ගියේය. තොරතුරු එක් රැස්කර තිබූ කෝෂ ග්‍රන්ථ වලින් "S" අකුර යටතේ වූ ග්‍රන්ථය හෝම්ස් අතට ගත්තේය.

"මහත්මයා මා ළඟ විස්තර තියෙනවා, ආතර් එච්. ස්ටෝන්ටන් - අර නැගී එන, තරුණ හොර සල්ලි අච්චු ගහන මිනිහා ගැන. ඊළඟට තියෙනවා හෙන්රි ස්ටෝන්ටන් ගැන තොරතුරු - මිනිහව එල්ලුම් ගස් යවන්න මාත් උදව් වුණා. ඒ වුණත් ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් කියන නම, මට සම්පූර්ණයෙන්ම අලුත් එකක්."

මෙවර පුදුමයට පත්වූයේ අපේ අමුත්තාය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා හෝම්ස් මහත්තයා? මං හිතුවා ඔබ මේවා දන්නවා ඇති කියලා. ඔබ ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් ගැන අහල නැත්නම් සිරිල් ඕවටන් ගැන වත් අහල නැද්ද?"

හෝම්ස් තම හිස දෙපසට සෙලවූයේ එය ද නොදන්නා බව හඟවමිනි.

"ඇයි දෙයියනේ!" ක්‍රීඩකයා කථා කිරීමට පටන් ගත්තේ මහත් කම්පාවෙනි.

"වේල්සයට එරෙහිව එංගලන්තයට නියෝජනය කළ කණ්ඩායමේ, මං පළමුවැනි අතිරේක ක්‍රීඩකයා හැටියට ක්‍රීඩා කළා නේ? මේ අවුරුද්ද පුරාම කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ රගර් කණ්ඩායමේ නායකත්වය දැරුවේ මමයි. ඒ වුණාට ඒක සුළු දෙයක්. මං හිතුවෙ නෑ, ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් ගැන අහපු නැති එක මනුස්සයෙක් මේ එංගලන්තයේ ඇති කියල. ත්‍රී ක්වෝටර් ස්ථානයේ ක්‍රීඩාකරන අතිදක්ෂම ක්‍රීඩකයා ඔහුයි. බ්ලැක්හීත් ප්‍රාදේශීය කණ්ඩායම, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයීය කණ්ඩායම, අන්තර් ජාතිකව තරඟ වදින කණ්ඩායම් පහක් නියෝජනය කරන එකම ක්‍රීඩකයා ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන්. දෙයියෝ සාක්කි හෝම්ස් මහත්මයා, ඔබ මෙච්චර කාලයක් ජීවත් වුණේ කොහේද?"

තරුණයා මවිතයට පත්වූ අයුරු දුටු හෝම්ස්ට සිනා පහළ විය.

"ඔබ ජීවත්වෙන්නේ, මං ජීවත්වෙන ලෝකයට වඩා වෙනස් ලෝකයක, ඕවටන් මහත්මයා. ඔබේ ලෝකය බොහොම සෞඛ්‍ය සම්පන්න, සතුටෙන් පිරුණු එකක්. එංගලන්තයේ තිබෙන වැදගත්ම, අනර්ඝතම ක්ෂේත්‍රයක් එයමයි. නමුත් මගේ ලෝකය ඊට වඩා හාත්පසින්ම වෙනස් එකක්. මගේ හස්තය දිගුවෙනවා, සමාජයේ විවිධ තරාතිරම වල, විවිධ ජන කොට්ඨාශ වලට. ඒත් මං සන්තෝසයි කියන්න, ආධුනික ක්‍රීඩා ක්ෂේත්‍රයට අත පොවන්න මට සිදුවෙලා නෑ. ඒ වුණත් ඔබේ මේ හදිසි පැමිණීමෙන් පෙනෙන්නේ, නැවුම් වාතය හා සාධාරණත්වය රජකරන ක්‍රීඩා ලෝකයේත්, මා මැදිහත් විය යුතු ප්‍රශ්නයක් මතු වෙලා වගෙයි.

ඉතින් මගේ හිතවත් මහත්මයා. මං ඔබෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඔය පුටුවෙ වාඩිවෙන්න. ඊළඟට කලබල නොවී,

http://sherlockholmesinvestigations.blogspot.com

මට පැහැදිලිව කියන්න සිද්ධ වෙලා තියෙන්නෙ මොනවද කියලා. ඊට පස්සේ මට කියන්න මං ඔබට උදව් කළ යුත්තේ මොන ආකාරයටද කියලා?"

"ඒක මෙන්න මේ විදියටයි සිදුවුණේ, මහත්මයා. මං කලිනුත් කිව්වා වගේ, කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ රගර් කණ්ඩායමේ නායකයා මමයි. මගේ කණ්ඩායමේ ඉන්න, අංක එකේ විශිෂ්ටතම ක්‍රීඩකයා තමයි ගොඩ්ෆ්‍රි ස්ටෞන්ටන්. අපි ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය එක්ක පවත්වන මහා රගර් තරඟය පැවැත්වීමට නියමිත හෙටයි. අපි කේම්බ්‍රිජ් නගරයෙන් පිටත්වෙලා, ලන්ඩන් නගරයට ආවෙ ඊයෙ. ඒ ඇවිත් අපි බෙන්ට්ලි පෞද්ගලික හෝටලයේ නවාතැන් ගත්තා. රෑ දහය වෙනකොට අපේ ක්‍රීඩකයෝ නින්දට ගියාද කියලා පරීක්ෂා කරලා බලන්න මං ඒ පැත්තට ගියා. ඒ මොකද මං ඔවුන්ගෙන් දැඩි විනයක් බලාපොරොත්තු වෙනවා. පුහුණුවීමේ කටයුතු තැපවීමෙන් කළ යුතුයි. ඒ වගේම ප්‍රමාණවත් තරම් නින්දක් මගින් හොඳ විවේකයක් ලබාගත යුතුයි. ගොඩ්ෆ්‍රි ඇඳට යන්න කලින් මං ඔහු සමගත් වචනයක් දෙකක් කතා කළා. මට පෙනුණා ඔහුගේ මුහුණේ කැළැඹුණු, ඒ වගේම සුදුමැලි ගතියක්. මං ඇහුවා ඔහුට මොකුත් ප්‍රශ්නයක් තියෙනවද කියලා. ඔහු කිව්වා, සුළු හිස කැක්කුමක් තියෙනවා ඒ හැර වෙන කරදරයක් නැති බව. ඉතින් මම ඔහුට සුභ රාත්‍රියක් පතා, පිට වී යන්න ගියා.

මීළඟට සිදුවුණු දෙය මට පසුව දැනගන්න ලැබුණේ හෝටලයේ සේවකයාගෙන්. මුහුණ පුරා රැවුලක් වැවුණු, මහා වණ්ඩි පෙනුමක් තිබූ කෙනෙක් ඇවිත් තියෙනවා, ගොඩ්ෆ්‍රිට ලියුමක් අරගෙන. මේ වෙනවිටත් ගොඩ්ෆ්‍රි නින්දට ගිහින් හිටියෙ නැතිලු. ඒ නිසා ලියුම ඔහුගේ කාමරයට ගෙනගොස් දුන්නාලු. ඒක කියවූ ගොඩ්ෆ්‍රි කපා හෙළූ ගසක් වගේ පුටුවක් මතට ඇද වැටුණාලු. හෝටලේ සේවකයා කොයිතරම් භීතියට පත්වුණාද කිව්වොත්, ඔහු එවෙලේම මා කැඳවාගෙන එන්න සූදානම් වුණාලු. නමුත් ගොඩ්ෆ්‍රි ඒකට ඉඩදීල නැහැ. ඊළඟට වතුර ටිකක් ඉල්ලාගෙන බිව් ඔහු, මඳ වේලාවක් ගතවෙද්දී සෑහෙන තරම් සතුටුදායක තත්ත්වයට පත්වුණාලු. ඊට පස්සේ ගොඩ්ෆ්‍රි පහළ තට්ටුවට බැස ආවලු. අර ලියුම අරගෙන ආව මිනිහා මේ වනතුරුත් රැඳී ඉඳල තියෙන්නේ හෝටලයේ විසිත්ත කාමරයේ. පහළ තට්ටුවට බැහැලා ආ ගොඩ්ෆ්‍රි, ඒ මිනිහා

http://sherlockholmesinvestigations.blogspot.com

සමග වචන කිහිපයක් කථා කරලා, සුහුව දෙදෙනාම හෝටලයෙ
පිටවී ගියාලු. හෝටලේ සේවකයා ඉදිරි දොර ඇරගෙන, එළිය
බැහැලා බලා ඉඳල තියෙනවා. ඔහු අන්තිමට දැක්කේ අර දෙන්
දුවන තරම් වේගයෙන් ස්ට්‍රැන්ඩ් පැත්තට ඇවිද යන බවයි.

අද උදේ මම ගිහින් බලන කොට ගොඩ්ෆ්‍රිගේ කාමරය හි
ඊයේ රාත්‍රී ඔහු ඇඳේ නිදාගත් බවට ලකුණක්වත් නෑ. ඔහුගේ
බඩුබාහිරාදිය සියල්ලක්ම, මං ඊයේ රෑ දුටු විදියට එහෙමම තිබුණ
ඔහු මේ නාඳුනන පුද්ගලයා සමග පිටවී ගිහින් තියෙන්නේ යම්කි
පණිවුඩයක් ලැබී, ඒ සැණෙන්. ඊට පස්සේ ඔහු ගැන කිසි
ආරංචියක් නෑ. මං හිතන්නේ නෑ ඔහු ආපහු ඒවි කියල. ගොඩ්
වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ක්‍රීඩකයෙක්. ඒ ගතිගුණ ඔහුගේ
ශරීරයේ ඇටමිදුළු වලට කා වැදී තිබුණා. මං හිතන්නේ නෑ, මහ
බරපතල ප්‍රශ්නයක් නොවෙයි නම්, ඔහු කිසිවිටෙකත් තමන්ගේ
නායකයා හා කණ්ඩායම අමාරුවේ වැටෙන්න ඉඩහැර පැනය
කෙනෙක් කියලා. ඒ ඔහුට විසඳාගන්න බැරි, අන්තිම දරුණු
ප්‍රශ්නයක් වියයුතුයි හෝම්ස් මහත්මයා, මට හිතෙනවා ඔහු ආප
නොඑන්නට ගිහිං කියලා. මං හිතන්නෙ නෑ අපට ආයෙ කවදාව
ඔහුව දකින්න ලැබේවි කියල."

මෙම අද්භූත කථාවට ෂර්ලොක් හෝම්ස් සවන්දීගෙන සිටි
මහත් උනන්දුවකිනි.

"ඔබ ඉතින් මොනවද කළේ?"

"මං කේම්බ්‍රිජ් වලට විදුලි පුවතක් යැව්වා, ඔහු ගැන ආරංචිය
එහේට ලැබිලද කියල බලන්න. ඒකට පිළිතුරක් ආවා. ඔහු ගැ
එහේට කිසිම ආරංචියක් නෑ."

"ඔහු ආපසු කේම්බ්‍රිජ් වෙත පිටත්වී ගියා වෙන්න බැරිද
"ඔව්. රෑ එකොළහයි කාලට ලන්ඩනයෙන් කේම්බ්‍රිජ් බ
යන දුම්රියක් තියෙනවා."

"නමුත් ලැබී ඇති සාක්ෂි වල හැටියට ඔහු ඒකෙ ගිහිල්
නෑ. එහෙමද?"

"ඒකෙ ගිහිනුත් නෑ. ඔහුව දැකපු කෙනෙකුත් නෑ."

"ඔබ ඊළඟට මොකක්ද කළේ?"

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

"මං මවුන්ට් ජේම්ස් සාමිවරයාට විදුලි පුවතක් යැව්වා."

"ඇයි මවුන්ට් ජේම්ස් සාමිට?"

"ගොඩ්ෆ්‍රි අනාථයෙක්. ඔහුගේ මවත් පියාත් මියගිහින් තිබෙන්නේ ඔහු කුඩා කාලයේදීමයි. මවුන්ට් ජේම්ස් සාමි තමා ඔහුගේ ළඟම ඥාතියා. මං දන්න හැටියට ඔහු ගොඩ්ෆ්‍රිගේ මාමා."

"හැබෑට? ඔබ ඒ බව කිව්වාම මේ ගැටලුවේ අඳුරු බව මකාලන්න යම්කිසි ආලෝකයක් ලැබෙනවා. මවුන්ට් ජේම්ස් සාමි කියන්නේ, එංගලන්තයේ ඉන්න අතිශයින්ම ධනවත් පුද්ගලයන්ගෙන් කෙනෙක්."

"ගොඩ්ෆ්‍රි එහෙම කියනවා මං අහල තියෙනවා."

"මේ දෙන්නා ළඟම ඥාතීන්ද?"

"ඔව්, සාමිවරයාගේ ධනස්කන්ධයේ මීළඟ උරුමකාරයා තමා ගොඩ්ෆ්‍රි. වයසක මනුස්සයා අවුරුදු අසූවක කෙනෙක්. ඔහු සන්ධිගත රෝගවලින් දරුණු ලෙස පීඩා විඳින කෙනෙක්. ඔහු දැඩි ලෝභකමින් පිරුණු මනුස්සයෙක්. ගොඩ්ෆ්‍රිගේ වියදමට යන්තමට ලැබෙන මුදලක් හැරෙන්න, මාමා බෑණාට අමතර ශිලිමක් වත් දෙන්නෙ නෑ. ඒ කොහොම වුණත් අන්තිමට මේ හැමදේම අයිතිවෙන්නෙ ගොඩ්ෆ්‍රිටයි."

"ඔබට මවුන්ට් ජේම්ස් සාමිගෙන් මොකුත් ආරංචියක් දැනගන්න ලැබුණද?"

"නැහැ."

"ඔබේ මිත්‍රයා තමන්ගේ මේ මාමා වෙත යෑමට මොකක් හරි විශේෂ හේතුවක් තිබුණා කියල ඔබට හිතන්න පුළුවන්ද?"

"මෙහෙමයි. කලින්දා රාත්‍රියේ ඔහුට යම්කිසි ප්‍රශ්නයක් පැනනැගී තිබුණා. ඒක මුදල් සම්බන්ධ එකක් නම්, ඔහු තමන්ගේ ඥාතියා සොයා යන එකේ පුදුමයක් නෑ. ඒ මොකද මේ ඥාතියාට මුදල් සෑහෙන්න තියෙන නිසා. නමුත් මට අහන්න ලැබී තිබෙන කරුණු වල හැටියට, ඒ ඥාතියාගෙන් ඔහුට මුදලක් ලබාගන්න හැකිවේවි කියල මං හිතන්නෙ නෑ. මේ මාමා ගැන ගොඩ්ෆ්‍රිගේ හිතේ කිසිම කැමැත්තක් නෑ. ප්‍රශ්නය විසඳා ගන්න වෙන මොනවා හරි ක්‍රමයක් තිබෙනවා නම්, ඔහු කොහොමටවත් මාමා ළඟට යන එකක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳයි අපට ඒක ඉක්මනින් විසඳා ගත හැකිවේවි. ඔබේ මිත්‍රයා ගියේ මවුන්ට් ජේම්ස් සාමි හමුවෙන්න කියල හිතමු. හොඳයි එහෙම නම් ඇයි මේ චණ්ඩි පෙනුමක් තිබෙන මිනිහෙක් අවේලාවේ ගොඩ්ප්‍රි හමුවෙන්න ආවෙ? ඒ පැමිණීමෙන් ඔහු අප්‍රමාණ කැළඹීමට පත්වුණේ ඇයි?"

සිරිල් මිවටත් දකුණත තම නළලේට තදකර ගත්තේය.

"මට නම් මොකුත් හිතාගන්න බෑ හෝම්ස් මහත්මයා."

"කමක් නෑ. පැහැදිලි ලෙසම, සම්පූර්ණ දවසක් අප ඉදිරියේ තියෙනවා. මේ ගැන සොයා බැලීම මං අන්හෝර්සෙත් හාරගන්නම්. මං ඔබට එක් කරුණක් අවධාරණය කරන්න කැමතියි. ඒ තමයි මේ තරුණ මහත්මයාගේ ආපසු ඒමක් ගැන විශ්වාසය තියන්න එපා. ඔබට හැකි තරමින් ඔබේ ක්‍රීඩා තරඟයට සූදානම් වෙන්න. ඔහුට මේ විදියට යන්න සිදුවුණේ, ඔබ කියන්න වගේ, මහ බරපතල ප්‍රශ්නයක් නිසා විය යුතුයි. ඔහුට ආපසු ඒමට විදියක් නැතිව ඉන්නෙත්, ඒ කරුණ නිසා වෙන්න පුළුවනි. මං කැමතියි ඔබ සමග හෝටලයට ඇවිත් බලන්න. හෝටල් සේවකයා එක්ක කථාකරල බලමු. මේ ගැන ඔහුට හෙළිකළ හැකි අලුත් කරුණු මොනවා හරි තියෙනවාද කියල."

යටහත් පහත් පුද්ගලයෝ, ඉහළ සමාජයේ අය ඉදිරියේ සාක්ෂිදීමේදී අවුල් සහගත බවක් පළ කරති. ඊට හේතුව ඔවුන්ගේ සිත්වල ඇති ගෞරව සම්ප්‍රයුක්ත භය නිසා මතුවෙන, සිතේ චංචල බවයි. එවැන්නන් එම තත්ත්වයෙන් මුදවාගෙන, ඔවුන් දන්නා සියල්ල හෙළිකරවා ගැනීමට, හෝම්ස්ට විශේෂ හැකියාවක් තිබේ. ප්‍රශ්න කිරීම සඳහා යොදාගත්තේ කලින් ආ ස්ටෝන්ටන් ලැගුම්ගත් කාමරයයි. සේවකයාට කීමට තිබූ සියල්ල උකහා ගැනීමට හෝම්ස් උත්සාහ දැරුවේය.

"ලියුම අරගෙන ආව කැනැත්තා මොන වගේ කෙනෙක්ද?"

"මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබුණු කෙනෙක්. වයස අවුරුදු පනහක් විතර ඇති. ඒ තරම් කැපී පෙනෙන විදියේ ඇඳුමක් ඇඳ හිටියේ නැහැ. මුහුණ සුදුමැලියි. රැවුලකින් වැහිලා. එයත් තැනින් තැන සුදුවෙලා. මට අහුණු හැටියට ඒ මිනිහා හිටියේ හුඟක් කලබල වෙලා වගේ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි ඔබ එහෙම කියන්නේ?"

"ඒ මොකද ඔහු අරගෙන ආ ලියුම ස්ටෝන්ටන් මහත්මයා වෙතට දිගුකරන වෙලාවෙ, ඒ මිනිහගේ අත වෙවුලන හැටි මා දුටුවා. විසිත්ත කාමරයේදි ස්ටෝන්ටන් මහත්මයා ඒ මිනිහට අතට අත දුන්නේ නැහැ. ඒ දෙන්නා අතරේ අඩු ශබ්දයකින් දෙබසක් ඇතිවුණා. ඒකෙන් මට පැහැදිලිව ඇහුණේ එක් වචනයක් පමණයි."

"මොකක්ද ඒ?"

"මට පැහැදිලිව ඇසුණේ 'කාලය' යන වචනයයි. ඊළඟට මං කලින් කිව් විදියට ඔවුන් ඉක්මනින් හෝටලයෙන් පිටවී ගියා. එතකොට වෙලාව රෑ දහයමාරයි."

"දවල් වරුවේ රාජකාරියට ඉන්නා සේවකයා ඔබයි. එහෙම නේද?" හෝම්ස් ඇසුවේ ස්ටෝන්ටන්ගේ ඇඳේ හිඳගනිමිනි.

"ඔව් මහත්මයා. මගේ රාජකාරි අවසන් වෙන්නේ රෑ එකොළහට."

"රෑ වැඩ මුරයට ඉන්නා සේවකයාට අමුතු යමක් දකින්න ලැබෙන්න නැතුව ඇති?"

"නැහැ මහත්මයා. නාට්‍ය කණ්ඩායමක් රෑ වෙලා හෝටලයට ඇවිත් තියෙනවා. වෙන කිසිත් අමුතු සිදුවීමක් නෑ."

"ඊයේ මුළු දවල් වරුවම ඔබ රාජකාරියේ යෙදිලද හිටියේ?"

"ඔව් මහත්මයා."

"ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් මහත්මයා වෙත එවුණු පණිවුඩ හෝ ලියුම් කිසිවක් ඔබ ඔහුට ගෙන ගොස් දුන්නාද?"

"ඔව් මහත්මයා. එක විදුලි පුවතක් ඔහු නමට ආවා. මං ඒක ඔහුට ගෙනිහිං භාර දුන්නා."

"අහා! ඒක හිත් ඇදගන්නා කරුණක්. ඒ වෙලාව කීයට විතරද?"

"හවස හයට විතර."

"ඒක භාරදෙද්දි ස්ටෝන්ටන් මහත්මයා හිටියෙ කොහේද?"

"මේ කාමරයෙමයි."

"ඔහු ඒක කියවා බලන විටත් ඔබ මෙතැන හිටියද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් මහත්මයා. පිළිතුරු විදුලි පුවතක් යවන්න තිබේද කියල බලන්න මම රැඳී හිටියා."

"එහෙම එකක් තිබුණාද?"

"ඔව් මහත්මයා. ඔහු පිළිතුරක් ලිව්වා."

"ඔබද ඒක විදුලි පණිවුඩ කාර්යාලයට ගෙන ගියේ?"

"නැහැ. ඔහුම ඒක ගෙනගියා."

"නමුත් ඔහු ඒක ලිව්වේ ඔබ මෙතැන හිඳිද්දී?"

"ඔව් මහත්මයා. මම ඔය දොර ළඟයි බලාගෙන හිටියේ. ඔහු ඒක ලියුවේ, මේසයට පිටිපස්ස හරවාගෙන. ලියල ඉවරවුණාම ඔහු කිව්වා:

'කමක් නැහැ. මම ම ඒක යවන්නම්' කියලා."

"ඔහු ඒක ලිවීමට යොදා ගත්තේ මොකක්ද?"

"පෑනක්."

"මේ මේසය උඩ තිබෙන විදුලි පණිවුඩ පෝර්ම වලින් එකකද ඔහු ලිව්වෙ?"

"ඔව් මහත්මයා. උඩම තිබුණු පෝර්මයේ."

හෝම්ස් වාඩිවී සිටි තැනින් නැගිට්ටේය. විදුලි පණිවුඩ පෝර්ම සියල්ල, පරෙස්සමෙන් ජනේලය අසලට ගෙන ගිය ඔහු, එහි උඩින්ම තිබූ කඩදාසිය හිරු එළියට අල්ලා පරීක්ෂා කර බැලුවේය.

"ඔහු පෑන්සලෙන් නොලිව් එක අපට පාඩුවක්. එහෙම ලිව්වා නම්, පෑන්සල කඩදාසියට තද කිරීම නිසා ඇතිවෙන සලකුණු, කඩදාසිය විනිවිද ගිහින් ඊළඟ කඩදාසියෙත් යන්තමට සටහන් වෙනවා. මෙතැන නම් එහෙම මොකුත් සලකුණුවීමක් නෑ. කොහොම වුණත් ලියල තියෙන්නේ මහත තලයක් සහිත පිහාටු පෑනකින්. සැකයක් නෑ. ඔහු තීන්ත පෙවීමට යෙදූ කඩදාසියේ, තීන්තෙන් ලියූ වාක්‍යවල ඡායාවක් තිබිය යුතුයි. අහා! මේ තියෙන්නේ මං කිව් විධියටම."

තීන්ත පොවන කඩදාසියේ ඒ කොටස ඉරාගත් හෝම්ස්, එය අප දෙසට හරවා අල්ලාගෙන සිටියේය.

Personal Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com



"මුහුණ බලන කණ්ණාඩියට අල්ලා බලමු." සිරිල් ඕවටන් කිවේ අතිශයින් කලබලයට පත්වයි.

"එහෙම කරන්න උවමනා නෑ. මේ කඩදාසිය තුනී එකක්. අනෙක් පැත්ත හරවා ඉර එළියට අල්ලා බැලුවම පෙනේවි."




"ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් අතුරුදන් වෙන්න, පැය කිහිපයකට පෙර යැවූ විදුලි පුවතේ අන්තිම වචන කිහිපයයි, ඒ පණිවුඩයේ කොටසක්, ඒ කියන්නේ වචන හයක් වත් මුලින් තිබෙන්න ඇති. ඒ මොකක්ද කියා අපි දන්නෙ නෑ. මේ වාක්‍යයේ හැටියට, මේ තරුණයාට කල්තබා පෙනිල තියෙනවා, ඔහුට මුහුණපෑමට තිබෙන භයානක අන්තරායක් ගැන. ඒකෙන් ඔහුව බේරාගතහැකි තවත් කෙනෙකුත් ඉන්න බවයි පෙනෙන්නේ. "අප" කියා යොදා තියෙන එකෙන් තේරෙන්නෙ මේ අවදානම ඇත්තේ ස්ටෝන්ටන්ට සහ තවත් කාටහරියි. ඒ කවුද කියලා අපට හිතාගන්න අමාරු නැහැ. ඒ පුද්ගලයා, මේ ලියුම ගෙනා, සුදුමැලි වී භයට පත්වෙලා හිටි පුද්ගලයා කියල හිතන්න පුළුවනි. ඔවුනට එල්ල වී ඇති අන්තරායෙන් බේරීමට ඔවුන් පිහිට පැතූ මේ තුන්වෙනි පාර්ශ්වය කවුද? දැනටම අපි ඒ ප්‍රශ්නය ළඟට ඇවිල්ලයි තියෙන්නේ."

"අපට හොයල බලන්න තියෙන්නේ මේ විදුලි පණිවුඩය යැව්වේ කාටද කියලා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හරියට හරි වොට්සන්. ඔබේ ඒ බුද්ධිමත් නිගමනය මගේ හිතටත් ආවා. නමුත් ඔබ මේ දේ දැකලා තියෙනවද මං දන්නෙ නෑ. අපි තැපැල් කාර්යාලයකට ගිහිං, තවත් කෙනෙකු යැවූ විදුලි පණිවුඩයක විස්තර අඩංගු පෝර්මය බලන්න ඉල්ලා හිටියොත්, ඒක පෙන්වීමට නිලධරයන් මැලිකමක් දක්වනවා. ඒ මොකද මේවා ගැන හුඟක් නීතිරීති තියෙනවා. නමුත් සියුම් උපක්‍රමයක් මගින් අර විස්තර හොයාගන්න බැරිකමකුත් නෑ. ඒ අතරේ මා කළයුතු තවත් වැඩක් තියෙනවා. මං කැමතියි ඔබටත් මහත්මයා මෙහි සිටියදීම මේසය උඩ තිබෙන ලියකියවිලි පරීක්ෂා කර බලන්න."

මේසය උඩ ලිපි කිහිපයක්, බිල්පත්, හා සටහන් පොත කිහිපයක් විය. හෝම්ස් ඒවා ඉතා තියුණු ලෙස, එහෙත් ඉක්මනින් පරීක්ෂා කර බැලුවේය.

"මෙතන නම් වැදගත් මොකුත්ම නැහැ. ඒක නෙමෙයි. මං විශ්වාස කරනවා, ඔබේ මිත්‍රයා නීරෝගී කෙනෙක් කියල. මොකුත් අසනීප ගතියක් එහෙම, ඔහුට තිබුණෙ නැහැ නේද?"

"නැහැ මහත්මයා. ඔහු ගහක් ගලක් වගේ ශක්තිමත් නිරෝගී කෙනෙක්."

"ඔහු අසනීපවී සිටි බවක් ඔබට කවදා හරි අහන්න ලැබුණාද?"

"කවදාවත් නෑ. ක්‍රීඩාකරද්දී වරක් අනෙක් පිලේ ක්‍රීඩකයෙකුගේ පා පහරකට ගොඩ්ප්‍රිගේ කකුලේ ඉදිරිපසට ලොකු තුවාලයක් සිදුවුණා. තවත් වරක් ඔහුගේ දණහිස් කටුව පැන්නා. ඒව මොනවද"

"බාග වෙලාවට ඔබ හිතාගෙන ඉන්න තරම් ඔහු ශක්තිමත් නැතිවෙන්නත් පිළිවන්. මට හිතෙන්නේ මොකක් හරි රහසිගත කරදරයක් ඔහුට බලපාන්න ඇති. මං කැමතියි මෙතැන තිබෙන කඩදාසියක් හෝ දෙකක්, ඔබේ අවසරය ඇතිව මගේ භාරයට ගන්න. අපේ ඉදිරි පරීක්ෂණ වලදී බාග වෙලාවට ඒවා ප්‍රයෝජනවත් වෙන්න ඉඩතියෙනවා."

"මොහොතක් ඉන්න! මොහොතක් ඉන්න!!"

කිසිවෙකු අපට බාධා කරන කටහඬක් ඇසිණි. අතපය වෙව්ලන බොහෝ වයස්ගත මහත්මයෙක් අපහසුවෙන් කාමරයට ඇතුළුවිය. ප්‍රමාණයෙන් කුඩා සිරුරක් තිබූ ඔහු, හැඳසිටියේ බො
ඇඳුම් කට්ටලයකි. පුළුල් වාටිය සහිත හිස්වැස්මක් ද පැළඳ සිටි

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

නිසා, ඔහුගේ පෙනුම ගම්බද දේවගැතිතුමෙකුගේ මෙන් විය. පෙනුම කෙසේ වෙතත් ඔහුට තිබුණේ තියුණු කටහඬකි. අන් අයගේ අවධානය යොමුකරවා ගැනීමට සමත්වෙන වේගවත් කථා විලාසයක් ද ඔහු සතුවිය.

"මහත්තයෙෝ, ඔහේ කවුද? අර මහත්තයෙකුට අයිති කඩදාසි අල්ලන්න ඔහේට තියෙන අයිතිය මොක්කද?"

"මම පෞද්ගලික රහස් පරීක්ෂකයෙක්. ඔහුගේ අතුරුදන්වීම ගැන පරීක්ෂණ පැවැත්වීම මම අරඹමින් සිටින්නේ."

"හැබෑට? ඔහේ රහස් පරීක්ෂකයෙක්? කවුද ඔහේට මේ රාජකාරිය භාරදුන්නෙ?"

"මෙන්න මේ මහත්තයා — මේ ස්ටෝන්ටන් මහත්මයාගෙ මිත්‍රයා. ඔහුව මා වෙත එව්වේ, ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිසියෙන්."

"ස්ටෝන්ටන්ගෙ මිත්‍රයා? මහත්මයා ඔබ කවුද?"

"මම සිරිල් ඕවටන්."

"හා එහෙනම් ඔබයි මට විදුලි පුවතක් එව්වෙ. මම මවුන්ට් ජේම්ස් සාමි. බේස්වෝටර් දක්වා එන මගී අශ්වකෝච්චියට මාව ගෙනැත් දාන්න හැකි ඉක්මනින් මන්න මං ආවා. එහෙනම් ඔබ මේ වැඩේ රහස් පරීක්ෂකයෙකුට භාරදීලත් ඉවරයි?"

"ඔව් මහත්මයා."

"එහෙනම් ඒවට යන වියහියදම් දරන්නත් ඔබ සූදානම්?"

"මහත්මයා. මට කිසිම සැකයක් නෑ මගේ මිත්‍රයා ගොඩ්ෆ්‍රිව සොයාගත්තාම ඔහු ඒ සියලු වියදම් ගෙවාවි."

"නමුත් ඔහුව හොයාගන්න බැරිවුණොත්? එතකොට කවුද ගෙවන්නෙ? දෙනව මට උත්තරයක්!"

"එහෙම වුණොත් ඔහුගේ පවුලෙ . . . "

". . . . ඒ වැඩේ හරියන්නෙ නෑ මහත්මයා, මාත් එක්ක. මගෙන් එක පැන්සයක් බලාපොරොත්තු වෙන්න එපා. ඔව්. එක පැන්සයක්! ඔහේටත් ඒක තේරුණාද රහස් පරීක්ෂක මහත්තයෝ! ඒ ඉලන්දාරියගෙ පවුල කිව්වාම. . . . ඒ ඔක්කොටම ඉන්නෙ මං විතරයි. මං ඔහේලට ආයෙමත් කියන්නෙ. ඔය කිසිම දේක වගකීමක්

http://sherlockholmesinvestigations.blogspot.com

මට හාරගන්න බෑ. මගේ බෑණාට යම්කිසි මුදලක් ලැබෙන්න තියෙනවා නම් ඒ, මං මෙච්චර කාලයක් මුදල් නාස්ති නොකළ නිසා. මුදල් නාස්තිකිරීම අද හෙට පටන්ගන්න මගේ බලාපොරොත්තුවකුත් නෑ. කිසි බයක් සැකක් නැතුව ඔහේ කඩදාසි වගයක් සාක්කුවේ දමාගත්ත නේද? මං ඔහේට මතක්කරන්න කැමතියි. ඔය අතරේ වටිනා කියන ලියවිල්ලක් තිබිල නැතිවුණොත්, ඒ ගැන ඔහේට සම්පූර්ණයෙන්ම වගකියන්න වෙනවා."

"බොහොම හොඳයි මහත්මයා. ඒ අතරේ මං කැමැතියි ඔබෙන් දැනගන්න, මේ තරුණයා අතුරුදන් වුණේ ඇයි කියල ඔබේ මොකුත් අදහසක් තියෙනවද?"

"නැහැ මහත්මයා. ඔහු තමන්ගේ පරෙස්සම සලස්වාගන්න බැරි තරම් පොඩි ළමයෙක් නෙමෙයි. කොහේ හරි අතරමං වෙන්න තරම් ඔහු මෝඩ නම්, මට ඒකට කරන්න දෙයක් නෑ. ඔහුව හොයා බැලීමේ වගකීම භාරගැනීම මං සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා."

වයස්ගත මහතා පිළිතුරු දුන්නේය.

"මට තේරෙනවා ඔබට මුහුණදීමට සිදුවී ඇති ගැටලුව." හෝම්ස් පැවසුවේ දඟකාර සිනාවක් මුවට නංවා ගනිමිනි.

"ඒ වුණාට මං මේ පිළිබඳව වටහාගෙන තියෙන කරුණු කිසිවක් ඔබට නම් තේරුම් ගන්න අමාරු ඇති. ගොඩ්ප්‍රි ස්ටෝන්ටන් දුප්පතෙක් බවයි පෙනෙන්නෙ. කවුරු හරි ඔහුව පැහැරගෙන ගිහිං නම්, ඒ ඔහු සතුව තිබූ වස්තුවක් මංකොල්ල කන අදහසින් වෙන්න බෑ. මවුන්ට් ජේම්ස් සාමි ඔබ විශාල ධනවතෙක් බව, එංගලන්තයේ පමණක් නොවෙයි විදේශ රටවලත් ප්‍රසිද්ධයි. මට හිතෙනවා බොහොම දුරට වෙලා තියෙන්නේ මේන්න මේකයි. නොම්මර එකේ දරුණු හොර කල්ලියක්, ඔබේ බෑණාව පැහැරගෙන ගිහින් තියෙනවා. ඒ මොකටද? ඔබේ ගෙදර පිහිටීම, ඔබේ දිනචරියාව, ඔබ යන එනතැන් පිළිබඳ විස්තර, ඔබේ ධනස්කන්ධය සඟවා ඇති තැන් ගැන තොරතුරු, ඔබේ බෑණාගෙන් ලබාගැනීමේ අරමුණෙන්."

අපේ අමුත්තාගේ මුහුණ සුදුරෙද්දක් සේ සුදුමැලි විය.

දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! මෙක ඒ වගේ අපරාධකාරී වැඩක්ය කියන අදහසක් මට හිතුණෙ නැහැනේ. මේ ලෝකෙ

http://sherlockholmesinvestigations.blogspot.com

ඉන්න හොරු මොන තරම් අමානුෂික අයද? ඒ වුණාට ගොඩ්ෆ්‍රි හොඳ කොල්ලෙක්. ඔහු මට හරි පක්ෂපාතියි. මිනිහා කීයටවත් එයාගෙ මාමාව පාවල දෙන්නෙ නෑ. අද හැන්දෑවෙම මගේ යකඩ සේප්පුව බැංකුවට යවන්න ඕනෙ. රහස් පරීක්ෂක මහත්තයෙෝ. මං ඔබට ආයාචනය කර සිටිනවා මගේ බෑණාව හොයා ගන්න, පුළුවන් හැම උත්සාහයක්ම දරන්න. ඔබේ ගාස්තුව ඕනෑ වුණාම මට කියන්න. ඒක පවුම් පහක් හෝ දහයක් නම් වෙන්නෙ, ඒකෙ ප්‍රශ්නයක් නෑ."

අපට ප්‍රයෝජනවත් විය හැකි කිසිදු තොරතුරක් ලබාදීමට මේ මසුරු වංශාධිපතියා සමත්වූයේ නැත. ඊට හේතුව සිය බෑණා ගෙවූ ජීවිතය ගැන මාමාට කිසිදු හැටහීමක් නොතිබීමයි. පරීක්ෂණය ඉදිරියට ගෙනයාමට අපට තිබූ එකම හෝඩුවාව වූයේ, ස්ටෝන්ටන් විසින් යවන ලද විදුලි පුවතයි.

තමනට මුහුණපෑමට සිදුවී ඇති අවාසනාවන්ත ඉරණම ගැන කණ්ඩායමේ මිතුරනට අනුමදීමට සිරිල් ඕවටන් පිටත්වී ගියේය. මවුන්ට් ජේම්ස් සාමිවරයා මඟ හැර යාමට අපි සමත්වීමු. විදුලි පුවත් පෝරම පිටපතක් ද රැගෙන අපි විදුලි පණිවුඩ කාර්යාලය දෙසට පානැගුවෙමු.

"මේක උත්සාහ කරල බලන්න වටින දෙයක් වොට්සන්. පොලිසියෙන් විශේෂ අවසර පත්‍රයක් ගත්තොත් මේක සුළු දෙයක්. එතකොට මට ඉල්ලා හිටින්න පුළුවනි, විදුලි පුවතේ අඩංගු තොරතුරු මොනවාද කියල හෙළිකරන්න කියලා. නමුත් අපි තවමත් ඒ තත්ත්වයට පත්වෙලා නැහැ. මේ වගේ කලබලකාරී තැන්වල නිලධරයන්ට මහජනයාගේ මුහුණු මතක හිටීවි කියල මම හිතන්නෙ නෑ. බලමු අපි උත්සාහයක් දරලා."

විදුලි පණිවුඩ කාර්යාලයේ කවුළුව පිටුපස සිටියේ කාන්තාවකි. කිසිදු හැඟීමක් පළ නොවන මුහුණකින් හෝම්ස් කථාව පටන්ගත්තේය.

"මේ ගැන ඔබට කරදර කරන්න සිදුවීම ගැන කණගාටුයි. මං ඊයේ මෙහෙන් යවපු විදුලි පුවතක, පොඩි වැරැදීමක් සිදුවෙලා වගෙයි. මට ඒකට කිසිම පිළිතුරක් ආවෙ නැහැ. මට හිතෙන්නේ ඒකෙ අන්තිමට මගේ නම ලියන්න මට අමතක වුණාද දන්නෙ

http://sherlockholmesinvestigations.blogspot.com

නැහැ. ඔබට කරුණාකරල බලන්න පුළුවන්ද මං අතින් ඒ වරද සිදුවෙලාද කියල?"

තරුණිය, යැවූ විදුලි පුවත් වල පිටපත් කිහිපයක් පෙරලා බැලුවාය.

"කීයට විතරද ඒක යැව්වේ?" ඇය ඇසුවාය.

"හවස හය පහුවෙලා ටික වෙලාවකට පස්සෙ."

"එය යැවූ ලිපිනය කියන්න පුළුවන්ද?"

තම තොලට ඇඟිල්ලක් තැබූ හෝම්ස් මා දෙස බැල්මක් හෙළුවේ හොරැහිනි.

"ඒකෙ මං ලියූ අන්තිම වචන තමා, දෙවියන්ගේ නාමයෙන් අප වෙනුවෙන් හැකි සෑම දෙයක්ම කරන්න.

මේකට පිළිතුරක් නොආ එක ගැන මං හරිම කැළැඹීමකට පත්වෙලයි ඉන්නෙ."

කාන්තාව විදුලි පුවත් පිටපත් මිටියෙන් එකක් එළියට ගත්තාය.

"මේ මේකෙ තමයි යටින් නමක් නැත්තෙ" ඇය පැවසුවේ එය කවුන්ටරය මත තබා, රැළි ඉවත්වන සේ එය අත්ලෙන් පිරිමදිමිනි.

"හරි! මට පිළිතුරක් නොලැබුණේ ඒක තමයි. අනේ දෙවියනේ! මං මොන තරම් මෝඩ විධියටද කටයුතු කරල තියෙන්නේ. පිළිතුරු නොආව හේතුව දැනගන්න එක මගේ හිතට ලොකු සහනයක්. ඒ ගැන ඔබට ස්තුතියි මෙනෙවිය. ඔබට ශුභ උදෑසනක්."

අපි වහා පාරට බැස්සෙමු.

"හරිද වැඩේ?" මම ඇසීමි.

"අපි ටිකෙන් ටික ඉදිරියට යනවා වොට්සන්. ඔය විදුලි පුවත බලාගැනීමට මගේ හිතේ සැලසුම් හතක් තිබුණා. යොදන පළමුවෙනි එකම හරියාවි කියල මං හිතුවෙ නෑ."

"මොනවද ඔබට දැනගන්න ලැබුණෙ?"

"අපේ පරීක්ෂණය ඇරඹීමට තැනක්." හෝම්ස් කුලීරියක් නවත්වා ගත්තේය.

"කිංස් ක්‍රොස් දුම්රියපොළට යමු."

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු රියැදුරාට උපදෙස් දුන්හේය.

"එහෙනම් අපට යන්න දුර ගමනක් තියෙනවද?"

"ඔව්. මං හිතන්නේ අපි කේම්බ්‍රිජ්වලට දුවල එන්න යන්න ඕනෙ. හැම දෙයක්ම මාව යොමුකරවන්නෙ ඒ පැත්තට"

අපි ග්‍රේස් ඉන් මාවත දිගේ ඉදිරියට අශ්ව කරත්තයෙන් ගමන් කළෙමු.

"මේ අතුරුදන් වීම ගැන මොකක් හරි හැක හිතන්න පුළුවන් කරුණක් ඔබට හමුවුණාද හෝම්ස්? මං හිතන්නෙ නෑ අපේ පරීක්ෂණ කිසි එකක, හේතුවක් හොයාගන්න බැරි මේ වගේ අතුරුදන් වීමක් තිබුණ කියල. ඔහුගේ ධනවත් මාමා ගැන තොරතුරු ලබාගන්න අදහසින් තරුණයා පැහැරගෙන ගියා කියලද ඔබ අදහස් කරන්නෙ?"

"මගේ හිතවත් වොට්සන්, තරුණයාගෙ අතුරුදන් වීම පැහැදිලි කිරීමට ඇති හොඳම හේතුව ඒකය කියල මං කොහොමවත් කියන්නෙ නෑ. නමුත් අර අප්‍රසන්න නාකි මිනුස්සයාගෙ මේ ගැන උනන්දුවක් ඇතිකරන්න හොඳම ක්‍රමය ඒකයි කියල මට හිතුණා."

"ඇත්තෙන්ම ඔබේ ඒ බලාපොරොත්තුව ඉටුවුණා. නමුත් මොනවද ඔබේ අනෙක් අදහස්?"

"මට ඉදිරිපත් කළ හැකි කාරණා හුඟක් තියෙනවා. මේ පළවෙනි එක. බොහොම වැදගත් ක්‍රීඩා තරඟයක් පවත්වන්න ඔන්න මෙන්න කියා තිබියදී ඒක කණ්ඩායමක ක්‍රීඩකයෙක් අතුරුදන් වෙනවා. ඔහු ඒ කණ්ඩායමේ ඉන්න, අති දක්ෂම, අත්‍යවශ්‍යම ක්‍රීඩකයා. බාගවෙලාවට ඒක අහම්බෙන් වූ දෙයක් වෙන්නත් පිළිවන්. නමුත් ඒක අපේ සිත්වල කුහුලක් ඇතිකරන කරුණක්. මේ වගේ ආධුනික ක්‍රීඩා තරඟවලදී ජය-පරාජය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ මුදල් ඔට්ටු ඇල්ලීමක් සිදුවන්නෙ නෑ. නමුත් අප්‍රසිද්ධියේ මහජනයා අතර මුදල් ඔට්ටු ඇල්ලීම විශාල වශයෙන් සිදුවෙනවා. එතකොට මොකක්ද වෙන්නෙ? අර අශ්වරේස් තරඟවලදී කුසලාන දිනයි කියල හිතන අශ්වයා, නොයෙකුත් අකටයුතු මගින් පරාජය කරන්න මැරවරයො යොදවනවා නේද? මෙතැනදී දක්ෂම කණ්ඩායම පරාජය කිරීමේ අරමුණෙන් හොඳම ක්‍රීඩකයා පැහැරගෙන ගියා වෙන්න පුළුවනි. ඒක එක් අදහසක්.

http://sherlockholmesinvestigations.blogspot.com

ඊළඟට වොට්සන්, අපට මෙහෙම දෙයක් හිතන්නත් පුළුවනි. මේ ඉලන්දාරියා විශාල ධනස්කන්ධයක එකම උරුමකාරයා. ඔහු දනට දුප්පතෙක් බව ඇත්තයි. නමුත් ඔහුගේ මාමාගෙන් කප්පම් වශයෙන් විශාල මුදලක් ලබාගැනීමේ අරමුණෙන්, තරුණයාව ප්‍රාණ ඇපකාරයෙක් ලෙස පැහැරගත්තා වෙන්නත් පුළුවන්."

"නමුත් මේ උපකල්පන එකක්වත් අර පුදුමාකාර විදුලි පුවතට ගැළපෙන්නේ නෑ."

"බොහොම හරි වොට්සන්. මේ පරීක්ෂණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට තවමත් අපට ඇති එකම හෝඩුවාව, ඒ විදුලි පුවත පමණයි. අපේ අවධානය ඒකෙන් ඉවත්වෙන්න ඉඩහරින්න හොඳ නෑ. අපි මේ කේම්බ්‍රිජ් බලා යන්නෙත්, එහි අරමුණ කුමක්ද කියල පැහැදිලි කරගන්නයි. අපේ පරීක්ෂණ ඉදිරියට ගෙන යායුත්තේ කුමන මාර්ගයකද කියන එක තවමත් නොපැහැදිලියි. නමුත් අද රෑ වෙන්න කලින් මේකෙ කාරණා පැහැදිලි කරගන්න බැරිවුණොත්, ඒකත් පුදුමයට කරුණක්."

සුප්‍රසිද්ධ මෙන්ම පැරණි විශ්ව විද්‍යාලය පිහිටි කේම්බ්‍රිජ් නගරයට අප ළඟාවෙද්දී ඇඳිරි වැටීමට පටන්ගෙන තිබිණි. අපි දුම්රියපොළේදී අශ්වකරත්තයකට නැඟුනෙමු. දොස්තර ලෙස්ලි ආම්ස්ට්‍රෝං ගේ නිවස වෙත අප ගෙන යන මෙන් හෝම්ස් රියැදුරාට දන්වා සිටියේය. මිනිත්තු කිහිපයකට පසු අපි එහි ළඟාවීමු. ඉතා විශාල මන්දිරයක් වෙත අප කැඳවාගෙන යන ලදී. වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කිරීමේ යෙදී සිටියේය. ඒ නිසා විවේක කාමරයේ බොහෝ වේලාවක් රැඳී සිටීමට අපට සිදුවිය. වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කළ කාමරය වෙත අප යැවුණේ අන්තිමටයි. ඔහු මේසයක් සමීපයේ අසුන්ගෙන සිටියේය.

මා වෛද්‍යවරයෙකු වුවත්, වෛද්‍ය ක්ෂේත්‍රයේ එතරම් ක්‍රියාකාරී දිවියක් නොගෙවූ නිසා, සමහර තොරතුරු පිළිබඳව මා සතුවූයේ අල්ප දැනුමකි. ලෙස්ලි ආම්ස්ට්‍රෝං පිළිබඳව මා අසා වත් නොතිබුණේ ඒ නිසයි. නමුත් ඔහු පිළිබඳ කරුණු රැසක් දන් මට දනගන්නට ලැබී ඇත.

ලෙස්ලි ආම්ස්ට්‍රෝං යනු කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ප්‍රධානම විද්වතුන් කිහිපදෙනා අතුරින් එක් අයෙකි. ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

පිළිබඳව යුරෝපය පුරා පැතිර තිබූ කීර්තිය, වෛද්‍ය විද්‍යාවේ එක් ක්ෂේත්‍රයකට සීමාවූයේ නැත. ඔහුගේ දක්ෂකම් පිළිබඳ කිසිවක් නොදන්නා අයෙකු වුවද, වෛද්‍ය ආම්ස්ට්‍රෝං ගේ ප්‍රතාපවත් පෙනුමෙන් පැහැදීමට පත්වනු නොඅනුමානය. දැඩි පෞරුෂයක්, සංවේදී මනසක්, කිසිවෙකුගේ මතයට හිස නොනමන ගතියක්, මම ලෙස්ලි ආම්ස්ට්‍රෝං තුළින් දිටිමි. මගේ මිත්‍රයාගේ ආගන්තුක කාඩ්පත කියවා බැලූ වෛද්‍යවරයා, අප දෙස බැලුවේ එතරම් ප්‍රසන්න හැඟීමකින් නොවේ.

"ඔබේ නම මං අහල තියෙනවා, ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔබේ වෘත්තිය මොකක්ද කියලත් මං දන්නවා. ඒක මට කොහොමටවත් හිතට නො අල්ලන වෘත්තීන්ගෙන් එකක්."

"ඔව් දොස්තර මහත්මයා. ඒ ගැන නම් රටේ ඉන්න අපරාධකාරයින් හැම්කෙනෙක්ම ඔබ සමඟ එකඟ වෙනවා සහතිකයි." මගේ මිත්‍රයා පැවසුවේ ඇහට පෙනෙන්නට නොදැනෙන අයුරෙනි.

"හෝම්ස් මහත්තයා. ඔබේ අරමුණ අපරාධ මේ සමාජයෙන් තුරන් කිරීමට නම්, ඒකට හැම තරාතිරමකම පුද්ගලයින්ගෙන් සහයෝගය ලබාගත යුතුයි. කොහොම වුණත් මගේ විශ්වාසය නම් ඒ කටයුත්ත සඳහා පොලීසිය හොඳටම ප්‍රමාණවත්. ඔබ අනික් මිනිස්සුන්ගේ පවුල්වල රහස් හාරා අවුස්සන්න යන්නේ මොකටද? ඒ වැඩවලට ගියාම ඔබ අහිත් සිද්ධවෙන්නෙ මොකක්ද? ඔබට වඩා වැඩරාජකාරී බොහොමයක් තියෙන මිනිස්සුන්ගේ කාලය විනාශකර දැමීම. උදාහරණයක් වශයෙන් මේ මොහොතේ මා කළ යුත්තේ ඔබ සමඟ කතාබහ කරමින් සිටීම නොමෙයි; වෛද්‍ය විද්‍යාවේ නවීන ප්‍රතිකාර විධි පිළිබඳ ලිපියක් සකස් කිරීම."

"ඒ ගැන මට කිසිම සැකයක් නෑ මහත්මයා. නමුත් ඔබට පෙනේවි, ඒ ලිපියට වඩා මා සමඟ කරන සාකච්ඡාව වැදගත් කියල. ඒ වගේම මා මේ දෙයත් කිව යුතුයි. ඔබ මට චෝදනා කරනවා, මා පවුල්වල පෞද්ගලික තොරතුරු හෙළි කිරීමට ක්‍රියාකරනවා කියල. නමුත් ඇත්තෙන්ම මා කරන්නේ හාත්පසින්ම ඊට විරුද්ධ දෙයක්; රහසිගත තොරතුරු ඒ විදියටම ආරක්ෂා කරනවා. පෞද්ගලික තොරතුරු එළිවෙන්නේ ඒවා පොලීසිය අතට පත්වුණාමයි. මං මෙහෙත් ආවෙ ඔබගෙන් ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් මහත්මයා, ගැන තොරතුරු දැනගන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකක්ද ඔබට ඔහු ගැන දැනගන්න උවමනා?"

"ඔබ ඔහුව හඳුනනවා. එහෙම නේද?"

"ඔහු මගේ හිතවත් මිත්‍රයෙක්."

"ඔබ දන්නවා දත් ඔහු අතුරුදන් වී ඇති බව?"

"ආ. . . . හැබෑට?" යයි ඇසුවත් වෛද්‍යවරයාගේ මුහුණේ හැඟීම්වල කිසිදු වෙනසක් සිදුනොවිණි."

"ඔහු ඊයෙ රාත්‍රි හෝටලයෙන් පිටවෙලා ගිහින්. ඊට පස්සේ ඔහු ගැන ආරංචියක් නෑ."

"කිසිම සැකයක් නෑ. ඔහු ආපහු එවි."

"වෛද්‍ය ආම්ස්ට්‍රෝං, ඔක්ස්ෆඩ් - කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාල දෙක අතරේ පැවැත්වෙන මහා රගර් තරඟය හෙටයි."

"මේ පුංචි ළමයින්ගේ කෙළි සෙල්ලම් ගැන මගේ උනන්දුවක් නෑ. ඒවා සෙල්ලම් කරගන්න බැරිවුණා කියලා මට දුකකුත් නෑ. මං ඔහුව හොඳින් හඳුනන නිසා ඔහුට අත්වුණු ඉරණම ගැන මගේ ලොකු උනන්දුවක් තියෙනවා. ඒ වුණාට ඔය රගර් තරඟය මගේ අනුකම්පාව හිමිවෙන එකක් නොවෙයි."

"එහෙම නම් ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන්ට අත්වූ ඉරණම මොකක්ද කියලා හොයන්න, මං කරන පරීක්ෂණයට, ඔබේ සහයෝගය ලබා දෙන්න. ඔබ දන්නවාද ඔහු ඉන්නේ කොහේද කියල?"

"සත්තකින්ම නැහැ."

"ඊයේ දක්කට පස්සේ ඔබ ඔහුව දක්කෙත් නෑ?"

"නැහැ."

"ස්ටෝන්ටන් මහත්මයා නිරෝගී කෙනෙක්ද?"

"ඇත්තෙන්ම ඔව්."

"ඔහුට අසනීපවූ බවක් ඔබ අහල තියෙනවාද?"

"කිසිදාක අහල නෑ."

තම සාක්කුවේ තිබූ කඩදාසියක් එළියට ගත් හෝම්ස් එය වෛද්‍යවරයාට පෙනෙන සේ ඔහුගේ දෑස් ඉදිරියට ගෙන ගියේය.

"එහෙනම් කියන්න බලන්න. ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් මහතාගෙන් ගිනි 13 ක ගාස්තුවක් වෛද්‍ය ලෙස්ලි ආම්ස්ට්‍රෝං විසින් භාරගත්තේ

http://sherlockholmesinvestigations.blogspot.com

කුමකටද කියලා? මට මේ රිසිට්පත ලැබුණේ ගොඩ්ෆ්‍රිගේ පෞද්ගලික ලියකියවිලි අතර තිබී."

වෛද්‍යවරයාගේ මුහුණ කෝපයෙන් රතු විය.

"හෝම්ස් මහත්තයා. මේවට හේතු ඉදිරිපත් කරන්න මට උවමනාවක් නෑ."

හෝම්ස් රිසිට් පත, තම සටහන් පොත තුළ තැන්පත් කළේය.

"ඔබ හේතු ඉදිරිපත් කරන්න කැමැති ප්‍රසිද්ධියේම නම්, දන් හෝ පසුව ඔබට එය කරන්න සිදුවෙනවා. මං ඔබට කලිනුත් කිව්වා. මේ වගේ දේවල් ප්‍රසිද්ධ වෙන්න නොදී යටපත් කර දමන්න මට හැකියාව තිබෙනවා. නමුත් පොලීසියට ඒවා අනිවාර්යයෙන්ම ප්‍රසිද්ධ කරන්න සිදුවෙනවා. මාව විශ්වාසයට ගැනීම වඩාත් නුවණට හුරු බව ඔබට වැටහේවි."

"මං ඔය ගැන කිසිදෙයක් දන්නෙ නෑ."

"ස්ටෝන්ටන් මහත්මයා ලන්ඩනයේ සිට ඔබට යම් පණිවුඩයක් එව්වද?"

"ඇත්තෙන්ම නැහැ."

"අනේ අනේ! මේ තැපැල් දෙපාර්තමේන්තුවෙන් සිදුකරන වැරැදි වැඩ!" හෝම්ස් සුසුමක් හෙළුවේ මහත් සේ කම්පාවට පත් අයුරෙනි.

"ඊයෙ හැන්දෑවේ හයයි කාලට ලන්ඩන් ඉඳලා ස්ටෝන්ටන් මහත්මයා "හදිසි" විදුලි පණිවුඩයක් එව්වා - මේක සැකයක් නැතිවම ඔහුගේ අතුරුදන්වීමට අම්බන්ධ එකක් - ඒ වුණත් ඒක ඔබට ගෙනැත් භාරදීල නැහැනෙ! ඔවුන් මහා අපරාධයක් නෙ කරල තියෙන්නෙ. මං යනවා හවුත් සැර්යක් ලන්ඩනයේ තැපැල් කාර්යාලයට. ගිහින් මේ ගැන ලිඛිතව පැමිණිලි කරනවා."

වෛද්‍ය ආම්ස්ට්‍රෝං පුටුවෙන් නැගිට්ටේ තරහෙන් පිපිරෙමිනි. ඔහුගේ මුහුණ කෝපය නිසා රතු පැහැ වී තිබිණි.

"මහත්මයා මං කැමැතියි ඔබ මගේ ගෙයින් එළියට බහිනවා නම්. ගිහින් කියන්න ඔබුන්ට ජේම්ස් සාමිට, ඔහු සමගවත්, ඔහුගේ නියෝජිතයන් සමගවත් මගේ කිසිම ගනුදෙනුවක් නැහැ කියල. තව එක වචනයක්වත් කතාකරන්න එපා!" එසේ කියූ වෛද්‍යවරයා සීනුව නාද කළේය. "ජෝන් එක්ක යනව මේ මහත්තුරු එළියට."

http://sherlockholmesinvestigations.blogspot.com

සේවකයා අප නිවසින් එළියට ඉගන ගියේ අකාරුණික විලසිනි. අප පාරට බසිද්දී හෝම්ස් මහ හඩින් සිනාසීමට පටන් ගත්තේය.

"දොස්තර ලෙස්ලි ආම්ස්ට්‍රෝං කියන්නේ, අප්‍රමාණ ශක්තියකින් වැඩ කළහැකි සුවිශේෂ චරිතයක්. ඔහුගේ හැකියාවත් හා බුද්ධිය මොරියාටිගේ අංශයට යොමු කළා කියලා හිතමු. එතකොට ඒ මහාචාර්යතුමාගේ මරණයෙන් ඇතිවූ හිස්තැන ආම්ස්ට්‍රෝංට පුරවන්න වුණත් පුළුවනි.

ඉතින් බලන්න වොට්සන්, දැන් අපි අසරණ වෙලා ඉන්න හැටි. ආගන්තුක සත්කාරය කියන එක නොහඳුනන නගරයක යාළු මිත්‍රයො කිසිකෙනෙක් නැතුව, අපි පාරේ අතරමං වෙලා. නමුත් එහෙම කියලා, මේ පරීක්ෂණය පැවැත්වීම අතරමග නවතාදමල නගරයෙන් පිටවෙලා යන්න අපිට හැකියාවකුත් නැහැ. මේ ආම්ස්ට්‍රෝංගේ ගේ ඉදිරිපිටම පාරෙන් අනෙක් පැත්තේ තියෙන්නේ කුඩා නේවාසිකාගාරයක් නේද? අපේ අවශ්‍යතා වලට ඒක නම් හොඳින්ම ගැළපෙනවා. ඔබට පුළුවන්ද වොට්සන් මේකෙ ඉස්සරහම කාමරය අප දෙදෙනා වෙනුවෙන් කුලියට ගන්න. ඒ ගමන්ම රෑට උවමනා කරන දේවල් මිලදී ගන්න. මට සුළු සුළු කාරණා වගයක් හොයා බලන්න තියෙනවා. ඔබ ඕා කිව් වැඩ වල යෙදෙද්දී, මට කාලය තිබේවි මගේ වැඩකටයුතු සම්පූර්ණ කරගන්න.

සුළු සුළු කාරණා ගැන හොයා බැලීම හෝම්ස් හිතුවාට වඩා දීර්ඝ එකක් වූ බව පෙනිණ. මා එසේ පැවසුවේ හෝම්ස් ආපසු නේවාසිකාගාරයට එද්දී රෑ නවය පමණ වූ නිසයි. ඔහුගේ මුහුණ සුදුමැලි වී දූවිල්ලෙන් වැසී තිබිණි. අධික වෙහෙට්ටුවට පත්ව, ඒ නිසාම කුසගින්නෙන් ද පෙළුණු හෝම්ස්, කලකිරීමට පත්ව සිටි අයුරු මම දුටුවෙමි. ඔහු වෙනුවෙන් සූදානම්ව තිබූ රාත්‍රී ආහාරය සීතල වී ගොසිනි.

කුසගිනි නිවාගෙන, පයිප්පයක් දල්වා ගත් පසු, මගේ මිත්‍රයා සංවාදයක් ඇරඹීමට සූදානම් බව මට වැටහිණ. තම වැඩකටයුතු අසාර්ථකවීගෙන යද්දී හෝම්ස් ඒවා යළි මෙනෙහි කළේ, අවඥ හාස්‍යයට මුසු දාර්ශනික ආකල්පයකිනි. අශ්වකරත්තයක හඬ ඇසෙද්දී පුටුවෙන් නැගිට සිටි මගේ මිත්‍රයා ජනෙල් වීදුරුව තුළින් බැලීය. ඒ ආම්ස්ට්‍රෝංගේ නිවස දෙසයි. අළු පැහැති අශ්වයින්

http://sherlockholmesinvestigations.blogspot.com

දෙදෙනෙකු බැඳි, හොඳින් ආවරණය කළ ලොකු අශ්වකරත්තයක් වෛද්‍යවරයාගේ නිවස ඉදිරිපිට නවතා තිබිණ.

"ඒක පිටත්වෙලා ගිහින් පැය තුනක් ගතකරලයි ආපහු ආවෙ. පිටත්වුණේ හයහමාරට. දන් ආපහු ආවා. ඒ කියන්නේ මේ ගිහිං එන්නේ හැතැක්ම දහයක දොළහක දුරකට. ඔහු හැමදාම මේ ගමන යනවාලු; සමහරදාට දෙවරක්."

"ඒක රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ යෙදී ඉන්න වෛද්‍යවරයෙකුට අමුතු දෙයක් නොමෙයි?"

"නමුත් ආම්ස්ට්‍රෝං රෝගීනට ප්‍රතිකාර කිරීම සඳහාම කැපවී ඉන්න වෛද්‍යවරයෙක්ද? නැහැ. ඔහු කථිකාචාර්යවරයෙක්. විශේෂඥයෙක්. සාමාන්‍ය ශල්‍යවෛද්‍යකමක් පවත්වාගෙන යන්න ඔහුගේ කැමැත්තක් නෑ. ඒකෙන් ඔහුගේ අර්යේෂණ වලට බාධා පැමිණෙනවා. එහෙම නම් ඇයි මේ ඔහු, දිනපතාම මේ වගේ දීර්ඝ ගමන් වල යෙදෙන්නේ? මේවා ඔහුට කරදරකාරී ඒවා බවට කිසිම සැකයක් නෑ. ඔහු මේ හැමදාම යන්නේ කාව බලන්නද?"

"ඔහුගේ රියැදුරාගෙන්. . . ."

". . . . මගේ හිතවත් වොට්සන්, ඔබ හිතනවද මං මුලින්ම රියැදුරාගෙන් නොඅහ හිටිව් කියලා? ඒක රියැදුරාගෙ ස්වභාවයද නැත්නම් ස්වාමියා විසින් කල්තබා අවවාද කරල තිබුණද මං දන්නෙ නෑ. නමුත් මං ඒ ගැන කථා කරන්න උත්සාහ කළ වෙලේ, මා වෙත දරුණු බල්ලෙක් උසිගන්වන්න තරම් ඔහු කුරිරු වුණා. නමුත් මගේ අතේ තිබුණු සැරයටියෙ පෙනුම දක්කාම, බල්ලත් හයවුණා. මිනිහත් හයවුණා. ඒ හින්ද ඒ ප්‍රශ්නය වැඩිදුර ගියේ නැහැ. ඔහු සමඟ ඇතිකරගත් හිතවත්කම එතැනින්ම බිඳ වැටුණා. ඉතින් මං කොහොමද තවත් ප්‍රශ්න අහන්නෙ? මට දනගන්න ලැබුණු තොරතුරු ඔක්කොම හොයාගත්තේ, අපේ මේ නේවාසිකාගාරය පිහිටි ඉඩමේම ජීවත්වෙන, මිත්‍රශීලී වෙනත් කෙනෙකුගෙන්. වෛද්‍යවරයා දිනපතාම යෙදෙන ගමන් බිමන් ගැනත් ඔහුගේ පිළිවෙල ගැනත් මට කිව්වේ ඒ තැනැත්තා තමයි. ඔහු මට කිව්දේ සනාථ කරන්න වගේ, ඒ මොහොතෙම අර අශ්වකරත්තය ඇවිත් ගේ දොරකොඩ නැවැත්තුවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට එය පිටිපසින් යන්න බැරිවුණාද?"

"විශිෂ්ටයි වොට්සන්! මේ හැන්දෑවේ ඔබත් දීප්තිමත්ව ඔපවැටුණු අදහස් පළකරනවා. ඔබ කිව් ඒ දේම මගේ හිතටත් ආවා. ඔබ දකින්න ඇති මේ නේවාසිකාගාරයට ටිකක් එහායින් බයිසිකල් සාප්පුවක් තියෙනවා. මං ඉක්මනට එතැනට ගිහිං බයිසිකලයක් කුලියට ගත්තා. අශ්වකරත්තය අර ඈත නොපෙනී යන්න කලින්, මට හැකිවුණා මෙතැනින් පිටත් වෙන්න.

මං මොකද කළේ, හැකි වේගයෙන් බයිසිකලය පැදගෙන ගිහිං අශ්වකරත්තය පහුකරගෙන ගියා. ඊළඟට ඔවුන්ගේ වැඩි අවධානයක් යොමු නොවෙන විදියට, යාර සීයක් විතර ඉදිරියෙන් ගමන් කළා. අපි නගර සීමාවෙන් පිටතට යනතුරු, මං ඔවුන්ගේ ලාම්පු එළිය ගැන හොඳිසියෙන් ගියේ. ගම්බද පාරවල යන්න පටන් ගත්තට පස්සෙ, මට මුහුණ දෙන්න වුණේ පුදුමාකාර සිද්ධිමකට. අශ්වකරත්තය මාවත් පහුකරගෙන ගිහිං නැවැත්තුවා. වෛද්‍යවරයා කරත්තයෙන් බැහැලා, ආව් ඉක්මනට පාරෙ මං නැවතී හිටි තැනට.

"මහත්මයා ඔබට කියන්න, මෙතැන ඉඳලා ඉදිරියට පාර හුහක් පටුයි. මං අපේක්ෂා කරනවා මගේ මේ අශ්වකරත්තය ගමන් කිරීම නිසා, බයිසිකලයේ ඔබ යන ගමනට බාධාවක් වෙන එකක් නැහැ කියල."

ඔහු ඒක කිව්වේ මහා උපහාසාත්මක අයුරෙන්. මං වහාම බයිසිකලය වේගයෙන් ඉදිරියට පැදගෙන ගියා. හරස් පාරවල නොගිහිං මං ප්‍රධාන පාරෙම සැතපුම් කිහිපයක් ඉදිරියට ගියා. ගිහිං ඔවුනට නොපෙනෙන විදියට පාරෙ අයිනෙ තැනක නැවතුණා. ඊට පස්සේ මං බලාගෙන හිටියා අශ්වකරත්තය එනතුරු. නමුත් ඒකෙ කිසිම ලකුණක් නෑ. ඒ නිසා මට හිතාගන්න පුළුවන් වුණා මං මුලින් දැකපු හරස්පාරකට ඔවුන්ගේ කරත්තය හරවන්න ඇති යන්න. ඊට පස්සේ මං ආපසු බයිසිකලය මේ දිසාවට පැදගෙන ආවා. ඒත් මට අශ්වකරත්තය දකින්න ලැබුණේ නැහැ. නමුත් ඔබට පෙනෙනවා ඇති එය ආපසු මෙහේට ආවෙ මං ආවට හුහක් වෙලාවකට -පස්සෙ.

http://sherlockholmesinvestigations.blogspot.com

මං මුලින්ම කියන්න ඕනෑ, වෛද්‍යවරයාගේ මේ ගමන ස්ටෝන්ටන්ගේ අතුරුදන්වීම සමග සම්බන්ධ කරන්න, මට කිසිම සාක්ෂියක් නෑ. මට උවමනාව තිබුණේ වෛද්‍ය ආම්ස්ට්‍රෝං යෙදෙන කටයුතු පිළිබඳව සාමාන්‍ය සොයා බැලීමක් කරන්න පමණයි. නමුත් දැන් මට පෙනෙන විදියට ඔහුගේ මේ රහස් ගමන් බිමන් යද්දී, ඔහු හරියට පරෙස්සම් වෙනවා. ඒ කියන්නේ ඔහුගේ මේ ගමනේ මොකක් හරි වැදගත්කමක් තියෙනවා. ඒක පැහැදිලි කරගන්නාතුරු, මට සෑහීමකට පත්වෙන්න බෑ."

"හෙට අපි දෙන්නාම ඔහු පිටිපස්සෙන් යමු."

"ඒක කරන්න අපට පුළුවන් වේවිද? ඒක ඔබ හිතන තරම් පහසු කටයුත්තක් නෙවෙයි. ඒකත් නැහැ . වොට්සන්. මේ කේම්බ්‍රිජ් ෂයර් ප්‍රාන්තයේ ගහකොළ වැවී තිබෙන පිළිවෙළ ගැන ඔබට වැටහීමක් නැහැ නේද? පාර අයිනේ කොහේවත් වරින් වර සැඟවී සිටීමට සුදුසු තැනක් නැහැ. අද හැන්දෑවේ මා පසුකරගෙන ගිය ප්‍රදේශය සම්පූර්ණයෙන්ම විවෘත තැනිතලාවක්. ඊළඟට අප ලුහුබඳින්න හදන පුද්ගලයා මෝඩයෙක් නෙමෙයි. ඔහු ඒ බව අදම ඔප්පුකර පෙන්නුවා. මං ඕවටන්ට විදුලි පුවතක් යැව්වා. මං ඔහුට කිව්වා ලන්ඩනයේ අලුතෙන් ඇතිවෙන සිදුවීම් අපේ මේ ලිපිනයට දන්වන්න කියලා.

ඒ අතරේ අපට කළ හැක්කේ ලෙස්ලි ආම්ස්ට්‍රෝං ගැන අවධානය දැඩි කිරීම පමණයි. ඔහු හොඳටම දන්නවා ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් ඉන්නෙ කොහේද කියලා. ඒ ගැන මට දිවුරන්න පුළුවනි. ගොඩ්ෆ්‍රි ඉන්න තැන වෛද්‍යවරයාගෙන් අපට හොයාගන්න බැරි නම්, ඒක අපේ වරදක්. මේ වෙලාවෙ හොඳ තුරුම්පු කොළ වලින් වැඩිවාසි ලබාගෙන ඉන්නේ ඔහු. නමුත් වොට්සන් ඔබ දන්නවා, සෙල්ලම මේ තත්ත්වයට පත්වුණාට පස්සෙ අත්අැරදාල යන මිනිහෙක් නෙමෙයි මම."

එහෙත් පසුදිනවත් මේ අභිරහස සම්බන්ධයෙන් අමතර යමක් හොයාගැනීමට අපට හැකියාවක් නොලැබිණි. අප නේවාසිකාගාරයේ උදේ ආහාරය ගෙන අවසන් කළා පමණකි. හෝම්ස් නමට එවා තිබූ ලිපියක් අප වෙත යොමු කරන ලදී.

http://sherlockholmesinvestigations.blogspot.com

*මහත්මයාණෙනි,*

*මගේ ගමන් බිමන් පිළිබඳව විමසිලිමත් වෙමින්, ඔබ කරන ලුහුබැඳීම ඔබේ කාලය නාස්ති කරගැනීමක් බවට මං සහතික වෙන්නම්. මගේ ආවරණය කළ අශ්වකරත්තයේ, පිටුපස නැරඹිය හැකි කුඩා කවුළුවක් ඇති බව ඊයේ ඔබ දකින්න ඇති. ඔබට උවමනා කරන්නේ සැතපුම් විස්සක් දුර බයිසිකල් පැදීමට නම්, මගේ කරත්තය පිටුපසින් එන්න. එපමණයි. ඒ අතරේ මං ඔබට දැනුම් දෙන්න කැමතියි, මගේ ගමන් බිමන් පිළිබඳව ඔත්තු බැලීමෙන්, ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් ගැන ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙන්නේ නැහැ. ඒ මහත්මා වෙනුවෙන් ඔබට කළ හැකි විශාලම සේවය නම් ආපසු ලන්ඩනය බලා යෑමයි. හිඟිං ඔබව මේ කටයුත්ත සඳහා යොදවා ගත් මහත්මයාට, ගොඩ්ෆ්‍රි ගැන කිසිවක් සොයාගැනීමට අපහසු වූ බව දැනුම් දෙන්න. ඔබ කේම්බ්‍රිජ්හි කරන්නේ කාලය නිකරුණේ අපතේ යැවීමකි.*

*මෙයට හිතවත්*
*ලෙස්ලි ආම්ස්ට්‍රෝං.*

"මේ වෛද්‍යවරයා විරුද්ධවාදියෙක් වුණත්, බොහොම නිර්භයව, අවංකව කථාකරන කෙනෙක්. හොඳයි කමක් නෑ. ඔහු මගේ කුතුහලය තව තවත් අවුස්සනවා. මෙහෙන් පිටවෙලා යන්න කලින් සත්‍යය මොකක්ද කියල හොයාගත යුතුමයි."

"ඔහුගේ අර අශ්වකරත්තය ඔන්න ආයෙමත් ගේ ඉදිරිපිට නවත්වලා." මම කීවෙමි.

"අන්න ඔහු එයට ගොඩවුණා. ඒ අතරේ ඔහු අපේ නවාතැනේ ජනේලය දිහා බැල්මක් හෙළුවා, හෝම්ස්. මම අද බයිසිකලයෙන් ඔහු පසුපස ගිහින් බලන්නද?"

"එපා වොට්සන් එපා! ඔබේ හිතේ එහෙම වැඩකට ඇතිවුණු උනන්දුව ගැන මම ගෞරව කරනවා. නමුත් මේ සටකපට වෛද්‍යවරයා එක්ක ඔබට හැප්පෙන්න බෑ. මං හිතන්නේ මගේ අරමුණ ඉටුකරගන්න වෙනත් මාර්ගයක් සොයාගත යුතුයි. මට කණගාටුයි වොට්සන්, ඔබව මෙහි දමා ඒ වැඩේට තනියෙන් යන්න සිදුවීම ගැන. නමුත් අපට ගැවසෙන්න වෙන්නේ නිහඬ ගම්බද පළාතක. එවැනි පැත්තක නාඳුනන මිනිසුන් දෙදෙනෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

ගැටසීමෙන්, ඇතිවෙන්න පුළුවන් කතාබහ මිපාදුප ප්‍රමාණය බොහොම වැඩියි. එහෙම වුණොත් ඒක මගේ ඉදිරි ගමනට බාධාවක් වෙන්න පුළුවනි. ඒ හින්දා ඒ වැඩේට මං තනියෙන් යන්නම්. මේ පෞරාණික නගරයේ ඔබට නැරඹීමට බොහෝ දේ තිබේවි. මං බලාපොරොත්තුවෙනවා අද හැන්දෑ වෙන්න කලින් සතුටුදායක ආරංචියක් රැගෙන ඔබ හමුවට එන්න."

කෙසේ වෙතත් තවත් වරක් මගේ මිත්‍රයාගේ බලාපොරොත්තු කඩවිය. එදින රාත්‍රියේ ඔහු ආපසු පැමිණියේ ද පරීක්ෂණ කටයුතු අසාර්ථක වී දඩි වෙහෙසකට පත්වයි.

"මගේ අද දවසත් පලක් නැති එකක් වුණා වොට්සන්. ආම්ස්ට්‍රෝං ගියේ කුමන ඉසව්වකටද කියල අනුමාන කරල, මම ඒ ඒ ප්‍රදේශවල ගමක් ගානේ ඇවිදිමින් දවස ගතකළා. ගමේ ප්‍රවෘත්ති බෙදා හරින්නන්, තානායම් පාලකයන් හමුවී කතාබහ කරමින් තොරතුරු එක්රැස් කළා. ඒ අනුව ඇතැම් පෙදෙසක් විමර්ශනයට ලක්කිරීමට මට හැකිවුණා. චෙස්ටර්ටන්, හිස්ටන්, වෝටබීච්, ඕකිංටන් ආදී ප්‍රදේශ හොඳින් සොයා බැලුවා. ඒ හැම එකකින්ම ලැබුණු ප්‍රතිඵල අසතුටුදායකයි. ඒ වගේ නිහඬ ගම්මාන වල අශ්වයින් දෙදෙනෙකු යෙදූ ලොකු අශ්වකරත්තයක් දකින්න ලැබුණොත් ඒකත් වැදගත් සිදුවීමක්. කාටවත් පහසුවෙන් අමතක වෙන්නෙ නෑ. වෙද, ආම්ස්ට්‍රෝං ලකුණු ගැනීමෙන් අපට වඩා තවත් ඉදිරියට යනවා. මගේ නමට විදුලි පුවතක් ආවද?"

"ඔව්. මං ඒක විවෘත කර බැලුවා. මෙන්න ඒක මං කියවන්නම්.

ක්‍රිස්ට් විද්‍යාලයේ ජෙරමි ඩික්සන්ගෙන් පොම්පේ ගැන අහන්න.

මට මේකෙ සඳහන් දේ තේරුම් ගන්න බෑ."

"ඒකෙ ඒ, හැටි ඇටළීමක් නෑ වොට්සන්. විදුලිපුවත අපේ මිත්‍රයා ඕවටන්ගෙන්, මේ මං අහල යැවූ ප්‍රශ්නයකට පිළිතුරු. මං ජෙරමි ඩික්සන් මහත්මයාට ලියුම් කැල්ලක් යවන්නම්. මං හිතන්නේ ඒකෙන් අපි නිසැකවම වාසනාවන්ත මඟකට යොමුවේවි. ඒක නොමෙයි. රගර් තරඟය ගැන ආරංචි මොකුත් තියෙනවද?"

"ඔව්. හවස පුවත්පත්වල අවසන් මුද්‍රණයේ ඒ ගැන හොඳ විස්තරයක් පළවී තියනවා. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය ලකුණු දෙකයි

http://sherlockholmesinvestigations.blogspot.com

ගෝල් එකකින් ජයගෙන. මේ අභාග්‍ය පත්තරයේ අවසන් වශයෙන් කියන දෙය. . . .

. . . .කේම්බ්‍රිජ් කණ්ඩායමේ පරාජයට ප්‍රධානම හේතුව, ඔවුන්ගේ අතිදක්ෂ, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් මෙදින ක්‍රීඩා නොකිරීමයි. තරඟය පැවැත්වුණු සෑම මොහොතකදීම ඔහු නොමැතිවීමේ අඩුපාඩුව කැපී පෙනිණි. ත්‍රීක්වෝටර් රේඛාවේදී සහයෝගයෙන් ක්‍රීඩාකිරීම, ප්‍රහාර එල්ල කිරීමේදී හා ප්‍රතිවාදීන්ගෙන් ආරක්ෂාවීමේදී දැක්වූ දුර්වලතාවය ආදී හැම ඉරියව්වකම කේම්බ්‍රිජ් ක්‍රීඩකයෝ සම්පූර්ණයෙන්ම අසාර්ථක වූහ."

"එහෙනම් අපේ මිත්‍රයා ඕවටන් කල්තබා කිව් දේවල් හරි. වෙද ආම්ස්ට්‍රෝං කිව් කථාවට මට පෞද්ගලිකව එකඟ වෙන්නත් පුළුවන්. පුංචි ළමයින්ගේ කෙළි සෙල්ලම් ගැන මගේ උනන්දුවකුත් නෑ. ඒව සෙල්ලම් කරගන්න බැරිවුණා කියල මට ඇති දුකකුත් නෑ. ඇත්තෙන්ම වොට්සන් රගර් ක්‍රීඩාව අපේ විමර්ශන පථයට බලපෑමක් ඇති කරන්නේ නෑ. අද රෑට අපි කල්තියා නින්දට යමු වොට්සන්. මට ඉවකින් වගේ දැනෙනවා හෙට දවස අපට වැඩ අධික බොහොම කලබලකාරී දවසක් වෙනවා."

පසුවදා උදයේ දක්නට ලැබුණු දර්ශනයෙන් මම භීතියට පත්වීමි. හෝම්ස් ගිනි උදුන අසල වාඩිවී සිටියේ සිරින්ජයක් ද අතැතිවයි. බොහෝ කලකට පෙර කොකේන් ශරීරයට විද ගැනීමට ඔහුගේ තිබූ පුරුද්ද සිහිවීමෙනුයි, මා බියට පත්වුණේ. එහෙත් මගේ මුහුණේ පළවූ හැඟීම් දුටු ඔහු, මහ හඬින් සිනාසී සිරින්ජය මේසය මතට දැම්මේය.

"නෑ නෑ. භයවෙන්න කිසිම කාරණයක් නෑ මගේ මිත්‍රයා. අද දවසේ නම් මේක විනාශකාරී උපකරණයක් නොමෙයි. බාගවෙලාවට අපේ අභිරහස විසඳනා යතුර මේක වෙන්නත් පුළුවනි. මම මගේ ඔක්කොම බලාපොරොත්තු තියලා තියෙන්නේ මේ සිරින්ජය මත. මං මේ පොඩි ඔත්තු බැලීමේ ගමනක යෙදිලා ආපහු ආවා විතරයි. හැම දෙයක්ම සතුටුදායකයි. හොඳට බඩ පිරෙන විදියට උදේ කෑම වේල කන්න වොට්සන්. ඒ මොකද මං බලාපොරොත්තු වෙනවා, අද වෙද ආම්ස්ට්‍රෝං ලුහුබැඳ යන්න. ඒක පටන් ගත්තට පස්සේ, මං කෑමට වත් විවේකයක් ගැනීමකට වත් මොහොතකට

http://sherlockholmesinvestigations.blogspot.com

වත් නවතින්නේ නැහැ. අද නම් මිණිහා රිංගන ගුහාවේ කෙළවරටම යනතුරු එළවාගෙන යනවා."

"එහෙම නම් උදේ කෑම පාර්සල් කරගෙන දැන්ම පිටත්වුණොත් හොඳයි. අශ්වකරත්තය මිනුගෙ දොරකඩ අර සූදානමින් තියෙන්නේ. මිනු උදේ පාන්දරින්ම සටන්ගන්න හදනවා වගෙයි."

"ඒකට කමක් නෑ. මහෙ ගිහිපුවාවෙ. මට ඔහුව ලුහුබඳින්න බැරි විධියේ මාර්ගයක ගමන් කරල තිබුණොත් ඔහු බොහොම දක්ෂයෙක්. කෑම කාල ඉවරවුණාම අහළ තට්ටුවට එන්න වොට්සන්. මං ඔබට අඳුන්වල දෙන්නම් රහස් පරීක්ෂකයෙක්. අප ඉදිරියේ ඇති වැඩ කොටස හොඳින් කිරීමට ඔහු හපනෙක්. ඔහුගෙ ක්ෂේත්‍රයේ ඔහු අතිදක්ෂයෙක්."

අප පහළ තට්ටුවට බැස්ස පසු හෝම්ස් ගමන් කළේ අශ්වයින් ගාල් කරන ඉස්තාලය දෙසටයි. එහි තිබු පෙට්ටියක් විවෘත කළ මගේ මිත්‍රයා බල්ලෙකු එළියට ගත්තේය. 'බීගල්' සහ 'ෆොක්ස්හවුන්ඩ්' වර්ගවල සුනඛයින්ට අතර මැදි පෙනුමක් තිබු මොහු, සුදු සහ දුඹුරු පැහැ මිශ්‍ර වර්ණයක් තිබු බල්ලෙකි.

"කෝ මං ඔබට පොම්පේව හඳුන්වා දෙන්න. හිවලුන් දඩයම් කරන දඩයක්කාරයන්ට මඟ පෙන්වන්නන් අතරේ විශිෂ්ටතමයා පොම්පේ. ඔහුගේ සිරුරේ හැටි බැලුවාම ඔබට පෙනෙනවා ඇති ඔහු වේගයෙන් දුවන්න පුළුවන් එකෙක් නොවන බව. ඒ වුණත් යන්තමින් හරි ඉවකරන්න දෙයක් තිබුණොත් සටන අත්හරින කෙනෙක් නෙමෙයි, පොම්පේ. අන්තිම කෙළවරටම ඉවකරගෙන යනවා.

ඒ ඔක්කොම හරි පොම්පේ. ඔහේ සුනඛයින් අතර වේගවත්ම එකා නොවෙන්න පුළුවනි. ඒ වුණාට ලන්ඩනයෙන් ආව මැදි වයසේ මහත්වරු දෙදෙනෙකුට ඔහේ ටිකක් වේගවත් වැඩිවෙයි කියලයි මට හිතෙන්නේ. ඒ නිසා ඔහේගෙ බෙල්ල වටේ තියෙන පටියට, මං මේ හම් පටිය ගැටගහනවා. දැන් ඉතින් ඇවිත් උඹට කරන්න පුළුවන් වැඩ මොනවාද කියල පෙන්නාපන් කොල්ලෝ."

හෝම්ස්, පොම්පේව පාරෙන් එහා පැත්තටත්, එතැනින් වෛද්‍යවරයාගේ නිවසේ දොර අසලටත් ගෙන ගියේය. ස්වල්ප

http://sherlockholmesinvestigations.blogspot.com

වේලාවක් එතැන ඉවකරමින් සිටි ඌ, ඊළඟට මිදුලට බැස පාරට ආවේ මහත් සතුටෙනි. ඉන්පසු පාර දිගේ ඉදිරියට යාමට පටන් ගත්තේය. පැය භාගයක් ගතවෙද්දී නගර සීමාවෙන් පිටවූ අපි, ගම්බද පෙදෙසක් මැදින් වැටුණු පාරක ගමන් කරමින් සිටියෙමු.

"මොකක්ද හෝම්ස් ඔබ යොදාගත්ත උපක්‍රමය?"

"බොහොම පැරණි කාල වල සිට යොදාගත්, එහෙත් උතුම් ක්‍රමයක්. ඒක මේ වගේ අවස්ථාවල හරිම ප්‍රයෝජනවත්. මං අද උදේ ආම්ස්ට්‍රෝං ගේ මිදුලට ගියා. අසමෝදගම් ඇට පිරවූ මේ සිරින්ජය අරගෙනයි ගියේ. ඔහුගේ අශ්වකරත්තයේ පිටිපස්ස රෝදය වටේටම හොඳින් අසමෝදගම් ආලේප කළා. දඩයමේ යනකොට ඉවකරන බල්ලෙක්, අසමෝදගම් සුගන්ධය ඔස්සේ ඉවකරමින් යාවි හැතැක්ම සියගණනක්. අපේ මිත්‍රයා ආම්ස්ට්‍රෝංට පොම්පේව මගහැරල යන්න ඕනෙ නම්, මුළු කේම්බ්‍රිජ්ෂයර් ප්‍රාන්තය හරහාම ගමන් කරන්න සිද්ධවේවි. හා හා! දක්කද කෛරාටික තක්කඩියගෙ වැඩ! ඊයෙ හැන්දෑවෙ මට අනුනොවී මිනිහා පැනල ගිහින් තියෙන්නෙ මෙතැනින්."

බල්ලා එක්වරම ප්‍රධාන පාරෙන් ඉවත්වී තණකොළ වැවී තිබුණු පටුමගකට හැරුණේය. මෙසේ සැතපුම් භාගයක් ගිය පසු මුලින් අප ආ මාවතට සමාන්තරව පිහිටි පුළුල් මාවතක් හමුවිය. එතැනදී පොම්පේ යළිත් වරක් හැරුණේ අප පසුකර ආ කේම්බ්‍රිජ් නගරය දෙසටමයි. නගරයට මදක් දකුණෙන් වැටී තිබුණු මෙම මාවත අප ගෙන ගියේ මුලින් ගමන ඇරඹූ දිශාවට, විරුද්ධ දිශාවටයි.

"මිනිහ මේ තරම් වටරවුමක් ගහල ඇවිත් තියෙන්නේ අපව මුළාකරන්නයි එහෙනම්?" හෝම්ස් කීය.

"මං අර ගම්මාන වල මිනිසුන්ගෙන් කොයිතරම් හොයා බැලුවත් කිසිවක් හොයාගන්න බැරිවුණු එකේ පුදුමයක් නෑ. දොස්තර මහත්මයා යමක් වසංකරන්න සම්පූර්ණ උත්සාහයම යොදලා තියෙනවා. එවැනි උත්සාහයක් දැරුවේ මොකක් හංගන්නද? එතකොට අපේ දකුණු පැත්තෙන් තියේන ගම්මානය ට්‍රම්පිංටන් වියයුතුයි. දෙයියෝ සාක්කි! -ඔන්න ආම්ස්ට්‍රෝංගේ අශ්වකරත්තය ඉස්සරහ

http://sherlockholmesinvestigations.blogspot.com

වංගුවේ. ඒක මේ පැත්තටයි එන්නෙ. ඉක්මනට හැංගෙන්න වොට්සන්. නැත්නම් අපි ඉවරයි.!"

එසේ කිව් හෝම්ස් පොම්පේව ඇදගෙන අසල වූ කුඹුරකට පැන්නේය. පාර අයිනේ වූ පඳුරුවලට අප යන්තම් මුවා වූවා පමණි. කරත්තය අප පසුකොට වේගයෙන් ගමන් කළේය. වෛද්‍ය ආම්ස්ට්‍රෝං එහි සිටිනු මම දුටුවෙමි. ඔහු සිටියේ හිස ඉදිරියට පහත් කරගෙන, දෑත්වල මුහුණ සඟවාගෙනයි. එම ඉරියව්ව අනුව, කිසියම් ප්‍රශ්නයක් නිසා වෛද්‍යවරයා අතිශයින් කම්පාවට පත්ව ඇතැයි මට සිතිණ. මගේ මිත්‍රයා ද එම දර්ශනය දැක ඇති බව ඔහුගේ කැළැඹීමට පත් මුහුණෙන් මම වටහාගතිමි.

"මං හිතනවා අපේ මේ පරීක්ෂණය කෙළවර වෙන්නේ ඒ තරම් සන්තෝෂදායක ආකාරයකට නොවෙයි කියලා. ඒක අපට බලාගන්න වැඩිවෙලා ගතවෙන එකක් නැහැ. පොම්පේ යමු! අහා! අර තියෙන්නෙ කුඩා නිවසක් ලොකු වත්තක් මැද්දේ."

අප ගමනාන්තයට පැමිණ ඇති බවට සැකයක් නොවීය. එහෙ මෙහෙ දිවූ පොම්පේ ගේට්ටුව අසල ඉවකරන්නට පටන් ගත්තේය. ඒ අශ්වකරත්තයේ රෝද ලකුණු හොඳින් සටහන්වී තිබුණු තැනයි. තනිව පිහිටි කුඩා නිවස වෙත වැටී තිබුණේ අඩිපාරකි. එතැන වූ වැටේ පොම්පේ ගැටගසා තබා, හෝම්ස් සහ මම නිවස දෙසට පා නැඟුවෙමු. මගේ මිත්‍රයා දිරාගිය දොරට කිහිපවාරයක්ම තට්ටු කළේය. ඇතුළතින් කිසිදු පිළිතුරක් නොලැබිණි. එහෙත් නිවස තුළ කවුරුන් හෝ සිටින බව සහතිකය. අපේ සවණට ඇසුණේ කිසිවෙකු දැඩි වේදනාවකින් හෝ ශෝකයෙන් නැංවූ හඬකි. ආපසු හැරී බැලූ අපි, අශ්ව පැහැති අශ්වයින් බැඳි කරත්තය, යළිත් වරක් නිවස දෙසට පැමිණෙන බව දුටුවෙමු.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! ලෙස්ලි ආම්ස්ට්‍රෝං ආපහු එනවා. අප මීළඟට ගතයුතු පියවර ඒකෙන් තීරණය වෙනවා. ඔහු එන්න කලින් අපි ගිහිං බලමු මොකක්ද මේකෙ තේරුම කියලා." පැවසූ හෝම්ස් දොර විවෘත කළේය.

අපි විසිත්ත කාමරයට ඇතුළුවූයෙමු. කලින් ඇසුණු ශබ්දය දැන් වඩාත් හොඳින් ඇසිණි. ඒ උඩුමහලෙන් බව පැහැදිලිය. හෝම්ස් වේගයෙන් උඩුමහලට නගිද්දී, මම ඔහු පසුපස දිවගියෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

ශබ්දය නිකුත්වුණු කාමරයේ දොර අඩවන් කර තිබිණි. හෝම්ස් එය තල්ලුකරගෙන ඇතුළට ගියේය. එහි දක්නට ලැබුණු දර්ශනයෙන් අපි දෙදෙනාම භීතියට පත්වුයෙමු.

තරුණ, ශෝභන කාන්තාවකගේ මළසිරුර ඇඳ මත තිබිණ. ඇගේ සුදුමැලි නිශ්චල මුහුණ, රන්වන් හිසකෙස්වල තිබුණේ සිත්ගන්නාසුලු පෙනුමකි. එහෙත් නිල්වන් දෑස විවරකරගත් ගමන්මය. ඇඳේ පාමුල බිම දණගසාගෙන සිටියේ තරුණයෙකි. ඇඳ රෙදි අතරේ මුහුණ සඟවාගෙන ඔහු ඉකිගසමින් වැලපුණේය. අතිශය සංවේගයෙන් සිටි ඔහුට, අප එහි ඇතුළු වූ බව වත් නොඇසිණි. හෝම්ස් තම අත ඔහුගේ උරහිසමත තැබූ විට ඔහු හිස හරවා බැලුවේය.

"ඔබද ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් මහත්මයා?"

"ඔව්. නමුත් ඔබ ප්‍රමාද වැඩියි. ඇය මියගියා."

දුක නිසාම ඔහු සිටියේ අඩ සිහියෙන් වියයුතුය. අප වෛද්‍යවරුන් නොවන බව පැවසුවත්, ඔහුට එය වටහාගැනීම අපහසු විය. ඔහු සිතාසිටියේ අප, ඇගේ අවසාන මොහොතේ ප්‍රතිකාර සඳහා පැමිණි වෛද්‍යවරුන් ලෙසයි.

මුලින් ඔහු සැනසීමට යමක් පැවසූ හෝම්ස්, ස්ටෝන්ටන්ගේ හදිසි අතුරුදන්වීම නිසා, ඔහුගේ මිතුරන් අතිශයින් කලබලයට පත්වූ බව කීමට උත්සාහ කළා පමණි. කිසිවෙකු වේගයෙන් තරප්පු පෙළ නැග එන අඩි ශබ්දය ඇසිණි. ඊළඟ මොහොතේ අප දුටුවේ ප්‍රශ්නාර්ථයක් මුහුණට නහාගත් ආම්ස්ට්‍රෝංගේ ගාම්භීර මුහුණයි.

"එහෙනම් මහත්වරුනි. ඔබේ අරමුණ ඉෂ්ට කරගෙන, මෙතැනට කඩා වැදීමට ඔබ සමත්වුණා. ඒත් ඔබ ඊකට තෝරාගත්තේ ඉතා දුක්බර අවස්ථාවක්. මරණයක් සිදුවී ඇති තැනක සණ්ඩුවක් පටන් ගැනීමට මං කැමති නෑ. නමුත් මං ඔබට සහතික කරලා කියන්නම්. මං මීට වඩා තරුණයෙක්ව හිටියා නම් ඔබේ මේ අශෝභන හැසිරීමට මගෙන් නම් සමාවක් ලැබෙන්නේ නෑ."

"ආම්ස්ට්‍රෝං මහත්මයා. අපි දෙන්නාම එකම අරමුණක් කරා දෙපැත්තකින් පැමිණි අය. පහළ තට්ටුවට ආ හැකි නම් මං ඔබට තේරුම් කරන්නම් මේ දුක්ඛදායක සිද්ධියට අප යොමුවුණේ කොහොමද කියලා."

http://sherlockholmesinvestigations.blogspot.com

මිනිත්තු කිහිපයකට පසු අපි දෙදෙනා වෛද්‍ය ආම්ස්ට්‍රොං සමග විසිත්ත කාමරයේ අසුන්ගෙන සිටියෙමු.

"ඉතිං මහත්මයා?" වෛද්‍යවරයා ඇසීය.

හෝම්ස් කථාව පටන්ගත්තේය.

"ඔබ තේරුම් ගතයුතුයි මා මේ කටයුත්තට යොමු කළේ මවුන්ට් ජේම්ස් සාමිවරයා නොවෙන බව. ඒ වංශාධිපතියාට මගේ කිසිම අනුකම්පාවක් නෑ. යම් කෙනෙක් ආගිය තැනක් හොයාගන්න බැරිවුණාම, ඔහුට අත්වුණු ඉරණම මොකක්ද කියල හොයල දෙන එක මගේ රාජකාරිය. ඒක ඉටුකළාට පස්සේ, අපරාධයක් මොකුත් සිදුවෙලා නැත්නම් මගේ කටයුතු අවසන් වෙනවා. එහෙම වෙලාවට මං වැඩි වශයෙන්ම කරන්නේ පෞද්ගලික කරුණු මහජනයාට හෙළිකිරීම නෙමෙයි; ඒවා රහසිගතව තබාගැනීමට උදව්කිරීම. මගේ විශ්වාසයේ හැටියට මෙතැන නීති විරෝධී දෙයක් අපරාධක් සිදුවෙලා නැහැ. එහෙම නම් මේවා පුවත්පත් වල පළනොවෙන අයුරින් රහසිගතව තබාගැනීමට මගේ සම්පූර්ණ සහයෝගය ඔබට ලැබෙනවා."

අඩියක් ඉදිරියට තැබූ ආම්ස්ට්‍රොං හෝම්ස්ගේ දකුණතෙන් අල්ලා සොලවා, ආචාර කළේය.

"ඔබ හොඳ මහත්මයෙක්. මං ඔබව තේරුම් ගත්ත හැටි වැරැදියි. ඇය අවසන් සුසුම් හෙළද්දී අසරණ ස්ටෝන්ටන් තනියෙන් දාලා මං යන්න ගියා. නමුත් ඒ තරම් ඉක්මනට පිටවී ගිය එක ගැන මගේ හදවත මට දොස් නැගුවා. මං ආපහු හැරිලා ආවෙ ඒකයි. එහෙම එන්න සිදුවීම ගැන මං දෙවියන්ට ස්තුති කරනවා. ඒකෙන් මට ඔබව හඳුනාගන්නට ලැබුණා. තොරතුරු බොහොමයක් ඔබ දනටමත් දන්න නිසා, මේක ඉතා පහසුවෙන් ඔබට තේරුම් ගැනීමට හැකිවේවි.

අවුරුද්දකට කලින් ගොඩ්ෆ්‍රි ස්ටෝන්ටන් ලන්ඩන් නගරයේ නිවසක නේවාසිකව සිටියා. එම නිවස හිමිකාරියගේ දුවණිය හා පෙමින් බැඳුණු ඔහු ඇය හා විවාහ වුණා.

ඇය ගතිගුණ අතින් යහපත් ඒ වගේම බුද්ධිමත් තරුණියක්. ඒ වගේ බිරිඳක් ගැන කිසිම මිනිහෙකුට ලැජ්ජා වෙන්න හේතුවක්

http://sherlockholmesinvestigations.blogspot.com

නෑ. නමුත් ගොඩ්ප්‍රි අර ඔලුව නරක් වෙච්ච වංශාධිපතියගෙ බෑණා. ඒ නිසාම ඔහුගේ ධනස්කන්ධයේ උරුමකාරයා. ගොඩ්ප්‍රිගේ විවාහය ගැන නාකිමිනිහාට ආරංචි වුණා නම්, ඔහු කටයුතු කරන්නේ බෑණාට එක පැන්සයක් වත් උරුම [illegible]න තැනට. ඒකෙ කිසි සැකයක් නෑ. මං මේ ඉලන්දාරියාව හොඳින් හඳුනගෙන හිටියා. මං ඔහුට ආදරය කලේ මගේ දරුවෙකුට වගේ. ගොඩ්ප්‍රිගේ විවාහය ගැන ආරංචිය ඉතාම රහසිගතව තබාගන්න මං ඔහුට උදව් කළා. ඒ මොකද මේ වගේ දෙයක් ගැන කුඩා කෙදිරිල්ලක් වත් පිටවී ගියොත්, ඒක කවුරුත් දන්නා ආරංචියක් බවට පත්වෙන්න වැඩි දවස් ගතවෙන්නෙ නෑ. නමුත් මේ ප්‍රාථ පළාතක තිබෙන මේ කුඩා ගෙයට ස්තුති වෙන්න, මේ දක්වාත් කාරණාව රහසිගතව තබාගන්න ගොඩ්ප්‍රිට හැකිවුණා. මේ රහස දනහිටියේ මමත් ඉතාම හිතවත් සේවකයෙකුත් පමණයි. මේ මොහොතේ ඔහු අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා ට්‍රම්පිංටන් වලට ගිහින්.

අපි කවුරුත් බලාපොරොත්තු නොවුණු විදියට එක්වරම ගොඩ්ප්‍රිගේ බිරිඳ භයානක රෝගයකට ගොදුරු වුණා. ඒකට හේතුව ඉතාම ප්‍රබල ආකාරයේ විෂබීජයක්. ඒ මගින් ඇගේ ශරීරයේ පටක විනාශ වී ගියා. මේ කරුණ නිසා ගොඩ්ප්‍රි සංවේගයෙන් පිස්සු වැටිලා වගෙයි හිටියේ. ඒ වුණත් අත්‍යවශ්‍ය රගර් තරඟයක් සඳහා ඔහුට ලන්ඩනයට යන්න සිදුවුණා. ඒ මොකද රහස හෙළි නොකොට, ඔහුට තරඟයට සහභාගී නොවී බේරීඑන්න ක්‍රමයක් තිබුණේ නැහැ. ඔහුව ධෛර්යමත් කරලා සතුටෙන් තබන්න, මං ඔහුට විදුලි පුවතක් යැව්වා. ඔහු මට විදුලි පුවතක් එව්වා ඇගේ ජීවිතය ගලවාගැනීම සඳහා හැකි සෑම දෙයක්ම කරන මෙන් ආයාචනය කරමින්. පුදුමාකාර විදියට ඔබට දකින්නට ලැබී තිබුණේ එයයි. ඇගේ ජීවිතයේ අවදානම් බව ගැන විස්තර මං ඔහුට දන්වා යැව්වේ නැහැ. ඒ මොකද ඇයගේ ජීවිතය ගලවා ගැනීමට ඔහුට කළ හැකි දෙයක් නොතිබුණු නිසා. එහෙත් මම තරුණියගේ පියාට සියල්ල දන්වා ලිපියක් යැව්වා. නමුත් ඔහු වැඩිදුර හිතානොබලා, අමනෝඥ ලෙස මේ ගැන ගොඩ්ප්‍රි හමුවී දනුම් දී තිබෙනවා. ඒකෙන් වුණු ප්‍රතිඵලය ගොඩ්ප්‍රි සියල්ල අත්හැර කඩාගෙන බිඳගෙන මෙහේ දිව් ඒමයි. ඒ ආ ද[illegible] ඉඳලා ඔහු දැඩි ශෝකයෙන්, ඇගේ ඇඳ ළඟ අද උදේ වනතුරු දණගසා ගෙන

http://sherlockholmesinvestigations.blogspot.com

හිටියේ. තවදුරටත් රෝගයෙන් දුක් නොවිඳ ඇය අද උදේ මියගියා. සම්පූර්ණ සත්‍යය එයයි, හෝම්ස් මහත්මයා. මං විශ්වාස කරනවා ඔබත් ඔබේ මිත්‍රයාත් ඒ රහස රැකගන්න කටයුතු කරාවි කියලා."

හෝම්ස් තම සුරතෙන් වෛද්‍යවරයාගේ සුරත සෙලවූයේ එම ප්‍රතිඥාව දෙමිනි.

"එන්න වොට්සන් අපි යමු."

Reading Purpose Only.. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

# ත්‍රී ගේබල්ස් වික්‍රමය

Reading Purpose Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ත්‍රී ගේබල්ස් වික්‍රමය

අභිරහස් පරීක්ෂණ රාශියක්ම විසඳීමට මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් ඉදිරිපත් වෙද්දී, මම ද ඊට සහභාගි වූයෙමි. එහෙත් ඉන් එකක්වත් මේ තරම් ත්‍රාසජනක අයුරින්, හදිසියේ ඇරඹුණු බවක් මට සිහි කිරීමටවත් නොහැක. දින කිහිපයකින් මට මගේ මිත්‍රයා දැකීමට ඉඩක් සැලසී තිබුණේ නැත. ඒ නිසාම ඔහු යෙදෙමින් සිටියේ කුමන පරීක්ෂණයකද යන්න, මම දැන නොසිටියෙමි. එදා උදේ වරුවේ හෝම්ස්ගේ ස්වභාවිය ප්‍රියජනකය. කතාබහක යෙදීමට ඔහු සූදානම් බවට ලකුණකි ඒ.

"ඔය ගිනිඋදුන අයිනෙ තියෙනු ඔබේ පුපුරුදු හාන්සි පුටුවේ වාඩිවෙන්න වොට්සන්. හුඟ දවසකින් ඔබ හමුබ වුණේ නැහැනෙ. ඔබත් එක්ක කථා කරන්න හුඟක් දේවල් තියෙනවා."

ඔහු පැවසුවේ මා ඉදිරිපිට වූ අනෙක් සැපපුටුවේ වකුටු වී පයිප්පය දල්වා ගනිමිනි.

අමුත්තා අපේ විසිත්ත කාමරයට කඩා වැදුණේ මේ මොහොතේදීය. එසේ පැමිණියේ කුලප්පු වූ හරකෙකු යයි මා කීවොත් සිදුවීම ගැන පැහැදිලි චිත්‍රයක් සිතේ මවාගැනීම ඔබට පහසුවෙනු ඇත.

දොර වේගයෙන් විවෘත වූයේ මහ හඬක් නංවමිනි. යෝධ සිරුරක් තිබු නීග්‍රෝ ජාතිකයා අපේ විසිත්ත කාමරයට කඩා වැදුණේ ඊට වැඩි හඬක් නගමිනි. ඔහු ආ පිළිවෙළ නොවෙන්නට, ඔහුට තිබුණේ බැලූ බැල්මට සිනහ උපදවන විසුළු පෙනුමකි. අළු පැහැති ලොකු කොටු රෙද්දකින් මැසූ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි ඔහු, රෝස පැහැති ටයිපටියක් පැළැඳ සිටියේය. ඔහුගේ පුළුල් මුහුණ මැද වූයේ බිඳී සමතලා වූ නාසයකි. කෝපයෙන් දිලිසුණු

http://sherlockholmesinvestigations.blogspot.com

දෙනෙත් නිසා ඔහුගේ මුහුණේ බිහිවුණු බවක් ද දිස්විය. අමුත්තා අප දෙදෙනාගේම මුහුණු දෙස පරීක්ෂාවෙන් බැලීය.

"ඔහේල දෙන්නගෙන් කොයි එක්කෙනාද හෝම්ස් මහත්තය කියන්නෙ?"

හෝම්ස් තම අත තිබූ පයිප්පය සංඥාවක් ලෙස ඉහළට එසවූයේ සිනාමුසු මුහුණෙනි.

"ඔහෝ! තමුසෙද?" ඇසූ අමුත්තා ඉදිරියට පැමිණ, අඩියට දෙකට හෝම්ස් වෙත ළංවූයේ භයානක අයුරෙනි.

"මේ බලනවා හෝම්ස් මහත්තයා, අනික් මිනිස්සුන්ගේ වැඩ වලට ඇඟිලි ගහන්න යන්නෙ නැතුව, තමුසෙ තමුසෙගෙ පාඩුවේ ඉන්නවා. ඒ මිනිස්සු තමන්ගේ වැඩ තමන්ම කරගනීවි. මං කිව්ව දේ ඔහේ හිතට ගත්තද?"

"දිගටම කථාකරගෙන යන්න මිත්‍රයා. ඔහේගෙ ඔය කථාව අහගෙන ඉන්න, හරි අපූරුයි," හෝම්ස් කීවේය.

"හැබෑට? ඔහේ ටිකක් ගණංකාර වැඩියි. ඔහේගෙ ඔය වැඩිහරිය මට කපල දාන්න වුණොත් ඒක ඒ තරම් අපූරු වෙන්නෙ නෑ. තේරුණාද? ඔහේ වගේ මිනිස්සුන්ව මං මීට කලින් මට්ටු කරල තියෙනවා. එහෙම කළාට පස්සෙ ඒ ගොල්ලන්ගෙ පෙනුම නම් ඒ තරම් අපූරු වුණේ නෑ, මෙන්න මේ දිහා බලනවා හෝම්ස් මහත්තයෝ."

නීග්‍රෝ ජාතිකයා, නහර ඉල්පී, කරගැට වලින් වැසුණු තම දැවැන්ත හස්තය මීට මොළොවා හෝම්ස් දෙසට එල්ල කළේය. එහෙත් හෝම්ස්ට පහර නොදී, ඔහුගේ නාසයට ඉතා නුදුරෙන් තම අත නවතා ගත්තේය.

කිසිදු කැළැඹීමකින් තොරව හෝම්ස් එම අත දෙස හෙළුවේ සුපරීක්ෂාකාරී බැල්මකි.

"මේ විදියට අත විරූපී වුණේ උපතින්මද? නැත්තං පස්සේ ටිකෙන් ටික වුණු දෙයක්ද?"

මගේ මිතුරා ඇසුවේ කිසිදු භීතියකින් තොරවයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයාගේ අත්සුන් බව නිසාද නැතිනම් මා ගිනිඅඟුරු අල්ලන බර යකඩ අඬුව අතට ගනිද්දී ඇතිවුණු ශබ්දය නිසාද නොදනිමි. අපේ අමුත්තාගේ සැරපරුෂ බව අඩුවිය.

"ඔන්න මං තොකිව්වා කියන්න එපා. ඔහේට මං කල් ඇතුව දැනුම් දුන්නා. හැරෝවේ වල මගේ මිත්‍රයෙක් ඉන්නව ඌත් දන්නවනේ මං කවුරු වෙනුවෙන්ද කථාකරන්නෙ කියල ඔහේගෙ මේ ඕන නැති ඇඟිලි ගැහීම් වලට එයා කැමැති නෑ. තෙරුණාද? ඔහේ පොලීසිය නොමෙයි නේ. මං කියනා දේ අහන්නෙ නැතුව ආවොත්, මමත් සූදානම්." නීග්‍රෝ ජාතිකයා ගිගුරුවේය.

"මං දැන් සෑහෙන කාලෙක ඉඳල තමුසෙ හම්බවෙන්නයි බලාගෙන හිටියෙ," හෝම්ස් කථාව ඇරඹුවේය.

"තමුසෙට අපේ පුටුවක වාඩිවෙන්න කියල මං ආරාධනා කරන්නෙ නෑ. ඒ මොකද තමුසෙගෙන් පිටවෙන ගඳ මට ඉවසන්න බෑ. ඒ වුණත් තමුසෙ නේද අර ස්ටීව් ඩික්සි කියන්නේ?"

"ඒක තමයි මගේ නම."

"අර හෝල්බෝන් නැබැරුම ළඟදී පර්කින්ස් කියන ඉලන්දාරියා මරා දැමූ එකට ඔහේ . . . . මොනවා? තමුසෙ පැනල දුවන්නෙ නැද්ද?"

නීග්‍රෝ ජාතිකයාගේ මුහුණේ පෙනුම වෙනස් විය.

"මං මොකටද ඔය කතා වලට කන්දෙන්නේ. ඔය පර්කින්ස් ඉලන්දාරියා මැරුම් කනකොට, මං බර්මිංහැම් වල බොක්සිං පුහුණු වෙමිනුයි හිටියෙ."

"තමුසෙ ඒ කථාව උසාවියේදී විනිසුකාරයට කියනවා ස්ටීව්. මං ඇස් දෙකෙන් බලාගෙන ඉඳිද්දි, තමුසෙ බාති ස්ටොක්ඩේල් එක්ක එකතුවෙලා . . . . ."

"අනේ දෙවියනේ! මාව බේරාගන්න හෝම්ස් මහත්තයා. ."

"ඇති තමුසෙගෙ කථාව. යනව යන්න මෙතනින්. මට ඕනවුණු වෙලාවට මං තමුසෙව අල්ලගන්නම්."

"ඔබට ශුභ දවසක් හෝම්ස් මහත්මයා. මං මෙහෙම ආව එක ගැන මාත් එක්ක අමනාපයක් හිතේ තියාගන්න එපා."

http://sherlockholmesinvestigations.blogspot.com

"කියනවා තමුසෙව මෙහාට එව්වෙ කවුද කියල."

"ඒක රහසක් නෙමෙයි හෝම්ස් මහත්තයා. ඔබ අර කලින් කිව්ව මහත්තයාමයි."

"ඒ මහත්තයට වැඩේ භාර දුන්නෙ කවුද?"

"දෙයියම්පා! මං ඒක දන්නෙ නෑ හෝම්ස් මහත්තයා. ඔහු මට කිව්වා ස්ටීව් තමුසෙ ගිහිං හෝම්ස් මහත්තයාට කියනවා, මීට පස්සේ හැරෝවේ පැත්තෙ ආවොත් ඔහුගේ ජීවිතේ පරෙස්සම් නැහැ කියලා. දෙයියම්පා! ඇත්ත ඒකයි මහත්මයා."

තවදුරටත් කථාවට නොඇදුණු අමුත්තා අපේ නිවසෙන් පැන දිව්වේය. සිනාවක් ඈ හෝම්ස් තම පයිප්පයේ අළු ඉවත් කිරීමට පටන් ගත්තේය.

"යකඩ අඬුවෙන් ඔහුගේ හිසට පහරක් එල්ල කිරීමට ඔබට සිදුනොවුණු එක ගැන මං සන්තෝෂයි වොට්සන්. මං දැක්කා ඔබ යකඩ අඬුව අතට අරගෙන සූදානම් වුණු හැටි. ඌ මහ බොරු චණ්ඩියෙක්. යෝධයෙක් වගේ ඇඟපත තිබුණාට, නිකම්ම භයකරගන්න පුළුවන් මෝඩයෙක්. මිය අර් ස්පෙන්සර් ජෝන්ස් කල්ලියේ එකෙක්. උන් මෑතකදී මැරවර වැඩවල යෙදුණු බව මට ආරංචි වුණා. ඉඩක් ලැබුණු හැටියෙ මවුන්ගේ තොරතුරු හොයලා, ඒක කෙළවරක් කරන්න ඕනෙ. මේ ආපු එකාට ඉහළින් ඉන්න එකා තමයි බානි. ඌ මෙයාට වඩා ටිකක් මොළේ තියන එකෙක්. මොවුන් මිනිස්සුන්ට පහරදීම්, තර්ජනය කිරීම් ගැන විශේෂඥයෝ. මට දැනගන්න උවමනා, මේ අවස්ථාවෙ මොවුන්ව ඉස්සරහට දාල තියෙන්නෙ කවුද කියල."

"මවුන් ඔබට තර්ජනය කිරීමට හේතුව මොකක්ද හෝම්ස්?"

"මේ ළඟදි මට ඉදිරිපත් වුණා හැරෝ වීල්ඩ් පැත්තෙන් ගැටලුවක්. බැලූ බැල්මට ඒකෙ ඒ හැටිම වැදගත් කමක් පෙනුණෙ නැහැ. නමුත් මොවුන් මේ විදියට තර්ජනය කරන නිසාම මට හිතෙනවා මේක තවදුරටත් හාරා අවුස්සා බලන්න. මේක යටගහන්න කාට හරි උවමනාවක් තියෙන නිසාම පෙනෙනවා මේකෙ මොකක් හරි අභිරහසක් තියෙන බව."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකක්ද ඔය ඔබ කිව් ගැටලුව?"

"මං ඒ ගැන ඔබට කියන්නයි හැදුවෙ වොට්සන්. කෝ අර මිනිහා අපට බාධා කළානේ. මෙන්න මේබර්ලි මහත්මිය මට එවූ ලියුම. ඔබ කැමැති නම් මාත් එක්ක යන්න එන්න. අපි යවමු විදුලි පුවතක් එන බව දන්වලා. ඊට පස්සෙ අපට පුළුවනි ඇය හමුවෙන්න යන්න."

මම එම ලිපිය කියවා බැලීමි.

*"හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතාණනි,*

*මා වාසය කරන මේ නිවසේ පුදුමාකාර සිදුවීම් කිහිපයකට මට මුහුණ දීමට සිදුවිය. ඒ ගැන ඔබෙන් උපදෙසක් ලබාගැනීමට හැකි වෙතොත්, මම එය අතිශයින් අගය කොට සලකමි. හෙට දවසේ ඕනෑම වෙලාවක, මේ ගෙදර දී ඔබට මා හමුවිය හැකියි. නිවස පිහිටා ඇත්තේ වීල්ඩ් දුම්රියපොළේ සිට පයින් එන දුරකයි. මගේ මියගිය ස්වාමිපුරුෂයා වූ මෝටිමර් මේබර්ලි, ඔබේ මුල් කාලයේ අනුග්‍රාහකයෙකු වූ බව, මගේ විශ්වාසයයි.*

*මෙයට,*

*හිතවත්,*

*මේරි මේබර්ලි*

*ලිපිනය - ත්‍රී ගේබල්ස් නිවස, හැරෝ වීල්ඩ්.*

"ඔබට මේකට කාලය යොදවන්න පුළුවන් නම්, අපි පිටත්වෙමු වොට්සන්."

කෙටි දුම්රිය ගමනක් අවසානයේ, අපි මඳ දුරක් අශ්ව කරත්තයෙන් ගමන් කළෙමු. කුඩාබිමක් මැද පිහිටි දැවයෙන් හා ගඩොලෙන් තැනූ නිවසක් වෙත අපි ළඟාවූයෙමු. ගෙවත්ත උද්‍යානයක් ලෙස අලංකාර කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබිණි. නිවසෙන් වත් ගෙවත්තෙන් වත් එතරම් සෞභාග්‍යමත් බවක් දිස් නොවීය. එහෙත් නිවස සකලවිධ ගෘහභාණ්ඩ වලින් සම්පූර්ණ වී තිබිණි. අප පිළිගැනීමට ඉදිරියට ආවේ, වයස්ගත

http://sherlockholmesinvestigations.blogspot.com

කාන්තාවකි. සිරිත් විරිත් පිළිබඳ හසල දැනුමක් තිබූ ඇය, මහත් ගෞරවයෙන් අප පිළිගත්තාය.

"ඔබේ ස්වාමිපුරුෂයා ගැන මට හොඳට මතකයි නෝනා. ඔහු මගෙන් උදව් ඉල්ලාගෙන ආවේ අවුරුදු ගණනාවකට කලින්. ඒ මොකක් හරි සුළු ගැටළුවක් ගැන. ඒ වුණත් මට ඔහුව හොඳට මතකයි." හෝම්ස් කීය.

"සමහර විට මගේ පුතා ඩග්ලස් මේබර්ලිගෙ නම, ඔබට වඩාත් හුරුපුරුදු ඇති?"

හෝම්ස් ඇය දෙස බැලුවේ මහත් උනන්දුවෙනි.

"හැබෑට? ඩග්ලස් මේබර්ලි මහත්මයාගේ මෑණියන් ඔබද? මං ඔහු ගැන දැනහිටියේ යන්තමින්. කොහොම වුණත් ලන්ඩනයේ කවුරුත් ඔහු පිළිබඳව දන්නවා. කොයිතරම් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්ද. මේ දවස්වල ඔහු කොහේද?"

"මියගියා හෝම්ස් මහත්මයා! ඔහු මියගියා! ඔහු රෝමයේ තානාපති කාර්යාලයේ සේවය කරමින් හිටියේ. නියුමෝනියා රෝගයට ගොදුරු වෙලා, ඔහු ගිය මාසයේ මියගියේ රෝමයේදීමයි."

"මට අහන්නත් හරිම කණගාටුයි මේබර්ලි නෝනා. ඒ වගේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් මේ තරම් ඉක්මනට මියයාවි කියල හිතන්නවත් බෑ. ඒ තරම් ක්‍රියාශීලීව හිටි, ජීවයෙන් පිරිපුන් මනුස්සයෙක්. ඔහු මියගියා කියන එක මට විශ්වාස කරන්නවත් බෑ. ඔහු කටයුතු කළේ අප්‍රමාණ ශක්තියකින්."

"කෙනෙකුට දරාගන්න බැරි ශක්තියකින් හෝම්ස් මහත්මයා. ඒක තමයි එයාගෙ විනාසයට මුල් වුණේ. ඔබ ඔහුව දකින්න ඇත්තේ ආචාරශීලී, ප්‍රසන්න පුද්ගලයෙක් හැටියට. ඒ වුණත් ඔබට දකින්න ලැබෙන්න නෑ, ඒ නිසා ඔහුගේ චරිතයේ අභ්‍යන්තරව වුණු වෙනස්වීම. ඔහු බොහොම කිපෙනසුළු, රළු ගතිපැවතුම් ඇති කෙනෙක් බවට පත්වුණා. හැම දෙයක් ගැනම කලකිරුණා. කල් ගතකළේ දැඩි කම්පාවකින්. මගේ ඒ නිර්භය, ප්‍රීතිමත් පුතා, මාසයක් ඇතුළත සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. කිසිකෙනෙක් පෙනෙන්න බැරි අප්‍රසන්න පුද්ගලයෙක් බවට පත්වුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකද හේතුව? ප්‍රේම සම්බන්ධයක්ද? ගැහැනියක නිසාවත්ද?"

"මොන යක්ෂයෙක් නිසාද කියන්න මම දන්නෙ නෑ මහත්මයා. කොහොම වුණත් මං ඔබට එන්න කිව්වේ, මගේ අසරණ කොල්ලා ගැන කථා කරන්න නම් නෙමෙයි."

"දොස්තර වොට්සනුත් මමත්, ඔබට හැකි උපකාරයක් කරන්න සූදානම්."

"මේ පහුගිය ටිකේ මහා පුදුමාකාර දේවල් වලට මුහුණ දෙන්න මට සිද්ධ වුණා. මං මේ ගෙදර පදිංචියට ඇවිත්, දැන් අවුරුද්දකට වැඩියි. බොහොම නිශ්ශබ්දව මගේ පාඩුවේම ජීවත් වෙන්නයි මගේ කැමැත්ත. ඒ නිසා මං අසල්වාසීන් එක්ක ආශ්‍රයකට ගියෙත් නැහැ. දවස් තුනකට ඉස්සරවෙලා මිනිහෙක් ආවා මාව හම්බවෙන්න. ඔහු මෙහෙම කිව්වා.

"නෝනා, මං දේපොළ වෙළඳ සමාගමක නියෝජිතයෙක්. අපේ ගනුදෙනුකාර මහත්මයෙක් මේ වගේ ගෙයක් මිලට ගන්න හොයනවා. මේ ගේ නම් ඒ මහත්මයාට අග්ගෙට ගැළපේවි. නෝනා ඔබ මේක විකුණන්න කැමැති නම් මිල ගණන කීය වුණත් ප්‍රශ්නයක් නැහැ."

ඔහු එහෙම කිව්වාම මට තරමක් පුදුමත් හිතුණා. ඒ මොකද මේ අවටම, මේ හා සමාන හිස්වුණු ගෙවල් කිහිපයක්ම විකුණන්න තියෙනවා. කොහොම වුණත් ඔහු කිව් කරුණ ගැන මගේ හිතේ උනන්දුවක් ඇතිවුණා. ඒ හින්දා, මම මේක මිලට ගත්ත ගණනට වඩා, තවත් පවුම් පන්සියයක් වැඩිකරලා, මං ගණන් කිව්වා. ඔහු එක්වරම ඒ ගණනට කැමැති වුණා. ඊළඟට ඔහු මෙහෙම කිව්වා.

"නෝනා. අපි බොහොම කැමැතියි ඔබ කිව් ගණනට ගේ මිලට ගන්න. මං කිව් මහත්මයා කැමැතියි, මේ ගෘහභාණ්ඩ ටිකත් ගේ ගනිද්දීම මිලට ගන්න. ඒකටත් ගණනක් කියන්න."

ඔහු එහෙම කිව්වාම මං ටිකක් කල්පනා කළා. මේ සමහරක් ලී බඩු, මං බැඳලා එනකොට මගේ මහගෙදරින් ගෙනා ඒවා. ඒ හින්දා මං ඒවටත් එක්තරා සෑහෙන ගණනක් කිව්වා. ඔහු ඒකටත් එක්වරම කැමැති වුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් මහත්මයා. මගේ ජීවිතේ මං හැමදාමත් ආසාවෙන් හිටි දෙයක් තමයි දේශ සංචාරයක යෙදෙන්න. දේපොළ සම්බන්ධයෙන් මට ලැබෙන මුදලත් හොඳ වගෙයි පෙනුණේ. ඒ හින්දා, මං හිතාගත්තා, දේශ සංචාරයකත් යෙදිලා, මුදලෙනුත් කොටසක් ඉතිරි කරගන්න. එතකොට මගේ ජීවිතේ ඉතිරි කාලෙ කාටවත් අත නොපා ජීවත්වෙන්න හැකිවේවිනේද කියලයි මට හිතුණේ.

ඔන්න මේ වෙළඳ සමාගම් නියෝජිතයා ආයෙම සැරයක් ඊයේ මෙහේ ආවා. ගනුදෙනුව සම්පූර්ණ කරන්න අදාළ ගිවිසුමත් අරගෙනයි ඔහු ආවේ. මගේ නීතිඥයා සුට්‍රෝ මහත්මයා, ඉන්නේ හැරෝ වල. හොඳ වෙලාවට මං ගිවිසුම් පත්‍රය අරගෙන ගිහිං සුට්‍රෝ මහත්මයාට පෙන්නුවා.

"මේබර්ලි නෝනා. මේක මහා පුදුමාකාර ලියවිල්ලක්. ඔබ මේ ලියවිල්ලට අත්සන් කළොත් නීතියෙන් ඔබ පත්වෙන තත්ත්වය ගැන දන්නවද? ඔබ ගෙය විකුණද්දී කිසිම දෙයක් - ඒ කියන්නේ ඔබේ පෞද්ගලික දේවල් පවා අගදරින් ඉවත්කරගෙන යන්න ඔබට අවසර නෑ."

අර නියෝජිතයා කිව්ව මිනිහා එදා හැන්දෑවෙ ආවම මං ඒ බව ඔහුට කිව්වා.

"මහත්මයා. මං මේ ගෙදර තියෙන බඩු විකුණනවා කියන එකෙන් අදහස් කළේ ගෘහභාණ්ඩ විතරයි."

"නෑ නෑ. ඔක්කොම ඔක්කොම!"

"එතකොට මගේ ඇඳුම් පැළඳුම්, ආභරණ, මුතු මැණික්?"

"ඒ වගේ පෞද්ගලික දේවල් ගැන අපට සහනයක් සලස්වන්න පුළුවනි. ඒ වුණත් බොහොම සියුම්ව පරීක්ෂා කරල මිසක් කිසිදෙයක් ගෙයින් එළියට අරගෙන යන්න අවසර නෑ. ගේ මිලට ගන්න කැමැත්ත පළකළ මහත්මයා බොහොම නිදහස් අදහස් තියෙන කෙනෙක්. නමුත් සමහර දේවල් ගැන ඔහුගේ තියෙන්නේ පුදුමාකාර ආශාවක්. ඒ දේවල් ගැන අනුගමනය කරන්නෙත් පුදුමාකාර පිළිවෙතක්. ඒ හින්දා වැඩිදුර කේවල් කරන්න, අරව මේව කථා කරන්න ගියොත් කියාවි - දේනාව නම් ඔක්කොම දෙන්න, නැත්නම් කොහොමටවත් එපා කියල."

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම නම් ඔහේගෙ මහත්තයාට කියන්න ගේ කොහොමටවත් විකුණන්නෙ නෑ කියල." මං කිව්වා. ඒ ගනුදෙනුව ගැන කතාබහ එතැනින්ම නැවතුණා.

නමුත් මේ වැඩේ හරිම අස්වාභාවික, අමුතුම තාලේ එකක් බව මට තේරුණා. ඉතින් මං හිතුවා . . . . "

මෙතැනදී අපේ සංවාදයට බාධාවන ආකාරයේ එක් විශේෂ සිදුවීමක් විය.

අත ඉහළට එසවූ හෝම්ස් කථාව නවත්වන මෙන් මේබර්ලි මහත්මියට සංඥා කළේය. අඩියට දෙකට කාමරය හරහා ගමන් කළ ඔහු, වසා තිබූ ඇතුළු දොර ළඟ නැවතුණේය. මීළඟට එක්වරම දොර විවෘත කළ හෝම්ස්, දොර අසල සැඟවී කථාවට සවන් දුන් කෙට්ටු කාන්තාවක් උරහිසෙන් අල්ලා කාමරය තුළට ඇදගත්තේය. කුකුළු කොටුවකින් එළියට අදිනා විට දඟලන කිකිළියක මෙන් ඇය හෝම්ස්ගේ ග්‍රහණයෙන් ගැළැවීමට තැත් කළාය.

"මට නිකං ඉන්න අරිනවා! මොකුත්ද මිනිහෝ තමුසෙ කරන්නෙ?" ඇය විලාප නැඟුවාය.

"අනේ අනේ සුසාන්. මොනවද මේ වැඩ?"

"බලන්න නෝනා මහත්තයා. මං මේ කාමරය ඇතුළට එන්න හැදුවේ, අමුත්තන් කෑමට නවතිනවාද කියල අහන්න. එතකොට එකපාරටම දොර ඇරුණා. මේ මිනිහා මගේ ඇඟට කඩාගෙන පැන්නා."

"මේබර්ලි නෝනා. පුහුගිය විනාඩි පහක් තිස්සේ, ඇය දොර ළඟට වෙලා ඔබේ කථාවට කන්දෙමිනුයි හිටියේ. ඇය එතැන සිටිමින් නැගූ ශබ්දය මට හොඳට ඇහුණා. ඒ වුණත්, ඔබේ සිත් ඇදගන්නා කථාවට බාධා කරන්න මට හිතුණේ නැහැ. සුසාන් ඔහේ හුස්මගන්න කොට ශබ්දය පිටවෙනවා වැඩියි. විකක් ඇදුම ගතිය වගෙයි නේද? මේ වගේ හොර වැඩවලට, ශබ්දෙට හුස්ම ගන්න, ඇදුම රෝගයෙන් පෙළෙන අය සුදුසු නෑ."

ඇය හෝම්ස් දෙස බැලුවේ මවිතයට පත් බැල්මකිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"තමුසෙ කවුරු වුණත් මට කමක් නෑ. මාව මේ විදියට එහාට මෙහාට ඇදලා හිරිහැර කරන්න තමුසෙට තියෙන අයිතිය මොකක්ද?" ඇය කෑගැසුවාය.

"මට ඕනෑ කරන්නේ ඔහේ ඉස්සරහා මෙබර්ලි මහත්මියගෙන් කාරණාවක් දැනගන්න. ඔබතුමිය මට ලියුමක් එවා, මගෙන් උපදෙස් ගන්න බලාපොරොත්තු වෙන බව කාටවත් කිව්වද?"

"නැහැ හෝම්ස් මහත්මයා. මං කාටවත් කිව්වෙ නෑ."

"ඔබ මට එවූ ලියුම තැපැල් කළේ කවුද?"

"මේ සුසාන් තමයි. . . ."

". . . . හරියට හරි. හොඳයි සුසාන්. දැන් අපට මේ ටික කියන්න. ඔබේ ස්වාමිදුව මගෙන් උපදෙස් ගන්න සූදානම් වෙනවා කියලා ඔබ කාට හරි කිව්වා. නැත්නම් පණිවුඩයක් යැව්වා. ඒ කාටද?"

"ඒක බොරුවක්. මං කාටවත් පණිවුඩයක් යැව්වෙ නෑ."

"සුසාන්. තදින් ඇදුම තියෙන අයට සමහර වෙලාවට දීර්ඝ කාලයක් ජීවත්වෙන්න අමාරුයි. එහෙම අය මේ වගේ පට්ටපල් බොරු කියන එක හරි දරුණු දෙයක්. කාටද ඔබ මේක දැනුම් දුන්නෙ?"

"සුසාන්!" ඇගේ ස්වාමිදුව කෑගැසුවාය.

"මට දැන් හිතාගන්න පුළුවන්, උඹ වංචාකාර මහ නරක ගෑනියෙක් කියලා. දැනුයි මට මතක් වුණේ. උඹ කවුරු හරි එක්ක මල්වැටට උඩින් කථා කර කර හිටියා. එහෙම නේද?"

"ඒක මගේ වැඩක්." සුසාන් කීවේ කිසිදු ගරුසරුවකින් තොරවය.

"ඔහේ ඒ කතා කළේ කවුරුන් එක්කද කියලා මං කියන්නද? ඒ බානි ස්ටොක්ඩේල් එක්ක." හෝම්ස් කීය.

"ඔහේ දන්නව නං මොකටද මගෙන් අහන්නෙ?"

"මං හරියටම දැනගෙන හිටියෙ නෑ, නමුත් දැන්නම් මට හොඳටම විශ්වාසයි. හොඳයි සුසාන්. ඔහේ මෙන්න මේ කාරණාව

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com



163. "මාව එහාට මෙහාට ඇදලා හිරිහැර කරන්න, තමුසෙට තියෙන අයිතිය මොකක්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

මට කිව්වොත්, මං පවුම් දහයක තෑග්ගක් දෙනවා. බානි ස්ටොක්ඩේල්ට මේ වැඩේ භාරදුන්නෙ කවුද?"

"ඔහේගෙ ඔය මහ ලොකු අවුම් දහයට පවුම් දාහක් ඔට්ටු වෙන්න පුළුවන් කෙනෙක්."

සුසාන් පැවසුවේ උපහාසාත්මක බැල්මක් හෙළමිනි.

"ඒ තරම් පොහොසත් මිනිහෙක්? නෑ. ඔහේට හිතාගියා. ඒ කියන්නේ පොහොසත් ගැහැනියක්. අපි දැන් කාරණා හුඟක් සොයාගත්තා. ඉතින් අපි මේ තරම් දැනගත්ත එකේ, ඇගේ නම කියන්න. පවුම් දහයක තෑග්ගක් ලැබෙනවා."

"ඒක අහගන්න නම් තමුසෙ ඉස්සර වෙලා නරකාදියට ගිහින් එනවා."

"සුසාන්! මොකක්ද ඔය භාෂාව?"

"මං යනව යන්න මෙහෙන්. ඔහේලගෙ ආඩම්බර බලල මට ඇතිවෙලයි තියෙන්නෙ. මං කවුරු හරි එවනවා හෙට, මගේ බඩු පෙට්ටිය ගෙනියන්න."

සුසාන් දොර දෙසට ගියාය.

"එහෙනම් ආයුබෝවන් සුසාන්. ඔබ යන බව අහන එකත් හිතට ලොකු සනීපයක්. . . ." පැවසූ හෝම්ස් යළිත් අප දෙසට හැරුණේය.

"මෙයාල බොහොම ඉක්මනින් ක්‍රියාත්මක වෙන මැර කල්ලියක්. බලන්න උන් කොයිතරම් ඉක්මනට වැඩ පටන් අරගෙනද කියලා. ඔබ මට එවූ ලියුමේ තැපැල් මුද්‍රාව වැදිලා තිබුණේ ඒ දහයට. ඒ වහාම සුසාන්ට පුළුවන් වුණා බානිට පණිවුඩය දෙන්න. ඔහුව මේ වැඩේට යෙදෙව්ව පුද්ගලයා හමුවෙලා, බානි අවශ්‍ය උපදෙස් ලබාගත්තා. ඔහු හෝ ඇය - මං හිතන හැටියට ගැහැනියක් කළු ස්ටීව් ව යෙදෙව්වා. ගත යුතු පියවර ඔහුට නියම කළා. පහුවදා උදේ එකොළහ වෙන කොට කළු ස්ටීව් ඇවිත් මට තර්ජනය කර අවසන්. පෙනෙනවා නේද ඔවුන්ගේ වැඩ කොයිතරම් ඉක්මන්ද කියලා."

"නමුත් මොනවද ඔවුනට උවමනා වෙලා තියෙන්නේ?"

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purposes Only, Not For Print

"අන්න ඒක තමයි ප්‍රශ්නෙ. මේ නිවස කලින් අයිතිව තිබුණෙ කාටද?"

"ෆර්ගියුසන් කියල මහත්මයෙකුට. ඔහු නාවික සේවයේ ඉඳල විශ්‍රාම ගත් කපිතාන් වරයෙක්."

"ඔහු ගැන විශේෂයෙන් සඳහන් කළ හැකි යමක් තියෙනවද?"

"එහෙම වැදගත් යමක්, මට අහන්න ලැබුණෙ නම් නෑ."

"ඔහු මොනවා හරි වටිනා දෙයක් ගේ ඇතුළෙ නිධන්කර තියෙනවද දන්නෙ නෑ. ඒත් දැන් කාලෙ මිනිස්සු නිධාන තැන්පත් කරන්නෙ තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ. එහෙමම කියන්නත් අමාරුයි, හොඳ ශෝටිසල්. සමහර වෙලාවට මහ විකාර අදහස් තියෙන අයත් ඉන්නෙ. ඔවුන් නොහිටින්න, මේ ලෝකෙ මහා නීරස ඒකාකාරී එකක් වෙනවා. මට මුලින් හිතුණේ ගේ ඇතුළෙ මොනවා හරි නිධන් කරල ඇති කියල. නමුත් එහෙම නම් ඔවුනට ඔබේ ගෘහභාණ්ඩ උවමනා වෙන්නෙ නෑ. මේබර්ලි නෝනා. ඔබ ළඟ තියෙනවද රෆායෙල් විසින් අඳින ලද චිත්‍රයක්? එහෙමත් නැත්නම් ශේක්ස්පියර්ගෙ අත්අකුරින් ලියූ ඔහුගේ නාට්‍යයක පිටපතක්? සමහරවිට මෙහෙම දෙයක් තිබෙන බව ඔබවත් දන්නෙ නැතුව ඇති?"

"මං හිතන්නෙ නෑ මහත්මයා, ඒ තරම් වටිනා දෙයක් මා ළඟ ඇති කියල. වටිනවා කියන්න පුළුවන් දෙයක් මා ළඟ තියෙනවා නම්, ඒ ක්‍රවුන් - ඩාබි තේ පෝච්චියක් සහ කෝප්ප කට්ටලයක් පමණයි."

"නෑ. එවැනි දෙයක් බේනුවෙන් මේ තරම් අබිරහසක් ගොඩනැඟුණය වෙන්න බෑ. අනික් කාරණය මේකයි. ඇයි ඔවුන්, ඔවුනට උවමනා කරන දේ විවෘතව කියන්නෙ නැත්තෙ? ඔබේ තේ කෝප්ප කට්ටලය ඔවුන් මේ තරම් අගය කරනවා නම්, ඔවුනට පුළුවනි ඒකට මිලක් නියම කරන්න. ඇයි මේ ඔබේ ගේයි, ලී බඩුයි, පෞද්ගලික දේවල් හැමදේමයි ගන්න හදන්නෙ?

මේබර්ලි නෝනා. මං ඔය තේරුම් කරන්නෙ මෙහෙමයි. ඔබ ළඟ තියෙනවා ඔවුනට ඕනෑ කරන යම්කිසි දෙයක්. ඒක ළඟ

http://sherlockholmesinvestigations.blogspot.com

තියෙන බව ඔබ දන්නෙත් නෑ. නමුත් ඒක මොකක්ද කියල දැනගත්තොත් ඔබ කියටවත් මවුනට දෙන්නෙත් නෑ."

"මටත් හිතෙන්නේ ඒ විදියට තමයි." මම කීවෙමි.

"හරි. දොස්තර වොට්සනුත් මගේ මතයට සම්පූර්ණයෙන්ම එකඟවෙනවා. එහෙනම් ඉතින් අප කියන දේ ස්ථිරයි."

"හොඳයි හෝම්ස් මහත්මයා. ඒක මොන වගේ දෙයක් කියලද ඔබ හිතන්නේ?"

"අපි දන්නා කරුණු මානසික විශ්ලේෂණයකට භාජනය කරල බලමු. බාගවෙලාවට අපට හැකිවේවි, සියුම් කාරණයක් උකහා ගන්න. ඔබ මේ ගෙදර පදිංචියට ඇවිත් දැන් අවුරුද්දක් සම්පූර්ණ වුණා කියලද කිව්වේ?"

"අවුරුදු දෙකකට කිට්ටුයි."

"ඒක වැඩිය පහසුයි. මේ අවුරුදු දෙකකට කිට්ටු කාලය ඇතුළත, කිසිකෙනෙකුව කිසිදෙයක් ඔබෙන් උවමනා උණේ නෑ. නමුත් එක්වරම දින තුන හතරක ඉඳන් විශාල ඉල්ලුමක්. මොකක්ද ඔබට ඒකෙන් හිතෙන්නේ?"

"නිශ්චිත වශයෙන් හිතාගන්න පුළුවන් එකම දෙයයි. බඩුව කුමක් වුවත් ඒක මේ ගේ ඇතුළට ආවා විතරයි." මම කීවෙමි.

"හරියට හරි වොට්සන්. ඉතින් මේබර්ලි නෝනා. එය කුමක් හෝ වේවා. ඊයෙ පෙරේදා ඔබ මේ ගෙදරට ගෙනා බඩුව කුමක් ද?"

"පහුගිය අවුරුද්දක කාලය ඇතුළත මම කිසිම දෙයක් අලුතෙන් මිලට ගත්තෙ නැහැ මහත්මයා."

"හැබැට? ඒකත් වැදගත් කරුණක්. එහෙම නම් අපි මේ කාරණාව, තව ටිකක් මෝරන්න ඉඩ හරිමු. එවිට අපට දන්න මොනවා හරි අලුතෙන් ලැබේවි. ඔබේ අර නීතිඥයා දක්ෂ පුද්ගලයෙක්ද?"

"සුට්‍රෝ මහත්මයා අතිදක්ෂයෙක්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට තවත් සේවිකාවක් ඉන්නවද? එහෙමත් නැත්නම් අර ඉස්සරහ දොර මහ සද්දෙට විහනවා ඇහුණෙ ලස්සන සුසාන්මද?"

"මට තවත් තරුණ සේවිකාවක් ඉන්නවා."

"දිනයක් හෝ දෙකක් සුට්ටර් මහත්මයා මේ ගෙදර රඳවා ගන්න උත්සාහ කරල බලන්න. මට හිතෙනවා ඔබට ආරක්ෂාව උවමනා වෙයි."

"කාගෙන්ද?"

"ඒක කොහොම කියන්නද? කාරණාව හොඳටම පැටලිලි සහගතයි. ඔවුන් හොයන්නේ මොකක්ද කියන එක මට හිතාගන්න බෑ. දැන් මට කරන්න තියෙන්නේ එක දෙයයි. ඒ තමයි ගැටලුව අනිත් කෙළවරේ සිට විසඳන්න උත්සාහ කර බැලීම. මේ දේපොල වෙළඳ නියෝජිතයා කිව් මිනිහා, ඔහුගේ ලිපිනය ඔබට දුන්නද?"

"ලිපිනයක් නැහැ. මේ ඔහුගේ කාඩ්පත."

**හේන්ස් ජොන්සන්**
**වෙන්දේසිකාර තක්සේරුකරු**

"මං හිතන්නේ නෑ, නාමාවලියේ අපට ඔහුගේ නම දකින්න ලැබේවි කියල. අවංක මිනිස්සු තමන්ගේ ව්‍යාපාරික ලිපිනය හංගන්නේ නෑ. අලුතෙන් මොනවා හරි දෙයක් සිදුවුණොත් වහාම මට දන්වන්න. ඔබේ ගැටලුව විසඳීම මං භාරගත්තා. මේක සම්පූර්ණයෙන්ම විසඳා අවසන් වෙනතුරු මං මේක අත්හැර දමන්නේ නෑ. ඒ ගැන ඔබට විශ්වාසය තියන්න පුළුවන් මේබර්ලි නෝනා."

අප සාලය හරහා ගමන් කරද්දී එහි කෙළවරක ගොඩගසා තිබූ ද්‍රව්‍ය කෙරෙහි හෝම්ස්ගේ උකුසු ඇස් යොමු විය. එහි වූයේ එකට ගොඩගසා තිබූ ට්‍රන්ක් පෙට්ටි හා ලී පෙට්ටි රාශියකි. ඒවායේ පිටත ලේබල් අලවා තිබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මිලානෝ. ලූසර්නි. මේව මේ ඉතාලියේ හදල එවපු බඩු වගයක් නේ."

"මගේ අසරණ පුතා ඩග්ලස්ට අයිතිව තිබුණු බඩුමුට්ටු. ඔහුගේ මරණයෙන් පස්සේ මට එවා තිබුණා."

"ඔබ මේවා එකක් වත් විවෘත කර බැලුවෙ නැද්ද? කොයි තරම දවසක් වෙනවද මේව මෙහෙට ඇවිත්?"

"මට ලැබුණේ ගිය සතියෙ"

"නමුත් ඔබතුමි කිව්වා . . . . ඇයි ඉදවියගනේ අපි හොයමින් හිටි දේ මේක වෙන්න පුළුවනි. මේවා ඇතුලේ වටිනා දෙයක් නැද්ද කියලා ඔබ කොහොමද දන්නෙ?"

"ඒක නම් වෙන්න විධියක් නෑ හෝම්ස් මහත්මයා. මගේ පුතා දුප්පතෙක්. ඔහුට හිමිවුණේ පඩිය සහ වාර්ෂිකව ලැබුණු සුළු දීමනාවක් පමණයි. ඔය තරම් වටිනා වස්තුවක් ඔහු ළඟ කොහොම තියෙන්නද?"

හෝම්ස් නළලේ රැළි කරමින් කල්පනා කරන්නට පටන් ගත්තේය.

"මොහොතක්වත් ප්‍රමාද කරන්න එපා මේබර්ලි නෝනා. වහාම මේ බඩු සියල්ලම ඔබේ නිදන කාමරයට ගෙනවා ගන්න. ඊට පස්සේ හැම දෙයක්ම හොඳින් සෝදිසි කර බලන්න. මං එනව හෙට උදේ ඔබට මොනවද කියන්න තියෙන්නෙ කියල දැනගන්න."

අපි මේබර්ලි මහත්මියගෙන් සමුගත්තෙමු. ත්‍රී ගේබල්ස් මන්දිරය හා එයට යන එන අය ගැන ඔත්තු බැලීමේ කටයුතු අඩුපාඩුවකින් තොරව සිදුවෙන බව අපි දුටුවෙමු. උස් මල්වැට පසුකර අප පටුමාවතට හැරුණා පමණි. එහි අස්වණකට වී සිටි නීග්‍රෝ ජාතිකයාට අපෙන් සැඟවෙන්නට ඉඩක් නොලැබිණි. යෝධ සිරුරක් තිබූ මේ බොක්සිං ක්‍රීඩකයා, එම පාළු ස්ථානයේ දකින්නට ලැබීම සිතට භය උපදවන දසුනක් විය. හෝම්ස් එක්වරම ශබ්ද නගා තම කලිසම් සාක්කු දෙකටම තට්ටු කළේය.

"මොකද හෝම්ස් මහත්මයා? පිස්තෝලෙ සාක්කුවෙ තියෙනවද කියලද බැලුවෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

Feel Free to Print

"නෑ ස්ටීව්. මගේ සුවඳ විලවුන් කුප්පිය අරගෙන ඇවිත්ද කියලයි බැලුවෙ."

"ඔබ විහිළු කරනවා නේද හෝම්ස් මහත්තයා?"

"මං තමුසෙ පස්සෙන් එළවන්න පටන් ගත්තොත් විහිළුවක් වෙන්නෙ නෑ. මං තමුසෙට අද උදේ ඒ බව පැහැදිලි කරල කිව්වා . . . ."

". . . . . ඔව් හෝම්ස් මහත්මයා. ඔබතුමා කිව් දේවල් මං හොඳට හිතට ගත්තා. අර පර්කින්ස් පටළැවිල්ලට මගේ නම සම්බන්ධ කරල කථා කරනව අහන්න මං කැමැති නෑ. මං ඔබට මහ උදව්වක් කරන්නම්. ඇත්තමයි."

"හොඳයි එහෙනම් කියනවා බලන්න. කවුද තමුසෙව මේ වැඩේට යෙදෙව්වෙ?"

"දෙයියම්පා හෝම්ස් මහත්මයා. ඇත්ත කථාව මං ඔබට ඉස්සරවෙලා කිව්වෙ? මගේ ලොක්ක බානි. ඔහු මට නියම කළ වැඩේ මං කළා. ඊට ඉහළින් ඉන්නෙ කවුද කියන එක මං දන්නෙ නෑ."

"හොඳයි එහෙනම් මෙන්න මේ ටික මතක තියාගන්නවා ස්ටීව්. අර ගෙදර ඉන්න නෝනාත් ඒ වහල යට තියෙන බඩුබාහිරාදිය හැමදේමත් ආරක්ෂා කිරීම දැන් මට භාරවෙලයි තියෙන්නේ. ඒ කිසිදේකට අත තියලා මට අහුවෙන්න එපා."

"හොඳයි හෝම්ස් මහත්මයා. මං ඒක මතක තියාගන්නම්." පැවසූ නීග්‍රෝ ජාතිකයා වහාම එතැනින් පිටවී ගියේය.

"මිනිහ ඉන්න අවදානම් තත්ත්වෙ නිසා, ඔහු මගේ කථාවට හොඳටම බයවෙලයි ඉන්නෙ. ස්ටීව් මේකට යෙදෙව්ව, ලොක්කා කවුද කියල දන්නවා නම් ඔහුගෙ නම හෙළිකරන්න ස්ටීව් පසුබට වෙන්නෙ නෑ. හොඳ වෙලාවටයි, මං ස්පෙන්සර් ජෝන්ස් කල්ලිය ගැන විස්තර දැන හිටියේත්, මේ මිනිහා උන්ගෙ එකෙක් වුණේත්. දැන් ඉතින් මේක ලැංඩේල් පයික්ගෙන් තොරතුරු ලබාගත යුතු සිද්ධියක් බවට පත්වෙනවා. මං යන්නම් ඔහුව හමුවෙන්න. මේ සම්බන්ධව පැහැදිලි වැටහීමක් ඔහුගෙන් ලබාගත හැකි බවට සැකයක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

එදා දවස මුළුල්ලේම මට හෝම්ස් දකින්නට නොලැබිණි. ඔහු ලැංඩේල් පයික් සමග කාලය ඉතා ප්‍රයෝජනවත් අයුරින් ගතකරන්නට ඇති බැව් නිසැකය. ලැංඩේල් පයික් යනු ඇවිදින තොරතුරු ගබඩාවක් බඳු මිනිසෙකි. එහෙත් ඔහුගේ එකම විෂයය ක්ෂේත්‍රය වූයේ ලන්ඩන් නගරවාසීන්ගේ ඕපාදූප, පෞද්ගලික රහස් තොරතුරු, අපකීර්තිමත් හා අපචාරාත්මක සිද්ධීන් ආදියයි. ලැංඩේල් පයික් මුළු දවසම ගතකළේ, සාන්ත ජේම්ස් වීථියේ සමාජශාලාවකයි. ඕපාදූප කීමට ඇති අයගෙන් පිටවන තොරතෝංචියක් නැති විස්තර සියල්ල, එතැනදී ඔහුගේ ග්‍රහණයට හසුවේ. ඒ අතරම ඒවා හතර වටේටම සම්ප්‍රේෂණය කිරීම ඔහුගේ රාජකාරියයි. අනුන්ගේ කුණු කන්දල් කියවා රසවිඳින අය සඳහා, ලන්ඩනයේ පළවෙන පුවත්පත් කිහිපයකි. පයික් ඒවාට සතිපතා කීරු ලිපි සම්පාදනය කරන බව රහසක් නොවේ. ඒ මගින් ඔහු උපයන ආදායම ඉලක්කම් හතරේ ගණනක් යැයි පැවසේ. ලන්ඩන් නගරවාසීන්ගේ පෞද්ගලික ජීවිත පතුලේ, යම්කිසි කැළැඹීමක් හෝ වෙනසක් ඇතිවුවහොත් එය, මෙම මනුෂ්‍ය මීටරයේ නිවැරදිව සටහන් වේ. ලැංඩේල්ගේ දැනුම පුළුල් කර ගැනීම සඳහා හෝම්ස් ඉඳහිට උදව් කළේය. ඒ අවශ්‍ය වූ විට ඔහුගෙන් ද තොරතුරු ලබාගැනීමේ අරමුණෙනි.

පසුවදා උදේ පාන්දරම මගේ මිත්‍රයා අපේ විසිත්ත කාමරයේ සිටිනු මට දක්නට ලැබිණි. කටයුතු සියල්ල සතුටුදායක අයුරින් සිදුවෙන බව, ඔහුගේ පෙනුමෙන් මම වටහාගතිමි. එහෙත් අප පුදුමයට පත් කරමින්, මෙම විදුලි පුවත හදිසියේම අප වෙත ලැබිණි.

"වහාම එන්න. අනුග්‍රාහකයාගේ නිවස ඊයේ රාත්‍රී හොරුන් බිඳ ඇත. පොලීසිය පැමිණියා.

සුප්‍රෝ"

විදුලි පුවත කියවූ හෝම්ස්ට සිවුරුහන් කෙරුණේ නිරායාසයෙනි.

"මේ රංගනය දැන් අර්බුදයක් බවට හැරිලා වොට්සන්. ඒකත් මං හිතුවාට වඩා ඉක්මනින්. පිටුපසින් ඉඳගෙන කවුරු හරි මේ

http://sherlockholmesinvestigations.blogspot.com

හැමදෙයක්ම ක්‍රියාත්මක කරන්නේ බොහොම අධිශක්ති බලවේගයකින්. මට අහන්න ලැබුණු විස්තර වල හැටියට මේ විධියට ගේ බින්ද එකේ පුදුමයක් නෑ. ඇගේ නීතිඥයා සුට්‍රෝ, ඇගේ ගේ පරෙස්සම් කරන්න යෙදෙවුණු එක මගේ අතින් වුණු වැරැද්දක්. එවැනි දෙයක් සාර්ථකව ඉටුකරන්න තරම් ඔහු දක්ෂ බුද්ධිමත් කෙනෙක් නොවෙන බවයි පෙනෙන්නෙ. වොට්සන් ඒ රාජකාරිය සඳහා මා විසින් යැවිය යුතුව තිබුණේ ඔබවයි. දැන් ඉතින් කරන්න දෙයක් නෑ, ගමු ආපහු ගමනක් හැරෝ - විල්ඩ් වලට."

ත්‍රී ගේබල්ස් නිවස කලින් දවසේ තිබුණේ කලබලයකින් තොර නිහඬ තැනක් ලෙසයි. නමුත් මෙදින එය අතිශයින්ම වෙනස් ස්වරූපයක් ගෙන තිබූ බව දුටුවෙමු. නිවසට ඇතුළුවන ගේට්ටුව අසල රස්තියාදුකරුවන් කිහිපදෙනෙකු විය. පොලිස් භටයෝ ජනේල සහ ඒ අවට මල්පාත්ති පරීක්ෂා කරමින් සිටියහ. නිවස ඇතුළත දී අපට හමුවූ වයස්ගත පුද්ගලයෙකි. සුට්‍රෝ නම් නීතිඥයා ඔහුය. රතු පැහැති මුහුණක් තිබූ, කඩිසර බවක් පෙන්වමින් එහා මෙහා ගිය පොලිස් පරීක්ෂකවරයෙක් ද දැකිය. කලින් දැන හැඳින සිටි පුද්ගලයකු විලසින් ඔහු හෝම්ස්ට ආචාර කළේය.

"ආයුබෝවන් හෝම්ස් මහත්මයා, ඔබට මේකට අතදාන්න නම් ඉඩක් සැලසෙන්නෙ නෑ. මේක ගම්බද පොලිසියකට විසඳාගන්න පුළුවන් සාමාන්‍ය ගෙවල් බිඳුමක්. මේ ප්‍රශ්නය විසඳන්න විශේෂඥයො මොකටද?"

"පරීක්ෂණය ඉතාම දක්ෂයින් අතට පත්වී ඇති බවට මට කිසිම සැකයක් නෑ. සාමාන්‍ය ගෙවල් බිඳුමක් කියලද ඔබ කිව්වෙ?"

"ඇත්තෙන්ම ඔව්. අපි දන්නවා මේක කළේ කවුද කියල. බානි ස්ටොක්ඩේල්ගෙ කල්ලියේ වැඩක්. උන්ගෙ අර යෝධ නීග්‍රෝ කාරයා, මේ හරියෙ ගැවසුණු බව කීපදෙනෙක්ම දැකල තියෙනවා."

"විශිෂ්ටයි! මොනවද උන් අරගෙන ගිහින් තියෙන්නෙ?"

"ඒ හැටි දෙයක් අරගෙන ගිය බවක් පෙනෙන්න නෑ මහත්මයා. මේබර්ලි මහත්මියට ක්ලෝරෆෝම් අල්ලා සිහි නැති කරලා ගේ . . . . . ආ . . . . . මේ එන්නේ මේබර්ලි මහත්මිය."

http://sherlockholmesinvestigations.blogspot.com

කලින් දිනයේ අපට හමුවූ කාන්තාව සේවිකාවගේ ආධාරයෙන් ඉදිරියට ආවාය. ඈ සුදුමැලි වී රෝගී බවට පත් අයුරක් අපට දකින්නට ලැබිණි.

"හෝම්ස් මහත්මයා. ඔබ මට දුන්නේ හොඳ අවවාදයක්. ඒත් අවාසනාවක හැටි මං ඒ අවවාදයේ හැටියට වැඩ කළේ නැහැනෙ. මට හිතුණෙ නෑ සුට්‍රෝ මහත්මයාට කරදර කරන්න. ඒකෙන් මාව පරෙස්සම් කරන්න කෙනෙක් නැතුව ගියා."

"ඔබේ අවවාදය ගැන මට අහන්න ලැබුණෙ අද උදෙයි." නීතිඥයා අපට පැවසීය.

"මිත්‍රයින් කිහිප දෙනෙක් ගෙදර රඳවාගන්න කියල හෝම්ස් මහත්මයා මට කිව්වා. මං ඒ අවවාදෙ සැලකුවේ නැහැනෙ. ඒකයි මට මේ විදියට කරදර විඳින්න සිද්ධවුණේ."

"මේබර්ලි නෝනා. ඔබ හුඟක් අසනීපයෙන් වගෙයි මට පෙනෙන්නෙ. මොකක්ද සිද්ධවුණේ කියල ඔබට අමාරුවෙන් හරි කියන්න පුළුවන් නම් . . . ." හෝම්ස් කීය.

"ඒ ඔක්කොම මං මේ පොලිස් ලියාගෙනයි තියෙන්නෙ." පොලිස් නිලධරයා පැවසුවේ තම සටහන් පොත පෙන්වා එයට තට්ටු කරමිනි.

"ඒ වුණත් නෝනාට අපහසුවක් නැත්නම් . . . ."

"කියන්න තරම් ලොකු විස්තරයක් නැහැ මහත්මයා. මට හොඳටම විශ්වාසයි, හොරුන්ට ගෙට ඇතුළුවෙන පිළිවෙළ කියල දුන්නෙ කවුද කියල. ඒ අර නපුරු ගැනි, සුසාන්. ගේ ඇතුළත අගලක් ගණනෙ පිහිටීම උන් දැනගෙන හිටියා. ඒකෙ සැකයක් නැහැ. මගේ මුහුණට ක්ලෝරෆෝම් අල්ලනවා මට මතකයි. ඊට පස්සේ කොයි තරම් වෙලාවක් මං සිහිනැතුව හිටියද කියන එක මං දන්නෙ නෑ. මට සිහි එද්දි එක මිනිහෙක් හිටියා ඇඳ ළඟ. තව එකෙක් මගේ පුතාගේ බඩු පෙට්ටි අවුස්ස අවුස්ස හිටියා. ඌ ලොකු පොදියක් අතේ ඇතිව එකපාරටම නැගිට්ටා. මේ වෙනකොට මගේ පුතාගෙ බඩු පෙට්ටි සමහරක් ඇරදමල, ඒවල තිබුණු බඩු බිම විසුරුවලයි තිබුණේ. ඔහු එතැනින් පිටවෙලා යන්න කලින් මං පැනලා ඔහුව අල්ලා ගත්තා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ මහා අවදානම් වැඩක් කරල තියෙන්නෙ." පොලිස් නිලධරයා කීය.

"මං උඹව අතහැරියෙ නැහැ. ඔහු මගෙන් ගැලවෙන්න මාව තල්ලුකර දමන්න හැදුවා. එතකොට අනෙක් එකා මට පහර දෙන්න ඇති. එතනින් එහාට සිද්ධවුණු දෙයක් මට මතක නැහැ. මේ සද්දෙ ඇහිල මගේ සේවිකාව විලාප නගල තියෙනවා. ඒ සද්දෙටයි පොලීසිය ආවෙ. නමුත් ඒ වෙනකොට අර හොර තක්කඩි පැන ගිහින්."

"මොනවද ඔවුන් අරගෙන ගිහින් තියෙන්නෙ?"

"ඒ තරම් වටිනා දෙයක් නැතිවෙලා කියල මං හිතන්නෙ නෑ. මගේ පුතාගේ බඩු පෙට්ටි වල එහෙමකට දෙයක් තිබුණෙ නෑ."

"හොරු ඉතුරු කරල ගිය හෝඩුවාවක් මොකුත් නැද්ද?"

අර මිනිහාගේ අතේ තිබුණු පොදියෙන්, මගේ අතට අහුවෙලා ඉරුණු කොළයක්, ගැලරී බිම වැටී තිබුණා. මගේ පුතාගේ අත් අකුරෙන් ලියූ යමක්."

"ඒ කියන්නෙ ඒ ලියවිල්ලෙන් ප්‍රයෝජනයක් නෑ. ඔන්න හොරාගෙ අත් අකුරෙන් ලියූ යමක් ඉතිරි කර ගියා නම් . . . ."

පොලිස් නිලධරයා කථාව ඇරඹුවේය.

අන්න හරි. මොන තරම් ප්‍රඥාවන්ත කියමනක්ද? කොහොම වුණත් මං කැමතියි ඒ කඩදාසිය බලන්න?" හෝම්ස් කීය.

පොලිස් නිලධරයා තම සටහන් පොත තුළ දමා තිබූ, නැමූ ෆුල්ස්කැප් කඩදාසියක් එළියට ගත්තේය,

"මොන තරම් සුළු දෙයක් වුණත් මං අහක දමන්නෙ නෑ." ඔහු පැවසුවේ උඩඟු ලීලාවෙනි.

"හෝම්ස් මහත්මයා. මං ඔබටත් කියන්න කැමැතියි අන්න ඒ අවවාදය හොඳින් මතක තබාගන්න කියල. අවුරුදු විසිපහක රාජකාරි කරල ලැබූ පළපුරුද්දෙන් මං මෙහෙම කියන්නේ. සමහරවිට ඕකෙ ඇඟිලි සටහන් එහෙම තිබෙන්න ඉඩ තියෙනවා."

හෝම්ස් එම කඩදාසිය පරීක්ෂා කර බැලුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට මොනවද මේක ගැන කියන්න පුළුවන්?"

හෝම්ස් ඇසුවේ පොලිස් නිලධරයාගෙනි.

"මට පෙනෙන හැටියට මොකක් හරි විකාර නවකථාවක අන්තිම හරිය."

"අමුතු විධියේ කතන්දරයක අන්තිම හරිය බව නම් ඇත්තයි. පෙනෙනවා නේද පිටුවේ උඩ කෙළවරේ පිටු අංකය - අංක 245. මුලින් තිබූ පිටු 244ට මොකද වුණේ?"

"මං හිතන්නේ ගෙවල් බිඳපු හොරු අරගෙන යන්න ඇති. උන්ට ලොකු වාසියක්මයි වේවි!" පොලිස් පරීක්ෂකවරයා කීවේ උපහාසයෙනි.

"මේ වගේ දෙයක් හොරකම් කරගෙන යන්න, ගෙයක් බිඳගෙන ඇතුළුවෙන එකත් බලාගෙන ගියාම පිස්සු වැඩක් වගේ නේද?"

"හෝම්ස් මහත්මයා. ඒකෙන් පෙනෙන්නෙ හොරු ගෙට ඇතුළුවුණු ගමන්, ඔවුන්ගේ අතට අහුවුණු ඔළුවැනි දේම බදාගත්තා. කලබල සිද්ධවෙන කොට අතට අහුවුණු දේත් අරගෙන පැන්නා." පොලිස් පරීක්ෂකවරයා තම අදහස ඉදිරිපත් කළේය.

"මොකද හෝම්ස් මහත්මයා ඔවුන් මගේ පුතාගෙ දේවල් අරගෙන ගියේ?"

"මට පෙනෙන හැටියට නම් . . . ." පොලිස් නිලධරයා හෝම්ස්ට පෙර පැහැදිලි කිරීම ඇරඹීය.

". . . . . පහළ තට්ටුවේ තිබිල, උන්ට වටිනා දෙයක් ගන්න ලැබුණේ නෑ. ඉතින් උන් හිතුවා උඩ තට්ටුවෙන් හරි මොකක් හෝ හොරකම් කරගන්න. එහෙම නේද හෝම්ස් මහත්මයා?"

"එක පාරටම මොකුත් කියන්න බෑ. මං ටිකක් කල්පනා කරල බලන්න ඕන. ජනේලය ළඟට එන්න වොට්සන්."

මා බලාගෙන සිටියදී හෝම්ස් එම පිටුවේ ලියා තිබූ දේ කියවීමට පටන් ගත්තේය. ඒ පිටුව ඇරඹුණේ වාක්‍යයක් මැදිනි. එහි මෙසේ සඳහන් විය!

http://sherlockholmesinvestigations.blogspot.com

"..... චිල්ල වූ ප්‍රහාරය නිසා මුහුණේ වූ කැපුම් තුවාල වලින් රුධිරය ගලා යාමට පටන් ගත්තේය. එහෙත් එය කුමක්ද ඔහුගේ හදවතින් ගලා හැළුණු රුධිර ධාරාව හා සසඳන විට? ඒ සුන්දර මුහුණ ඔහුගේ දෙනෙතට යොමුවූයේ මේ මොහොතේදීයි. තමා දැඩි වේදනාවටත් අවමානයටත් පත්ව, කම්පාවූ ආකාරය දෙස ඒ මුහුණ යොමු වූ හැටි. ඒ මුහුණ සතු තැනැත්තිය වෙනුවෙන් තමා මුළු ජීවිතය වුවත් පූජා කිරීමට සූදානම් ව සිටි බව ඔහුට මෙනෙහි විය. නමුත් ඔහුගේ වේදනාව දැක ඇය සිනාසුණාය. දෙවියනි! ඔහු දැඩි වේදනාවෙන් විඳින දුක දැක දැකත්, හදෙහි කිසිදු හෙතමනයක් නැති යක්ෂණියක මෙන් ඇය සිනාසුණු හැටි!

ආදරය අතුරුදන් වී, ඒ වෙනුවට වෛරය උපන්නේ, ඒ මොහොතේදීයි. මිනිසා ජීවත්විය යුත්තේ යම් අරමුණක් සඳහාය. ඒ වෙලාවේ ඔබේ ආලිංගනය නොවන්නට! මා ප්‍රිය සොඳුරිය; මගේ පළිගැනීම සම්පූර්ණ වන්නට ඉඩ තිබිණි."

"මේකෙ ව්‍යාකරණ යොදා තිබෙන්නේ මහ විකාර පිළිවෙළකට නේ." හෝම්ස් කීවේ කඩදාසිය යළිත් පොලිස් පරීක්ෂකයා වෙත භාරදෙමිනි.

"ඔබ දුටුවද, ඡේදය මුල හරියෙ 'ඔහු' කියල කියාගෙන ගිය කථාන්තරය, අන්තිම හරියේදී එකපාරටම 'මම' කියල වෙනස්වුණු හැටි. මේක ලියූ ලේඛකයා කථාවෙ ප්‍රධාන චරිතයට, තමන් කොයි තරමක් බැඳී සිටියාද කිව්වොත්, අන්තිම හරියෙදි ලේඛකයාට හිතෙන්නෙ, මේ කථාවේ වීරයා තමන්ය කියල."

"බොළඳ ප්‍රේමකථා." පැවසූ පොලිස් පරීක්ෂකවරයා කඩදාසිය යළිත් සටහන් පොත තුළ තැන්පත් කරගත්තේය.

"මොනවා? ඔබ ආපහු යන්නද හදන්නෙ හෝම්ස් මහත්තයා?"

"මේ පරීක්ෂණය බොහොම දක්ෂයින් අතටයි පත්වෙලා තියෙන්නෙ. මං හිතන්නෙ නෑ, තවත් තුළ හැකි යමක් මට ඉතිරි වෙලා තියෙනවා කියල. ඒක නෙමෙයි මේබර්ලි නෝනා. ඔබ කිව්වා නේ ඔබට දේශ සංචාරයේ යෙදෙන්න ලොකු ආශාවක් තියෙනවා කියල?"

"මං හැමදාමත් සිහින මැව්වේ ඒකටයි හෝම්ස් මහත්මයා."

http://sherlockholmesinvestigations.blogspot.com

"කොහේ සංචාරයක යන්නද ඔබ කැමැති? කයිරෝව, මැඩෙයිරා, රිවෙයිරා? කොහේද?"

"සල්ලි තියෙනවා නම් මං ලෝකෙ වටේම ගිහිං එන්න කැමැතියි මහත්මයා."

"ඒක හරි. ලෝකය වටේම සංචාරයක් කරන්න පුළුවන් නම් කොයිතරම් හොඳද? අද හවස් වෙද්දි මං ඔබට පණිවුඩයක් එවන්නම්. ඔබට ශුභ දවසක්."

අප පිටත්ව යද්දී පොලිස් නිලධරයාගේ මුහුණේ නැඟුණු සිනාව සමග ප්‍රකාශවුණු හැඟීම කුමක්දැයි අනුමාන කිරීමට මම නැත් කළෙමි.

"මේ අතිදක්ෂයන්ට නම් බාගෙට පිස්සු."

ඔහුගේ මුහුණේ ප්‍රකාශ වූයේ ඒ හැඟීම විය යුතුය.

"ඔන්න වොට්සන්. අපි අපේ පරීක්ෂණයේ අවසන් අදියරටයි දැන් පැමිණ ඉන්නේ." හෝම්ස් පැවසුවේ අප යළිත් ලන්ඩන් නගර මධ්‍යයේ කලබලකාරී පරිසරය තුළට පිවිසෙද්දීය.

"මට හිතෙන්නෙ අපි මේ ප්‍රශ්නෙ ඉක්මනින් විසඳා ඉවරයක් කර දැමිය යුතුයි කියලා. ඔබත් මා සමග එන එක වඩා හොඳයි. ඉසදෝරා ක්ලයින් වගේ කාන්තාවක සමග කරන ගනුදෙනු වලදී, සාක්ෂිකාරයෙක් ඉන්න එක වැඩිය පරෙස්සම්."

කුලීරියකට නැඟුණු අපි, ඉතා වේගයෙන් ග්‍රොව්නර් චතුරශ්‍රය වෙත ගමන් කරමින් සිටියෙමු. ගැඹුරු කල්පනාවක වෙලී සිටි හෝම්ස්, සිහිනයකින් අවදි වූවාක් මෙන් එක්වරම කලබල විය.

"ඒක නෙමෙයි වොට්සන්. ඔබට කාරණා හැම එකක්ම පැහැදිලිව තේරුම් ගත හැකියි නේද?"

"කිසිවක් පැහැදිලිව තේරුම් ගත හැකියි කියල මට නම් කියන්න බෑ. නමුත් අපි මේ යන්නෙ, මේ කලබලය ඔක්කොම ඇති කළ කාන්තාව මුණ ගැහෙන්නයි, කියන කාරණාව නම් මට අනුමාන කරන්න පුළුවනි."

"අන්න හරි. හොඳයි. ඉසදෝරා ක්ලයින් කියන කාන්තාව ගැන ඔබ මොනවද දන්නෙ? ඇය තමා රූප සුන්දරියන් අතර

Reading Purpose Only... Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

රූපරාජිනියක් බවට පත්වූ තැනැත්තිය. කිසිම ගැහැනියකට හැකිවුණේ නෑ රූපශෝභාව අතින් ඇයට ළංවෙන්නවත්. උපතින් ඇය සම්පූර්ණයෙන්ම ස්පාඤ්ඤ ජාතික කාන්තාවක්.

ලොව පුරා රටවල් යටත් කරගෙන, ඒවායේ තමන්ගේ අණසක පැතිරූ, ස්පාඤ්ඤ රණකාමීන්ගේ ලේ තමයි ඇගේ නහරවල දුවන්නෙ. ශතවර්ෂ ගණනාවක්ම පර්නැම්බුකෝ රාජ්‍යය පාලනය කළේ ඉසදෝරාගෙ පරම්පාවෙ අය. සැහෙන කුලකට ඉහත දී මේ තරුණ කාන්තාව බොහොම වයස්ගත, ජර්මන් ජාතික ක්ලයින් නම් ධනවතා සමග විවාහවුණා. සීනි නිෂ්පාදනයෙන් මහා ධනකුවේරයෙක් බවට පත්වුණු ක්ලයින් ඒ හැටි කාලයක් ජීවත්වුණේ නෑ. වැඩි දවසක් යන්න කලින්, ඉසදෝරා ක්ලයින්, මිහිපිට වාසය කළ රූමත්ම ධනවත්ම වැන්දඹුව බවට පත්වුණා. ඊට පස්සේ විවාහ වෙලා නැත්පත් ජීවිතයක් ගත කරන්න ඇයට උවමනාවක් තිබුණෙ නැහැ. ඇයට ඩග්ලස් මේබර්ලි හමුවුණේ ඔමන්න මේ කාලෙදි. ලන්ඩනයේ හිටි කඩවසම්ම තරුණයා වුණු ඩග්ලස්, අභිමානවත් කෙනෙක්. සමනලයෙක් වගේ සැහැල්ලු විනෝදකාමී ජීවිතයක් ගත කරන්න ඔහුගේ බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. ඔහුට වුවමනාව තිබුණේ ඉසදෝරා විවාහ කරගන්නයි. පෙම් සබඳතා කඩාබිඳ දමන එක ඉසදෝරා ක්ලයින්ට බොහොම සැහැල්ලු දෙයක් වුණා. ඇය කියන වචනය අනෙක් පක්ෂය විසින් එක්වරම පිළිගතයුතු වුණා. එහෙම පිළිනොගත්තා නම්, ඔහුට එය අවබෝධ කරවන්න ඕනෙ පිළිවෙළත් ඇය දැන හිටියා."

"එහෙනම් ඔහු අර ලියල තිබුණෙ තමන්ගෙම ජීවිත කථාවයි . . . ."

"දැන් ඔබට තේරෙනව නේද, කුථා දෙක එකට සම්බන්ධ වෙන්නෙ කොහොමද කියල. මට අහන්න ලැබුණා ඇය අද හෙටම ලොමොන්ඩ් ආදිපාදතුමා එක්ක විවාහ වෙනව කියල. ඔහු, ඇයගේ පුතෙක් වෙන්න තරම් ලාබාල වයසේ තරුණයෙක්. ආදිපාදතුමාගේ මෑණියෝ වයසේ පරතරය නොසලකා ඉන්න පුළුවනි. නමුත් ඩග්ලස් මේබර්ලි හා තිබුණු සම්බන්ධය ගැන කටකතා පැතිරුණොත්, ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම . . . . ආ . . . . . දන්නෙම නැතුව අපි ඇයගේ ගේ ළඟටම ඇවිත්."

http://sherlockholmesinvestigations.blogspot.com

එය ලන්ඩනයේ වෙස්ට්එන්ඩ් ප්‍රදේශයේ තිබූ අනර්ඝතම මැදුරක් විය. එයින් කිරීම නිසා ක්‍රියාකරන යන්ත්‍රයක් ලෙස හැසිරුණු සේවකයෙක් අප ඉදිරියට පැමිණියේය. අපේ ආගන්තුක කාඩ්පත් අපි ඔහුට ඉදිරිපත් කළෙමු. කාඩ්පත් රැගෙන නිවස තුළට ගිය ඔහු, ආපසු ආවේ ක්ලයින් මැතිණිය නිවසේ නොමැති බව පවසමිනි.

"ආ කමක් නෑ. එතුමිය ගෙදර එනතුරු අපි රැඳී ඉන්නම්."

"යන්ත්‍රය" සත්‍යය හෙළිකළේය.

"එතුමිය ගෙදර නෑ කිව්වෙ, ඔහේලට ගෙදර නෑ."

"බොහොම හොඳයි. එහෙම නම් අපට වැඩි වෙලාවක් බලාගෙන ඉන්න සිදුවෙන්නෙ නෑ. කරුණාකර මෙන්න මේ ලියුම් කැල්ල ක්ලයින් මැතිණියට දෙන්න."

තම සටහන් පොතෙන් පිටුවක් ඉරාගත් හෝම්ස් එහි වචන තුන හතරක් කුරුටු ගා, එය සේවකයා අතට දුන්නේය.

"මොනවද හෝම්ස් ඔබ ලිව්වෙ?"

සේවකයා නික්ම ගිය පසු මම ඇසීමි.

"පොලීසියෙන් එක්ක ආවොත් විතරද හමුවෙන්න පුළුවන්? මං ලියුවේ එයයි. මං හිතන්නේ අපට යන්න අවසර ලැබේවි."

ඔහුගේ ඒ වචන සැබෑ විය. එය ද පුදුමාකාර ඉක්මනිනි. මොහොතකින් අප සිටියේ, අරාබි නිශෝල්ලාසයේ විස්තර කෙරෙන ආකාරයේ, ඉතා මනරම් විසිත්ත කාමරයකයි. ඒ තුළ පැවැති මඳ අඳුර තුනී කිරීමට, තැන් තැන්වල රෝස පැහැති කුඩා විදුලි බුබුළු දැල්විණි. ගෙහිමි කාන්තාව විසිත්ත කාමරයේ අසුන්ගෙන සිටියාය. අප එහි ඇතුළුවෙද්දී, ඇය වාඩිවී සිටි සෝපාවෙන් නැගිට්ටාය. සැහෙන තරම් උස, මනස්කාන්ත රූ සපුවක් තිබූ ඇය ඇත්තෙන්ම රූ රැජිනකි. ස්පාඤ්ඤ ජාතිකයන්ටම ආවේණික දිදුලන මැණික් වැනි දෑසක් ඇය සතු විය. එහෙත් ඒ දෑසින් අප වෙත එල්ල කළේ කෝපය උතුරන මිනීමරු බැල්මකි.

"මේ විදියට බලෙන්, මගේ ගෙට ඇතුළුවීමේ තේරුම මොකක්ද? ඊළඟට අපහාසාත්මක ලියුම් කෑලි එවන්නේ මේ පිළිවෙළට?" ඇය ඇසුවේ හෝම්ස්ගේ ලියුම පෙන්වමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං මේ ගැන ඔබට අමුතුවෙන් තේරුම් කර දෙන්න උවමනා නැහැනෙ ක්ලයින් නෝනා. ඔබේ බුද්ධිමත්කම ගැන මගේ තියෙන්නෙ විශාල ගෞරවයක්. එහෙම කෙනෙකුට මේක පහදාදෙන්න අවශ්‍යතාවයක් නෑ. ඒත් ඔබේ බුද්ධිමත් ස්වභාවය, මෑතක ඉඳල ඉතා පුදුමාකාර විධියට පරිහානියට පත්වී ඇති බව මා කියන්න ඕනෙ."

"එහෙම වුණේ කොහොමද මහත්මයා?"

"මං භාරගෙන යම් වැඩක් ඉදිරියට කරගෙන ගියා. ඒක තර්ජන මගින් අත්හැර දම්මවන්න හැකිවේවි කියල හිතල, ඔබ ඒ සඳහා චණ්ඩි මැරවරයින් යෙදෙව්වා. මේ වෘත්තියේ තිබෙන ඉතා අවදානම් බව දැන දැනත් මිනිහෙක් ඒකම තෝරගන්නේ, අවදානමේ ඇති ආකර්ෂණීය ගතිය නිසයි, මේබර්ලි තරුණයා පිළිබඳ පරීක්ෂණයට මාව බලෙන් වගේ යොමුකළේ ඔබයි."

"මං දන්නෙ නෑ ඔබ මේ මොනවද කථා කරන්නේ කියල. කුලියට තර්ජනය කරන චණ්ඩින් එක්ක මාව සම්බන්ධ වෙන්නෙ කොහොමද?"

මෙතෙක් වේලා ඇය දෙස බලාගෙනම කථා කළ හෝම්ස් ආපසු හැරුණේ විඩාවට පත් අයුරෙනි.

"ඔව්. ඔබේ බුද්ධිමත්කම ගැන මම අඩු තක්සේරුවක් නේ කරල තියෙන්නෙ. හොඳයි ඔබට සුභ සන්ධ්‍යාවක් ක්ලයින් නෝනා."

"නවතින්න ඔහොම! කොහේද ඔබ ඔය යන්න හදන්නෙ?"

"ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට."

අප විසිත්ත කාමරයෙන් පිටවී යාම සඳහා දොර දෙසට ගියෙමු. අප පසුකර වේගයෙන් ඉදිරියට දිවගිය ඇය, අපේ මග අවුරා සිටගත්තාය. ඉන්පසු ඇය හෝම්ස්ගේ අතින් අල්ලා ගත්තාය. මෙතෙක් වේලා වානේ මෙන් දැඩි බවක් පළකළ ඇය, එක් මොහොතකින් විල්ලුද මෙන් සෞම්‍ය ගතියට පත්වූවාය.

"කලබල වෙන්න එපා මහත්වරුනි. ඇවිත් වාඩිවෙන්න. අපි මේ ප්‍රශ්නය කථා කරලා විසඳගමු. මං හිතන්නේ මට ඔබත් එක්ක අවංකව කථාකරන්න පුළුවන් හෝම්ස් මහත්මයා. ඔබට තියෙන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

නියම මහාත්ම ගතිගුණ. ඒ හොඳ ගතිගුණ හඳුනාගැනීමට, ගැහැනියකට ක්ෂණික ඉවක් තියෙනවා. මං ඔබට මගේ හොඳ මිත්‍රයෙක් හැටියට සලකන්නම්."

"ඒ වුණාට ඔබව මගේ හොඳ මිතුරියක් හැටියට බාරගන්න බවට මට පොරොන්දු වෙන්න බැහැ නෝනා. ඒ මොකද යම් යම් කාරණා පිළිබඳව තීන්දුවකට එන්න, මට නීත්‍යානුකූල බලයක් නෑ. ඒ වුණත් මට හැකිතරමින් මම යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරනවා. ඒක මගේ ප්‍රතිපත්තිය. ඔබ කැමැති දෙයක් කියන්න. මං ඒවා අහගෙන ඉන්න සූදානම්. මං ක්‍රියාකරන්නේ කොහොමද කියලා, මං ඊට පස්සේ කියන්නම්."

"හෝම්ස් මහත්මයා. ඔබ වගේ නිර්භය කෙනෙක් තර්ජනයෙන් භය ගන්වන්න හැදූ එක මෝඩ වැඩක් බව මට දැන් තේරෙනවා."

"ලොකුම මෝඩකම ඒක නෙමෙයි ක්ලයින් නෝනා. ඔබ අර තක්කඩි රැළක් ගැන විශ්වාසය තියලා, ඔවුන් උදව්වට ගත්තු එකයි ලොකුම මෝඩකම. රහස් හෙළිකරන බව කියලා, උන් ඔබෙන් කප්පම් ගන්න ඉඩ තියෙනවා. නැත්නම් උන් ඔබව පාවාදේවි."

"නෑ නෑ. මං ඒ තරම් මෝඩ නෑ. මං ඔබට අවංකව කරුණු හෙළිකරනවා කිව් නිසා කියන්නම්. බාර්නි ස්ටොක්ඩේල් හා ඔහුගේ බිරිඳ සූසාන් දෙදෙනා ඇරෙන්න, වෙන කිසිකෙනෙක්, මං ඔවුන් යොදවන බව දන්නෙ නෑ. ඒ දෙන්නා නම් මෙවැනි වැඩක් කරන පළමුවෙනි වතාව මේක නෙමෙයි . . ." මායම්කාරී සිනාවක් පෑ ඇය, අප සමග සුහදශීලී බවක් පෙන්වීමට උත්සාහ කළාය.

"හැබැට? එහෙනම් ඔබ ඔවුන් මීට කලින් පරීක්ෂණයට භාජනය කරලයි තියෙන්නෙ?"

"ඔව්. ඔවුන් බොහොම නිහඬ, සේවය වෙනුවෙන් කැපවී සිටින දඩ බල්ලන් වගෙයි."

"නෝනා. මේ වගේ දඩබල්ලෝ කවදා හරි දවසක, උන්ට කන්න දුන්නු අත සපාකනවා. ගෙවල් බිඳුම ගැන පොලිසිය ඔවුන් හිරභාරයට ගනීවි. දැනටම පොලිසිය ඔවුන් පිටිපස්සේ ලුහුබඳිනවා."

http://sherlockholmesinvestigations.blogspot.com



181. "මං ඔබට මගේ හොඳ මිත්‍රයෙක් හැටියට සලකන්නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

"එහා ඕනෑම දේකට නිශ්ශබ්දව මුහුණ දෙන්න, ඔවුන් සූදානම්. මං ඒකට උන්ට හොඳට ගෙවනවා. මොන දේ වුණත් මගේ නම හෙළිවෙන්නෙ නෑ."

"මං ඔබේ නම හෙළිකළොත් මිස?"

"නෑ නෑ. ඔබ හෙළිකරන්නෙත් නෑ. ඔබ මහත්මයෙක්. මේක ගැහැනියකගේ රහසක්."

"හොඳයි. එහෙම නම් මුලින්ම ඔබ, ඩග්ලස් මේබර්ලි ලියූ කථාන්තරයේ අත්පිටපත අපට භාරදීල ඉන්න."

මහහඬින් සිනාසීමට පටන්ගත් ඉසදෝරා ක්ලයින්, ගිනිඋදුන දෙසට අත දිගු කළාය. ඝන පොදියට දැවී ගොස්, අහුරු කුට්ටියක් බවට පත්වූ යමක් එහි තිබිණි. අහුරු අල්ලන යකඩ අඬුව අතට ගත් ඇය, දැවී ගිය පොදිය කැබැලි වලට කඩා දැම්මාය.

"මං මේ ටික ඔබට ආපහු දෙන්නද?"

පැවසූ ඇය හෝම්ස් වෙත පෑවේ, ජයග්‍රාහී ප්‍රෞඪ සිනහවකි. හෝම්ස්ට මුහුණ දීමට සිදුවූ අපරාධකරුවන් අතරින්, මේ තරම් දැඩි සිතක් තිබූ පුද්ගලයෙකු ඔහුට කිසිදිනෙක හමුවන්නට නැතැයි මට සිතිණි.

"ඒ වැඩෙන් ඔබේ ඉරණම තීන්දු වුණා. ඔබේ වැඩ රාජකාරි කිසිම ප්‍රමාදයකින් තොරව කෙරෙනවා. නමුත් ක්ලයින් මහත්මිය, මේ සැරේ නම් ඔබ ඉක්මන් වුණා වැඩියි."

අතේ තිබූ ගිනි අහුරු අඬුව ඇය උදුනට විසි කළේ ශබ්දයක් නැහෙන අයුරෙනි.

"ඔබ මහ මුරණ්ඩු පුද්ගලයෙක් හෝම්ස් මහත්මයා. සම්පූර්ණ කථාවම මං ඔබට කියන්නද?"

"මට හිතෙනවා ඒ කථාව ඔබට කියාදෙන්න මට පුළුවන් වේවි කියා."

"ඒ වුණත් හෝම්ස් මහත්මයා. මේ ප්‍රශ්නය දිහා මගේ දෘෂ්ටි කෝණයෙන් බලන්න. ගැහැනියක් ඇගේ ජීවිතයේ පරමාර්ථ, අවසන් අරමුණු, මුදුන්පත් කරගන්න සූදානමින් ඉන්නවා. අන්තිම මොහොතේ ඒක විනාශ වෙලා යන හැටි දකින්න මොන ගැහැනියද කැමති?

http://sherlockholmesinvestigations.blogspot.com

තමන්ගේ විනාශය වළක්වන්න ඒ තැනැත්තිය පියවර ගැනීම වරදක් කියලද ඔබ කියන්නේ?"

"මෙතන මුලින්ම වැරැද්දක් කළේ ඔබයි."

"ඔව්. ඔව්. ඒක මං පිළිගන්නවා. ඩග්ලස් හරි අහිංසකයෙක්. ඔහු ඉතා සුන්දර ප්‍රේම ලෝකෙක ජීවත්වෙන්න හැදූ තරුණයෙක්. මගේ හිතේ මං සැලසුම් කරගෙන හිටි වැඩ පිළිවෙළට හැඩගැහෙන්න ඩග්ලස්ට හැකියාවක් තිබුණේ නැහැ. ඔහුගේ කටේ තිබුණේ විවාහය - විවාහය - විවාහය. මං කොහොමද හෝම්ස් මහත්මයා අතේ පැන්සයක් නැති, දුප්පත් සාමාන්‍ය මිනිහෙක් එක්ක විවාහ වෙන්නෙ? ඒත් ඔහු? ඔහු විවාහයට අඩුවෙන් කිසිදෙයක් භාරගන්න සූදානම්ව හිටියෙ නෑ. ඔහු තමන්ගේ මතයේම එල්ලී හිටියා. මං යෝජනා කළ කිසිදේකට කන්දුන්නෙ නෑ. ඔහු හිතුවා මං ඔහුගේ වචනයට යටත් විය යුතුයි කියල. ඒක කොහොම ඉවසන්නද? අන්තිමට මට සිද්දවුණා ඒක ඩග්ලස්ට වටහල දෙන්න."

"කොහොමද? ඔබව පෙනි පෙනීම මැරවරයින් යොදවා ඔහුට පහර දීමෙන්?"

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා. ඔබ හැමදෙයක්ම දන්නවා. කථාව සම්පූර්ණ ඇත්ත. බානියි එයාගෙ ගෝලයෝ ටිකයි ඩග්ලස්ව පන්නල දැම්මා. ඒ දේ කරන්න බානිගෙ කල්ලියට, ටිකක් සැරපරුෂ ක්‍රියා මාර්ගයක් ගන්න සිද්දවුණු බව, මං පිළිගන්නවා. ඉතින් ඔහු මොකද කළේ?

ඔහු තමන්ගේ ප්‍රේම කථාව විස්තර කරලා පොතක් ලිව්වා. ඒකෙ ඔහු අහිංසක බැටළු පැටියා; මම නපුරු වෘකයා. නම් ගම් ටිකක් වෙනස් කළත් අපේ සම්පූර්ණ කථාන්තරයම ඒකෙ තිබුණා. මේ කථාව මොකක්ද කියලා, ලන්ඩනයේ මොන මිනිහටද තේරුම් ගන්න බැරිවෙන්නෙ? හෝම්ස් මහත්මයා. දැන් මොනවද ඔබට කියන්න තියෙන්නෙ?"

"එවැනි දෙයක් කිරීමට ඔහුට අයිතිවාසිකමක් තියෙනවා."

"ඩග්ලස් ඉතාලියේ ජීවත්වෙලා ඉතාලි ජාතිකයන්ගේ නපුරු ආකල්ප ඔහුගේ ලේ වලට ඇතුළු කරගෙන කියලයි මට හිතෙන්නේ. ඔහු මට පොතේ පිටපතක් එව්වා. ඒ හරියට, මාව ලක් කිරීමට

http://sherlockholmesinvestigations.blogspot.com

බලාපොරොත්තුවෙන වධ හිංසා නැත කල් ඇතුව දැනුම්දීමට වගේ. ඔහු මට කියා එව්වේ මොකක්ද දන්නවද? පොතේ පිටපත් දෙකක් තිබෙනවා. එකක් මට, අනෙක ඔහුගේ පොත් ප්‍රකාශකයාට."

"ඔබ කොහොමද දන්නේ, ඔහු ප්‍රකාශකයාට අත්පිටපත භාරදුන්නාද නැද්ද කියලා?"

"ඔහුගේ ප්‍රකාශකයා කවුද කියලා මං දැන හිටියා. ඩග්ලස් මීට කලිනුත් පොත් ලියලා තියෙනවා. මේක ඔහුගේ පළමුවෙනි නවකථාව නෙමෙයි. මට දැනගන්න ලැබුණා අත්පිටපත් භාරගත්තා කියල ප්‍රකාශකයාගෙන් ඔහුට ලියුමක් නොලැබුණු බව. ඊළඟට ඩග්ලස් හිටිහැටියෙම මියගියා. අනෙක් අත්පිටපත මේ ලෝකෙ කොහේ හරි තිබුණොත්, මට ආරක්ෂාවක් නැති බව මං දැනහිටියා. එය තිබිය යුත්තේ ඔහුගේ පෞද්ගලික බඩු බාහිරාදිය සමගයි. ඒ සියල්ල නොවැරදීම ඔහුගේ මවට එවන බව මං දැන හිටියා. මං මගේ කණ්ඩායමට වැඩේ භාරදුන්නා. එක්කෙනෙක් ඒ ගෙදරට ගියා සේවිකාවක් හැටියට. මට ඕනෑවුණා මේ වැඩේ, බොහොම වැදගත්, අවංක විදියට කරන්න. ඒ නිසයි මම ගෙයයි එහි බඩුමුට්ටු ඔක්කොමයි මිලට ගන්න, කැමැත්ත පළ කළේ. ඒ ක්‍රමය අසාර්ථක වුණු නිසයි, වෙනත් විදියේ ක්‍රියාමාර්ගයක් ගන්න සිද්ධ වුණේ. හෝම්ස් මහත්මයා. මං ඩග්ලස්ට ටිකක් සැරපරුෂ වුණා වැඩි බව ඇත්තයි. ඒක මං පිළිගන්නවා. දෙවියො දන්නවා, මගේ ඒ හැසිරීම ගැන මං හරියට කම්පා වෙනවා! නමුත් මගේ මුළු අනාගතයම අවදානමකට ලක්වෙලා තියෙද්දි, මං වෙන මොනවා කරන්නද?"

ඒ ප්‍රශ්නයට තමාට පිළිතුරක් දීමට නොහැකි බව හඟවමින්, හෝම්ස් තම උරහිස් හැකිළුවේය.

"හොඳයි හොඳයි. මට පෙනෙන්නේ වැරදි වැඩක් යටපත් කරන්න මටත් හවුල් වෙන්න සිදුවෙනවා වගේ. පළමුවැනි පංතියේ මගියෙකු හැටියට, ලෝකය වටේ සංචාරයක යෙදිල එන්න, කීයක් විතර වියදම් වේවි කියලද ඔබ හිතන්නේ?"

කාන්තාව අප දෙස තුෂ්නිම්භූතව බලා සිටියාය.

"ඒ වැඩේ රන්පවුම් පන්දහසකින් කරන්න පුළුවන් වේවිද?"

"මං හිතන්නේ පුළුවන් වේවි."

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම හොඳයි. එහෙනම් අවුරුදු පන්දහසකට චෙක්පතක් ලියලා, මට අත්සන් කරල දෙන්න. මං ඒක මේබර්ලි මහත්මියට ලැබෙන්න සලස්වන්නම්. ඇයට මේ වේදනාකාරී පරිසරයෙන් මිදෙන්න ඉඩක් සලස්වාදීම, ඔබේ යුතුකමක්. ඒ අතරම මෙන්න මේ විකත් මතක තියාගන්න ක්ලයින් නෝනා . . . . ."

දබරඇඟිල්ල ඔසවා අනතුරු අඟවමින්, හෝම්ස් ක්ලයින් මහත්මිය ඇමතුවේය.

". . . . . . මුවහත් ආයුධ එක්ක සෙල්ලම් කරලා ඔබට හැමදාමත් බේරෙන්න ලැබෙන්නේ නෑ. මුවහත් ආයුධයකට ඔබේ මිය ලස්සන දෑත් කැපුණු දවසක ඒ බව ඔබට වැටහේවි."

Reading Purpose Only. Not For...
http://sherlockholmesinvestigations.blogspot.com

# බේදජනක සාක්ෂිය

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# බේදජනක සාක්ෂිය

එදා උදෑසන මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් වෙතින් මා දුටුවේ, අතිශයින් කම්පාවට පත්වූ දාර්ශනිකයෙකුගේ ස්වභාවයකි.

"වොට්සන් ඔබ දුටුවද ඒ මිනිහා?"

"ඔබ කියන්නේ මේ දැන් අපේ ගෙදරින් එළියට බැහැලා ගිය වයසක මනුස්සයාද?"

"අන්න හරි."

"මං ගෙට ඇතුළුවෙද්දි, දොර ළඟදි ඔහුව හමුවුණා."

"ඔබට මොනවද ඔහු ගැන හිතුනේ?"

"ජීවිතේ ගැන කලකිරීමකට පත්වෙලා දුකෙන්, සිත් වේදනාවෙන් ඉන්න කෙනෙක්?"

"හරියට හරි වොට්සන්. අපි කල්පනා කරල බැලුවොත් මේ මුළු ජීවිතේම, දුකෙන් වේදනාවෙන් පිරුණු එකක් නේද. අර මිනිහාගේ කථාව, මුළු මහත් සමාජය තුළම පැතිර ඇති, ජීවිතයේ දුක්ඛදායක තත්ත්වය සියුම්ව පෙන්වන කැටපතක් වගෙයි. අපි දැත් දිගුකරලා පුළුවන් තරම් දේවල් ලබාගන්න හදනවා. නමුත් අන්තිමට අපේ අත්වලට හසුවෙලා, ඉතිරි වී තියෙන්නෙ මොකක්ද? මායාවක් පමණයි. මායාවකටත් වඩා අන්තයි. දුක වේදනාව පමණයි."

"ඒ තැනැත්තා ඔබේ අනුග්‍රාහකයෙක්ද?"

"ඔව්. මට එහෙම හඳුන්වා දෙන්න පුළුවනි. ස්කොට්ලන්ඩ්යාඩ් එකෙනුයි ඔහුව මෙහාට එවල තිබුණේ. සමහර වෙලාවට වෛද්‍ය විශේෂඥයො, තමන්ට මොන විධියකටවත් සනීප කරන්න බැරි ලෙඩ්ඩු, වෛද්‍ය පුහුණුවක් නොලැබූ හොර වෙදුන් ළඟට යවන්නෙ? අන්න ඒ වගෙයි. එහෙම වෙලාවට වෛද්‍යවරුන්ගේ තර්කය මොකක්ද

http://sherlockholmesinvestigations.blogspot.com

දන්නවද? අර ලෙඩා සනීප කරන්න කියලා තමන්ට තවත් කරන්න කිසිදෙයක් ඉතිරිවෙලා නෑ; හොරගෙදා මොනවා කළත් ලෙඩාගේ අමාරුවෙ තවත් නරක අතට හැරෙන්න කියලා දෙයකුත් නෑ."

"ඇයි අර මිනිහට මොකක්ද වෙලා තියෙන්නෙ?"

කිළිටි වී තිබුණු ආගන්තුක පතක් හෝම්ස් අතට ගත්තේය.

"ජොසයියා ඇම්බර්ලි. ඔහු කියනවා බ්‍රික්ෆෝල් සහ ඇම්බර්ලි සමාගමේ කනිෂ්ඨ කළමනාකාර අධ්‍යක්ෂකවරයා හැටියට හිටියේ ඔහුයි කියල. එයාල තමයි චිත්‍ර ශිල්පීන් වෙනුවෙන් දිය සායම්, තෙල් සායම් හා පින්සල් නිපදවන්නේ. ඔවුන්ගේ නම දියසායම් පෙට්ටි වල පිටපැත්තේ අඳහන් කර තිබෙනවා ඔබ දැකල ඇති.

ඔහු සෑහෙන ධනයක් උපයාගෙන, වයස හැටඑක වෙද්දි ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත්තාලු. ඊළඟට ලුවිශාම් වලින් නිවසක් මිලයට ගෙන, විවේකීව කාලය ගතකරන අදහසින් එහි පදිංචි වුණාලු. දීර්ඝ කාලයක් ව්‍යාපාර කටයුතුවල යෙදීම නිසා, ඔහු හෙම්බත් වෙලා ඉන්න ඇත්තෙ. ඉතින් මේ තොරතුරු ඇහුවම කෙනෙකුට මොනවද හිතෙන්නෙ? දැන් ඉතින් ඔහුට නිවිසැනසිල්ලේ කාලය ගතකරන්න හැකිවේවි කියන එක නේද?"

"ඇත්තෙන්ම ඔව්."

හෝම්ස් පරණ ලියුම් කවරයක් පිටුපස ඔහු සටහන් කරගත් යමක් කියවා බැලුවේය.

"ඔහු විශ්‍රාම අරගෙන තියෙන්නේ 1896 දී. ඊළඟට 1897 මුල හරියෙදි ඔහු විවාහවුණා. ඒ තමන්ට වඩා අවුරුදු විස්සකින් බාල කාන්තාවක් සමග. ඡායාරූපයේ පෙනෙන හැටියට ඇය හොඳ රූමත් තැනැත්තියක්. ඔහුගේ දක්ෂකම නිසා මුදල් හදල් ලැබුණා. බිරිඳක් ලැබුණා. දැන් විවේකයත් ලැබුණා. මේ හැමදෙයකින්ම පෙනෙන්නෙ මොකක්ද? ඔහු ඉදිරියේ, යෑමට තිබෙන මාර්ගය බොහොම පහසු, කරදර කම්කටොලු වලින් තොර එකක්. එහෙම නේද? නමුත් අවුරුදු දෙකක් ගතවුණේ නෑ. ඔබට පෙනෙනවා නේද මේ වයසක ඇම්බර්ලි මහත්මයා, ඉරහඳ යට ඉන්න, කාලකණ්ණිම, අවාසනාවන්තම මිනිහා බවට පත් වී ඇති හැටි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි මොකක්ද සිද්ධ වුණේ?"

"පරණ කථාවමයි වොට්සන්. එපල බිරිඳක් සහ මිත්‍ර ද්‍රෝහියෙක්. ඔහු කියන හැටියට ඇම්බර්ලිගේ ජීවිතයේ හැමදාමත් ඔහු ඉතාම ප්‍රිය කළ විනෝදාංශය තමා චෙස් ක්‍රීඩාව. ලුවිශාම්හි ඔවුන්ගේ නිවසට කිට්ටුව නිවසක ඉන්නවා තරුණ වෛද්‍යවරයෙක්. ඔහුත් චෙස් ක්‍රීඩාවට කැමැති කෙනෙක්. ඔහුගේ නම වෛද්‍ය රේ අර්නස්ට්. චෙස් ක්‍රීඩාව සඳහා නිතර නිතර නිවසට පැමිණි වෛද්‍යවරයා සහ ඇම්බර්ලිගේ බිරිඳ අතරේ හිතවත් කමක් ඇතිවුණා. අපේ අවාසනාවන්ත මිත්‍රයාගේ බාහිර පෙනුම නම් ඒ හැටි සතුටුදායක එකක් නොවෙන බව ඔබ දකින්න ඇති. ගිය සතියේ අර ජෝඩුව පැන ගිහින්. කොහේ ගිහින්ද කියල කවුරුවත් දන්නෙ නෑ. ඒ මදිවාට අර ගෑනිය තමන්ගේ ගමනාබඩු හැටියට ගෙනිහිං තියෙන්නේ මොනවද දන්නවද? ඇම්බර්ලි මහත්මයා ජීවිත කාලයක් තිස්සේ එකතු කළ මුදල් වලින් විශාල කොටසක් සහ ඔහු මුදල් ආයෝජනය කර ලබාගත් සුරැකුම්පත් සහිත පෙට්ටිය. ඔහු මගෙන් අහනවා, අපට පුළුවන්ද කියලා හොරකම් කරගෙන ගිය මුදල් සහ බිරිඳ හොයල දෙන්න. දැනට පෙනෙන හැටියට නම් සාමාන්‍ය ආකාරයේ ප්‍රශ්නයක්. නමුත් ජෝසයියා ඇම්බර්ලිට නම් විශාල ගැටලුවක්."

"හෝම්ස් මොනවද ඔබ මේකට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ඔව්. මෙතැනදි වහාම මතුවෙන ප්‍රශ්නය, වොට්සන් ඔබ මේකට මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

මගේ ගෝලයා හැටියට ඔබ දන්නවා නේ මේ දිනවල මගේ කාලය සම්පූර්ණයෙන්ම ගතවෙලා තියෙන්නේ වෙනත් වැඩකට බව? අර ඊජිප්තු-ක්‍රිස්තියානි බිෂොප්වරුන් දෙදෙනා සම්බන්ධ සිද්ධියේ වැඩකටයුතු දැන් සෑහෙන තරම් අවසානයි. මට හිතෙනවා අද හැන්දෑව වෙනකොට ඒකෙ කෙළවරක් දකින්න පුළුවන් වේවි කියලා. ලුවිශාම් වෙත ගිහින් පරීක්ෂා කරල බලන්න, මට කොහොමටවත් වෙලාවක් නැහැ. නමුත් සිද්ධිය වූ තැනට ගිහිං සටහන් කරගන්න සාක්ෂිවල විශේෂ වටිනාකමක් තියෙනවා. නාකි මනුස්සයා මගෙන් තදින්ම ඉල්ලා හිටියා ඔහු සමග එන්න කියලා.

http://sherlockholmesinvestigations.blogspot.com

මට ඇතිවී තිබෙන ප්‍රශ්නය මං ඔහුට තේරුම් කර දුන්නා. පස්සේ ඔහු කැමැතිවුණා මගේ නියෝජිතයාව භාරගන්න."

"මං දන්නෙ නෑ හෝම්ස් මගෙන් නම් ඒ හැටි ප්‍රයෝජනයක් වේවිද කියල. නමුත් මං පුළුවන් උත්සාහයක් දරන්නම්."

හෝම්ස්ගේ ඉල්ලීම පිළිගෙන ග්‍රීෂ්ම සෘතුවේ ඒ සවස් භාගයේ මම ලූවිශාම් බලා පිටත්වී ගියෙමි. එංගලන්තය පුරා මහත් ආන්දෝලනයක් ඇතිවන සිදුවීමක් බවට, සතියක් ඇතුළත එය පරිවර්තනය වනු ඇතැයි මට එවේලේ කිසිසේත් නොසිතිණි.

මා ආපසු බේකර් වීථිය කරා පැමිණෙන විට රෑ බෝවී තිබිණ. මගේ ගවේෂණාත්මක ගමන ගැන දීර්ඝ විස්තරයක් හෝම්ස් වෙත ලබාදීමට මට සිදුවිය.

ඔහුගේ දිගු සිහින් ශරීරය හාන්සි පුටුවේ දිගහැර, හෝම්ස් මගේ කථාවට සවන්දීම ඇරඹුවේය. සැර දුම්කොළ යොදා දල්වාගත් පයිප්පය සුදු පැහැති ඝන දුම්රැලි පිටකරන්නට පටන් ගත්තේය. දෑස් පියාගෙන සිටි ඔහුට නින්දගොස් ඇතැයි, කිසිවෙකු දුටුවේ නම් සිතන්නට ඉඩ තිබිණ. මම ගමන් විස්තරය ඇරඹීමි.

"ජෝසයියා ඇම්බර්ලිගේ නිවසේ නම "ද හැවන්" ඒ හරියේ හැමතැනකම ගඩොල් වලින් බැඳුණු උස් තාප්ප සහිත ඉඩම්. මේ හැම මධ්‍යයේ ඇම්බර්ලිගේ නිවස පිහිටා තිබුණේ, ඒකාකාරී පරිසරයක් මැද, පෞරාණික සංස්කෘතිය හා සුවපහසුව විදහා දක්වන දූපතක් වගේ. මෙම නිවස වටේ බැඳුණු, හිරු රැසින් තැහැවුණු උස් තාප්පය, පාසි තීර්ග හා පුස් වලින් සැඳුණු පැල්ලම් වලින් අලංකාර . . . ."

"ඔය කාව්‍යමය වර්ණනා ටික අත්ඇරල දාන්න වොට්සන්. ගේ වටේට ගඩොල් වලින් හදපු උස් තාප්පයක් තිබුණා. මට ඒ ඇති. . . . ." හෝම්ස් මගේ කථාවට බාධා කළේ කෝප වූ අයුරෙනි.

"හරි හරි. ගේ කොයි එකද කියලා හොයාගන්න වැඩේ ඒ හැටි ලේසි නොවෙන්න ඉඩ තිබුණා. නමුත් වීථියේ දුම්බොමින් රස්තියාදු වෙමින් හිටි තරුණයෙකුගෙන් මං ඒ ගැන ඇහුවා. ඔහු ගැන මං විශේෂයෙන් සඳහන් කරන්නේ හේතුවක් ඇතුවයි. ඔහු

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com



91. "ඔය කාව්‍යමය වර්ණනා අත්ඇරල දාන්න වොට්සන්."

http://sherlockholmesinvestigations.blogspot.com

හුහක් උස, කළු පැහැති සිරුරක් තිබුණු ලොකු උඩුරැවුලක් තිබුණු මිනිහෙක්. පෙනුමෙන් ටිකක් යුද හමුදා භටයෙක් වගේ.

"ජෝසයියා ඇම්බර්ලි මහත්මයගෙ ගේ මේකද?" කියල මං ඇහැව්වම ඔහු හිස සොලවා ඒ බව ඇඟෙව්වා. ඊළඟට මා දිහා හෙළුවේ කුතුහලයෙන් යුතු ප්‍රශ්නාර්ථ බැල්මක්. ඒක මගේ සිහියට ආවේ ටිකක් වෙලා ගියාට පස්සේ.

මං ගේට්ටුවෙන් ඇතුළුවෙද්දීම ඇම්බර්ලි මහත්මයා ඉස්සරහට ආවා. අද උදේ මං ඔහුව දුටුවේ යන්තමින් විතරයි. ඒ වෙලාවෙ මට හිතුණේ ඔහු මහ පුදුමාකාර මිනිහෙක් කියලයි. අද හවස ඔහුව පැහැදිලිව දකින්න ලැබුණාම, පෙනුමේ අස්වාභාවිකකම තවත් තහවුරු වුණා."

"ඒ කාරණය මමත් නිරීක්ෂණය කළා. ඒ වුණත් මං කැමතියි ඔහු ගැන ඔබේ සිතේ ඇතිවුණු අදහස් දැනගන්න."

"මට ඔහුව පෙනුණේ මිනැකම්නම හිස ඉදිරියට පහත් කරගෙන සිටි කෙනෙකුගේ අයුරින්. එහෙම පෙනෙන්න හේතුව පිට ටිකක් කුදු ගැහී තිබුණු නිසා බව මට දකින්න ලැබුණා. ඒ වුණත් ඔහු, මම මුලින් හිතු තරම් දුර්වල කෙනෙකු වෙන්න බෑ. ඔහුගේ උරහිස් දෙකත් පපුවත්, යෝධයෙකුගෙ වගේ ඉතාම පුළුල්. නමුත් ශරීරය පහතට වෙන්න හරිම කෙට්ටුයි.

"වම් සපත්තුව රැළි වැටී, ඇඹරී තිබුණු හැටි සහ දකුණු කකුලේ සපත්තුව සාමාන්‍ය ආකාරයට තිබුණු හැටි, ඔබ දකින්න ඇති?"

"ඒ හරිය මං දැක්කෙ නෑ."

"ඔව්. ඔබට ඒක දකින්න ලැබෙන්න නැහැ. මං දැක්කා ඔහුගේ එක කකුලක් කෘතිම කකුලක් බව. කමක් නෑ. කථාව දිගටම කියන්න."

"ඔහුගේ පරණ තොප්පිය අතරින් පහතට වැටුණු, තැනින් තැන සුදු වී කැරලි ගැසුණු කොණ්ඩයෙන් මා පුදුමයට පත්වුණා. එපමණක් නොවෙයි, ඔහුගේ රැළිවැටුණු මුහුණෙන් ප්‍රකාශවුණේ බියකරු පෙනුමක්."

Reading Purposes Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"හරි හරි වොට්සන්. මොනවද ඔහු කිව්වෙ කියල මට කියන්න."

"ඔහු තමන්ගේ දුක් ගැනවිලි අඳෝනාව දිගහරින්න පටන් ගත්තා. අපි පාර දිගේ ඇවිද යමිනුයි කථා කළේ. ඒ අතරේ, ගෙය හා අවට පිහිටීම ගැන මං හොඳින් පරීක්ෂා කළා. ඒ තරම් අපිරිසිදුවට තිබුණු ගෙයක් හා ගෙවත්තක් මං කවදාවත් දැකල නැහැ. ගෙවත්තේ සෑම්තැනකම වල් පැළෑටි හැදිලා වල්බිහි වෙලා. හැදිච්ච පවුලක ගැහැනියක්, ගෙවත්ත මේ වගේ වෙන්න ඇරලා, බලාගෙන හිටියෙ කොහොමද කියල මට නම් තේරුම් ගන්න බෑ. ගේත් හොඳටම ගරා වැටිලා, විනාශ වෙලා යන්න ඔන්න මෙන්න වගේ. මේ අහිංසක මිනුද්දයාට ගෙයි පිළිවෙළ තේරිලා වෙන්න ඇති. ඔහුට ගේ ටිකක් අලුත්වැඩියා කරන්න හිතිලා. ඔහු නිවසේ තීන්ත ගාන්න පටන්ගෙන තිබුණා. විශාල, කොළපාට තීන්ත බඳුනක් සාලය මැද තබා තිබුණා. මං එහි යද්දිත් ඔහු ඒ වැඩේ යෙදිලා ඉන්න ඇත්තේ. නිවසෙහ් එළියට ආවෙත් ලොකු තීන්ත බුරුසුවක් අතේ තියාගෙන.

ඔහු මාව කැඳවාගෙන ගියා කුඩා කුටියකට. අපි හුහක් වෙලා කතාබස් කළා.

"ඇයි හෝම්ස් මහත්තයම ආවෙ නැත්තෙ මේ ගැන පරීක්ෂා කරන්න? හැබැවටම මං එහෙම හිතන එකත් වැරැදියි. මුදල් හදල් විනාශ වෙලා ගිහිං මං බොහොම දුප්පත් අසරණයෙක් බවට පත්වෙලයි ඉන්නේ. ඉතින් මං කොහොමද ෂර්ලොක් හෝම්ස් මහත්තය වගේ සුප්‍රසිද්ධ කෙනෙකුගේ පැමිණීම බලාපොරොත්තු වෙන්නෙ?" ඇම්බර්ලි කිව්වා.

"එහෙම කියන්න එපා ඇම්බර්ලි මහත්මයා. මගේ මිත්‍රයා ම මේ වැඩේට ආවෙ නැත්තෙ මුදල් හදල් පිළිබඳ ප්‍රශ්නයක් නිසා නෙමෙයි. ෂර්ලොක් හෝම්ස් කියන්නෙ සල්ලිකාරයින්ගෙ වැඩ ගැන උනන්දුවෙන, නැතිබැරි අය නොසලකා හරින කෙනෙක් නෙමෙයි."

"ඔව්. මං ඒ බව් අහල තියෙනවා. කලා ශිල්පීන් කලාත්මක නිර්මාණයක යෙදෙන කොට මුදල් ගැන නොහිතනව වගේ; හෝම්ස් මහත්මයා මෙහේ ආව නම්, මේ සිද්ධියෙත් යම්කිසි කලාත්මක දෙයක් අධ්‍යයනය කරන්න තිබුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

මනුස්සයෙකුට කොයිතරම් දරුණු විදියට අකෘතඥ වෙන්න පුළුවන්ද කියන එක දකින්න තිබුණා. ඇය ඉල්ලූ දෙයක් මං කවදද ප්‍රතික්ෂේප කළේ? මේ විදියට ඇය ඉල්ලන හැම දෙයක්ම ලබාදෙමින්, ඇය කියන විදියට හැමදෙයක්ම කළා. ගැහැනියකට කවදාවත් ඒ වගේ ඇඹියෙක් ලැබිල තියෙනවද? ඊළඟට අර ඉලන්දාරියා - මගේ පුතෙක් වෙන්න පුළුවන් වයසේ තරුණයෙක්. ඔහුට මේ ගෙදර කැමැති හැටියකට ඉන්න නිදහස පවා මං දීලා තිබුණා. ඒ වුණත් බලන්න ඔහු මට සැලකූ හැටි! අයියෝ වොට්සන් මහත්මයා. මේක මහා දුෂ්ට, කෲර ලෝකයක්."

පැයකට හෝ ඊට වැඩි කාලයක් ඔහු දෙඩෙව්වේම ඒ ගැන තමයි. මේ තරුණයා හා ඔහුගේ බිරිඳ අතර රහස් සබඳකමක් තිබුණු බවට, ඔහුගේ හිතේ සැකයක්වත් තිබිල නැහැ. ඇම්බර්ලි හා ඔහුගේ බිරිඳ ජීවත්වුණේ තනිවම. ඒ කියන්නේ ගෙදර නැවතී වැඩපල කරදුන් සේවක සේවිකාවෝ කවුරුත් නැහැ. ගෙදර කටයුතු කරදීමට, උදේට ඇවිත් හැන්දෑවේ හයට පිටවී යන ගැහැනියක් සිටිනවා.

මේ සිද්ධිය වුණු දවසෙ හැන්දෑවෙ නාට්‍ය දර්ශනයක් නැරඹීම සඳහා ආසන වෙන්කරගන්න ඇම්බර්ලි තීරණය කර තිබෙනවා. ඔහු හේමාකට් රඟහලේ හැන්දෑවෙ දර්ශනය සඳහා සඳළුතල ආසන වලින් ටිකට් පත් දෙකක් මිලට ගත්තාලු. ඒ ඔහුගේ බිරිඳගේ විනෝදාස්වාදය සඳහා නාට්‍ය නැරඹීමේ අදහසින්. නමුත් රඟහලට පිටත්වී යන්න සූදානම් වෙන අන්තිම මොහොතේ, ඇගේ හිස කකියන බව කියමින්, නාට්‍යය නැරඹීමට යාම බිරිඳ ප්‍රතික්ෂේප කළාලු. ඒ හින්ද, ඔහු තනියම ගිහින් තියෙනවා. ඒ ගැන කිසි සැකයක් නෑ. ඒ මොකද ඔහු බිරිඳ වෙනුවෙන් මිලට ගත් ටිකට්පත පවා මට පෙන්නුවා."

"මේක හැබෑවටම මගේ සිත් ඇදගන්නා තාලේ එකක්. ඉතිං කියන්න වොට්සන්. ඔබේ කථාන්තරය හරිම සිත්ගන්නා සුලුයි. ඔබ ඒ ටිකට් පත පරීක්ෂා කරල බැලුවද? ඔබට ඒකෙ අංකය සටහන් කරගන්න මතක් වුණේ නැද්ද?"

"මං ඒක හොඳට මතක් තියාගත්තා."

මා පැවසුවේ තරමක් ආඩම්බරයෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මං පාසල් යන කාලේ මගේ අංකය. ඒ හින්දා හොඳට මතක හිටියා - අංකය 31."

"විශිෂ්ටයි වොට්සන්! එහෙනම් ඔහුගේ අංකය වෙන්න ඇත්තේ අංක 30 නැත්නම් 32."

"ඔව්. එහෙම විය යුතුයි. ඒක B අකුරෙන් තිබෙන ආසන පේළියේ අසුන් දෙකක්ලු."

"විශිෂ්ටයි. වෙන මොනවද ඔහු කිව්වෙ?"

"ඔහු තමන්ගේ ආරක්ෂිත කාමරය කියල හැඳින්වූ කාමරයක් මට පෙන්නුවා. ඒක හැබැවටම බොහොම ආරක්ෂිත තැනක්. හරියට බැංකුවක සුරක්ෂිතාගාරය වගේ. දොර යකඩින් තැනූ එකක්. ජනෙල් ආවරණ හොරුන්ට කඩන්න බැරි, යකඩ තහඩුවලින් තැනූ ඒවා. ඇම්බර්ලිගේ බිරිඳ ළඟ මේ කාමරයේ දොරට අමතර යතුරක් තිබුණු බවයි පෙනෙන්නේ. ඇයත් මේ රේ අර්නස්ට් නම් තරුණයාත් එකතු වෙලා රන්පවුම් හත්දහසක වටිනාකමට මුදල් හා සුරැකුම්පත් හොරකම් කරගෙන ගිහින්."

"සුරැකුම්පත්? ඔවුන් කොහොමද ඒවා විකුණන්නෙ?"

"ඇම්බර්ලි කිව්වා ඔහු පොලිසියට ඒවායේ විස්තර අඩංගු ලේඛනයක් දී ඇති බව. ඒ නිසා නම් ඔවුනට විකුණගන්න බැරිවෙයි. ඔහු රංග ශාලාවේ ඉඳල ආපහු එද්දී මැදියම් රැය වුණාලු. එතකොට ඔහුට දකින්න ලැබුණාලු, ඔහුගේ ආරක්ෂක කාමරය විවෘත කරල, තිබුණු දේවල් අරගෙන සැකකරුවො පැන ගිහින් ඇති බව. ඔහු වහාම මේ ගැන පොලිසියට දැනුම් දීල තියෙනවා."

හෝම්ස් මඳ වේලාවක් කල්පනා කරමින් සිටියේය.

"ඔබ කියනවා ඔහු නිවසේ තීන්ත ගාමින් හිටියෙ කියල. මොනවායෙද ඔහු තීන්ත ගෑවෙ?"

"මං යද්දී ඔහු බරාඳයේ තීන්ත ගාමින් සිටියා. අර ආරක්ෂිත කාමරයේ බිමත්, දොරෙත් තීන්ත ගා අවසන් කර තිබුණා."

"ඔබට හිතෙන්නේ නැද්ද වොට්සන්, මේ වගේ සිදුවීමක් වුණු වෙලාවෙ, යම්කිසි කෙනෙක් මෙවැනි වැඩක යෙදීම පුදුමාකාර දෙයක් කියල?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හදවතේ දැනෙන වේදනාව අමතක කරන්න මොකක් හරි වැඩක යෙදෙන්න ඕන මහත්මයා." ඔහු කිව්වෙ එහෙමයි.

බලාගෙන ගියාම ඒ අදහස විකාරයක් නමා. එක අතකින් පුදුමෙකුත් නෑ. ඒ මොකද ඇම්බර්ලි කොහොමටත් පිස්සු විකාර කාරයෙක් වගෙයි මට පෙනුණෙ. ඔහුගේ බිරිඳගේ ඡායාරූපයක් තිබුණා. ඔහු කෝපයෙන් මං ඉදිරියෙදිම ඒක කෑලි කෑලිවලට ඉරා දැම්මා.

"මේ ගෑනිගේ කාලකණ්ණි මූහුණ මට ආයෙත් දකින්න උවමනා නෑ." ඔහු කිව්වේ කෝපයෙන් වෙව්ලමින්."

"වෙන මොනවද වොට්සන් ඔබ දුටුවෙ?"

"ඔව්. අනික් හැමදේකටම වඩා මගේ හිතට වැදුණු එක් කරුණක් තිබුණා. ආපහු එන්න, දුම්රියට නගින්න මං බ්ලැක්හීත් දුම්රියපොළට ආවෙ අශ්වකරත්තයකින්. දුම්රිය පිටත්වෙන මොහොතෙදි මං දුටුවා මිනිහෙක් දුවගෙන දුවගෙන ඇවිත්, මං නැගපු මැදිරියට, අල්ලපු දුම්රිය මැදිරියට නගිනවා. ඔබ දන්නවනෙ හෝම්ස් මට මිනිස්සුන්ගෙ මුහුණු හොඳට මතක තියෙන බව? කිසිම සැකයක් නෑ: ඒ තමයි අර ඇම්බර්ලිගේ ගේ ළඟ රස්තියාදු වෙවී හිටිය උස කළු පුද්ගලයා. ලන්ඩන් පාළම දුම්රියපොළේ මං බහිද්දි, ඔහුත් දුම්රියෙන් බැස්සා. නමුත් ඔහු වහාම සෙනග අතරේ නොපෙනී ගියා. මට හොඳටම විශ්වාසයි, ඔහු මගේ ගමන ගැන සෝදිසි කරන්න මගේ පිටිපස්සෙන්ම ආ බව."

"කිසි සැකයක් නෑ. කිසිම සැකයක් නෑ." හෝම්ස් කීය. "වොට්සන්, ඔහු උස කළු මිනිහෙක්. ලොකු උඩුරැවුලක් තියෙනවා. අළුපාට අව්කණ්ණාඩි දෙකක් පැළැඳගෙන හිටියා. එහෙම නේද?"

"හෝම්ස් ඔබ ඉන්ද්‍රජාලිකයෙක් වගේ. මං ඔබට නොකිව්වට, ඔහු අළුපාට අව්කණ්ණාඩියක් පැළැඳගෙන හිටි බව සම්පූර්ණ ඇත්ත."

"ඒ වගේම ටයි පටියේ මේසොනික් සමාජයේ ලාංඡනය සහිත ටයි කටුවක්?"

"මොනවා හෝම්ස්? ඔබ කොහොමද ඒකත් දන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com



197. "මේ ගෑනිගේ කාලකණ්ණි මුහු ණ ආයෙමත් දකින්න මට උවමනා නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම සරලයි මගේ හිතවත් වොට්සන්. නමුත් අපි ඉස්සර වෙලා මේ ගැටලුවේ ඉතාම වැදගත් ප්‍රායෝගික පැත්ත ගැන සිත් යොමු කරමු.

මං මුලින්ම පිළිගන්න කැමැතියි කිසිම වැදගත්කමක් නැති, සරල ප්‍රශ්නයක් කියල මං හිතූ දේ, බොහොම ඉක්මනින් බැරෑරුම් ගැටලුවක් බවට පරිවර්තනය වෙිගෙනයි එන්නෙ. ඔබ ලූවිශාම් වෙත ගිය ගමනේදී, ඉතාම වැදගත් නිරීක්ෂණ හා කරුණු හැම එකක්ම, ඔබට අල්ලාගන්න බැරිව මගහැරී ගියා. ඒක ඇත්තක් වොට්සන්. නමුත් තවත් සමහර කාරණා විගයක් බලෙන්ම වගේ ඔබේ ඇහට ඇවිත් තියෙනවා. ඒවායේ පවා වැඩිදුර හිතාබැලිය යුතු වැදගත්කමක් ඇති බවයි මට නම් පෙනෙන්නෙ."

"හොඳයි මොනවද මට මග හැරුණේ?"

"ඕකට හිත අමාරු කරගන්න එපා මිත්‍රයා. ඔබ දන්නවානේ වරදක් පෙන්වා දෙන්න ගියාම, මං හිතවත්කම ගැන සිහිකරන්නෙ නැති බව. වෙන කව්රු හරි යාළුවන්, මේක ඔබට වඩා හොඳට කරන එකක් නෑ. නමුත් පැහැදිලිවම, ඉතාම වැදගත් කරුණු කිහිපයක් ගැන සෙවීම ඔබෙන් අතපසු වුණා.

අපි මෙහෙම හිතමු. ඇම්බර්ලි හා ඔහුගේ බිරිඳ ගැන අසල්වාසීන් මොනවද හිතන්නේ? ඒක හරිම වැදගත්. දොස්තර අර්නස්ට් මොන වගේ කෙනෙක්ද? සමාජයේ චාරිත්‍ර ධර්ම ගැන නොතකා නිදහසේ හැසිරෙන කෙනෙක්ද? මය පැත්තේ දකින්න ලැබුණු ගැහැනු කාගෙන් හරි ඔබට ආරංචි ලබාගන්න තිබුණා. ඔවුන් ඔබේ උදව් කාරයන් කරගන්න තිබුණා. තැපැල් කන්තෝරුවේ වැඩ කරන ගැහැනු ළමයාගෙන් විමසලා බැලුවෙ නැද්ද? එලවළු කඩේ වෙළෙන්දාගේ බිරින්දෑගෙන් ඔබට සෑහෙන තොරතුරක් දැනගන්න තිබුණා. මට හිතේ මවාගන්න පුළුවනි, බ්ලූඇන්කර් අවන්හලේ වැඩ කරන තරුණියක් සමග වොට්සන් බොරුවට මොනවා හරි කොඳුර කොඳුර ඉන්න හැටි. ඇයගෙන් ලබාගන්න තිබුණා වැදගත් කරුණක් දෙකක්. ඔබ මේ කිසිදෙයක් කරලා නෑ."

"හොඳයි. ඒ දේවල් කරන්න, තවමත් බැරිකමක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ දේවල් කරල අවසානයි වොට්සන්. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියටයි, දුරකථනයටයි ස්තුති වෙන්න, මං මේ කාමරේ ඇතුළෙ ඉඳගෙනම ඒ දේවල් හොයාගත්තා.

මට ලැබුණු තොරතුරුවල හැටියට ඇම්බර්ලි කිව් කථාව තහවුරු වෙනවා. ඔහු මහා ලෝභයෙක් හැටියට පළාතේ ප්‍රසිද්ධයි. ඒ වගේම බිරිඳට කිසිම තෙහුමතායක් නොවෙන්වූ, කෲර නීතිරීති මගින් ඇයව බියට පත්කරගෙන සිටි කෙනෙක්ලු. ඔහුගේ අර සුරක්ෂිතාගාරයේ නිසැකවම ලොකු මුදලක් තිබෙන්නට ඇති බවයි ආරංචිය. චෙස් ක්‍රීඩාව සඳහා නිවසට ආව දොස්තර අර්නස්ට් තරුණයා අවිවාහකයෙක්. මේ හැමදෙයක්ම පැහැදිලියි. ඒ අනුව තීරණයකට ඒම බොහොම පහසු වගෙයි පෙනෙන්නෙ. කෙනෙකුට හිතෙන්න පුළුවනි, තවත් මොන ගැටලුවක්ද මෙතැන තියෙන්නෙ කියලා. ඒ වුණත් . . . . ඒ වුණත් . . . . . ."

"ඇයි කොතැනද ගැටලුව තියෙන්නෙ?"

"ගැටලුව නම් තියෙන්නේ බාග වෙලාවට. . . . . මගේ හිතේ. ඒක අපි එහෙමම තියෙන්න අරිමු වොට්සන්. මේ වෙහෙසකාරී, කලබලකාරී ලෝකයෙන් ඉවත් වෙලා, සංගීත ලෝකයේ දොර හැරගෙන ඒකට පිවිසෙමු. අද රාත්‍රියට ගායිකා කාර්නාගේ ගීත ගායනයක් තියෙනවා ඇල්බට් ශාලාවේ. හොඳ ඇඳුමකින් සැරසිලා, එතැනට ගිහිං කෑම ටිකක් කාලා, විනෝද වෙන්න තවමත් අපට වෙලා තියෙනවා."

* * *

පසුවදා මම උදෑසනින්ම අවදිවීමි. එහෙත් කෑම මේසයේ දකින්නට ලැබුණු පාන්වාට් හා බිත්තර කටු වලින් මගේ මිත්‍රයා ඊටත් වඩා උදෑසනින් අවදි වී ඇති බව මම වටහා ගත්තෙමි. මා වෙත ලියා තිබූ කෙටි ලියුම් කෑබැල්ලක් මේසය මත විය.

***"හිතවත් වොට්සන්,***

***ජෝසයියා ඇම්බර්ලි මහතා සමග කතාබස් කර විසඳාගත යුතු කරුණක් හෝ දෙකක් මතු වී ඇත. මෙම පරීක්ෂණය***

http://sherlockholmesinvestigations.blogspot.com

*නවදුරටත් කරගෙන යා යුතුද, නැතිනම් අත්හැර දැමිය යුතුද යන්න තීරණය වන්නේ එවිටයි. සවස්වරුවේ මට ඔබේ සහයෝගය අවශ්‍ය වීමට ඉඩ ඇත. සවස තුනට පමණ සූදානමින් සිටින්න.*

*එස්. එච්."*

එදා දවසේ හවස්වන තුරු මට හෝම්ස් දකින්නට හොලැබිණ. එහෙත් හවස තුන වෙද්දී ඔහු ආපසු අපේ නිවහනට පැමිණියේය. මා ඇසූ ප්‍රශ්නවලට කිසිදු පිළිතුරක් නොදුන් හෝම්ස්, ගැඹුරු කල්පනාවක වෙළී සිටියේය. බරපතල ප්‍රශ්නයක් මතුවී, ඔහු එය විසඳීමට උත්සාහ දරමින් සිටිනවා වියයුතු යයි මම සිතාගත්තෙමි. මෙවැනි වේලාවලට, ප්‍රශ්න ඇසීමට යාමට වඩා හෝම්ස්ට තනිවම කල්පනා කිරීමට ඉඩහැරීම වඩාත් උචිත බව, මම අත්දැකීමෙන් දැන සිටියෙමි.

"ඇම්බර්ලි මෙහේ ආවේද?"

"නෑ?"

"අහා? මං මේ ඔහු ගැන බලාපොරොත්තුවෙන් ඉන්නෙ."

හෝම්ස්ට වැඩිවේලාවක් බලා සිටීමට සිදු නොවීය. ඇම්බර්ලි මහතා අපේ නිවහනට පැමිණියේය. එහෙත් ඔහුගේ මුහුණේ දක්නට ලැබුණේ තවත් කැලැඹීමට පත් ලකුණුයි.

"මට විදුලි පුවතක් ලැබුණා හෝම්ස් මහත්මයා. මේකෙන් මට කිසිදෙයක් තේරුම් ගන්න බෑ.

*"නොවරදවාම හැකි ඉක්මනින් පැමිණෙන්න. මෑතකදී ඔබට අහිමි වූ දේ පිළිබඳ තොරතුරු ලබාදිය හැකියි.*

*එල්මන්*
*දේවගැති නිවස."*

"හවස 2.10ට ලිට්ල් පර්ලිංටන් තැපැල් කාර්යාලයෙන් එවූ විදුලි පුවතක්. ලිට්ල් පර්ලිංටන් තියෙන්නේ එසෙක්ස් ප්‍රාන්තයේ. මං හිතන හැටියට ෆ්‍රින්ටන් ඉඳල ඒ තරම් දුරක වෙන්න බැහැ. කොහෙමම

http://sherlockholmesinvestigations.blogspot.com

වුණත් ඔබ වහාම පිටත් වෙලා යා යුතුයි ඇම්බර්ලි මහත්මයා." හෝම්ස් කීය.

"ඔබට මේ විදුලි පුවත ලැබිල තියෙන්නේ වගකිව යුතු කෙනෙකුගෙන්. ඒ මේ ප්‍රදේශයේ දේවගැතිතුමාගෙන්. කෝ වොට්සන් මගේ ආගමික තොරතුරු නාමාවලිය? වහාම ඉන්න බලන්න . . . . ලිට්ල් පර්ලිංටන් . . . . . ආ මේ තියෙන්නේ විස්තර

*ජේ. සී. එල්මන් (එම්. ඒ.) මූස්මූවර් සහ ලිට්ල් පර්ලිංටන් භාර දේවගැතිතුමා.*

ඒ පැත්තට යන දුම්රියක් තියෙන්නේ කීයටද කියලා දුම්රිය කාල සටහන බලන්න වොට්සන්."

"ලිවර්පූල් වීදියේ දුම්රියපොළෙන් හවස පහයි විස්සට පිටත්වෙන දුම්රියක් තියෙනවා. . . ."

"අනර්ඝයි වොට්සන්. ඔබත් යන්න ඇම්බර්ලි මහත්මයාගේ තනියට. ඔහුට උදව් සහ උපදෙස් ඕනෑවෙන්න ඉඩ තියෙනවා. අපි මේ පරීක්ෂණයේ සන්ධිස්ථානයකට පැමිණ ඇති බව පැහැදිලියි."

එහෙත් අපේ අනුග්‍රාහකයා නම්, ගමනට පිටත්වීම සඳහා එතරම් උනන්දුවක් දැක්වූ බවක් නොපෙනිණ.

"මේක මහා තේරුමක් නැති වැඩක් හෝම්ස් මහත්මයා. මේ කොහේවත් ඉන්න මිනිහෙක්, මට සිද්ධවෙලා තියෙන කරදර කොහොමද දන්නෙ? මේක කාලයත් මුදලුත් නාස්තිවෙන නිෂ්ඵල වැඩක්."

"මේ දේවගැතිතුමා මොනවා හරි දන්නවා. නැත්නම් ඔහු ඔබට විදුලි පුවතක් එවන එකක් නැහැ. ඔබ එන බව දන්වා වහාම විදුලි පුවතක් යවන්න." හෝම්ස් කීය.

"මම නම් හිතන්නෙ නෑ මේ ගමන යා යුතු එකක් කියල." ඇම්බර්ලි පිළිතුරු දුන්නේය

හෝම්ස්ගේ මුහුණේ මතුවූයේ අතිශයින්ම කෝපයට පත් ලකුණුය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ තරම් පැහැදිලි ලෙස්ම හෝඩුවාවක් තිබෙන බව දැනගෙනත්, ඔබ යන්න ප්‍රතික්ෂේප කරනවා. එහෙම වුණොම පොලීසියටත් මටත් ඔබ ගැන ඇතිවෙන්නෙ ලොකු සැකයක් ඇම්බර්ලි මහත්මයා. අපට හිතෙනවා ඔබ මේ පරීක්ෂණය ඉදිරියට ගෙනියන්න, අවංකව සහයෝගය දෙන්නෙ නැහැ කියල."

හෝම්ස්ගේ මේ ප්‍රකාශයෙන් අපේ අනුග්‍රාහකයා අප්‍රමාණ භීතියට පත්වූ බව පෙනිණ.

"නෑ නෑ. ඔබ ඒ විධියට කල්පනා කරනවා නම් මම යන්නම්. බැලූ බැල්මට කෙනෙකුට හිතෙන්නේ මොකක්ද? මේ ඈත ගමක ඉන්න දේවගැතිතුමෙක් මගේ ප්‍රශ්නයට අදාළ කරුණු දන්නෙ කොහොමද කියන එකයි. නමුත් ඔබ හිතනවා නම් මේ ගමන . . . ."

"මං හිතනවා!" හෝම්ස් ශබ්ද නගා කීවේ දැඩි අවධාරණයෙනි.

එයින්ම අපේ ගමන තීන්දු විය. අප නිවසින් පිටත්වී යාමට පෙර, මා වෙනත් පැත්තකට කැඳවූ හෝම්ස්, ඉතා වැදගත් යයි ඔහු සිතූ උපදෙසක් මට දුන්නේය.

"මතක තියාගන්න වොට්සන්. ඔයාට කැමැති දෙයක් කරන්න නිදහස තියෙනවා. හැබැයි මේ මිනිහා ලිට්ල් පර්ලිංටන් වලට යා යුතුමයි. යම් විධියකින් ඔහු ඔබව මඟහැරල ගියොත්, එහෙමත් නැත්නම් යන්න බෑ කියල ආපසු හැරුණොත් කළයුත්තේ එකම දෙයයි. ළඟම තියෙන තැපැල්හලට ගිහිං "පැනගියා" කියල මට විදුලි පුවතක් එවන්න. ඒක එවිය යුත්තේ බේකර් වීථියේ ලිපිනයට. මං කොහේට ගියත්, ඒක මං ඉන්න තැනට ලැබෙන විධියට මං කටයුතු සලස්වා යන්නම්."

ලිට්ල් පර්ලිංටන් යනු පහසුවෙන් ළඟාවිය හැකි ගම්මානයක් නොවේ. ලන්ඩනයේ සිට බොහෝ ඈතකට, ප්‍රධාන දුම්රිය මාර්ගයේ දිවෙන දුම්රියකින් පළමුව ගමන් කළයුතුය. ඉන්පසු දුම්රිය මංසන්ධියකින් වෙනත් දුම්රියකට නැගී ඈත පිටිසර දක්වා වැටුණු අතුරු දුම්රිය මාර්ගයක ගමන් කළ යුතුය. මේ ගමන ගැන මගේ සිතේ ගොනුවී ඇත්තේ එතරම් සතුටුදායක මතක සටහන් නොවේ. අප ගමන් කළ පෙදෙස අධික උණුසුම් බවකින් යුක්ත විය.

http://sherlockholmesinvestigations.blogspot.com

පරිසරය හරහා හමා ගියේ මුළු ශරීරයම වියළා දැමූ අතිශයින් උණුසුම් සුළඟකි. දුම්රිය ගමන් කළේ ද ඉබි ගමනින් වීම අපගේ නොසතුටට හේතුවිය. මුල සිටම ගමනට කැමැත්තක් නොදැක්වූ ඇම්බර්ලි බුම්මාගෙන සිටියා මිස, කතාබහකට නැඹුරු වූයේ නැත. ඔහු ඉදහිට යමක් කීවා නම් ඒ, මේ ගමනේ නිශ්චලත්වය ගැන පළකළ උපහාසාත්මක සඳහනක් පමණි.

මුළු සැන්දෑවරුවම ගතවූ ගමනින් පසු, අපි ලිට්ල් පර්ලිංටන් දුම්රියපොළට ළඟාවූයෙමු. දේවගැති ගෘහය පිහිටා ඇත්තේ එතැන් සිට සැතපුම් දෙකක් දුරින් බව අපට අසන්නට ලැබිණි. අශ්ව කරත්තයක නැගී අපි එම දුර ගමන් කළෙමු. සිරුරෙන් තරබාරු, ස්වභාවයෙන් උඩඟු දේවගැතිතුමා, ඔහුගේ කන්තෝරු කාමරයේදී අප හමුවිය. ගමන පිටත්වීමට පෙර අප ඔහු වෙත එවූ විදුලි පුවත ඔහු හමුවේ තිබිණ.

"හොඳයි මහත්වරුනි. මොනවද මගෙන් කෙරෙන්න ඕනෑ?"

"අපි මේ ආවෙ ඔබතුමා එවූ විදුලි පුවත නිසා." මම කීවෙමි.

"මං එවූ විදුලි පුවත නිසා? මම කාටවත් විදුලි පුවතක් යැව්වෙ නෑ?"

"මං අදහස් කළේ ජෝශියා ඇම්බර්ලි මහත්මයාත්, ඔහුගේ බිරිඳ සහ නැතිවූ මුදල් ගැන ඔහුට යැවූ විදුලි පුවත . . . ."

". . . . මහත්මයා. මේක විහිළුවක්ද? එහෙම නම් මං දැනගන්න කැමැතියි, ඒක මොන අරමුණකින් කෙරෙන විහිළුවක්ද කියලා? ඔහේ කිව්ව නම ඇති කෙනෙක් ගැන මං කවදාවත් අහල නෑ. මං කිසිකෙනෙකුට විදුලි පුවතක් යැව්වෙත් නෑ." දේවගැතිතුමා කෑගැසුවේ කෝපයෙනි.

ඇම්බර්ලිත් මමත් පුදුමයෙන් මුහුණට මුහුණ බලාගතිමු.

"සමහරවිට කොතැනක හරි පොඩි වැරැද්දක් වුණාද දන්නෙ නෑ. මේ ගමේ දේවගැති නිවාස දෙකක් තියෙනවද? මේ තියෙන්නේ අපි කිව් විදුලි පුවත. අත්සන් කර තියෙන්නේ එල්මන් නමින්."

"මෙහේ තියෙන්නේ එකම දේවගැති ගෘහයයි, මහත්මයා. ඉන්නේ එකම දේවගැතිතුමයි. මේක මගේ නම පාවිච්චි කරල කළ

http://sherlockholmesinvestigations.blogspot.com

හොර මගඩියක්. අනිවාර්යයෙන්ම මේක පොලිසියෙන් හොයා බැලිය යුතුයි. කොහොම වුණත් ඔබත් එක්ක මේ කතාබහ තවදුරටත් කරගෙන යන්න මට උවමනාවක් නෑ."

ඇම්බර්ලි මහතා සමග මම පාරට බැස්සෙමි. අප පැමිණ සිටින්නේ එංගලන්තයේ ඇති ඉතාමත් නොදියුණුම ගම්මානයට යයි මට හැඟිණ. අප විදුලිපණිවුඩ කාර්යාලය වෙත ගියත්, ඒ වනවිට එය වසාදමා තිබිණි. ගම්මානයේ දුරකථනයක් ද නොවීය. කෙසේ වෙතත් දුම්රියපොළ වෙත ගිය පසු මම හෝම්ස්ට දුරකථනයෙන් ඇමතුවෙමි. අපේ ගමනේ අවසන් ප්‍රතිඵලය ගැන, ඔහු ද විස්මයට පත්වූ බව පෙනිණ.

"හරිම පුදුමාකාරයි වොට්සන්! හරිම පුදුමාකාරයි! ඔබට මේ රෑම ආපහු එන්න දුම්රියක් වත් නැහැ නේද? මට කණගාටු ඔබට ආපහු එන්න විධියක් නැතිව ඔය ගම්මානයේ රාත්‍රිය ගතකරන්න සිද්ධවෙන එකටයි. නොදැනුවත්කමින්, මං ඔබව පාළු පළාතක තානායමක, බියකරු පරිසරයකට යොමු කළා නේද? කොහොම වුණත් ඔබට සුන්දරත්වය නැරඹීමට සොබාදහම තියෙනවා නේ වොට්සන්? සොබාදහම සහ ජොසයියා ඇම්බර්ලි. ඔබ මේ දෙපක්ෂය සමගම සමීප සබඳතාවෙන් ඉන්න."

මගේ මිත්‍රයා ඔහුට අහල වූ සිනාවක් යටපත් කරගන්නා අයුරු මට යන්තමින් ඇසිණි.

ඇම්බර්ලි මසුරු පුද්ගලයෙකු ලෙස ප්‍රකට වී තිබුණේ ඇයිද යන්න, මට වැඩිවේලා යාමට පෙර දැකගැනීමට හැකිවිය. මේ ගමනට යන වියදම ගැන ඔහු මුල සිටම කෙඳිරිගාමින් සිටියේය. ගමනට කැමැත්ත දුන් පසුව ද, අප ගමන් කළ යුත්තේ තුන්වැනි පංතියේ දුම්රිය මැදිරියක බව ඔහු අවධාරණයෙන් කියා සිටියේය. ඇම්බර්ලි ඊළඟට කලබල කළේ තානායමේ බිල ගෙවීමට සිදුවූ විටයි. දුම්රියෙන් ආපසු ලන්ඩන් නගරයට ළඟාවෙද්දී, අප දෙදෙනාම සිටියේ මහත් වෙහෙසකට මෙන්ම දැඩි කලකිරීමකට ද පත්වයි.

"ඇම්බර්ලි මහත්මයා. ඔබ ලන්ඩන් නගරයෙන් පිටත්වෙලා යන්න කලින් බේකර් වීථියේ අපේ නිවහනට ඇවිත් ගියොත් හොඳයි. ෂර්ලොක් හෝම්ස් මහත්මයාට ඔබ වෙනුවෙන් දිය හැකි අලුත් උපදෙස් හෙම තියෙනවාද දන්නෙ නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒවත් ඉතින් ඊයෙ දුන්නු උපදෙස් වගේ නම් ඇති වැඩක් නෑ."

ඇම්බර්ලි එසේ පැවසුවත්, මා සමග අපේ නිවහනට පැමිණියේය. අප ආපසු පැමිණෙන වේලාව සඳහන් කොට එදින උදයේ මට ට්විල් පර්ලිංටන්හි සිට හෝම්ස්ට විදුලි පුවතක් එවීමි. එහෙත් තමා ලුවිශාම් හි ඇම්බර්ලිගේ නිවස කරා යන බවත්, අප එහි පැමිණිය යුතු බවත් දන්වමින් හෝම්ස් පණිවුඩයක් තබා ගොස් තිබිණි.

අපි දෙදෙනා මීළඟට ලුවිශාම් බලා පිටත්වී ගියෙමු. ඇම්බර්ලිගේ විසිත්ත කාමරයේ හෝම්ස්ට අමතරව තවත් අමුත්තෙකු සිටිනු දැක අපි මවිතයට පත්වීමු. මෙසොනික් මෝස්තරයේ කටුවක් ටයිපටියේ ගැසූ, අළුපැහැති අවකණ්ණෝඩි පැළඳි උස පුද්ගලයා, හෝම්ස් අසලින්ම අසුන්ගෙන සිටියේය.

"මේ තමයි මගේ මිත්‍ර බෑකර් මහත්මයා." හෝම්ස් කීය. "ඔබේ මේ ගැටලු සහගත පරීක්ෂණය ගැන, මිනුත් දැඩි උනන්දුවකින් හොයල බලනවා. අපි දෙන්නා මේක පරීක්ෂා කිරීමට තීරණය කළේ, දෙදෙනා එකතු වෙලා කලින් සැලැසුම් කරගෙන නෙමෙයි. නමුත් අපි දෙන්නටම අහන්න තියෙන්නේ එකම ප්‍රශ්නයයි."

ඇම්බර්ලි මහතා පුටුවේ වාඩිවුවා නොව ඒ මතට ඇද වැටුණා යයි මට සිතිණි. ළඟ එන අන්තරායයක් පිළිබඳව ඔහුට ඉව වැටී ඇති සැටියකි. ඔහුගේ දෑසේ මෙන්ම මුහුණේ ද අතිශයින්ම බියට පත් ලකුණු මම දුටුවෙමි.

"මොකක්ද හෝම්ස් මහත්තයා ඒ ප්‍රශ්නෙ?"

"මේකයි ප්‍රශ්නෙ; ඔබ මළමිනී දෙකට මොකද කළේ?"

ඇම්බර්ලි පුටුවෙන් ඉහළට එසැවුණේ යටිගිරියෙන් නැඟූ විලාපයක් සමගයි. ඔහු කෙසඟ දෑත් අහසට දිගු කළේය. කට බාගෙට ඇරිණි. එක් මොහොතකට ඔහු දිස්වූයේ සතුන් ගොදුරට ගන්නා ගිජුලිහිණියකු විලසිනි. සත්‍ය ජෝසයියා ඇම්බර්ලි කුමන තරාතිරමේ පුද්ගලයකු දැයි අපට වටහාගත හැකිවූයේ ඒ මොහොතේදීයි. ඒ, ශරීරය මෙන්ම ආත්මය ද විකෘති වී ගිය

http://sherlockholmesinvestigations.blogspot.com

යක්ෂයෙකු නොවේද? ඔහු ආපසු පුටුව මතට ඇද වැටෙද්දී, අතකින් කට වසා ගත්තේ කැස්සක් සැඟවීමට තැත් කරන අයුරෙනි.

ඒ දුටු හෝම්ස් ඇම්බර්ලි වෙත පැන්නේ ගොදුරකට කඩා පනින කොටියෙකු ලෙසයි. ඔහුගේ බෙල්ල ළඟින් අල්ලා ගත් හෝම්ස්, මහල්ලාගේ කට පහතට හරවා, හිස පොළොවට ළං කළේය. සුදු පැහැති පෙත්තක් ඔහුගේ දෙතොල් අතරින් බිමට වැටිණි.

"ඔහේට යන්න තියෙන ගමනට කෙටි පාරවල් නැහැ, ජොසයියා ඇම්බර්ලි. හැමදෙයක්ම නියම පිළිවෙළටම අපි කරනතුරු ඔහේට ඉවසන්න වෙනවා. මොකෝ බාකර් කියන්නේ?"

"මං කුලීරියක් ගේට්ටුව ළඟ රඳවලයි ආවෙ."

"පොලිස් ස්ථානයට තියෙන්නේ යාර කිහිපයක දුරක් පමණයි. අපි දෙන්නම මිනිහාව අරගෙන යමු. වොට්සන් ඔබ මෙහෙන් ඉන්න. මං පැය භාගෙකින් එන්නම්."

දියසායම් නිෂ්පාදකයා වයස්ගත වුවත් සිංහයෙකු මෙන් ශක්තිමත් විය. එහෙත් අපරාධකරුවන් මෙල්ල කොට පළපුරුද්දක් තිබූ දෙදෙනෙකු ඉදිරියේ ඔහුට හැකිවීමක් නොවීය. හෝම්ස් - බාකර් දෙදෙනාගේ ග්‍රහණයෙන් මිදීමට ඇම්බර්ලි දැඩි උත්සාහයක් දැරුවේය. එහෙත් ඉතා අපහසුවෙන් ඔහු මෙල්ල කරගෙන කුලීරිය වෙත ඇදගෙන යන ලදී.

හෝම්ස් ආපසු එනතුරු, මම ඒ මුසල නිවසේ රැඳී සිටියෙමි. පැය භාගයක් ගතවීමට පෙර, ඔහු ආපසු පැමිණියේ තරුණ පොලිස් නිලධරයෙකු ද සමගයි.

"එතැන රාජකාරි කටයුතු වලට උදව්වෙන්න මං බාකර්ව රඳවල ආවා. ඔබට ඔහුව කවදාවත් හමුවෙලා නැහැ නේද වොට්සන්? සරේ මුහුදු තීරයේ මට අල්ලන්නෙම නැති අපරාධ පරීක්ෂකයා තමා ඔහු. කළු උස මිනිහෙක් කියල ඔබ කිව්වාම, ඉතුරු ටික හිතාගන්න මට අපහසු වුණේ නෑ. ඔහු තරමක හපනෙක්. මට මතකයි ඔහු බොහොම අමාරු ගැටලු කිහිපයක්ම සාර්ථකව විසඳා දුන්නා. එහෙම නේද ඉන්ස්පෙක්ටර් මහත්මයා?"

http://sherlockholmesinvestigations.blogspot.com



207. යටිගිරියෙන් නැගූ විලාපයක් සමග ඔහු දැත් අහසට දිගුකළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඔහු කීපවාරයක්ම අපේ පරීක්ෂණ වල අතරමැදියෙක් හැටියට ක්‍රියා කළා." පොලිස් නිලධාරියා පැවසුවේ සත්‍යයේ කොටසක් සඟවා ගනිමිනි. හෝම්ස් නැවතත් කතාබහ ඇරැඹුවේය.

"ඔහු අපරාධ පරීක්ෂණයට යොදා ගන්නේ එතරම් ක්‍රමානුකූලව පිළිගත් විධි නොවෙයි. මමත් සමහර විට වැඩ කරන්නේ එහෙමයි. ඔබ දන්නවද අක්‍රමවත් පරීක්ෂණ විධින් ඇතැම් විට ප්‍රයෝජනවත් වෙනවා. උදාහරණයක් මං කියන්නද?

ඇම්බර්ලි කැමැත්තෙන්ම යමක් කියන්න හැදුවොත්, ඔහුට අනතුරු ඇඟවීමක් කරන්න පොලීසිය අනිවාර්යයෙන්ම බැඳී සිටිනවා. ඔබ කියාවි,

"ඔහේ කියන ඕනෑම දෙයක් ඔහේට විරුද්ධව සාක්ෂියක් ලෙස උසාවියේදී ඉදිරිපත් කළ හැකියි" කියල. එහෙම කිව්වා නම් මොකද වෙන්නේ? අර තක්කඩියා කිසි දෙයක් හෙළි කරන්නේ නෑ. නමුත් දැන් බොරු රඟපෑමක් මගින් බේකර්ටයි මටයි හැකිවුණා රහසක් එළිදරව් කරගන්න. සම්පූර්ණ පාපෝච්චාරණයක් තරමටම සාර්ථක රහසක් අපි එළිදරව් කරගත්තේ."

"එහෙම කියන්න එපා හෝම්ස් මහත්තයා. බාග වෙලාවට අපටත් මේ දුරම එන්න තිබුණා, සාමාන්‍ය පොලිස් ක්‍රියා මාර්ග වලින්. මේ අතුරුදන්වීමේ පැමිණිල්ල ගැන අපෙත් යම් යම් අදහස් නොතිබුණා කියල හිතන්න එපා. එහෙම නම් අපටත් අන්තිමේදී ඔහුව අත්අඩංගුවට ගන්න තිබුණා.

ඔබ වැනි රහස් පරීක්ෂකයන් අපරාධ සොයිසි කරන්නේ අවිධිමත් කෙටි ක්‍රම මගින්. ඒ ක්‍රම යොදාගන්නට අපට නීතියෙන් ඉඩක් නෑ. ඔබේ කෙටි ක්‍රම වලින් අපරාධකාරයින් ඉක්මනට අල්ලා ගැනීම නිසා මොකද වෙන්නේ? පොලීසියට ලැබිය යුතු ගෞරවය, කීර්ති නාමය ඔබ පැහැරගන්නවා. තරහ වෙන්න එපා කීවට. ඒ ගැන අපටත් ටිකක් හිතට අමාරුයි."

"ඒ වගේ ගෞරවය පැහැර ගැනීමක් මෙතැන කොහොමටවත් සිදුවෙන්නෙ නෑ මැකිනොන් මහත්මයා. මං ඒ ගැන ඔබට සහතික වෙන්නම්. මේ අභිරහස හෙළිකිරීම ගැන මගේ නම සඳහන් කිරීමටවත් අවශ්‍ය නෑ, මෙතැනින් ඉදිරියට. බාකර් ගැන කියනවා නම්; මං ඔහුට දැනුම් දුන් කාරණා හැරෙන්න, ඔහු කළ දෙයක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print.

පොලිස් පරීක්ෂකයා පත්වූයේ මහත් හැනසීමකට බව ඔහුගේ මුහුණෙන්ම පෙනිණ.

"ඔබ ඉතා කරුණාවන්තයි හෝම්ස් මහත්මයා. පෙර ලොව අගැයීමක් කළත්, විවේචනයක් කළත්, ඔබතුමාට නම් ඒකෙන් ඒ හැටි බලපෑමක් නෑ. නමුත් පත්තර වාර්තාකාරයෝ ප්‍රශ්න අහන්න පටන් ගත්තම, පොලීසියට නම් ඉමාන ඉවසීමකින්වත් සහනයක් නෑ."

"ඒක හරි. ඔවුන් ප්‍රශ්න අහන බවට සැකයක් නෑ. ඒ නිසා ඒවාට සුදුසු පිළිතුරු සූදානම් කරගෙන ඉන්න එක හොඳයි. බොහොම බුද්ධිමත් සුවහස් වාර්තා කාරයෙක් ඔබෙන් අහවි. මෙහෙම.

"මෙම සිද්ධිය පිළිබඳව ඔබේ හිතේ හරියටම සැකයක් ඇතිවුණේ මොන කරුණු නිසාද? ඊළඟට මේක. කටයුතු සිද්ධවුණේ මේ අයුරින් යන්න හිතාගැනීමට ඔබට මඟ පෑදුණේ කුමන සිදුවීම් අනුපිළිවෙළ නිසාද?"

පොලිස් පරීක්ෂකවරයාගේ මුහුණේ දිස්වූයේ, මහා ප්‍රහේලිකාවකට මැදිවී අතරමංවූ අයෙකුගේ ස්වරූපයකි.

"අපට තවමත් ඇම්බර්ලිට විරුද්ධ සාක්ෂි කිසිම දෙයක් හම්බුවෙලා නැහැනෙ හෝම්ස් මහත්තයා. ඔබතුමා තමයි කිව්වේ, ඇම්බර්ලිගේ බිරිඳටත් ගේ අයිතිකාරයාටත් මොකද කළේ කියල ඇහුවාම, ඔහු සියදිවි නසාගන්න හැදුවා කියල. ඒක පාපොච්චාරණයක් කළාට සමානයි කියල කියන්නෙත් ඔබතුමාමයි. මොනවද හෝම්ස් මහත්මයා, ඔබතුමා ළඟ තියෙන අනික් සාක්ෂි?"

"මළ සිරුරු ඇත්තේ මේ ළඟමයි. එවැන්නක් සෝදිසි කිරීම සඳහා ඔබ කටයුතු සූදානම් කළාද?"

"පොලිස් භටයන් තුන්දෙනෙක් මෙහෙ එනවා."

"හොඳයි එහෙනම් ඔබට ප්‍රබලම සාක්ෂි හොයාගත හැකි විදිය මං කියන්නම්. කුස්සියේ පෝරණුව යට, නැත්නම් වත්තේ තැන් තැන් හාරා සෝදිසි කර බලන්න. ඒ හැටි වෙලාවක් ගතවෙන එකක් නෑ. මේ ගේ බොහොම පැරණි එකක්. ඒකට ජලනළ

http://sherlockholmesinvestigations.blogspot.com

සවිකර තියෙන්නේ පුහු කාලෙක. ඒ නිසා, පාවිච්චි නොකර අත්හැර දැමූ ළිඳක්, වත්තේ කොහේ හරි ඇති. අන්න ඒක පරීක්ෂා කර, ඔබේ වාසනාව උරගා බලන්න."

"නමුත් ඔබ කොහොමද දන්නේ මෙහෙම දෙයක් සිදුවෙලා තියෙන බව? ඊළඟට, ඒක කළේ කොහොමද කියලා?"

"මං ඔබට මුලින් කියා දෙන්නම් ඒක කළේ කොහොමද කියලා. ඊළඟට මම දෙන්නම් ඔබට අවශ්‍ය විසඳුම. නමුත් ඒ ඔක්කොටම කලින් මේ මිනිහා මොනු ආකාරයේ මානසික තත්ත්වයක් ඇති කෙනෙක්ද කියලා අප තේරුම් ගත යුතුයි. මගේ හැඟීම නම් ඇම්බර්ලි මානසිකව විකෘති වූ පුද්ගලයෙක්. ඒ නිසා මට හිතෙනවා ඔහු ගිහින් අන්තිමට නවතින්නේ එල්ලුම් ගහේ නොමෙයි; මානසිකව විකෘති වූ භයානක අපරාධකාරයින්ට වෙන්වුණු බ්‍රෝඩ්මුවර් බන්ධනාගාරයේ. මේ වගේ මානසිකත්වයක් තිබුණු මිනිස්සු, අද කාලයේ එංගලන්තයට වඩා අහන්න ලැබුණේ, මධ්‍යකාලීන යුගයේ ඉතාලියේ.

ඇම්බර්ලි අතිශයින්ම ලෝභ පුද්ගලයෙක්. ඒකෙන් ඔහුගේ බිරිඳ පීඩාවට පත්වෙලා, ජීවිතය ගැන අතිශයින් කලකිරිලා ඉන්න ඇති. මේ අතරේ ඇම්බර්ලි සමග චෙස් ක්‍රීඩා කරන්න, තරුණ වෛද්‍යවරයා ගෙදරට යන්න එන්න පටන් ගත්තා. ඇම්බර්ලි චෙස් ක්‍රීඩාවට අතිදක්ෂයෙක්. ඉතා සූක්ෂ්ම අයුරින් යමක් සැලසුම් කිරීමට ඔහුගේ ඇති දක්ෂතාවය, චෙස් ක්‍රීඩාවෙන් ලැබූ එකක්. හැම මසුරු තැනැත්තාම වගේ ඔහු ඊර්ෂ්‍යාකාරයෙක්. ඔහුගේ ඊර්ෂ්‍යාව කොයිතරම් දරුණු වුණාද කිව්වොත්, ඒක මානසික රෝගයක් තරමට බරපතල වුණා. කාරණා ඇතුව හෝ නැතුව ඔහු තමන්ගේ බිරිඳ හා වෛද්‍යවරයා ගැන සැකයක් ඇතිකර ගත්තා. ඔහු තීරණය කළා පළිගන්න. ඒක ඉතාම දක්ෂ විදියට සැලැසුම් කළා. මේ බලන්න!"

හෝම්ස් බරාඳය මැදින් අප නිවස තුළට කැඳවාගෙන ගියේය. මේ නිවසේ පදිංචිව සිටි කෙනෙකුට මෙන් ඔහුට නිවසේ පිහිටීම හොඳින් හුරුපුරුදු බව අපට පෙනිණ. ඔහු අප කැඳවාගෙන ගියේ, ඇම්බර්ලිගේ ආරක්ෂක කාමරය වෙතයි.

"පූ: මේ තීන්ත වල ගඳ තමා ඉවසන්න බැරි!" පොලිස් පරීක්ෂකවරයා කීවේ නාසය හකුළුවමිනි.

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක තමයි අපට ලැබුණු පළමුවැනි හෝඩුවාව. වොට්සන් දොස්තර මහත්මයා තමයි ඒක මුලින්ම නිරීක්ෂණය කළේ. ඔහුට එයින් නිගමනයකට එන්න බැරිවුණත්, ඒ කාරණය දැක්කේ ඔහු. ඒ ගැන අප ඔහුට ස්තුති කළ යුතුයි. ඒකෙන් තමයි ගොදුර පිටුපස ලුහුබැඳීමට මං මුල් පියවර තැබුවේ. මේ වයසක මිනිහා මේ වෙලාවෙ ඇයි, අධික සැර ගඳක් පිටවන ද්‍රව්‍ය ගෙනත් ගෙදර ගබඩා කළේ? පැහැදිලිවම ඔහුට ඕනෑවුණා, ගේ ඇතුළෙන් හැමු තවත් ගඳක් සඟවන්න. ගේ ඇතුළෙන් එවැනි දුර්ගන්ධයක් හැමුවාම ඔහු ගැන සැකයක් ඇතිවෙනවා. ඊළඟට, මගේ සිහියට ආවේ මෙන්න මේ සුරක්ෂිත කාමරයේ ඇති වැදගත්කම. මෙහි යකඩ දොර හා යකඩ ජනෙල් පියන් වැහුවාම කාමරය මුද්‍රා තැබූ කුටියකට සමාන වෙනවා. ඒ කාරණා දෙක එකට සම්බන්ධ කළොත් අපි යොමුවෙන්නේ කොතැනටද? ඒක හරියට සොයාගන්න නම්, ගේ සෝදිසි කිරීම මා විසින්ම කළයුතු බව මට වැටහුණා.

මේක මහා සැක කටයුතු අභිරහසක් බව, මේ වනවිටත් මට අවබෝධ වෙලයි තිබුණේ. ඒකට හේතුව, මං ඒ වනවිටත් හේමාකට් රංග ශාලාවේ යම් පරීක්ෂාවක යෙදිලා හොයාගත්ත කරුණු. ඇම්බර්ලි තනියම නාට්‍යය නරඹන්න ගියා කියන ඔය දවසේ, B ආසන පේළියේ ආසන අංක 30වත් 32වත් කිසිම ප්‍රේක්ෂකයෙක් එදා රාත්‍රී අසුන් ගෙන ඉඳල නැහැ. එතකොට ඇම්බර්ලි රංග ශාලාවේ නාට්‍යයක් නැරඹුවා කියන එක බොරුවක්. ඔහු අතින් ලොකු අතපසු වීමක් වුණා. ඒ තමයි මගේ දක්ෂ මිත්‍රයා වොට්සන්ට අර ටිකට් පතේ අංකය බලාගන්නට ඉඩ හැරීම. ඊළඟට මට මතුවුණු ප්‍රශ්නය තමයි, ගේ හරිහැටි සෝදිසි කරන්නේ කොහොමද කියන එක.

මං මගේ නියෝජිතයෙක් යැව්වා රටේ යන්න පුළුවන් දුෂ්කරම, ඈතම කෙළවරට. එහි සිට ඔහු අපේ මිත්‍රයාට විදුලි පුවතක් එව්වා. ඒක ලැබෙන්න සැලැස්වුවේ, යන දවසේ රෑම ආපහු ලුවිශාම් වලට එන්න නොහැකි වෙන විදියටයි. ඔහු මේ ගමන මඟ හරින්න උත්සාහ කරන බව මා දැන හිටියා. ඒක වළක්වන්න දොස්තර වොට්සන් වත් ඒ සමඟ යැව්වා. දේවගැතිතුමාගේ නම මං ලබාගත්තේ ආගමික තේරතුරු නාමාවලියෙන්. මං කියන කාරණා පැහැදිලි ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ ඉතා විශිෂ්ට අයුරින් කටයුතු කර තිබෙනවා."

"කාගෙන්වත් බාධාවක් නොවෙන බවට විශ්වාසයෙන් මං ඇම්බර්ලිගේ ගේ බිදින්න පටන් ගත්තා. ගෙවල් බිදින වැඩේ මට හොඳින් කළ හැකි තවත් වෘත්තියක්. මං ඒකට යොමු වුණා නම් කිසිම සැකයක් නෑ, මට අංක එකේ ගෙවල් බිදින හොරෙක් වෙන්න තිබුණා.

දැන් මං හොයා ගත්තු දේ හොඳින් නිරීක්ෂණය කරල බලන්න. ඔබට පෙනෙනවා ඇති, මේ කාමරයට එන ගෑස් පයිප්පය ගමන් ගන්නේ බිත්තියේ පහළම කෙළවරෙන් - බිත්තිය පොළොවට සම්බන්ධ වෙන තැනට බොහොම කිට්ටුවෙන්. ඊළඟට ඔබට පෙනෙනවා ඇති, කාමරයෙන් පිටත ගෑස් පයිප්පයේ 'L' හැඩයක නැම්මක් සහ ඒ මත කරාමයක් ඇති බව. කරාමය පහුකරලා ගෑස් පයිප්පය ආරක්ෂිත කාමරයට බිත්තිය යටින් ඇතුළුවෙනවා. මීළඟට ඒ පයිප්පය බිත්තිය ඇතුළතින් සිවිලිම දක්වා ගිහින්, සිවිලිමෙන් කාමරය තුළට විවෘතවෙනවා. සිවිලිමට සවිකළ එල්ලෙන පහනකින් ආවරණය වෙලා තිබුණත් පයිප්පයේ කට හොඳටම විවෘතයි. ඒ හින්දා මේ එළියේ තිබෙන ගෑස් කරාමය ඇරලා, ආරක්ෂිත කාමරය ගෑස්වලින් පිරවිය හැකියි. ඒ කාමරය තුළට මනුස්සයෙක් දමලා, දොර වහලා, පිටත කරාමය ඇරියොත්, ඔහුට මිනිත්තු දෙකකට වඩා සිහියෙන් ඉන්න හැකිවේවි කියල මං හිතන්නේ නෑ. මොන ප්‍රයෝගයකින් අර දෙන්නාව ආරක්ෂක කාමරයට යැව්වාද මම දන්නෙ නෑ. නමුත් ඇතුළට ගියාට පස්සේ ඇම්බර්ලිගෙන් ඔවුනට අනුකම්පාවක් තිබුණෙ නෑ."

පොලිස් පරීක්ෂකවරයා ගෑස් පයිප්පය උනන්දුවෙන් පරීක්ෂා කළේය.

"අපේ පොලිස් භටයෙකුට ගෑස් ගඳ දැනිල තියෙනවා. නමුත් ජනෙල් දොරවල් හොඳින් ඇරලා, තීන්තවල ගඳත් ආවම, ගෑස් ගඳේ විශේෂත්වයක් ඔහුට තේරුණේ නෑ. තීන්ත ගාන වැඩේ ඇම්බර්ලි කලින් දවසෙ පටන් අරගෙනයි තිබුණෙ. ඊළඟට ඔබ මොකද කළේ හෝම්ස් මහත්මයා?"

"ඊළඟට මට මුහුණ දෙන්න වුණේ කොහොමටවත් බලාපොරොත්තු නොවූ දේකට. අද උදේ එළිවෙන පාන්දර කැම

http://sherlockholmesinvestigations.blogspot.com

කාමරයේ ජනේලයකින් මම මේ බෙට රිංගන්න උත්සාහ කළා. මට දැනුණා එක්වරම කවුදෝ මගේ පිටිපස්සෙන් අත දමලා, බෙල්ල ළඟින් තද වෙන්න අල්ලා ගත්ත හැටි. කටහඬකුත් ඇහුණා.

"හොර තක්කඩියා! මොනවද මිනිහෝ උඹ කරන්න හදන්නෙ?"

හිස පොඩ්ඩක් ආපහු හරවා බැලුවාමයි මම දැක්කෙ, මගේ මිත්‍ර බාකර්ගේ වර්ණවත් උපැස් යුගල. මාව කවුද කියල ඔහුත් හඳුනාගත්තා. දැන් අපි දෙන්නටම හිතා, ඔහුව මේ පරීක්ෂණය සඳහා යොදවා තියෙන්නේ දොස්තර රේ අර්නස්ට්ගේ පවුලේ උදවිය. ඔවුනටත් හිතිල තියෙනවා මෙතැන ඇම්බර්ලිගේ කෛරාටික වැඩ පිළිවෙලක් ඇති බව. බාකර් දින ගණනක් තිස්සේ ගෙදරට යන එන අය ගැන පරීක්ෂාවෙන් ඉඳල තියෙන්නේ. ඔහු දැකල තියෙනවා දොස්තර වොට්සන් මේ ගෙදරට ඇවිත් ගිය හැටි. වොට්සන් ගැන බාකර්ගේ හිතේ ලොකු සැකයක් මතුවෙලා තියෙනවා. නමුත් වොට්සන්ව අල්ලාගන්න ඔහුට හැකිවුණේ නැහැ. මං ඔහුට කිව්වා මේ සිද්ධිය ගැන මං හොයාගත්තු තොරතුරු. ඊට පස්සෙ ඉතිරි ටික අප දෙදෙනා කළේ එකටයි."

"ඇයි ඉතින් ඔහුත් එක්ක හවුලෙ වැඩ කළේ? ඇයි අපිත් එක්ක කටයුතු නොකළේ?" පොලිස් නිලධරයා ඇසීය.

"ඒ අර මගේ හිතේ ඇතිවුණු සැකය, බොරු රහපෑමක් මගින් ඇම්බර්ලිට දමලා, ක්ෂණික ප්‍රතිචාරය නිරීක්ෂණය කරන්න. මං හිතන්නේ නෑ ඔබට ඒ තරම් දුරකට පරීක්ෂණය ඉදිරියට ගෙන යන්න හැකියාව තිබුණා කියල."

"හෝම්ස් මහත්මයා, ඔබ පොරොන්දු වුණා, ඔබ මේ අපරාධ පරීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම ඉවත්වෙලා, හොයාගෙන තිබෙන දේවල් ඔක්කොම පොලීසියට ඉදිරිපත් කරනවා කියල?"

"සත්තකින්ම ඔව්. මං හැමදාමත් කළේ ඒ විදියටයි. ඒක මගේ සිරිත."

"පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් මං ඔබට ස්තුතිවන්ත වෙනවා හෝම්ස් මහත්මයා. ඔබ කියන්න වගේ මේක විනිවිද

http://sherlockholmesinvestigations.blogspot.com

පෙනෙන පරීක්ෂණයක්. මළසිරුරු හොයාගන්න එක ඒ තරම් අපහසු වෙන එකක් නැහැ."

"මං ඔබට පෙන්වන්නම් ඉතාම බේදජනක අන්දමේ සාක්ෂියක්. මට විශ්වාසයි ඇම්බර්ලි මේක කොහොමටවත් දකින්න නැහැ. ඔබට ප්‍රතිඵල ලබා ගන්න ඕනෙ නම්, කළයුත්තේ එක දෙයයි. මැකිනොන් මහත්මයා ඔබ හිතුවන්න, ඒ අපරාධයට ගොදුරු වී ඉන්න තැනැත්තා ඔබයි කියල. එතකොට ඔබ ඊළඟට ගන්න පියවර මොකක්ද? මේක තරමක් දුරට සිතේ මවාගන්නා ලෝකයකට පිවිසීමක් කියන්න පුළුවනි. නමුත් ඒකෙන් ලැබෙනවා ලොකු ප්‍රයෝජනයක්.

හොඳයි අපි මොහොතකට හිතමු, මේ යකඩ දොරටු තිබෙන කාමරයේ හිරකර ඉන්නේ ඔබය කියල. ඔබට ජීවත්වෙන්න ඉතිරිවෙලා තියෙන්නේ මිනිත්තු දෙකක් පමණයි. දොරේ අනෙක් පැත්තට වෙලා, ඔබට නින්දා අපහාස කරමින් ඉන්නා, තව මොහොතකින් ඔබව මරා දමන තිරිසන් මිනිහාගෙන් පළිගන්න ඔබට කළ හැකිදේ මොකක්ද?"

"පණිවුඩයක් ලියා තැබීම."

"හරියට හරි. ඔබ මියගිය හැටි ගැන අනෙක් මිනිසුන්ට දැනුම් දීමට යමක් ලියා තබනවා. කඩදාසියක ලියා තබල වැඩක් නෑ. ඒක ඔහු දකිනවා. නමුත් බිත්තියේ ලියා තැබුවොත් කවුරු හරි, කවදා හරි දකින්න ඉඩ තියෙනවා. දැන් බලන්න මෙන්න මෙතැන. බිත්තියේ පහළම, පෝර්ලොවට හොඳටම ළඟින්, දම්පාට සායම් පැන්සලකින් ලියා තිබෙනවා.

අප අපව . . . .

එපමණයි. ඔබට ඒකෙන් හිතාගන්න පුළුවන් මොකක්ද?"

"මේ පොළොවේ සිට අඩියක් පමණ ඉහළින්. මරණයට පත්වූ මිනිහා, මියයමින් සිටිද්දී මේක ලියා තිබෙන්නේ. උවමනා දේ ලියා ඉවරවෙන්න කලින් ඔහුට සිහිය නැතිවෙන්න ඇති."

Reading Purpose Only Not For Profit

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහුට ලියන්න අවශ්‍යතා වෙන්න ඇත්තෙ අපව මරා දැම්මා කියල. මම ඒක තේරුම් ගත්තෙ එහෙමයි. මළසිරුර සමග අර දම්පැහැති කාබන් පැන්සල් කැබැල්ලත් හොයාගත්තොත් . . . . ."

"ඒ ගැනත් බලන බවට මම ඔබට පොරොන්දු වෙන්නම්. අර නැතිවුණා කිව් සුරකුම් ජන් ඔහු ළඟ තිබුණු බව හෙළිවුණා."

"ඒ හැමදෙයක්ම ඔහු ආරක්ෂා සහිතව කොහේ හරි සඟවා ඇති. අර ජෝඩුව පැන ගියා කියන කතාව මිනිසුන්ට අමතක වෙලා ගියාම, ඔහු කියන්න ඉඩ තිබුණා, ඒවා කොහේ හරි තිබිල ඔහුට හමුවුණා කියල. එහෙමත් නැත්නම් ඒ ජෝඩුවට කණගාටු හිතිල ඒවා ආපහු එව්වා කියල."

"ඔබට හැම ප්‍රශ්නයකටම පිළිතුරක් තියෙනවා හෝම්ස් මහත්මයා. මේ ජෝඩුව මරාදැම්මෝ වුණත්, ඇම්බර්ලි තමන්ගේ ගැළවීමට, පොලීසියට දැනුම් දෙන එක මුදුමයක් නෙමෙයි. නමුත් මට තේරුම් ගන්න බැරි, පොලීසියෙන් කිව්වාම ඇයි ඔහු ඔබතුමා හමුවෙන්න ගියේ?"

"ඒ, මුළු අපරාධ පරීක්ෂණ සේවයම මුළා කිරීමේ අරමුණෙන්. කොයිතරම් සූක්ෂම විධියට ඔහු ඒ වැඩේ කළාද කිව්වොත්, ඔහුට ඇතිවුණා පුදුමාකාර ආත්ම විශ්වාසයක්. ඔහු හිතුවා මේ ලෝකෙ කිසිකෙනෙකුට ඔහුගේ අපරාධය හෙළිකරගන්න බැරිවේවි කියල. කවුරු හරි අසල්වැසියෙක් දැක හිතිල මොනවා හරි කිව්වොත් ඔහු මෙහෙම කියන්න ඉඩ තිබුණා.

"බලන්න මං පොලීසියට කිව්වා, එච්චර විතරක් නෙමෙයි ෂර්ලොක් හෝම්ස් මහත්තයටත් කියලා, සෝදිසි කෙරෙව්වා" කියල.

පොලිස් නිලධරයා සිනාසුණේය.

"මේක නම් මට මතක ඇති කාලෙක දකින්න නොලැබුණු දරුණු අපරාධ කාරයෙකුගේ වැඩක්."

* * *

http://sherlockholmesinvestigations.blogspot.com

දින කිහිපයකට පසු අපේ නිවසතේදී මගේ මිත්‍රයා "නෝර්ත් සරේ ඔබ්සර්වර්" පුවත්පතේ පිටපතක් මා වෙත විසි කළේය. එහි පළවී තිබූ ප්‍රවෘත්තිය මම කියවා බැලීමි.

## ද හැවන් මැඳුරේ භීෂණය

### අති විශිෂ්ට පොලිස් පරීක්ෂණයක්

ඇම්බර්ලි මිනීමැරුම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් වූ එහි අවසන් ඡේදයේ මෙසේ ද සඳහන් විය.

*". . . . . තීන්ත වලින් හා ගෑස් වලින් හැමූ දුර්ගන්ධය හමුවේ සැඟවී යා හැකිව තිබූ අභිරහසක්, පොලිස් පරීක්ෂක මැකිනොන්ගේ තීක්ෂණ බුද්ධියේ මහිමයෙන් ලොවට හෙළිවිය.*

*මරණ සිදුවී ඇත්තේ ආරක්ෂක කාමරයේ වියයුතු යයි ස්ථිර නිගමනයකට පැමිණි පොලිස් නිලධාරියා, මළසිරුරු තිබිය යුත්තේ පාවිච්චියට නොගන්නා ළිඳක විය යුතු යයි තීරණය කොට ඇත. ඔහු සිතූ පරිදිම අත්හැර දමා තිබූ පාළු ළිඳේ මතුපිට, බලු කූඩුවකින් ආවරණය කොට තිබිණි. එහි පතුලේ තිබී මළසිරුරු සොයා ගැනීමට හැකිවිය. අපේ පොලිස් අපරාධ පරීක්ෂකයන්ගේ පරිණත බුද්ධියේ මහිමය කියාපාන අපූරු නිදසුනක් වන මෙය, අපරාධ පරීක්ෂණ ඉතිහාසයේ නොමැකෙන ලෙසින් සටහන් වනු ඇත."*

"හොඳයි හොඳයි වොට්සන්. මැකිනොන් කියන්නේ බොහොම දක්ෂයෙක්!"

හෝම්ස් පැවසුවේ සිනහමුසු මුහුණෙනි.

". . . . . ඒ වුණත් ඔබේ කථාන්තර වලත් මේ සිද්ධිය වාර්තා කරල තියන්න. කවදාහරි දවසක මිනිස්සු ඇත්ත කථාන්තරය දැනගන්නට කමක් නෑ."

Pesdine Purpose Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# මහ රෑ ආ මාරයා

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



# මහ රෑ ආ මාරයා

ඒ 1897 වසරේ ශීත ඍතුවේ අවසන් භාගයයි. රාත්‍රිය මුළුල්ලේ පැවැතියේ අධික ශීතලකි. හිම වැටෙන අන්දර කිසිවෙකු මගේ උරහිසෙන් අල්ලා සොලවනු දැනී මම අවදි වූයෙමි. ඒ මගේ මිත්‍ර හෝම්ස්ය. කුමක් හෝ බරපතල ප්‍රශ්නයක් මතුවී ඇත. මා දෙසට පහත් වී තිබූ ඔහුගේ මුහුණේ මම එය දුටුවෙමි.

"නැගිටින්න වොට්සන් නැගිටින්න. සෙල්ලම පටන් අරගෙන. ප්‍රශ්න අහන්න වෙලා යාතකරන්න එපා. ඇඳුම් මාරු කරගන්න. අපි වහාම යමු."

මිනිත්තු දහයක් ගතවෙද්දී අපි කුලීරියක නැඟී චාරිංක්‍රොස් දුම්රියපොළ වෙත ගමන් කරමින් සිටියෙමු. මුළු ලන්ඩන් නගරයම තවමත් ගන අඳුරෙන් වැසී ඇත. නිවසේදී උදේ ආහාරය ගැනීමටවත් අපි ප්‍රමාද නොවුණෙමු. සිසිර ඍතුවේ දැඩි සීතල සුළඟෙන් වැළැකීමට, හෝම්ස් තම සනකම් ලෝම කබාය හැඳගත්තේය. මම ද ඔහු අනුගමනය කළෙමි.

චාරිංක්‍රොස් දුම්රිය පොළේදී අපි උණුසුම් තේ පානය කළෙමු. දැඩි ශීතල යන්තමින් මඟහැරී ගියේය. කෙන්ට් ප්‍රාන්තය කරා දිවෙන දුම්රිය, වේදිකාවේ කෙළවර නවතා තිබිණ. එහි නැගී අසුන් ගැනීමෙනුත් පසුවයි, හෝම්ස් අපේ ගමනේ අරමුණ කුමක්ද කියා පැවසුවේ. සාක්කුවෙන් ලියුම් කැබැල්ලක් එළියට ගත් ඔහු, එය හඩනගා කියෙව්වේය.

http://sherlockholmesinvestigations.blogspot.com



219. "නැගිටින්න වොට්සන්! නැගිටින්න! සෙල්ලම පටන් අරගෙන."

http://sherlockholmesinvestigations.blogspot.com

ඇබෙග්රේන්ජ්,
මාෂම්,
කෙන්ට්,
පාන්දර 3.30ට

මගේ හිතවත් හෝම්ස් මහතාණනි,

ඉතා විශිෂ්ටතම පරීක්ෂණයක් විය හැකි මේ අභිරහස විසඳීමට, ඔබේ සහයෝගය අපේක්ෂා කරමි. මේ ඔබ කැමැති තාලේ එකක්. ආර්යාව මුදාහරිනවා හැරෙන්නට අන් සියලු දෙයක්ම, මා දුටු හැටියටම තබාගන්නම්. මොහොතක්වත් පමාවෙන්න එපා. සර් යූස්ටස් තවදුරටත් ඒ ආකාරයෙන්ම තබාගැනීම දුෂ්කරයි.

මෙයට හිතවත්
ස්ටැන්ලි හොප්කින්ස්."

"හොප්කින්ස් ඔහුගේ පරීක්ෂණ විලට මාව හත්වාරයක් කැඳවලා තියෙනවා. ඒ හැම එකක්ම, මං සෑහෙන උත්සාහයක් දරලා විසඳූ සංකීර්ණ ඈටලු. මං හිතන්නේ ඒ හැම එකක්ම ඔබේ කථාන්තර පොත්වල අඩංගු වෙනවා. එහෙම නේද වොට්සන්? රසවත් කථාම තෝරා ගැනීමට ඔබ හරි හපන්කමක් දක්වනවා. ඒ වුණත් මං කැමැති නැති එක දෙයක් ඒවායේ තිබෙනවා. ඒ තමයි සිද්ධීන් විද්‍යානුකූල අභ්‍යාසයක් ලෙස සලකනවා වෙනුවට, ඔබ බලන්නේ රසවත් කථාන්තරයක් කීමටයි. එයින් එහි උපදේශාත්මක ගතිය නැතිවී යනවා."

"ඉතින් ඇයි ඔබම ඒ කථා ලියන්නේ නැත්තේ?" මා ඇසුවේ මඳක් කෝපයට පත්විය.

"මං ලියනවා වොට්සන්, දවසක මං ලියනවා. ඔබ දන්නවානේ දැනට මට ඒ සඳහා විවේකයක් නැති බව. මගේ ජීවිතේ අවසන් භාගය මං කැපකරන්නේ ඒ කටයුත්ත වෙනුවෙන්. මං හිතාගෙන ඉන්නේ මෙම ක්ෂේත්‍රය ගැඹුරට අධ්‍යයනය කරන්නන් සඳහා, අපරාධ පරීක්ෂණයේ සියලුම අංග අළලා පාඨ ග්‍රන්ථයක් ලියන්න. අද අපට ලැබී තිබෙන පරීක්ෂණය මිනීමැරුමක් වගෙයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ හිතන්නේ මේ සර් යූස්ටෙස් කියන තැනැත්තා මිය ගිහින් කියලද?"

"එහෙම වියයුතුයි. හොප්කින්ස් ලියුම ලියා ඇති පිළිවෙළට මට ඒක තේරුම් ගන්න පුළුවන්. ඔහු බොහොම කැළඹීමට පත්වෙලා. හොප්කින්ස් ලෙහෙසියෙන් ඒ වගේ තත්ත්වයකට පත්වෙන කෙනෙක් නෙමෙයි. මට හිතෙනවා මොනවා හරි බිහිසුණු සිදුවීමක් වෙලා ඇති කියල. මළසිරුර අපට පරීක්ෂා කිරීම සඳහා තබන බවයි ඔහු කියන්නේ. සාමාන්‍ය සියදිවි හානිකරගැනීමක් වුණා නම්, ඔහු මාව කැඳවන්නේ නෑ. ආර්යාව මුදාහරිනවා කියන එකෙන් ඔහු අදහස් කළේ මොකක්ද? බාගවෙලාවට මේ ඛේදවාචකය සිදුවෙන්න ඇත්තේ ඇයව කාමරයක දමලා හිරකරලා පිටියදි වෙන්න පුළුවනි. මේක ඉතාම ඉහළ පෙළේ ප්‍රභූ පැළැන්තියේ පවුලක සිදුවීමක්. බලන්න මේ ලියුම ලියා ඇති ඔපවත්, ඝනකම් කඩදාසිය දිහා. උඩින් E. B. යන අකුරු දෙක සමග ප්‍රභූ ලාංඡනය. රමණීය පෙදෙසක ලිපිනය. අද උදේ වරුව බොහොම සිත් ගන්නා ආකාරයේ වැඩ කටයුතුවල යෙදෙන්න අපිට අවස්ථාව ලැබේවි. අපරාධය සිදුවී තිබෙන්නේ ඊයේ රෑ දොළහට කලින්."

"ඔබ කොහොමද ඒක හරියටම කියන්නේ?"

දුම්රිය කාල සටහන ගැන හිතල, කාලය ගණනය කිරීමෙනුයි මං එහෙම කියන්නේ. මුලින්ම මේ සිදුවීම දැනුම් දෙන්න ඇත්තේ ළඟම ඇති පොලිසියට. ඔවුන් ස්කොට්ලන්ඩ්යාඩ් එකට දැන්නුවා. හොප්කින්ස් කෙන්ට් වෙත පිටත්වෙලා ගියා. ඊළඟට ඔහු මාව කැඳවලා ලියුමක් එව්වා. මේ වැඩ් ටික කෙරෙන්න රැයක් ගතවෙන්න ඇති. ඔන්න දුම්රිය ළඟාවුණා චිස්ල්හර්ස්ට් දුම්රියපොළට. සිදුවෙලා තියෙන්නේ මොකක්ද කියලා එතැනට ගිහින්ම බලාගන්න පුළුවනි ඉක්මනින්ම.

දුම්රියපොළේ සිට අපි අශ්වකරත්තයකින් ගමන් ගත්තෙමු. ගම් මැදින් වැටී තිබුණු පටු මාර්ග වල සැතපුම් ගණනාවක් ගමන් කිරීමෙන් පසු, අපි විශාල වතුයායක ගේට්ටුව අසලට පැමිණියෙමු. එහි මුරකරුවා ඉදිරියට පැමිණ ගේට්ටුව විවෘත කළේය. මහ ඛේදවාචකයක් සිදුවී ඇති බව ඔහුගේ දුක්බර මුහුණෙන් අපට සිතාගත හැකි විය.

http://sherlockholmesinvestigations.blogspot.com

පෞරාණික එල්ම් වෘක්ෂයන්ගෙන් සෙවණ ලැබූ, අලංකාර මාවතක් දිගේ අපි ඉදිරියට ගමන් කළෙමු. එය කෙළවර වූයේ විශාල වලව්වකිනි. යෝධ කුළුණු යොදා තැනූණු එහි, ප්‍රධාන කොටස ඉතා පැරණි එකක් විය. එහි තැනින් තැන අයිවි මල් පඳුරු වලින් වැසී තිබිණ. එමෙන්ම එය මෑතකදී වෙනස්කම් වලට භාජනය වී ඇති බව ද සිතාගත හැකිවිය. එහි පැරණි මෝස්තරයේ ජනේල ඉවත්කොට අලුත් මාදිලියේ විශාල ජනේල සවිකොට තිබිණි. ගෘහයේ අනෙක් කොටස මෑතකදී වැඩ නිම්කළ නවීන එකක් විය. ඒ ඉදිරිපිට අප එනතුරු නොඉවසිල්ලෙන්, බලා සිටියේ ස්ටැන්ලි හොප්කින්ස්ය.

"ඔබේ පැමිණීම ගැන මට බොහොම සන්තෝෂයි හෝම්ස් මහත්මයා. මං ඔබවත් සාදරයෙන් පිළිගන්නවා දොස්තර වොට්සන්. ඒ වෙලාවෙ මට ඔබව කැඳවන්නෙ නැතුව ඉන්න හැකියාවක් තිබුණෙ නැහැ. නමුත් ආර්යාවට සිහිය ලැබුණට පස්සෙ සිද්ධිය ගැන පැහැදිලි විස්තරයක් කළා. ඒ නිසා අපට, හොයන්න බලන්න, කරදර වෙන්න ඒ හැටි දෙයක් ඉතිරිවෙලා නැහැ. හෝම්ස් මහත්මයා ඔබට මතකද අර ලුවිශෑම් හි ගෙවල් මංකොල්ලකන කල්ලිය?"

"කවුද ඒ රැන්ඩෝල් අවුලෙ තුන්දෙනාද?"

"හරියට හරි. තාත්තයි පුත්තු දෙන්නයි. මේකත් ඔවුන්ගෙ වැඩක්. ඒ ගැන කිසිම සැකයක් නෑ. දවස් දෙකකට කලින් ඔවුන් සිඩ්න්හැම් වල ගෙයක් බින්දා. එතැනදී ඔවුන්ව හඳුනාගන්න ලැබිලා තුන්දෙනා ගැනම හොඳ විස්තරයක් පොලීසියට ලැබුණා. වැඩි දවසක් ගතවෙන්න කලින් උන් ඒ කිට්ටුවම තවත් ගේකට කඩාපැන්න හැටි. කිසිම සැකයක් නෑ. මේක උන් තුන්දෙනාගෙ වැඩක්. මේ සැරේ නම් අප්පයි පුත්තු දෙන්නයි, තුන්දෙනාම එල්ලුම් ගස් යනවා."

"සර් යුස්ටස් මියගිහින්ද එහෙනම්?"

"ඔව්. ගිනි උදුනේ ගිනි අඟුරු අල්ලන යකඩ අඬුවෙන් ඔහුගේ හිසට පහරදීලා."

"රියැදුරා මට කිව්වා, ඔහු සර් යුස්ටස් බ්‍රැකන්ස්ටෝල් කියලා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හරියට හරි. කෙන්ට් ප්‍රාන්තයේ ධනවත්ම පුද්ගලයන්ගෙන් කෙනෙක්. බ්‍රැකන්ස්ටෝල් ආර්යාව මේ වෙලාවේ උදෑසන කාමරයේ ඉන්නවා. ආර්යාව හරිම අසරණ තත්ත්වයකටයි පත්වුණේ. ඇයට මුහුණ දීමට සිදුවෙලා තියෙන්නේ මහා භයානක අත්දැකීමකට. මං මෙහේට එද්දී ඇය හිටියේ බාගෙට මැරිලා වගේ. ඔබ මුලින්ම ඇයව හමුවී බලන්න. සිදුවීම ගැන විස්තර ඇගේ කටෙන්ම අහගන්න. ඊට පස්සේ අපි කෑම කන කාමරය පරීක්ෂා කරල බලමු."

බ්‍රැකන්ස්ටෝල් ආර්යාව සාමාන්‍ය පෙනුමෙන් යුත් කාන්තාවක නොවූවාය. ඇය අතිශයින්ම රූමත් විය. මේ තරම් සුන්දර කතක් මා දැක තිබුණා නම් ඒ ඉතා කලාතුරකිනි. රත්වන් පැහැ කේශ කලාපයකට හා නිල්වන් දෑසකට හිමිකම් කියූ ඇය, ඉතාමත් ශෝභා සම්පන්න විය. ඊයේ රාත්‍රියේ මුහුණදීමට වූ සිදුවීම නොවෙන්නට, ඇගේ සමේ වර්ණය පවා කොණ්ඩයට ගැළපෙන වර්ණයක් වීමට ඉඩ තිබිණ. දැඩි මානසික කම්පනයකට පත් ඇයට, කායික හිරිහැර ද සිදුවී තිබූ බව අපි දුටුවෙමු.

ඇසකට මදක් ඉහළින් එල්ල වූ පහරක් නිසා, භයානක ආකාරයේ ඉදිමීමක් මුහුණේ එක් පැත්තක තිබිණි. ඇගේ සේවිකාවක් විනාකිරි මිශ්‍ර වතුරෙන්, එම දම් පැහැගත් ඉදිමුණු ප්‍රදේශය තවමින් සිටියාය. ආර්යාව කවිච්චියක් මත හාන්සි වී සිටියේ විඩාවට පත් අයුරෙනි. එහෙත් අප කාමරයට ඇතුළුවෙද්දී, ඇගේ අවධානය වහාම අප වෙත යොමු විය. කටුක අත්දැකීම නිසා, ඇගේ බුද්ධිය හෝ ධෛර්යය පසුබෑමකට ලක්වී නොමැති බව එයින් පැහැදිලි විය. ඇය නිල් හා රිදී පැහැ මිශ්‍ර සැහැල්ලු ඩ්‍රෙසිං ගවොමකින් සැරසී සිටියාය. රාත්‍රි ආහාරයට යද්දී ඇය හැඳ සිටි, සීක්වින් වලින් අලංකාර කළ කළු පැහැති රාත්‍රී ඇඳුම ද කවිච්චිය මත විය.

"සිදුවුණු හැම දෙයක්ම මං ඔබට කියල ඉවර නේ හොප්කින්ස් මහත්මයා." ඇය පැවසුවේ විඩාපත් අයුරෙනි.

"මං වෙනුවෙන් ඒ හැම දෙයක්ම ඔබ මේ මහත්වරුන්ට කියන්න." පැවසූ ඇය මදක් කල්පනා කළාය.

"කොහොම වුණත් ඔබ හිතනවා නම් යළිත් වරක් ඒ දේ කීම අත්‍යවශ්‍යයි කියල, මං මේ මහත්වරුනට කියන්නම්කො. ඔබ කෑමකන කාමරයට ගිහිං ද ආවෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතුවා ඔවුන් ඔබතුමියගෙ කථාවට මුලින් සවන් දීල හිටිය නම් වඩා හොඳයි කියල." හොප්කින්ස් කීය.

"ඒ වුණත් මං කැමතියි ඔබ ඉක්මනට එතැන පිළිවෙළක් කරනවා නම්. ඔහු එතැන ඇද වැටී සිටින බිහිසුණු ආකාරය ගැන මට හිතෙන කොටත් භයයි."

සිරුර එක්වරම කිළිපොළා ගිය අයුරක් ඇගේ මුහුණෙන් ප්‍රකාශ විය. ඇය දෑතින්ම මුහුණ වසා ගැනීමට තැත්කළාය. එසේ කරද්දී, ඩ්‍රෙසිං ගවොමේ මැණික් කටුව දක්වා දිගු ගවොම් අත්, පහළට වැටිණ.

"ඔබට තවත් තුවාල සිදුවේලා නේද ආර්යාවෙනි. මේ මොනවද මේ?" හෝම්ස් මවිතයෙන් ඇසුවේ ඇගේ දෑතේම තිබූ රතු පැහැති දිලිසෙන තුවාල දෙකක් දුටු පසුයි.) ඇය ඉක්මනින් ඒවා ආවරණය කරගත්තාය."

"ආ ඒක සුළු දෙයක්, මේ භයානක සිද්ධියට සම්බන්ධ ඒවා නොවෙයි. ඔබ දෙදෙනා මෙහෙත් වාඩිවෙන්න. දන්න හැමදෙයක්ම මං ඔබට කියන්නම්.

මම තමයි සර් යුස්ටස් බ්‍රැකන්ස්ටෝල්ගෙ බිරිඳ. අපි විවාහ වෙලා අවුරුද්දක් පමණ වෙනවා. ඔබට ඇත්ත තත්ත්වය හැංගීමෙන් ඇති පලක් නෑ. අප දෙදෙනාගේ විවාහ ජීවිතය සතුටින් ගෙවුණු එකක් නෙමෙයි. මං සත්‍යය සඟවන්න උත්සාහ දැරුවත්, එය පසුව අපේ අසල්වාසීන්ගෙන් ඔබට දැනගන්න ලැබෙන බව සහතිකයි. අපේ විවාහය අසාර්ථක වීමට භාගවෙලාවට මමත් වැරදිකාරියක් වෙන්න ඇති. මම දකුණු ඕස්ට්‍රේලියාවේ නිදහසේ හැදුණු වැඩුණු ගැහැනියක්. බැඳීම් වලින් තොරව නිදහසේ, මගේ රටේ ජීවත්වෙන්න පුරුදුවුණු මට, එංගලන්තයේ ජීවිතය ගැළපුණේ නෑ. නමුත් අපේ විවාහ ජීවිතය අසාර්ථක වෙන්න ප්‍රධාන කරුණ ඒක නෙමෙයි. ඒ කරුණ මොකක්ද කියල කවුරුත් දන්නවා. ඒ තමයි මගේ සැමියා, අධික වශයෙන් බීමට ඇබ්බැහිවුණු බේබද්දෙක් වීම. ඒ වගේ මිනිහෙක් එක්ක, එක පැයක් ජීවත්වෙන්න සිදුවීම පාපයක්. නමුත් ඔබ කල්පනා කරල බලන්න, සංවේදී තරුණ කාන්තාවකට, එහෙම මිනිහෙකුට රෑ දවල් දෙකේ බැඳී ඉන්න වුණාම ඇතිවෙන තත්ත්වය

http://sherlockholmesinvestigations.blogspot.com



225. "මම තමයි සර් යූස්ටස් බ්‍රැකන්ස්ටෝල්ගේ බිරිඳ"

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

කොහොමද? ගැහැනියක් මේ වගේ කාලකණ්ණි මිනිහෙකුට ජීවිත කාලයක් බැඳ තැබීම දරුණු අපරාධයක්.

නමුත් මට මේකෙන් ගැළවෙන්න හැකියාවක් තිබුණෙ නෑ. දික්කසාදයක් ලබාගැනීමට නොහැකිවෙන පරිදි, ඔබේ රටේ තිබෙන මෙම නීතිය මුළු දේශයටම සාපයක් වෙනවා සහතිකයි. ගැහැනියකට හැමදාමත් මේ විධියේ කෲරකම් වලට මුහුණ දෙමින් දුක්විඳින්න දෙවියන් වහන්සේ ඉඩහරින්නේ නෑ."

මෙතෙක් කවිච්චියේ වැතිරී කථා කළ ඇය, මොහොතකට එහි හිඳගත්තාය. ඇගේ දෙකම්මුල් තදින් රතුපැහැ ගැන්වී තිබිණි. ස්වාමිදූව වුවද පාලනය කරන ආකාරයේ දැඩි බවක් පෙන්වූ සේවිකාව, ආර්යාව කොට්ටයක් මත හාන්සි කරවා ගත්තාය. මෙතෙක් වේලා කෝප්පයට පත්ව සිටි ආර්යාව, ඉකිගසමින් හැඬීමට පටන්ගත්තත්, එය නවතා යළිත් කථාව ඇරඹුවාය.

"ඊයේ රාත්‍රී සිදුවීම ගැන මං ඔබට කියන්නම්. සේවක සේවිකාවන් හැම කෙනෙක්ම නිදියන්නේ, නිවසේ අලුතෙන් ඉදිකර ඇති කොටසේ. අපේ වාසය සඳහා යොදාගෙන තිබෙන මේ මැද කොටස පැරණියි. මෙහි පිටුපසින් තියෙන්නේ කෑම කන කාමරය හා කුස්සිය. ඒ කෙළින්ම ඉහළින් අපේ නිදන කාමර. මගේ මේ සේවිකාව තෙරේසාගේ කාමරය තියෙන්නේ මගේ කාමරයටත් ඉහළින්. මේ අවට වෙන කිසිකෙනෙක් නෑ. අලුත් කොටසේ නිදාගන්න සේවකයින්ට, මේ පැත්තේ ඇතිවෙන ශබ්දයක් ඇහෙන්නෙත් නෑ. මේ බව හොරු හොඳින් දැනගෙන ඉන්න ඇති. නැත්නම් ඔවුන් භය නැතුව මේ විධියට කටයුතු කරන එකක් නෑ.

රෑ දහයමාර වෙද්දී සර් යූස්ටස් නින්දට ගියා. තවමත් නිදි නැති මගේ සේවිකාව ඉහළ තට්ටුවේ ඇයගේ කාමරයේ සිටියා. ඒ, මට උවමනාවක් වුණොත් අහළට බැස එන්න සූදානමින්. පහළ තට්ටුවට වී කථා පොතක් ආශාවෙන් කියවමින් හිටි මට රෑ එකොළහ වෙනතුරු, ඒ බවක් දැනුණේවත් නෑ. ඊළඟට මම නිදාගන්න යන්න තීරණය කළා.

ඒ සඳහා උඩ තට්ටුවට යෑමට පෙර, දොර ජනෙල් හරියට වසා ඇත්දැයි ගේ ඇතුළෙ ඇවිද මම සෝදිසිකර බැලුවා. මෙවැනි වැඩ ගැන සර් යූස්ටස් කෙරෙහි විශ්වාසයක් තබන්න පුළුවන්

http://sherlockholmesinvestigations.blogspot.com

කමක් තිබුණේ නෑ. ඒ නිසා පුරුද්දක් හැටියට හැමදාමත් ඒ රාජකාරිය කළේ මමයි. මං කාමරයක් පාසා ගිහින් බැලුවා. සේවකයින්ගේ කෑමසාලෙට, අවිආයුධ කාමරයට, බිලියඩ් කාමරයට, විසිත්ත කාමරයට ගිහිං, අන්තිමට ගියේ අපේ කෑම කන කාමරයට. එහි ජනේල ආවරණය කිරීමට යොදා තිබෙන්නේ, පොළොව දක්වා දිගු, ඝන තිරරෙදි. නමුත් ජනේලයට ළං වෙද්දී මට දැනුණා, සීතල සුළං පහරක් මා වෙතට හමා එන හැටි. එනකොටයි මට තේරුණේ ජනේලය වහලා නැති බව. මං තිර රෙද්ද මේ පැත්තට ඇද්දා විතරයි, එය පිටිපස්සෙ මං දිහා මුහුණට මුහුණ බලාගෙන මිනිහෙක්! ඔහු කාමරය ඇතුළට පැනගෙන ඒ හැටි වෙලා ගතවුණා වෙන්න බෑ. ඔහු පුළුල් උරහිස් ඇති මැදි වයසෙ වගේ මිනිහෙක්. ගෙවත්තට විවෘත වෙන මේ ජනේලය, උසින් වැඩි දොරක් වැනි, ප්‍රංශ මාදිලියේ එකක්. නිදන කාමරයට ගෙන යන ඉටිපන්දම ඒ වෙලාවෙ තිබුණේ මගේ අතේ. ඒකෙ ආලෝකයෙන් මා දුටුවා, කලින් මිනිහට පිටිපස්සෙන් තවත් දෙදෙනෙක් ගෙට ඇතුළුවෙන හැටි,

මං අඩියක් පිටිපසට ගෙන පැන දුවන්නයි හැදුවේ. ඒත් ඔහු එක්වරම මා වෙතට පැන්නා. මුලින් මගේ අතින් අල්ලා ගත් ඔහු, ඊළඟට මගේ බෙල්ලෙන් අල්ලා ගත්තා. කෑගහන අදහසින් මං කට අරිනකොටම ඔහු මිට මොළොවා මගේ මුහුණට පහරක් එල්ල කළා. ඇහැ ළඟට වැදුණු ඒ පහරින්, මා බිම ඇද වැටුණා.

මං මිනිත්තු කිහිපයක් සිහි නැතුව ඉන්න ඇති. ඊළඟට මට සිහිය එනකොට මං දුටුවේ, ඔවුන් මාව බැඳ දමන හැටි. සීනුවට සවිකර තිබුණු දිග ලනුව අරගෙන, කෑම මේසය කෙළවරේ තිබුණු ඕක් ලීයෙන් තැනූ බර පුටුවකට තියල මාව බැඳ දැමුවා. කොයිතරම් තදින් මාව ගැටගැහුවාද කිව්වොත්, මට යන්තමින් හෝ හෙලවෙන්න ඉඩක් ලැබුණේ නෑ. මගේ කටේ තිරකළ ලොකු ලේන්සුව නිසා මට කෑගහන්න ඉඩක් ලැබුණෙත් නෑ.

මගේ අවාසනාවන්ත ස්වාමිපුරුෂයා කෑම කාමරේට ඇතුළුවුණේ මෙන්න මේ වෙලාවේදීයි. ඔහුට මොනවා හරි සැක සහිත ශබ්ද අහන්න ලැබුණා වෙන්න ඇති. ඔහු ආවෙ ඒවාට මුහුණ දෙන්න සූදානමින්. ඔහු සැරසී හිටියේ රාත්‍රී ඇඳුමෙන්. මගේ

http://sherlockholmesinvestigations.blogspot.com

සැමියා ආයුධයක් ලෙස බොහොම ප්‍රිය කරන, උල් සහිත මුගුර ඔහු අතේ තිබුණා. ඔහු මුගුර අමෝරාගෙන හොරු වෙතට පැන්නා. නමුත් වයස්ගත මිනිහා පහත්වෙලා, සැමියා එල්ල කළ පහර මග හැරියා. ඒ මිනිහා ගිනිඋදුනෙන් ගිනිඅගුරු අල්ලන අඬුව අරගෙන, මගේ සැමියාගේ ඔලුවට දරුණු පහරක් දුන්නා. ඔහු කෙඳිරි ගාගෙන බිම ඇද වැටුණා. ඊට පස්සේ ඔහු හෙලවුණේ වත් නැහැ. ඒක දැකල මං ආයෙමත් සැරයක් ක්ලාන්ත වුණා. ඒ සිහිනැතිවීම තිබෙන්න ඇත්තේ ටික වෙලාවයි. ඒ මොකද මං ඇස් ඇරලා බලද්දී මං දුටුවා, අල්මාරිවල තිබූ රිදී පිඟන් කෝප්ප තොගයක් ඔවුන් එකතු කරගෙන තිබෙන හැටි. ඊළඟට ඔවුන් කොහෙහෙන් හරි වයින් බෝතලයක් අරගෙන මේසය උඩ තබලා තිබුණා. ඔවුන් තුන්දෙනාගෙම අත්වල වීදුරුව බැගින් තිබුණා. මං ඔබට කිව්වා නේද, එක් මිනිහෙක් නම් මැදිවියේ කෙනෙක් බව, අනෙක් දෙන්නා මුහුණේ රැවුලවත් නැති තරුණ ගැටව්. සමහරවිට ඒ තාත්තයි පුතාලා දෙන්නෙකුයි වෙන්නත් පුළුවන්.

ඔවුන් කොඳුරමින් එකිනෙකා සමඟ කතාබස් කළා. ඊට පස්සෙ ඇවිත් මට තනියම ලිහාගන්න ඉඩක් තිබේද කියලා සෝදිසි කර බැලුවා. එවැනි දෙයක් කිරීමට මට නොහැකි බව දැනගත්තාම ජනේලයත් වහගෙන නිවසෙන් පැන ගියා. මගේ කටේ හිරකර තිබුණු ලේන්සුව ඉවත්කර ගන්න මට පැය කාලක්වත් යන්න ඇති. ඊට පස්සේ මං විලාප නගන්න පටන් ගත්තාම මගේ සේවිකාව දුව ආවා. ඊට පස්සේ අනෙක් සේවකයන්ටත් දැනුම් දුන්නා. ඔවුන් ගිහිං පොලීසියට පැමිණිලි කරලා, එතැනින් තමයි ලන්ඩනයට දැන්නුවේ. මහත්වරුනි, මට කියන්න තිබෙන්නේ එපමණයි. මං විශ්වාස කරනවා මේ ඛේදජනක කථාන්තරය තවත් සැරයක් කියන්න මට ඉඩ නොලැබේවි කියලා."

"හෝම්ස් මහත්මයා, ඔබට තියෙනවාද මොනවා හරි ප්‍රශ්න?" හොප්කින්ස් ඇසීය.

"ප්‍රශ්න අසමින් බ්‍රැකන්ස්ටෝල් ආර්යාවට තවදුරටත් වධහිංසා කරන්න මං කැමති නැහැ. ඒ වුණත් මං කැමතියි දැනගන්න, මේ මහත්මියට දෙන්න පුළුවන් සාක්ෂි මොනවද කියලා?"

හෝම්ස් කීවේ ආර්යාවගේ සේවිකාව දෙස බලමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"උන් ගෙට එන්න කලින්, මං උන්ව දැක්කා. මං මගේ නිදන කාමරේ ජනේලය ළඟ වාඩිවෙලයි උන්නෙ. වලව්වේ ගේට්ටුව පැත්තේ ඉඳල අර ඈතින්, උන් තුන්දෙනෙක් මේ දිහාවට එනවා මට හඳ එළියේ පෙනුණා. ඒත් ඒ වෙලාවෙ මං ඒ ගැන ඒ තරම් දෙයක් හිතුවෙ නෑ. ඊට පැයකට විතර පස්සෙ මගේ ස්වාමිදූව විලාප නගනවා අහන්න ලැබුණා. එතකොට තමයි මං පහළට දුවගෙන ආවේ. ඇය කිව්වා වගේ ඇය පුටුවක බැඳ දමලා. ඔහු බිම. ඔහුගේ මොළ කැබලි. ලේ කාමරය පුරා හැම තැනකම. ඒ විදිය නැතත, පුටුවක තබල බැඳ දමල තියෙන එකම ඇති, ගැහැනියකව පිස්සු වට්ටන්න. ඔහුගේ මොළ කෑලි ඇගේ ගවුමෙත් එක්ක තිබුණා. ඒ වුණත් මගේ මැණික ඒවට බයවුණේ නෑ. ඇඩිලේඩ් නගරයේ මේරි ෆ්‍රේසර් කවදාවත් ඒ වගේ දේවලට බයවුණේ නෑ. ඇය ඇබේ ග්‍රේන්ජ්හි බ්‍රැකන්ස්ටෝල් ආර්යාව බවට පත්වුණු එක ඇත්තයි. නමුත් අලුතෙන් දෙයක් ඉගෙන ගන්න තිබුණෙ නෑ. මහත්වරුනි ඔබ දැන් ප්‍රශ්න කරලා, ඇයව වෙහෙසට පත්කළ හරියට හොඳටම ඇති. දැන් එතුමිය ඇගේ කාමරයට යා යුතුයි. ඔව්. ඇගේ පැරණි සේවිකාව තෙරේසා එක්ක විවේක ගන්න, ඇගේ කාමරයට යායුතුයි."

මවක සිය දුවණිය තුරුළු කරගන්නාක් වැනි සෙනෙහසකින් ආර්යාවගේ පිටුපසින් අත යැවූ සේවිකාව, ආර්යාව කැඳවාගෙන කාමරයෙන් ඉවත් වූවාය.

"ආර්යාව ළඟ හැමදාමත් ඉඳල තියෙන සේවිකාව ඇයයි." හොප්කින්ස් කීය.

"ආර්යාව පුංචි අතදරුවෙකුගේ කාලෙ ඉඳල රැකබලාගෙන, ඇය ඔස්ට්‍රේලියාවෙ සිට එද්දිත් මේ සේවිකාව පැමිණ තියෙනවා. ඒ අවුරුදු එකහමාරකට කලින්. ඇගේ නම තෙරේසා රයිට්. මේ වගේ හිතෙන්ෂී සේවිකාවො දැන් කාලෙ දකින්නවත් ලැබෙන්නෙ නෑ. එන්න හෝම්ස් මහත්මයා. අපි මේ පැත්තෙන් යමු."

අභිරහස විසඳීම සඳහා හෝම්ස්ට ඇතිව තිබූ දැඩි උනන්දුව නැතිවී ගොස් ඇති ලකුණු, ඔහුගේ මුහුණේ මම දුටුවෙමි. අභිරහස හෙළි වූ පසු, එහි තිබූ ආකර්ෂණීය ගතිය තුරන් විය. තවත් ඉතිරිව ඇත්තේ මිනීමරුවන් අත්අඩංගුවට ගැනීම පමණකි. එහෙත් මෙවැනි සාමාන්‍ය ගෙවල් බිඳින හොරුන් ඇල්ලීමට හෝම්ස් වැනි අපරාධ

http://sherlockholmesinvestigations.blogspot.com

පරීක්ෂකයකු කාලය නාස්ති කළ යුතුද? හඳුනාගත නොහැකි අරුම පුදුම රෝගයක් ඇතැයි පවසමින්, එය නිශ්චය කිරීම සඳහා ඉහළම පෙළේ වෛද්‍ය විශේෂඥයකු කැඳවූවා යයි සිතමු. එහෙත් මෙය කුඩා ළමයින්ට සාමාන්‍යයෙන් වැළඳෙන සරම්ප රෝගය බව දුටු පසු, තමාට අනවශ්‍ය ලෙස කරදර කිරීම නිසා, වෛද්‍ය විශේෂඥයාගේ මුහුණේ පළවන්නේ කුමන හැඟීමක්ද? මා හෝම්ස්ගේ මුහුණේ දුටුවේ ද එම හැඟීමමයි.

එහෙත් ඇබේ ග්‍රේන්ජ් මන්දිරයේ කෑම කන කාමරය තුළ තිබූ දර්ශනය නම් පුදුමාකාර එකකි. ඒ දර්ශනය නිසා මගේ මිත්‍රයාගේ අඩුවෙමින් තිබූ උනන්දුව යළිත් ඇතිවූවා යයි කිම නිවැරදිය.

මෙම පෞරාණික වලව්වේ කෑම කන කාමරය ඉතා විශාල ශාලාවකි. එහි සිවිලිම පිහිටියේද සෑහෙන තරම් ඉහළිනි. එය කැටයම් කළ ඕක් දැවයෙන් නිම කළ එකක් විය. ජනෙල්, දොරටු, උළුවහු ආදී සියල්ල ද ඕක් ලීයෙන් නිමකළ ඒවා විය. බ්‍රැකන්ස්ටෝල් පරපුරේ අය විසින් දඩයම් කරන ලද මුව ගෝන සතුන් රාශියකගේ සංරක්ෂණය කරන ලද ශීර්ෂ ශාලාව පුරා බිත්ති වල සවිකොට තිබිණි. කෑම ශාලාවේ ඈත කෙළවරේ දකින්නට ලැබුණේ කලින් ද සඳහන් කළ, ප්‍රංශ මෝස්තරයේ උස් ජනේලයයි. දකුණු පැත්තේ වූ කුඩා ජනේල තුනෙන් ශාලාව තුළට සතුටුදායක ආලෝකයක් ලැබිණි. වම් පැත්තේ විශාල ගිනි උදුනක් විය.

ගිනි උදුන සමීපයේම අපට දකින්නට ලැබුණේ, බර ඕක් ලීයෙන් අනගි ලෙස නිම කර තිබූ අසුනකි. එහි අත් තබා ගැනීම සඳහා ඇඳි හා පා තබාගැනීමට පහළින් එකිනෙකට හරස්ව සවිකල ලී දෙකක් ද විය. බ්‍රැකන්ස්ටෝල් ආර්යාව බැඳ දමා තිබුණේ මේ පුටුවට බව හොප්කින්ස් පෙන්වා දුන්නේය. බැඳීම සඳහා යොදාගෙන තිබුණේ තද රතු පැහැති වර්ණයක් කැවූ, කොහු ඇඹරීමෙන් සෑදූ, තරමක් ඝනකම් ලණුවකි. මෙය පුටුවේ ඉහළට හා පහළට කිහිප වාරයක් යවා, පුටුවේ අත් හා පා තබන කොටසේ පටලා ගැට යොදා තිබිණි. ආර්යාව මේ බැම්මෙන් නිදහස් කරගෙන ඇත්තේ, ලණුව බුරුල් වූ තැන්වලින් අත්පා ඉවතට ඇද ගැනීමෙන් බව පැහැදිලිය. කෙසේ වෙතත් බාහිර කිසිවෙකුගේ උදව් නොමැතිව මෙම බැම්මෙන් ගැලැවීමට ආර්යාවට

http://sherlockholmesinvestigations.blogspot.com



233. මත්පැන් බී ඡේරිවුණොම ඔහු නියම තිරිසනෙක්.

http://sherlockholmesinvestigations.blogspot.com

"මිනිහව අල්ල ගන්න එක ඔබට අපහසු වෙන එකක් නැහැ නේද හොප්කින්ස්?"

"කිසි අපහසුවක් නෑ. අපි සැඟෙන කාලෙක ඉඳල ඔහු ගැන සෙවිල්ලෙන් හිටියෙ. ඔහු ඇමරිකාවට පැන ගියා කියලත් ආරංචියක් තිබුණා. නමුත් මේකෙන් අපට තේරෙන්නෙ ඔවුන් තවමත් එංගලන්තයේම සැරිසරන බවයි. රැන්ඩෝල්ල කොහොමද අපේ රටෙන් පනින්නෙ? ඔවුන් ගැන සම්පූර්ණ තොරතුරු මම සෑම වරායකටම දන්වලයි තියෙන්නෙ. රැන්ඩෝල් කල්ලිය අල්ලා ගැනීමට හරි තොරතුරක් සපයන අයෙකුට විශාල ත්‍යාග මුදලක් දෙන්න අපි තීරණය කළා. ඒ විස්තර අද හැන්දෑවෙන්න කලින් අපි ප්‍රසිද්ධියට පත්කරනවා. මට තවමත් තේරුම් ගන්න බැරි එක කාරණයක් තියෙනවා හෝම්ස් මහත්මයා. ඔවුන්ව හඳුනාගන්න පුළුවන් හැම විස්තරයක්ම බ්‍රැකන්ස්ටෝල් ආර්යාව දැනුම් දේවි යන්න, දැන දැනත්, ඔවුන් මේ වගේ දරුණු වැඩක් කළා කියන එකයි මට තේරුම් ගන්න බැරි."

"හරියට හරි. කෙනෙකුට හිතෙන්න පුළුවනි, ඔවුන් ආර්යාව නිශ්ශබ්ද නොකළේ ඇයි කියලා," හෝම්ස් පිළිතුරු දුන්නේය.

"ආර්යාව සිහි විසඥතාවයෙන් මියයනව මිසක්, ආපහු සිහි ලබාවි කියල ඔවුන් හිතන්න නෑ."

"ඔව්, ඒකත් වෙන්න පුළුවනි. ඇය සම්පූර්ණයෙන්ම සිහි විකල් වුණා කියල හිතල, ඇගේ ජීවිතේ නැති නොකරන්න හිතුවා වෙන්නත් පුළුවනි. මේ අසරණ මනුස්සයා ගැන ඔබ දන්න තොරතුරු මොනවද හොප්කින්ස්? ඔහු ගැන මට අහන්න ලැබුණු කථා නම් එච්චර සතුටුදායක නෑ."

"මත්පැන් නොබී ඉඳපු වෙලාවට ඔහු කාරුණික හදවතක් තිබූ හොඳ මහත්මයෙක්. ඒත් මත්පැන් බී වෙරිවුණාම ඔහු නියම තිරිසනෙක් බවට පත්වුණා. ඒ තරමටම දරුණුයි. ඒ වෙලාවට ඔහු හැසිරුණේ හිතට යක්ෂයෙක් ආවේශ වෙලා වගේ. ඕනෑම බිහිසුණු දෙයක් කරන්න ඔහුට හැකියාව තිබුණා. කොයිතරමක් ධනය තිබුණත්, ප්‍රභූ පෙළපතක තානාන්තර තිබුණත්, වරක් හෝ දෙවරක් ඔහු හිරේ විලංගුවේ නොවැටී බේරුණේ අනූනවයෙන්ලු.

http://sherlockholmesinvestigations.blogspot.com



233. මත්පැන් බී වෙරිවුණොම ඔහු නියම තිරිසනෙක්.

http://sherlockholmesinvestigations.blogspot.com

එක සැරයක් බල්ලෙකුගේ ඇඟට පෙට්‍රල් වත්කරලා, ගිනි තියා මරා දැම්මාලු. වෙන බල්ලෙකු නම් තමන් නෑ කියමුකො. ආර්යාවගේ සුරතල් බල්ලාවයි මේ විදියට මරා දැම්මේ. මේක උසාවි නොගිහින් සමථයකට පත්කර ගත්තෙත් බොහොම අමාරුවෙන්. ඊළඟට ඔහු අර වයසක සේවිකාව - තෙරේසා රයිට්ගේ ඇළුවට වතුර පුරවපු වීදුරු ජෝගුවකින් දමා ගැහුවලු. ඒකටත් අඬදබර හුඟක් තිබිල තියෙනවා. මං කාටවත් නොකිව්වට මේ මිනිහා මැරුණට පස්සේ, ගෙදර බොහොම සාමකාමී, සන්සුන් එකක් හෝම්ස් මහත්මයා......... මොනවද ඔබ මේ සෝදිසි කරල බලන්නෙ?"

බ්‍රැකන්ස්ටෝල් ආර්යාව බැඳ දැමීමට යොදා ගත් පුටුව අසල දණගසා ගෙන, හෝම්ස් එය පරීක්ෂා කරමින් සිටියේය. ඇය බැඳීමට යොදාගත් රතු පැහැති ලණුව, පහළට ඇද කඩාගනිද්දී, එහි කැඩීගිය, පළුදු වූ කෙළවර හෝම්ස් මුලින් පරීක්ෂාවට ලක් කළේය. මීළඟට ඔහු කාන්තාව බැඳ දැමීමට ලණුවට ගැට යොදා තිබූ ආකාරය ද දැඩි උනන්දුවකින් විමසා බැලුවේය.

"මේ ලණුව වේගයෙන් ඇදල කඩාගන්න වෙලාවෙ, කුස්සියේ තිබෙන සීනුව බොහොම තදින් නාදවෙන්න ඇති නේද හොප්කින්ස්?"

"කාටවත් ඒ ශබ්දෙ ඇහිල නෑ. ඒ මොකද කුස්සිය තියෙන්නෙ ගෙයි පිටිපස්සේ කෙළවරේ නේ."

"ශබ්දය කාටවත් ඇහෙන එකක් නෑ කියල, හොරා කොහොමද දැන හිටියෙ? ඒ ගැන කිසිම සැලකීමක් නොකර ඔහු ලණුව ඇද්ද එක නේ පුදුමෙ?"

"බොහොම හරි හෝම්ස් මහත්මයා. බොහොම හරි. ඔබ මේ අහන්නෙ මගේ හිතටත් නැවත නැවතත් නැගුණු ප්‍රශ්නයක්. කිසිම සැකයක් නෑ. හිතන්න පුළුවන් එකම දෙයයි. මේ මිනිස්සු ගෙයි පිහිටීම ගැනත්, සේවක සේවිකාවො නිදාගන්න තැන් ගැනත් කලින් දැනගෙන ඉඳල තියෙනවා. ඒ තරම් රෑ වෙලාත් නෑ. නමුත් මේ වෙලාව වෙනකොට, සේවකයො ඔක්කොම ඔවුන්ගේ කාමර වලට වෙලා නිදි බවත්, මේ මිනිස්සු දැනගෙන ඉන්න ඇති. ඒ නිසා කුස්සියේ සීනුව නාද වුණත්, ඔවුනට නොඇසෙන බව හොරුන්ට පැහැදිලි කරුණක්. ඒකෙන් තේරෙන්නේ ඔවුන් මේ ගෙදර සේවකයෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

හෝ සේවිකාවක් සමග හිතවත්. ඔහුගේ මහා ඇයගේ උදව්වෙන් තමයි මේ වැඩේ කරල තියෙන්නේ. ඒ ගැන කිසිම සැකයක් නෑ. නමුත් මෙහේ සේවක මණ්ඩලයේ අට දෙනෙක් ඉන්නවා. ඔක්කොම හොඳ චරිත ඇති විශ්වාස කටයුතු අය" හොප්කින්ස් කීවේය.

"සේවක සේවිකාවන්ට ලැබුණු සැලකිලි පඩිනඩි එක සමානයි කියල මොහොතකට හිතමු." හෝම්ස් කීය. "එතකොට හාම්පුතාට විරුද්ධව හොරුන්ට ඔත්තුවක් දුන්නා කියල සැක කරන්න පුළුවන් කවුරුන්ද? නිසැකවම වීදුරු ජෝග්වකින් හිසට පහරක් එල්ලවුණු සේවිකාව. ඒත් එහෙම ද්‍රෝහී ක්‍රියාවකට හවුල් වුණොත්, ඒක තමන්ගේ හිතවත් ස්වාමිදුවටත් එරෙහිව කරන ද්‍රෝහී ක්‍රියාවක් වෙනවා. නමුත් ඇය තමන්ගේ ස්වාමිදූවට අතිශයින්ම කැපවීමෙන් සේවය කරන තැනැත්තියක්. කෙසේ වුණත් ඒ ප්‍රශ්නය මෙතනදී ඒ තරම් ගැටලුවක් වෙන්නෙ නෑ. රැන්ඩෝල් කල්ලිය අල්ල ගත්තම, උදව්කාරයා කවුද කියල ඔවුන්ගෙන්ම දැනගන්න හැකිවේවි. අප දුටු හැම දෙයකින්ම ආර්යාවගේ සාක්ෂිය අකුරටම තහවුරු වෙනවා." යයි පවසා හෝම්ස් කථාව නැවැත්වූයේය. මීළඟට ඔහු පොළොවේ සිට ඉහළටම විහිදුණු උස් ජනේලය වෙත ගොස් එය විවෘත කළේය.

"ජනේලයෙන් කිසිම සලකුණක් නෑ. එළියේ පොළොවත් ගල් වගේ හයියයි. මං හිතන්නෙ නෑ කිසිම අඩි සලකුණක් වැදිල ඇති කියල. උඳුන්පඩිය මතයි ඉටිපන්දම් දල්වා තිබිල තියෙන්නේ."

"ඔව් ඒ ඉටිපන්දම්වල එළියෙන් හා ආර්යාවගේ නිදන කාමරයේ ඉටිපන්දම්වල එළියෙන් තමා, හොරු ඔවුන්ගේ වැඩ කටයුතු කරල තියෙන්නේ."

"මොනවද උන් අරගෙන ගිහින් තියෙන්නේ?"

"ඒ හැටි දෙයක් අරගෙන ගිහින් නැහැ. මේ පිඟන් අල්මාරියක තිබුණු රිදී පිඟන් හයක් පමණයි. ආර්යාව කියනවා, හොරුන්ගේ පහරින් සර් යුස්ටස් මැරී වැටුණු නිසා ඔවුන් හොඳටම කලබල වෙලා, ඉක්මනින් පැන යන්න ඇති කියලා. ඒ මොකද ඔවුන් සාමාන්‍යයෙන් කරන්නේ ගෙන යා හැකි තරමක් බඩු හොරකම් කරගෙන යාමයි."

"ඔව්, කිසිම සැකයක් නෑ. ඒක තමයි සිද්ධවෙන්න ඇත්තේ. ඔවුන් වයින් බිව් බවත් අහන්න ලැබුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මිනීමරන්න සිදුවුණු නිසා ඔවුන්ගේ හිත්වල ඇතිවුණු කැලඹීම අමතක කරන්න, අඩියක් ගහන්න තිබෙන්න ඇති."

"හරියට හරි. මේ කැබිනෙට්ටුව මත තිබෙන වීදුරු තුන ඔවුන් තබා ගිය හැටියටම නේද තියෙන්නේ? කවුරුවත් ඒවා අතින් ඇල්ලුවෙවත්, එහා මෙහා කළේවත් නැහැ නේද?"

"නෑ. නෑ. ඒ හැටියටමයි තියෙන්නේ. වයින් බෝතලයත් ඔවුන් තබා ගිය හැටියටමයි."

"හොඳයි අපි බලමු. අහා! මේ මොකවද?"

වීදුරු තුන එක තැන තබා තිබිණි. ඒ තුනේම වයින් ස්වල්පය බැගින් විය. එහෙත් ඉන් එකක මණ්ඩි ස්වල්පයක් පැහැදිලිව දැකගත හැකි විය. වයින් බෝතලය තිබුණේ ද වීදුරු අසලමයි. බෝතලයේ තිබුණු වයින් වලින් තුනෙන් දෙකක ප්‍රමාණයක්ම ඉතිරි වී තිබිණි. වයින් බෝතලය වසා තැබීමට යොදා තිබි ඉවත් කළ, පොරොප්පය හෙවත් කිරල මූඩිය ඒ අසල විය. එහි පෙනුම මෙන්ම බෝතලය වටා එකතු වී තිබුණු දූවිලි ප්‍රමාණය ද හෝම්ස්ගේ දැඩි අවධානයට යොමුවිය. මිනීමරුවන් රසවිඳීම සඳහා තෝරාගෙන තිබුණේ සාමාන්‍ය වයින් නොව, පරණ කළ අතිවිශේෂ වයින් වර්ගයක් බව අපි දුටුවෙමු.

හෝම්ස්ගේ මුහුණෙන් පළවුණු හැඟීම්වල යම් වෙනස්වීමක් ඇති වූ බව මම දුටුවෙමි. වයින් බෝතලයේ මූඩිය අතට ගත් ඔහු එය සියුම් ලෙස පරීක්ෂා කළේය.

"ඔවුන් කොහොමද මේ මූඩිය එළියට ඇද්දේ?"

බාගෙට විවෘතව තිබූ ලාච්චුවක්, හොප්කින්ස් අපට පෙන්විය. අනපිස්නා කිහිපයක් සමඟ ලොකු කස්කුරුප්පුවක් එහි තිබිණි.

"බ්‍රැකන්ස්ටෝල් ආර්යාව කිව්වද, ඔවුන් මේ කස්කුරුප්පුව පාවිච්චි කළා කියල?"

"නැහැ. ඇයි මතක නැද්ද, වයින් බෝතලේ අරින වෙලාවෙ ඇය හිටියේ සිහිනැතිවෙලා නේ?"

"ඒක හරි. ඇත්තටම මේ කස්කුරුප්පුව කොහොමටවත් පාවිච්චි කරල නෑ. මූඩිය ගලවලා තියෙන්නේ, කුඩා ප්‍රමාණයේ -

http://sherlockholmesinvestigations.blogspot.com



237. "අහා! මේ මොනවද?"

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

අඟල් එකහමාරක් පමණ දිග කස්කුරුප්පුවකින්. ඒක බොහොම වෙලාවට අර සාක්කුවේ දාගෙන යන, පෑන පිහිවල සවිකර තිබෙන වර්ගයේ එකක් වියහැකියි. ඔබ මේ මූඩිය හොඳින් පරීක්ෂා කර බැලුවොත් ඔබට පෙනේවි, මූඩිය එළියට අදින්න කලින් කස්කුරුප්පුව තුන් වරක් ඇතුළට යවල තියෙනවා. එය කිරල මූඩිය සම්පූර්ණයෙන්ම විනිවිද ගිහින් නැහැ. මේ ලොකු කස්කුරුප්පුව යොදාගත්තා නම් ඒක මූඩිය හරහා සම්පූර්ණයෙන්ම ගමන් කරනවා. අදාළ පුද්ගලයා අල්ලා ගත්තොත් ඔබට පෙනේවි ඔහු ළඟ සාක්කු පෑන පිහියක් තිබෙන බව. අර බහුකාර්ය උපකරණ කිහිපයක් තිබෙන වර්ගයේ එකක්."

"විශිෂ්ටයි." හොප්කින්ස් කීය.

"නමුත් මේ වයින් වීදුරු දිහා බැලුවාම මගේ සිතේ එක ප්‍රහේලිකාවක් ඇතිවෙනවා. ආර්යාව කිව්වා නේද ඇය දුටුවා කියල මේ මිනිස්සු තුන්දෙනාම වයින් බොන හැටි?" හෝම්ස් ඇසීය.

"ඔව්. ඇය ඒක පැහැදිලිවම කිව්වා."

"ආ.......... එහෙම නම් ඒ ගැන තවත් කථාකරල වැඩක් නෑ. ඒ වුණත් හොප්කින්ස් අපට පිළිගන්න වෙනවා, මේ වීදුරු තුනේ යම් අමුතු ස්වභාවයක් තිබෙන බව. දැනෙනවා? ඔබ එවැන්නක් දුටුවේ නැද්ද? හොඳයි හොඳයි. අපි ඒක එහෙමම අත්හැර දාමු. මා වගේ විශේෂඥ දැනුමක් සහ සියුම් ඉඳ් නිරීක්ෂණයට, සංවේදී බවක් දක්වන අයට ඇතිවෙන හැඟීමක්; සරල හේතුවක් අත ළඟ තිබෙද්දී හිතට එන්නේ පැටළුම් සහගත සංකීර්ණ හේතු රාශියක්. වීදුරු සම්බන්ධයෙන් එකත්, සමහර වෙලාවට අහම්බෙන් ඇතිවුණු දෙයක් වෙන්නත් පිළිවන්.

එහෙනම් හොප්කින්ස්, ඔබට ශුභ දවසක්. ඔබේ පරීක්ෂණය ඉතාම පැහැදිලිව විසඳී තිබෙන බවයි පෙනෙන්නෙ. ඒ නිසා මං හිතන්නෙ නෑ, මං තවත් මෙතැන හිඳීමෙන් ප්‍රයෝජනයක් ඇතිවේවි කියල. රැන්ඩෝල්ලා අත්අඩංගුවට ගත්තාම මට දන්වන්න. ඒ වගේම අලුතෙන් යමක් සිදුවුණොත් ඒකත් දන්වන්න. මං විශ්වාස කරනවා මේ පරීක්ෂණයේ ඉතාම සාර්ථක ලෙස විසඳීම ගැන, අද

http://sherlockholmesinvestigations.blogspot.com

හෙටම ඔබට ශුභ පතන්න ලැබේවි කියලා." එහෙම නම් වොට්සන් අපි යමු. කාලය වඩාත් ප්‍රයෝජනවත් විධියට යොදවන්න පුළුවනි, ගෙදර පැත්තේ හිඳගෙන."

ඔහුට දකින්නට ලැබුණු යම්කිසි දෙයක් නිසා, හෝම්ස් ගැටලුවකට මැදිවී සිටියේය. ඔහුගේ මුහුණෙන් එය ප්‍රකාශ වූ අයුරු මා දුටුවේ, අපේ ආපසු ගමනේ දුම්රියේදීය. නළල රැලිකරගෙන ඔහු කල්පනා කළේ, ඇබේ ග්‍රේන්ජ් නිවසේ කෑම කන කාමරයේ දුටු යමක් ගැන බව, මට විශ්වාසය. විටෙක ඔහු මා සමග සන්සුන් අයුරින් කථා කිරීමට උත්සාහ කළේ, හිතේ තිබූ ගැටලුව විසඳුණාක් මෙනි. එහෙත් මඳ වේලාවක් ගතවෙද්දී කථාව නවත්වා, යළි යළිත් කල්පනා කිරීමට පටන්ගත්තේය. අපේ දුම්රිය නගරාසන්න දුම්රියපොළකින් පිටත්වී යාමට පටන් ගත්තා පමණි. හෝම්ස් එක්වරම කලබලයෙන් අසුනෙන් නැගිට්ටේය. ඉන්පසු මගේ අතින් ද ඇදගෙන දොරටුව වෙත පැමිණ, දුම්රියෙන් වේදිකාව මතට පැන්නේය. මම ද ඔහු අනුගමනය කළෙමි.

"මට සමාවෙන්න මිත්‍රයා." ඔහු පැවසුවේ දුම්රියේ අන්තිම මැදිරිය ද අපේ දසුනෙන් ඉවත් වෙද්දීය.

"මගේ හිතේ පුංචි සැකයක් මතුවුණා. ඒක නිසා ඔබ මේ විධියේ හිරිහැර වලට භාජනය කරන්න සිදුවීම ගැන කණගාටුයි. දෙයියම්පා වොට්සන්! අර ගැටලුවට ලැබුණු විසඳීම නිවැරදියි කියල, ඒක ඒ හැටියටම භාර අරගෙන නිකං ඉන්න මට හිතෙන්නෙ නෑ. මගේ හිතේ ඉවෙන් වගේ නොයෙක් තර්ක මතුවීගෙන එනවා. ඒ හැම එකක්ම එන්නේ ඔය සිද්ධිය වුණාය කියන පිළිවෙළට විරුද්ධව. ඒක වෙන්න බැහැ! හොප්කින්ස්ල හිතන විධියට ඒක මොන විධියකටවත් වෙන්න බැහැ. ඒ වුණත් ආර්යාව හෙළිකළ කරුණුවල අඩුපාඩුවක් නැහැ. සේවිකාවගේ සාක්ෂියත් ඒකට හරියටම ගැළපෙනවා. ඊට විරුද්ධව මට ඉදිරිපත් කරන්න පුළුවන් තර්කය මොකක්ද? ඔව්, ඒ වයින් වීදුරු තුන සම්බන්ධයෙන් පමණයි.

ඔය කියැවුණු කරුණු, මං ඒ හැටියටම බාර නොගත්තා කියල හිතමු. එතකොට මම හැමදෙයක්ම තවදුරටත් ඉතා හොඳින් පරීක්ෂා කළා කියලත් හිතමු. එහෙම නම් අපි එන්නෙ කොතැනටද? ............ එහෙම නම් තල්තබා, නියම ආකාරයට සකස්වුණු

http://sherlockholmesinvestigations.blogspot.com

කථාවක් මට අහන්න ලැබෙන්නෙත් නෑ. ඒකටම ගැළපෙන විධියට මගේ මොළය පහසුවෙන් හැඩගැසෙන්නෙත් නෑ. එහෙම වුණා නම්, තවදුරටත් ගැඹුරටම පරීක්ෂා කරන්න මට මොනවා හරි නොලැබී යාවිද?

මෙන්න මේ බංකුවේ වාඩිවෙන්න වොට්සන්. විස්ල්හර්ස්ට් බලායන දුම්රියක් එනතුරු අපි බලා ඉඳිමු. එහෙත්, මම ඔබට සාක්ෂි නියම ආකාරයට ඉදිරිපත් කරන්නම්. ඒත් මං ඔබෙන් ඉල්ලා හිටිනවා එක දෙයක්. ඔබ හිතාගෙන ඉන්නෙ අර බ්‍රැකන්ස්ටෝල් ආර්යාව සහ ඇගේ සේවිකාව කියූ දේවල් ඇත්ත වියයුතුමයි කියල නේද? අන්න ඒ උපකල්පනය ඔබේ හිතෙන් ඉවත් කරන්න. ලැබී ඇති කාරණා අනුව විනිශ්චයකට එන්න. ආර්යාවගේ ඉතා ශෝභමාන රූ සපුව, අපේ නිගමනවලට බාධාවක් කරගන්න හොඳ නෑ.

මෙහෙම කල්පනා කර බලන්න වොට්සන්. ඇගේ කථාන්තරය ගැන අනුකම්පා විරහිතව කල්පනා කර බැලුවොත්, අපේ හිතට මේ වගේ සැකයක් ඇතිවෙන්නෙ නැද්ද? මේ හොර කල්ලිය සති දෙකකට කලින් සිඩ්න්හැම්වල ගෙයක් බිඳල වටිනා දේවල් රැසක් කොල්ලකාගෙන ගියා. ඔවුන් ගැන තොරතුරු, ඔවුන්ගේ බාහිර පෙනුම, ආදී විස්තර රැසක්, හැම පුවත්පතකම පළවුණා. හොර කල්ලියක් ගැන කතාවක් ගොතන්න හිතන කෙනෙකුගේ මොළයට බොහොම පහසුවෙන් ඇතුළුවෙන්නෙ මොකක්ද? රැන්ඩෝල් හොර කල්ලිය. විශාල වශයෙන් වාසි අත්වුණු මහා මංකොල්ලයක් කළ හොරු, සිරිතක් වශයෙන්, ටික කාලයක් යනතුරු අලු හම්බකර ගනිපුවායින් කමින් බොමින්, විනෝද වෙමින්, නිදහසේ කල් ගතකරනවා. ඔවුන් තවත් අවදානම් වැඩකට අතගහන්නෙ, තරමක කාලයක් ගතවුණාට පස්සෙ.

ඊළඟ වැදගත් කාරණය මේකයි. මේ තරම් කලින්, ඒ කියන්නෙ රෑ දොළහ වෙන්නත් කලින්, හොරු ගෙවල් බිඳුමක යෙදෙනවා කියන එක හරිම අසාමාන්‍යයි. අනෙක කෑගහන්නෙ නැතුව නිකං ඉඳපු ගැහැනියකුට පහර දුන්නා කියන එක විශ්වාස කරන්න පුළුවන්ද? ඒ මොකද සුළු පහර දීමක්ම ඇති, ගැහැනියක් මරහඬ දීල කෑගස්සවන්න. තවත් කාරණයක් තමයි; එක මිනිහෙක් යටත්

http://sherlockholmesinvestigations.blogspot.com

කරගැනීමට හැකි තරමට හොර කල්ලියේ පිරිස සිටිනවා නම්, ඔවුන් මිනීමැරීමක් කරන්නෙ බොහොමත්ම කලාතුරකින්.

ඊළඟ කරුණ මෙයයි. වටිනා දේවල් රාශියක් බොහොම පහසුවෙන් හොරකම් කරගෙන යාමට ඉඩ තිබියදී, රිදී පිහාන් කෝප්ප දුසිම් බාගයක් පමණක් අරගෙන යාවි කියල හිතන්න පුළුවන්ද? ඒක හරිම අස්වාභාවිකයි. අවසාන වශයෙන් මට කියන්න තියෙන්නේ ඔය පිළිවෙළේ මිනිස්සු තුන්දෙනෙක් වයින් බෝතලයක් ඇරියාම, ඒකෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් ඉතිරි කරලා යනවා කියන එක හිතන්නත් අමාරුයි නේද? මේ වගේ අසාමාන්‍ය දේවල් ඔබට පෙනෙන්නේ කොහොමද වොට්සන්?"

"ඒවා එකින් එක වෙන්කරලා ගත්තම නම්, යම් තරමක් සාමාන්‍යයි කියලා හිතන්න පුළුවනි. නමුත් ඔක්කොම එකට කැටි කරලා ගත්තොත්, ඒ අසාමාන්‍ය කරුණු රාශියේ බලය වැඩි වෙනවා. ඒවට ලොකු වැදගත් කමක් ලැබෙනවා. මට පෙනෙන හැටියට නම් මෙතැන තිබෙන අස්වාභාවිකම කරුණ, ආර්යාව පුටුවට තබා බැඳ දැමීම."

"ඒක නම් මට තවමත් හරියට පැහැදිලි නැහැ වොට්සන්. මට හිතෙන හැටියට හොරු ඇයවත් මරා දමන්න ඉඩ තිබුණා. එහෙමත් නැත්නම්, තමන් පැනගිය බවු අනික් අයට ඉක්මනින් දැනුම් දෙන්න බැරිවෙන ආකාරයට, ඇයව බැඳ දමන්න ඉඩ තිබුණා. කොහොම හරි, මේ කාන්තාවගේ සාක්ෂියේ තැන් කිහිපයක්ම, ඉතාම සැක සහිත බව මං ඔබට පෙන්නුවා නේ. ඒ හැමදේකටම වඩා මේ වයින් වීදුරු සම්බන්ධයෙන් . . . . මං නිරීක්ෂණය කළ දේ."

"වයින් වීදුරු සම්බන්ධයෙන්? ඒ මොනවද?"

"ඒවා තිබුණු හැටි හිතෙන් මවාගන්න පුළුවන් නේද?"

"ඔව්."

අපට කිව්වෙ මිනිස්සු තුන් දෙනෙක් ඒ වීදුරු තුනේ වයින් බිව්වා කියලයි. ඔබ හිතන්නේ ඇත්තෙන්ම ඒක වෙන්න පුළුවන්ද?"

"ඇයි මොකක්ද ඒක වැරැද්ද? වීදුරු තුනේම වයින් ඉතිරිවෙලා තිබුණා නේ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක හරි. නමුත් ඔබ දුටුවද, වයින් මණ්ඩි ඉතිරි වෙලා තිබුණෙ එයින් එක වීදුරුවක විතරයි. ඒකෙන් මොකක්ද ඔබට හිතාගන්න පුළුවන්?"

"අන්තිමට පිරවූ වීදුරුවට තමයි මණ්ඩි ටික එකතු වුණේ කියන කාරණයද?"

"නෑ ඒක නෙමෙයි. බෝතලයේ වයින් වල මණ්ඩි ගතිය බහුලව තිබුණා. මුල් වීදුරු දෙකේම එය නැතිවීමටත්, අන්තිම එකේ තිබීමටත් කාරණයක් නෑ. එය සිදුවෙන්න පුළුවන් ක්‍රම තියෙන්නේ දෙකක් පමණයි. වෙන කිසිම ක්‍රමයක් නෑ.

පළමුවෙනි ක්‍රමය; අංක 1 සහ 2 දරන වීදුරු වලට වයින් වත් කළාට පස්සෙ, බෝතලය සෙලවීම, කැළඹීම නිසා, තුන්වැනි වීදුරුවට මණ්ඩි එකතු වුණා කියන එක. ඒක නම් මං හිතන්නෙ නෑ වෙන්න පුළුවන් දෙයක් කියලා. නෑ නෑ. මං නිවැරදියි. ඒක වෙන්න බෑ."

"එහෙනම් වෙන්න පුළුවන් මොකක් කියලද ඔබ කියන්නේ?"

"වීදුරු දෙකයි මෙතැන පාවිච්චි වුණේ. ඒ දෙකේ අඩියෙ ඉතුරුවුණු වයින් ටික, තුන්වැනි වීදුරුවකට වත් කළා. ඒ මොකටද? තුන් දෙනෙක් මෙතැන හිටි බව පෙන්වන්න. එහෙම නොවෙයිද? මට නම් හොඳටම විශ්වාසයි, එය සිදුවුණේ ඒ ආකාරයට යයි කියලා.

හොඳයි. මං මේ කරන පැහැදිලි කිරීම, වයින් වීදුරු තුනේ සිද්ධියට නිවැරදි පැහැදිලි කිරීම කියල මොහොතකට හිතමු. එහෙම වුණොත්, මේක සාමාන්‍ය තාලේ හොරකමක් සහ මිනීමැරුමක් කියන එකෙන් වෙනස් වෙලා, මහා අපූරු තාලයේ වෙනස් ආකාරයක සිද්ධියක් බවට පෙරළෙනවා. ඒ මොකද, එතකොට අර බ්‍රැකන්ස්ටෝල් ආර්යාව සහ ඇගේ සේවිකාව අපට කියූ හැම දෙයක්ම, හිතාමතා කිව් බොරු බව අපට සලකන්න සිද්ධ වෙනවා. ඔවුන් කී දේවල් එක් වචනයක්වත් අපට විශ්වාසයට ගන්න බැහැ. ඊළඟට නියම අපරාධකාරයා වසන් කිරීමට, ඔවුන් බොරු ගොතා කියන්නේ, මොකක් හරි වැදගත් හේතුවක් ඇතිවයි. එතකොට අප කළ යුත්තේ කුමක්ද? ඒක වචනයක්වත් විශ්වාසයට නොගෙන, සිද්ධිය ඇත්තෙන්ම වුණු ආකාරය උපකල්පන වලින් ගොඩ නහන්න

http://sherlockholmesinvestigations.blogspot.com

වෙනවා. අපේ පිට පැවරිලා තිබෙන බරපතල රාජකාරිය ඒකයි වොට්සන්. ඔන්න එනවා සිඩ්න්හැම් බලා යන දුම්රිය. නගිමු ඒකට."

අප දෙදෙනා ආපසු පැමිණීම ගැන, ඇබේ ග්රේන්ජ්හි නිවැසියෝ ඉමහත් විස්මයට පත්වූහ. ස්ටැන්ලි හොප්කින්ස් මේ වනවිටත්, සිද්ධිය පිළිබඳව වාර්තා කිරීමට ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය බලා ගොස් සිටියේය. ඔහු නොමැති නිසා පරීක්ෂණයේ වැඩ කටයුතු තමන් භාරගන්නා බව හෝම්ස් දන්වා සිටියේය. ඉන්පසු ඔහු මා සමග කෑම කන කාමරයට ඇතුළුවී, දොරවසා ඇතුළතින් අගුළු දමා ගත්තේය. ඔහුගේ සියුම් නිරීක්ෂණ හා නිගමනවලට අදාළ කැන්, තියුණු ලෙස විමර්ශනයට ලක් කරමින්, හෝම්ස් එහි දෙපැයක් ගත කළේය. මම කාමරයේ කෙළවර වූ පුටුවක වාඩිවීමි. සිය මහාචාර්යවරයාගේ දේශනයට සවන් දෙමින්, පර්යේෂණ නරඹන සිසුවකු මෙන්, මම හෝම්ස්ගේ අදහස් වලට සවන් දුනිමි. උස ජනේලය, ජනේලයේ තිර රෙදි, බුමුතුරුණ, ඕක් ලී පුටුව, රතු ලනුව ආදී මේ සියල්ලක්ම, යළි යළිත් පරීක්ෂණයට භාජනය කොට, අලුතෙන් දකින්නට ලැබුණු දේ සැලකිල්ලට ගන්නා ලදී.

සර් යුස්ටස් බ්රැකන්ස්ටෝල්ගේ මළසිරුර එතැනින් ඉවත්කොට තිබූ අතර, අනෙක් සියලු දේ අප උදේ වරුවේ දුටු ආකාරයෙන් නොවෙනස්ව තිබිණි. මා මවිතයට පත් කරමින්, හෝම්ස් ඊළඟට කළේ, මා කිසිසේත් බලාපොරොත්තු නොවූ දෙයකි. ඕක් ලී කඳකින් සෑදූ ගිනි උදුන් පඩිය තිබුණේ පොළොවට සෑහෙන තරම් ඉහළිනි. හෝම්ස් එය මතට නැග ගත්තේය. දැන් ඔහුගේ හිසට තරමක් ඉහළින්, රතු පැහැති ලනුවේ අහල් කිහිපයක් දිග කැබැල්ලක් දිස්විය. ඒ, සීනු ලීවරයේ කම්බියට එව්කළ තැන තවමත් ඉතිරිව තිබූ ලනු කැබැල්ලයි. ඌනු කැබැල්ල දෙස බලමින් හෝම්ස් සෑහෙන වේලාවක් ගිනි උදුන් පඩිය මත ගත කළේය. ඊළඟට එය ඇල්ලීමට මෙන් පා ඇඟිලි වලින් ඉහළට එසැවුණේය. ලනු කැබැලි කෙළවර තිබුණේ තවත් ඉහළිනි. ඊටපසු බිත්තියේ සවිකොට තිබූ ලී බ්රැකට්ටුවක් මත තම දණහිසක් රැඳෙව්වේය. එවිට රතු ලනු කැබැල්ල හා හෝම්ස් ඉහළට දිගු කළ අතේ ඇඟිලි අතර වූයේ අහල් කිහිපයක පරතරයකි. ඉන්පසු ඔහු එතැන සිට බිමට පැන්නේ තෘප්තිමත් ස්වභාවයකිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතු හැටි හරි වොට්සන්. මේකට විසඳීම මට දැන් හොඳටම පැහැදිලියි. මේක අපේ පරීක්ෂණ අතර සුවිශේෂම එකක් වෙනවා. ඒ වුණත් පුදුමය කියන්නේ, මට මේ කිසිදෙයක් ඉස්සර වෙලා නොපෙනී ගිය හැටි. මගේ මොළේ ක්‍රියා කළේ බොහොම හෙමින්. ජීවිත කාලයටම නොවුණු විදියේ විශාල වැරැද්දක් තව ටිකෙන් මා අතෙන් සිදුවෙනවා! තවමත් මට හොයාගන්න අපහසුවුණු පුරුක් කිහිපයක් අමුණා ගත්තාම මගේ දම්වැල සම්පූර්ණයි."

"අපරාධකාරයින් ටික ඔබට අල්ලාගන්න පුළුවන්ද?"

"අපරාධකාරයින් නෙමෙයි වොට්සන්, අපරාධකාරයා. මෙතැන ඉන්නේ එකම එක්කෙනයි. නමුත් බොහොම දරුණු පුද්ගලයෙක්. සිංහයෙක් වගේ ශක්තිමත්, බලවත් අර ගිනි අඟුරු අල්ලන අඬුව නැමී ගොස් ඇති හැටි. උස අඩි හයයි. අහල් තුනයි. ලේනෙක් වගේ බොහොම ක්‍රියාශීලියි. දෑතේ ඇඟිලි නම්‍යශීලියි, කඩිසරයි. තැනට සුදුසු නුවණ සහ වහාම ක්‍රියාත්මක වීමේ හැකියාව, අන්තිම ඉහළයි. මෙම අතිවිශිෂ්ට ලෙස සැලසුම් කළ රංගනය, ඔහුගේ නාට්‍ය නිෂ්පාදනයක්. ඔව් වොට්සන්. අපට මේ දකින්න ලැබිල තියෙන්නේ සුවිශේෂ කෙනෙක්. දක්ෂ ලෙස සකස් කළ, සියුම් රඟපෑමක්. ඔව් ඒ වුණත් . . . . ඒ වුණත් අර සීනුවට සම්බන්ධ රතුපාට ලණුවේ ඔහු එක සළකුණක් ඉතිරි කළා. සැකයක් නැතිව අපට ඔහු හඳුනාගන්න පුළුවන් වෙන හෝඩුවාවක් ඔහු අතින් ඉතිරි වුණා."

"මොකක්ද ඒ හෝඩුවාව?"

"සීනුවට ගැටගසා ඇති ලණුවක් ඔබ එක්වරම වෙගයෙන් ඇද්දා කියල හිතමු. එතකොට ඒ ලණුව කැඩෙන්නෙ කොහෙන් කියලද ඔබ හිතන්නෙ? නිසැකවම ඒක යකඩ කම්බියට ගැටගැසූ තැනෙන්. නමුත් ඒක ගැටගැසූ තැනට අහල් තුනක් පහළින් ලණුව කැඩියන්නෙ කොහොමද වොට්සන්? මෙතැනදී වෙලා තියෙන්නෙ එහෙමයි."

"බාගවෙලාවට, ඒ අහල් තුනක් පහළ තැන, ලණුවේ පොටවල් ලිහී ගොස් දුර්වල වී තිබුණාද දන්නෙ නෑ?"

"ඔව්, ඔබ කියන හැටියට ලණුවේ පොටවල් ලිහීගොස්, ඇති බව මෙන්න කෙළවර පරීක්ෂා කර බැලුවම පෙනෙනවා. නමුත් අර

http://sherlockholmesinvestigations.blogspot.com

උඩ ඉතිරි වෙලා තියෙන අහල් තුනක ලනු කැබැල්ලේ කෙළවර ලිහිගොස් නැහැ. ඔබට මේතරම් පහත් ඉඳගෙන බැලුවාම ඒක පෙනෙන්නේ නැහැ. නමුත් ගිනි උදුන් පඩියේ බිත්ති කණ්ඩිය උඩට නැගල බැලුවොත් නම් ඒක හොඳින් දකින්න තිබුණා. ඒතැන ලනුව මුවහත් ආයුධයකින් කපාදමලා. ඒ කෙළවර ලිහීගිය ලකුණක්වත් නෑ. එහෙම නම් අපේ අතේ තිබෙන කෙළවර ලිහී ගියේ කොහොමද? ඒක ඔහු පිහියේ උදව්වෙන් කළ කපටි වැඩක්. ඔහු ඉතා කපටි පුද්ගලයෙක්.

දැන් ඔබට දකින්න හා අහන්න ලැබුණු දෙයින් මේ සිදුවීම වුණු ආකාරය උපකල්පනය කරන්න පුළුවන් නේද? මිනිහට ඕනැවුණා ලනුවක්. සීනුවේ ලනුව හයියෙන් ඇදල කඩාගන්න ඔහු කැමැති වුණේ නැහැ. එහෙම කළා නම් සීනුව නාද වේවි යයි ඔහුට බය හිතුණා. මොකක්ද ඔහු කළේ? ඔහු නැඟුණා උදුන් පඩිය ඉහළ, බිත්ති කණ්ඩිය උඩට. ඒත් ලනුව සීනුවට ගැට ගහලා තියෙන හරියට උස මදි. ඉතින් දණහිස බිත්තියේ සවිකර තියෙන ලී බ්‍රැකට්ටුවට තියලා තවත් ටිකක් ඉහළට ඇදුණා. ඔහු ඒතැන දණහිස තැබූ ලකුණු බිත්තියේ එතැනු වූ දූවිලි මත සටහන් වී තිබුණා. ඒතැන ඉඳගෙන ඔහුට අල්ලා ගන්න පුළුවන් වුණු ඉහළම තැනින් ලනුව කපාගත්තා. ඒ මට්ටම, මට ළඟාවිය හැකි හරියට තවත් අහල් තුනක්වත් ඉහළයි. ඒකෙන් තමයි මං තීරණය කළේ, ඔහු මටත් වඩා අහල් තුනක් වත් උස කෙනෙක් කියලා. වොට්සන් ඊළඟට බලන්න, අර ඕක් ලී පුටුවේ වාඩිවෙන කොටස මත තිබෙන පැල්ලම මොකක්ද?"

"ලේ පැල්ලමක්"

"කිසිම සැකයක් නෑ. ඒ ලේ පැල්ලමක්. ඒකම ඇති ආර්යාවගේ කතාව අමූලික බොරුවක් බව, උසාවියට යන්න කලින්ම ඔප්පු කරන්න. ඇයව ඒ පුටුවේ වාඩි කළේ, ඇගේ ස්වාමියාගේ මරණෙන් පසුවයි. ඒක සහතිකයි. මං ඔනෙ නම් ඔට්ටුවක් අල්ලන්නම්. ඔබට මතකද අර කච්චියේ පැත්තක දමා තිබුණු, සීක්වින් අල්ලා තිබූ කළුපාට ගවොම. මේකට අනුරූප තැන ඒ ගවොමේ ඇති ලේ පැල්ලමක්. තවමත් අපව වංචාවෙන් රවටලා, අන්ත පරාජයකට ලක් කරන්න කාටවත් හැකිවුණේ නෑ වොට්සන්. මුලින් අපි පරාජය

http://sherlockholmesinvestigations.blogspot.com



246. "අර පුටුවේ තිබෙන ඇල්ලම මොකක්ද වොට්සන්?"

http://sherlockholmesinvestigations.blogspot.com

වෙච්ච ගියත් අවසානයේදී ජයග්‍රහණය කළා. මං දැන් කැමැතියි අර ගැනි - තෙරේසා රයිට් එක්ක ටිකක් කථා කරන්න. අපි බොහොම ප්‍රවේශම් වෙන්න ඕනෙ. අපට ඕන කුරලා තියෙන තොරතුරු ඇයගෙන් එළියට ගන්න හැකිවෙන්නේ එතකොටයි."

ඕස්ට්‍රේලියානු ජාතික තෙරේසා රයිට් සිත් ඇදගන්නාසුලු චරිතයක් විය. ස්වභාවයෙන්ම මුරණ්ඩු, අනුකම්පා විරහිත තැනැත්තියක් වූ ඇය, ඉතා නිහඬ බවක් පෙන්වූවාය. අප කෙරෙහි මහත් සැකයෙන් සිටි ඇය කිසිදු ප්‍රශ්නයකට පිළිතුරු දීමට මැළි බවක් දැක්වූවාය. එහෙත් හෝම්ස්ගේ සුහදශීලී, කාරුණික බව හමුවේ ඇය දැක්වූ මුරණ්ඩු බව ක්‍රමයෙන් අඩුවිය. අප සමග හිතවත් බව වැඩිවෙද්දී දොඩමළු වූ ඇය, තමා සර් යූස්ටස්ට වෛර කළ බව සැඟවූයේ නැත.

"ඔව් මහත්මයා. අර කුඨාව් සම්පූර්ණ ඇත්ත. ඔහු වතුර පුරවපු වීදුරු ජෝගුවෙන් දමලා ගැහුවෙ මගේ ඔලුවට. ඔහු මගේ ස්වාමිදුවට මහා නරක විදියට කථා කළා. මං කිව්වා, ඇගේ සහෝදරයා ඉන්න තැන්දී ඔබ ඔය විදිහට කතා කළා නම් බලන්න තිබුණා ඔබට ලැබෙන අඩුම කියලා. එතකොටයි ඔහු මට අර විදියට හිරිහැර කළේ.

මගේ පුංචි කිරිල්ලිට නිදහසේ ඉන්න හැරියා නම් ඔහු වීදුරු ජෝගු දුසිමකින් මට දමලා ගැහුවත් හිතට අමාරු නැහැ මහත්මයා. සර් යූස්ටස් හැමදාමත් ඉතාම නරක විදියටයි ඇයට සැලකුවේ. ලැජ්ජාව නිසා මේ ගැන පොලීසියට පැමිණිලි කරන්න වත් ඇය කැමැතිවුණේ නැහැ. සමහර වේලාවට ඒ කරන හිරිහැර මටවත් කිව්වේ නැහැ. ඔබ දැක්කා නේද ඇගේ අත් දෙකේ රතුපාට තුවාල දෙකක්? ඒකවත් ඇය මට කිව්වේ නෑ. ඒත් මං දන්නවා ඒවා ඇතිවුණේ කොහොමද කියලා. සර් යූස්ටස් වරක් ඇය සමග කෝපවෙලා, අර කාන්තා හිස්වැසුම් වලට සවිකරන දිග මහත වානේ කටුවකින් ඇගේ අත්දෙකටම ඇනලා තමයි ඒ තුවාල ඇතිවුණේ. ඔහු මහා කාලකණ්ණි යක්ෂයෙක්. මැරිච්ච මිනිහෙක් ගැන මං මෙහෙම කතාකරනවිට දෙවියන් වහන්සේ මට කමාකරන සේක්වා! ඒ වුණත් මහ පොළොව උඩ ජීවත්වුණු අන්තිම දරුණුම යක්ෂයා නම් ඔහුයි, මහත්මයා!

http://sherlockholmesinvestigations.blogspot.com

අපොයි අපිව පළමුවෙන්ම මුණගැසුණු වෙලාවෙ ඔහු හැසිරුණේ බොහොම අහිංසක සුමනලයෙක් වගේ. ඒ කියන්නේ මාස දහඅටකට කලින්. ඒ වුණාට අපි දෙන්නාටම ඒක දැනෙන්නේ අවුරුදු දහඅටක් වගෙයි. අපේ මේරි ෆ්රේසර් මෙනෙවිය විදේශ සංචාරයක යෙදුණු මුල්ම වතාවයි මේ. ඊට කලින් කවදාවත් ගෙදරින් පිට ගිහින් නැති අහිංසක ගෑනු ළමයා. ලන්ඩනයට ඇවිත් නැවෙන් ගොඩ බැස්සා විතරයි, ඒ යක්ෂයාට රැවටුණා. ලන්ඩනයේ මිනිස්සුන්ගෙ තියෙන බොරු ෂෝක්වලට සම්පූර්ණයෙන්ම රැවටුණා. එයාගෙ සල්ලි වලටයි, පුහු තත්තුරටයි වශීවුණා. ඇය ඒ ගත්තු වැරැදි තීරණයට ජීවිත කාලයකටම සෑහෙන්න වන්දි ගෙව්වා.

ඔහුව හමුවුණේ මොන මාසේදිද කියලද මහත්මයා ඇහුවෙ? අපි එංගලන්තයට ආව ගමන්ම. අපි මෙහේට ආවෙ ජූනි වල. ඔහුව හමුවුණේ ජූලි වල. ඊළඟ ජනවාරියෙ කසාද බැන්දා. ඔව් ඇය ඉන්නවා කාමරයට වෙලා. ටිකක් විවේක ගන්නවා. ඔබව හමුවෙන්න ඇය අකමැති වෙන එකක් නෑ. නමුත් වැඩිපුර ප්‍රශ්න අහලා ඇයව වෙහෙසට පත්කරන්න එපා. මනුස්සයෙකුට විඳින්න පුළුවන් දුක් කරදර හැම එකක්ම විඳලයි ඇය ඉන්නෙ."

ආර්යාව අප කලින් හමුවූ තැන, එම කවිච්චියේම වැතිර සිටියාය. එහෙත් කලින් වතාවේට වඩා ඇගේ මුහුණේ යම් සැනසුම් ගතියක් ඇතැයි මට සිතිණි. අප සමගම එහි ඇතුළු වූ සේවිකාව, ස්වාමිදුවගේ මුහුණේ ඉදිමුණු තැන යළිත් තැවීමට පටන් ගත්තාය.

"මං හිතනවා මේ මහත්වරු ආවේ මගෙන් තවත් සැරයක් හරස් ප්‍රශ්න අහන්න නෙමෙයි කියල?"

"නැහැ. මං ඔබට අනවශ්‍ය ලෙස කරදර කරන්නෙ නැහැ ආර්යාවෙනි. මං දන්නවා ඔබ අවුරුදු එකහමාරක්, අධික ලෙස හිරිහැරයට, වධ හිංසාවලට ලක්වූ කෙනෙක්. මගේ එකම අරමුණ ඔබට කටයුතු ටිකක් පහසු කිරීමයි. ඔබ මාව මිත්‍රයෙක් හැටියට සලකලා මා ගැන විශ්වාසය තියන්න. එතකොට ඔබට පෙනේවි, ඔබ තැබූ විශ්වාසයට මං සාධාරණය ඉටුකරන බව."

"ඔබ මොකක්ද මගෙන් බලාපොරොත්තු වෙන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මං ඔබෙන් ඉල්ලා සිටින්නේ සම්පූර්ණ සත්‍යය මට හෙළිකරන්න කියලයි."

"ඇයි හෝම්ස් මහත්මයා මං ඔබට කිව්වෙ . . . . .?"

". . . . . වැඩක් නෑ බ්‍රැකන්ස්ටෝල් ආර්යාව. මෙව මං හැංගීමෙන් ඇති ප්‍රයෝජනයක් නෑ. ඔබට සමහර විට අහන්න ලැබිල ඇති, අපරාධ පරීක්ෂණය ගැන මට එක්තරා කීර්ති නාමයක් ලැබී ඇති බව. මං ඒක මට්ටුවට තියලා ඔබට අභියෝග කරනවා; ඔබ මට පැවසූ කථාව සම්පූර්ණයෙන්ම බොරු එකක්."

ආර්යාව මෙන්ම ඇගේ සේවිකාව ද, හෝම්ස් දෙස බලා සිටියේ දෑස් විශාල කරගෙන, භීතියෙන් සුදුමැලි වූ මුහුණෙනි.

"ඔහේ මහා ලැජ්ජා නැති මිනිහෙක්. ඔහේ කියන්නේ මගේ ස්වාමිදුව බොරු කියනවා කියලද?" තෙරේසා සර්ජනා කළාය.

හෝම්ස් තම අසුනෙන් නැගිට්ටේය.

"එහෙම නම් මට කියන්න වෙන මොනවත්ම ඔබට නෑ?"

"මං දන්නා සියල්ලම ඔබට කියලයි තියෙන්නේ."

හෝම්ස් තම හිස්වැස්ම ද අතට ගෙන පිටත්ව යෑමට සූදානම් විය. දෙවුර හකුළමින් ඔහු හැසිරුණේ තම බලාපොරොත්තු කඩවූ අයුරකි.

"මට බොහොම කණගාටුයි."

වෙන වචනයකුදු නොදොඩා අපි නිවසෙන් එළියට බැස්සෙමු.

ගෙවත්ත මැද තරමක් විශාල පොකුණක් විය. මගේ මිතුරා ගමන් කළේ ඒ දෙසටයි. ශීත සෘතුව නිසා පොකුණ මතුපිට සම්පූර්ණයෙන්ම වාගේ හිම මිදී, අයිස් තට්ටුවකින් වැසී තිබිණ. එහෙත් පොකුණේ එක් කෙළවරක පමණක් හිම නොමැති වූ අතර එතැන ජලයේ හංසයෙකු පිහිනමින් සිටියේය. එදෙස මඳ වේලාවක් නිහඬව බලා සිටි හෝම්ස් අනතුරුව ගේට්ටුව දෙසට ගමන් කළේය. තම සටහන් පොත අතට ගෙන පිටුවක් ඉරා, එහි යමක් සටහන් කළ හෝම්ස්, එය ස්ටෑන්ලි හොප්කින්ස්ට භාරදෙන මෙන් ඉල්ලා මුරකරු අතට දුන්නේය.

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

"මේක ඉලක්කය හරියටම නොබැඳිව එල්ල කරන හියක් වගෙයි. හරියන්නත් පුළුවනි, වරදින්නත් පුළුවනි. අපි දෙවැනි වරටත් මෙහේ ආව නිසා අපේ මිත්‍ර හොප්කින්ස්ට යම් උදව්වක් කිරීම අපේ යුතුකමක්." හෝම්ස් කීය.

"මගේ රහස් සියල්ලම ඔහුට හෙළිකරන්න තවමත් මට හැකියාවක් නෑ. මීළඟට අපේ වැඩ රාජකාරි පිණිස යන්න වෙනවා නැව් කටයුතු කාර්යාලයකට. ඒ, ඇඩිලේඩ් - සවුත්හැම්ටන් අතර යාත්‍රා කරන නැව් පිළිබඳ, නාවික සම්බන්ධීකරණ කාර්යාලයටයි. මට මතක හැටියට ඒක තියෙන්නේ පෝල්මෝල් වල. මීට අමතරව දකුණු ඕස්ට්‍රේලියාව හා එංගලන්තය අතර යාත්‍රා කරන තවත් දුම්නැව් සේවයක් තියෙනවා. නමුත් අපි ඉස්සර වෙලා ගිහින් බලමු ප්‍රධාන එකට."

හෝම්ස් තම හැඳුනුම්පත කළමනාකරුවා වෙත ඉදිරිපත් කළේය. එවිට අපට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට එතරම් වේලාවක් ගතවූයේ නැත. ලේඛන පිරික්සූ ඔහු, හෝම්ස්ගේ ප්‍රශ්න වලට ඉක්මනින්ට පිළිතුරු සැපයුවේය.

"1895 ජූනි මාසයේදී එංගලන්තයට ළඟාවූයේ අපේ නැව්වලින් එකම එකයි මහත්මයා. ඒ තමයි "රොක් ඔෆ් ජිබ්‍රෝල්ටා" නෞකාව. ඒක තමයි අපේ විශාලම හොඳම නැව."

"ඔව් මගී ලැයිස්තුවේ හැටියට, ඕස්ට්‍රේලියාවේ සිට මෙහේට පැමිණිලා තියෙනවා, ඇඩිලේඩ්හි මේරි ෆ්‍රේසර් මෙනෙවිය සහ ඇගේ සේවිකාව . . . ."

"මේ දවස්වලද? නැව ආපුහු ඕස්ට්‍රේලියාව බලා පිටත්වෙලා ගිහිං. මේ දවස්වල එය ඇත්තේ සූවස් ඇළ පහුකරලා, දකුණු දිගට වෙන්න."

"නැවේ සේවක මණ්ඩලයද? ඔව් එකම වෙනසක් හැරෙන්න, කලින් ඉඳපු සේවක මණ්ඩලයම වෙනසක් නැතිව ඉන්නවා. ඒ දිනවල කපිතාන්ගේ දෙවැනියා හැටියට ඉඳපු මහත්මයා විතරක් එහි නැහැ. ඒ මහත්මයාට උසස්වීමක් ලැබුණා. . . . ."

". . . . . ඔහුගේ නමද? ඔහු ජැක් ක්‍රොකර්. දැන් ඔහු නැව් කපිතාන් කෙනෙක්-හැටියට උසස්වීමක් ලබලා. ඔව් අලුත් නැවක

http://sherlockholmesinvestigations.blogspot.com

කපිතාන් තනතුරට පත්වීමක් ලැබුවා. ඒ නැවේ නම "බාස්රොක්". ඔව් තව දවස් දෙකකින් ඒ නැව සවුත්හැම්ටන් වලින් පිටත්වෙනවා."

"කපිතාන් ක්‍රොකර්ද? ඒ මහත්මයා මේ දිනවල සිඩ්න්හැම්වලයි පදිංචි. ඔහුට අලුතෙන් ලැබිලා තියෙන උපදෙස් මොනවද කියල දැනගන්න, තව ටික වෙලාවක් යද්දි ඔහු මේ කාර්යාලයට ඒවි. ඔබට ටිකක් වාඩිවෙලා ඉන්න හැකිනම් ඔහු හමුවෙන්න පුළුවනි."

"ආ . . . . මහත්මයාට ඔහුව හමුවෙන්න අවශ්‍යතාවයක් නැද්ද? ඔහු ගැන විස්තර දැනගන්නද උවමනා? අපි ළඟ ඇති ඔහු ගැන ලැබුණු සහතික . . . ."

කපිතාන් ක්‍රොකර්ගේ සහතික පරීක්ෂා කිරීමේදී ඔහු විශිෂ්ට නාවික නිලධරයකු බව දැනගන්නට ලැබිණ. දක්ෂතාවය අතින් ඔහු සමීපයටවත් පැමිණිය හැකි වෙනත් නිලධරයකු නොවීය. ක්‍රොකර් රාජකාරිය අකුරටම ඉටු කළ පුද්ගලයෙකු විය. එහෙත් ඔහු අයුක්තියේදී තදින්ම කෝපවන, එසේ වූ විට චණ්ඩ මෙන්ම භයානක පුද්ගලයෙකු ද විය හැකි බවද සඳහන් විය. පහසුවෙන් කලබල වුවත්, කපිතාන් ජැක් ක්‍රොකර්, අවංක, පක්ෂපාත මෙන්ම කරුණාබර හදවතක් ඇත්තෙකු බවද තවදුරටත් පැවැසිණි.

නාවික කාර්යාලයෙන් හෝම්ස්ට දැනගැනීමට ලැබුණු තොරතුරුවල සාරාංශය එයයි. මීළඟට මගේ මිත්‍රයා ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසිය වෙත යාමට අවශ්‍ය බව පැවසූ නිසා, අපි කුලීරියකට නැගුනෙමු. මඳ වේලාවකින් අපි එම පොලිස් කාර්යාලය වෙත ළඟා වූයෙමු. අප එතැනට පැමිණි බව රියැදුරා දැනුම් දුන්නත්, හෝම්ස් තවමත් නළල රැළි ගන්වාගෙන කල්පනාවක වෙළුණු ගමන්ය. සිහින ලෝකයක සැරිසරන්නෙක් මෙන් මඳ වේලාවක් සිටි ඔහු, අවසානයේ තීරණයක් ගත්තේය. චාරිංක්‍රොස් තැපැල් කාර්යාලය වෙත රිය පදවන මෙන් හෝම්ස් රියැදුරාගෙන් ඉල්ලා සිටියේය. විදුලි පුවතක් යවා හෝම්ස් ඉක්මනින් පැමිණියෙන් අපි ආපසු බේකර් වීථියේ අපේ නිවහනට ළඟාවූයෙමු.

"ඒ දේ කරන්න මගේ හිත මට ඉඩ දුන්නේ නැහැ වොට්සන්." ඔහු පැවසුවේ කාමරයට ඇතුළුවෙද්දීයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"පොලිසියෙන් වරෙන්තු නිකුත් කළා නම් මේ ලෝකෙ කිසි කෙනෙකුට ඔහුව බේරාගන්න ලැබෙන්නෙ නැහැ. මගේ වෘත්තියේ යෙදුණු කාලපරිච්ඡේදයේ, වරක් හෝ දෙවරක් මට මෙහෙම අත්දැකීම් වලට මුහුණදෙන්න සිදුවෙලා තියෙනවා. ඒ අදාළ පුද්ගලයා අතින් වුණු අපරාධයක් එළිකර ඔහුට දඬුවම් ලබාදීමට මං උදව්වුණා. නමුත් අන්තිමට බැලුවාම මගේ අතින් වුණු හානිය, අර මිනිහා අතින්වුණු අපරාධයට වඩා බරපතලයි. මං දැන් දන්නවා, අපරාධකාරයා නීතියට හසුකර දීමේදී ඉතා ප්‍රවේශමින් කටයුතු කළයුතු ආකාරය. මගේ හෘදසාක්ෂියත් එක්ක ප්‍රයෝගවල යෙදෙනවාට වඩා එංගලන්තයේ නීතිය එක්ක ප්‍රයෝගවල යෙදෙන්න මං වැඩිය කැමතියි. තවදුරටත් ක්‍රියාත්මක වෙන්න කලින්, අපි කාරණා පිළිබඳව තවත් ටිකක් දැනුවත් වෙලා ඉඳිමු."

සවස් වීමට පෙර අපේ හිතවත් ස්ටැන්ලි හොප්කින්ස් අප හමුවීමට නිවහනට පැමිණියේය. ඒ යුගය ඔහුගේ රාජකාරී ඔහු සිතූ අන්දමින් සාර්ථක නොවූ කාලයකි.

"මම නම් හිතන්නේ ඔබ ඉන්ද්‍රජාලිකයෙක් හෝම්ස් මහත්මයා. මට වෙලාවකට හිතෙනවා, ඔබට අනෙක් මිනිස්සුන්ට නැති අද්භූත බලයක් ඇති කියලා. හොරකම් කළ රිදී පිඟන් කෝප්ප, අර පොකුණ ඇතුළේ තිබෙන ආරංචිය ඔබට ලැබුණේ මොන ලෝකෙන්ද?"

"මං ඒක දැනගෙන හිටියෙ නෑ."

"ඔබ ඒ වුණාට මට කිව්වේ නේ ඒක සෝදිසි කර බලන්න කියලා?"

"හරි. ඉතින් බඩු හම්බවුණාද?"

"හම්බවුණා."

"මගෙන් ඔබට උදව්වක් ලැබුණා නම් මං ඒ ගැන සන්තෝෂයි."

"ඔබ ඒ කළේ උදව්වක් කියල කියන්නෙ කොහොමද? ඒකෙන් දැන් මගේ ප්‍රශ්නය වඩාත් සංකීර්ණ අමාරු එකක් වුණා. ගෙයක් බිඳලා, වටිනා රිදී පිඟන් හොරකම් කරලා, ඒවා වත්තේ පොකුණට විසිකරලා යන හොරු, ලෝකෙ කොහේවත් ඉන්නවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හැබෑමයි. ඒක හරිම අසාමාන්‍ය විධියක හැසිරීමක්. මට ඒ වෙලාවෙ මෙන්න මෙහෙම දෙයක් හිතුණා හොප්කින්ස්. මේ රිදී පිඟන් හොරකම් කරලා තියෙන්නේ ඒවා අවශ්‍ය නොවන අය වෙන්න ඇති. ඔවුන් ඒවා ගන්න ඇත්තෙ පොලීසිය නොමඟ යැවීම සඳහා. එහෙම වුණාම ඒවා කොහේට හරි විසිකර දමන්න ඔවුන් ප්‍රමාද වෙන්නෙ නෑ."

"ඒ වුණත් ඒ වගේ අදහසක් ඔබේ ඔලුවට ඇතුළුවුණේ කොහොමද?"

"මට හිතුණා වෙලා තියෙන්නේ එහෙම දෙයක් කියල. ඔවුන් උස ජනේලයෙන් එළියට පැන්නාම, ඉස්සරහටම හම්බවෙන්නෙ අර පොකුණ. බඩු හංගන්න ඊට වඩා හොඳ තැනක් කොහෙන් හොයන්නද?"

"අන්න හරි. බඩු හංගන්න තැනක්!" හොප්කින්ස් උස් හඬින් කීවේ මහත් සන්තෝෂයෙනි.

"හරි හරි. මට දැන් තේරෙනවා කාරණේ. වැඩිය රෑ බෝවෙලා නැති නිසා, ඔවුන් හොරකම් කරපු බඩු එතැන හැංගුවා. මොකටද? කවුරුවත් පෙනෙන තෙක් මානෙක නැති, අන්ධකාර රාත්‍රියක ඇවිත් අරගෙන යන්න. විශිෂ්ටයි හෝම්ස් මහත්මයා. අර ඔබ කිව් "පොලීසිය නොමඟ යවන" කතාවට වඩා මේ අදහස හොඳයි."

"ඒ කතාවත් හරි. ඔබගෙත් තියෙනවා යම් වටිනා උපකල්පනයක්. මගේ සිතේ ඇති අදහස් නම් බොහොම අවුල් සහගත අක්‍රමවත් ඒවා. කොහොම වුණත් අන්තිමට පිඟන් ටික හම්බවුණා."

"හරි හරි හෝම්ස් මහත්මයා. ඒක ඔබේ හපන්කමක්. මගේ උපකල්පනයත් නම් සම්පූර්ණයෙන්ම වැරදුණා."

"වැරදුණා? ඒ කොහොමද?"

"ඔව් මහත්මයා. රැන්ඩෝල් කල්ලිය අද උදේ පාන්දරම, ඇමරිකා එක්සත් ජනපදයේ, නිව්යෝක් නගරයේදී හිරභාරයට අරගෙන!"

http://sherlockholmesinvestigations.blogspot.com

"අනේ දෙවියනේ! ඒකෙන් ඔබේ උපකල්පනයන් හැම එකක්ම බිඳ වැටෙනවා නේද? එහෙනම් ඊයෙ රාත්‍රි එංගලන්තයෙදි ඔවුන් මිනීමැරුමක් කළා වෙන්න බෑ?"

"මේක මහා මාරාන්තික ප්‍රශ්නයක් වෙලයි තියෙන්නෙ හෝම්ස් මහත්මයා. ඉතාම භයානක තත්ත්වයක්. මේ රන්ඩෝල්ලා ඇරුණාම, තුන්දෙනාගේ කල්ලි තවත් ඉන්නවා. මේ සමහර විට පොලීසිය කිසිත් නොදන්න අලුත්ම හොර කල්ලියක් වෙන්න ඇති."

"ඔව්. ඒකත් හරි. කොහොමටත් වෙන්න පුළුවන් දෙයක්. මොනවා? ඔබ මේ දැන් ගෙදරින් පිටවෙලා යන්නද හදන්නෙ?"

"ඔව් හෝම්ස් මහත්මයා. මේ ගැටලුව පතුලටම කිමිදිලා ඔක්කෝම හෙළිකරනතුරු, මගේ හිතට නම් සැනසීමක් නෑ. මට ප්‍රයෝජනවත් විය හැකි හෝඩුවාවන් කිසිවක් ඔබ ළඟ නැද්ද හෝම්ස් මහත්තයා?"

"ඇයි මං ඔබට හෝඩුවාවක් දුන්නේ?"

"ඒ මොකක්ද?"

"ඇයි මං කිව්වේ, හොර බඩු මේ විදියට හංගල තියෙන්නේ පොලීසිය නොමග යවන අදහසින් කියලා?"

"ඒ වුණත් හෝම්ස් මහත්තයා, ඇයි ඔවුන් පොලීසිය නොමග යවන්නේ? ඒ මොන එකකටද?"

"අන්න ඒක තමයි ප්‍රශ්නෙ. ඒ වුණත් මං කැමැතියි ඒ කාරණය අවධාරණය කරන්න. ඒක හොඳට හිතේ තියාගන්න. ඒ කරුණේ මොකක් හරි දෙයක් සැඟවී ඇති බව, සමහරවිට ඔබට හොයාගැනීමට හැකිවේවි.

මොනවා, ඔබ රෑට කෑම ටිකක් කන්නවත් ඉන්නෙ නැද්ද? හොඳයි හොඳයි. එහෙනම් ආයුබෝවන්. ඔබේ පරීක්ෂණ කටයුතු කෙරීගන යන හැටි අපටත් දන්වන්න."

අපේ භෝජනය අවසන් විය. සේවකයා පැමිණ කෑම පිඟන් සියල්ල ඉවත් කරගෙන ගිය පසු හෝම්ස් පයිප්පය දල්වා ගත්තේය. අනතුරුව ඔහු වේලාව පරීක්ෂා කර බැලුවේ යමක් කීමට සූදානමෙනි.

Reading Purpose Only. Never Print

http://sherlockholmesinvestigations.blogspot.com

"මං බලාපොරොත්තු වෙනවා වොට්සන් මේ පරීක්ෂණය සම්බන්ධ අලුතෙන් යමක් සිදුවෙයි කියලා. . . . "

"අලුතෙන් යමක්? කොයි වෙලාවටද?"

"මේ දැන්. තව මිනිත්තු කිහිපයක් ඇතුළත. ඔබට හිතෙන්න ඇති මං ස්ටැන්ලි හොප්කින්ස්ට සැලකූ හැටි එච්චර හොඳ නෑ කියලා?"

"ඔබ ඒ විදියට කටයුතු කරන්න ඇත්තේ මොකක් හරි විශේෂ හේතුවක් නිසා බව මට විශ්වාසයි."

"ඉතාම ඥානාන්විත පිළිතුරක් වොට්සන්. ඔබ මෙම සිද්ධිය ගැන මං කියන පැත්තෙන් බලන්න. මම මොනවා හරි දෙයක් දැනගත්තොත්, සොයාගත්තොත්, ඒවා නිල වශයෙන් කොහේවත් සටහන් වෙන්නෙ නෑ. යම් සිදුවීමක සාධාරණත්වය ගැන, පෞද්ගලිකව විනිශ්චයකට එන්න මට නිදහස තියෙනවා. නමුත් ඔහුට ඒ නිදහස නෑ. තමන් දැනගන්න හැම දෙයක්ම ඔහු ඉහළ නිලධරයන්ට හෙළිකළ යුතුයි. නැත්නම් ඔහු පොලිස් සේවයට වංචාකාරයෙක්, ද්‍රෝහියෙක් වෙනවා. සැක සහිත අවස්ථාවක ඔහුට එවැනි උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණපාන්න මං ඉඩතියන්නෙ නෑ. සිදුවීමට අදාළ කාරණා සියල්ලක්ම හොඳින් පැහැදිලි වෙනතුරු, සම්පූර්ණ වෙනතුරු, ඒවා මගේ හිතේම රඳවාගන්නවා."

"ඔය කාරණා පැහැදිලිවීම, සම්පූර්ණවීම කවදා වෙන දෙයක්ද?"

"දැන් ඒකට වෙලාව හරි, වොට්සන්. තරමක් ත්‍රාසජනක වූ නාටකයක අවසන් ජවනිකාවයි ඔබ නරඹන්න හදන්නේ."

කිසිවෙකු අපේ නිවහනේ තරප්පුව නැග උඩුමහලට එන පියවර හඬ ඇසිණ. දොර විවෘත කොට ඔහු අපේ විසිත්ත කාමරය වෙත කැඳවාගෙන එන ලදී. ඉතා උස් සිරුරක් තිබූ ඔහු කඩවසම් තරුණයෙකි. නිල් පැහැති දෙනෙත් හා රන්වන් පැහැති උඩුරැවුලක් තිබූ ඔහු, ඉතා ශක්තිමත් පුද්ගලයෙකු බව බැලූ බැල්මට පෙනිණ. අව්වට පිළිස්සුණු සමක් තිබූ මෙම අමුත්තා, ඉතා කඩිසර පුද්ගලයෙකු බව මම එක්වරම වටහා ගතිමි. අපේ කාමරයට ඇතුළුවුණු වහාම, ඔහු දොර වසා දමා නැගිට සිටියේ, දැත් මිටි මොළවාගෙනයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"වාඩිවෙන්න කපිතාන් ක්‍රෝකර්. ඔබට මා එවූ විදුලි පුවත ලැබෙන්න ඇති?"

පුවපහසු ඇඳි පුටුවක වාඩිවූ ඔහු, අප දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට හෙළුවේ ප්‍රශ්නාර්ථ බැල්මකි.

"ඔබේ විදුලි පුවත ලැබුණා. ඔබ කියූ වෙලාවට මෙන්න මං ආවා. ඔබ නැව් කටයුතු කාර්යාලයට ඇවිත් ගිය බව මට අහන්න ලැබුණා. ඔබගෙන් මට බේරීමක් නැතිවා වගෙයි.

ඔබට කියන්න තියෙන නරකම දේ අහන්න මම සූදානම්. මොනවද ඔහේ මට කරන්න හදන්නෙ? මාව හිරභාරයට ගන්නද? කථා කරනවා මනුස්සයෝ! කථා කරනවා! මරාගෙන කන්න ඉන්න මීයෙක් එක්ක සෙල්ලම් කරන බළලෙක් වගේ, ඔතැනට වෙලා නිකම් බලාගෙන ඉඳලා හරියන්නෙ නෑ."

"වොට්සන්. දෙන්න ඔහුට සුරුට්ටුවක්. හරි. දැන් ඔය සුරුට්ටුව තදින් හපලා තියාගන්න කපිතාන් ක්‍රොකර්. හිතේ ඇතිවෙන හැඟීම් වලින්, හයට කම්පනයට පත්වෙන්න එපා. ඔබ සාමාන්‍ය අපරාධකාරයෙක් ලෙසටයි මං සැලකුවේ කියලද හිතන්නෙ? එහෙම නම් මං ඔබත් එක්ක මෙහෙම කථා කර කර සුරුට්ටු බිබී ඉන්නෙ නෑ. ඒක හොඳට මතක තියා ගන්න.

මං ගැන විශ්වාසය තියලා. මට ඇත්ත හෙළි කරන්න. ඒකෙන් ඔබට වෙන්නේ යහපතක්මයි. නමුත් වංචාවක් කරලා මාව රවටන්න උත්සාහ කළොත්, ඔබව විනාශ කරන්න මට පුළුවනි."

"මොනවද ඔබ මගෙන් බලාපොරොත්තු වෙන්නෙ?"

"ඊයේ රාත්‍රි ඇබේ ග්‍රේන්ජ් මන්දිරයේ වුණු සිදුවීම ගැන සම්පූර්ණ සත්‍යය මට හෙළිකරන්න. මතක තියාගන්න මට ඕනෑ සම්පූර්ණ ඇත්ත. මොකුත් හංගන්න එපා. මොකුත් එකතු කරන්නත් එපා. මං කාරණා ඔක්කොම විගේ හොයාගෙනයි තියෙන්නෙ. බොරුවක් කරලා ඔබට මගෙන් බේරෙන්න අමාරුයි. නියම කථාවෙන් එක අඟලක් ඔබ වැරැදි මාර්ගයේ ගියොත්, මම මේ පොලිස් නළාව පිඹිනවා. ඒ හඬ මගේ ජනේලයෙන් පිටවී ගිය ගමන්, මේ පරීක්ෂණය මගේ ග්‍රහණයෙන් ගිලිහී යනවා. ඊට පස්සේ ඒක ආපහු මගේ දෑතට ලබාගන්න ක්‍රමයක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com



257. "වාඩිවෙන්න කපිතාන් ක්‍රොකර්....."

http://sherlockholmesinvestigations.blogspot.com

නාවිකයා මඳ වේලාවක් කල්පනා කළේය. ඉන්පසු තම මිට මොළවූ ඔහු අතෙන් තම කලවයටම පහරක් එල්ල කරගත්තේය.

"වෙන දෙයක් වෙච්චාවේ! මං ඒ අවදානම භාරගන්නවා. ඔබ ඒ කියන වචනය මං විශ්වාසයට ගන්නම්. ඔබ පුදුහම ඇති මිනිහෙක්. මං ඔබට සම්පූර්ණ කථාන්තරයම කියන්නම්. ඒ වුණත් මං මෙන්න මේ ටිකත් මුලින්ම කියලා හිටින්නම්. මං ගැන විතරක් හිතුවොත්, මට පසුතැවිලි වෙන්න කිසිම දෙයක් මං කරලා නෑ. මං කිසිදේකට භයත් නෑ. ඒක ආයෙම සැරයක් කරන්න සිද්ධවුණත් මං බොහොම ආඩම්බරයෙන් ඒ දේ කරනවා. ඒ තිරිසනාට ශාප වේවා! ඌට බළලෙකුට වගේ ජීවිත කීපයක් තිබුණොත්, ඒ හැම එකකම ණය ගෙවන්න මං ලෑස්තියි.

ඒ වුණත් අර තරුණ කාන්තාව මේරි - මේරි ෆ්රේසර් ගැනයි මට හිතට දුක. අර කාලකණ්ණියාගෙ නමෙන් ඇයව හඳුන්වන්නවත් මං කැමති නෑ. ඈගේ සුන්දර මුහුණේ හිනාවක් වෙනුවෙන්, මුළු ජීවිතයම කැපකරන්න සූදානම් මිනිහෙක් මම. එහෙව් මම, ඇය කෲර වධ හිංසා වලට ලක්වෙලා, කාලකණ්ණි ජීවිතයක් ගෙවන හැටි දකින්න කොහොමටවත් සූදානම් නෑ. ඒකෙන් මගේ හදවත හරියට කම්පාවුණා. මට වෙන මොනවද කරන්න ඉතිරි වෙලා තිබුණේ? මහත්වරුනි. මං ඔබට කියන්නම් මගේ කථාව. ඔබත් මෙවැනි තත්ත්වයකට මුහුණ දුන්නොත්, පිරිමියෙක් හැටියට ඔබ ගන්න පියවර මොකක්ද කියලා එතකොට කියන්න.

කථාව මුල සිටම පටන්ගන්න, මට ටිකක් කාලයේ ආපස්සට යන්න සිද්ධවෙනවා. ඔබ කාරණා බොහොමයක් දන්නා බවයි පෙනෙන්නෙ. එහෙනම් ඔබට මේ ටිකත් අහන්න ලැබෙන්න ඇති. මේරි ෆ්රේසර් මට මුලින්ම මුණගැහුණේ ඇය අපේ නැවේ "රොක් ඔෆ් ජිබ්රෝල්ටා" වෙ මගියෙක් හැටියට ගමන් කරද්දියි. එතකොට මං ඒ නැවේ කපිතාන්ගේ දෙවැනියා. මට ඇයව දකින්න ලැබුණු පළමුවෙනි අවස්ථාවේ ඉඳල, මගේ සිත ඇය කෙරෙහි වශීවුණා. ඒ මුහුදු ගමනේ අප යාත්රා කළ හැම දිනයක් පාසාම, ඇය ගැන මගේ සිතේ තිබුණු ආදරය වැඩිවුණා. ඒත් අප දෙදෙනා අතර ආදර සම්බන්ධයක් පටන් ගැනුණේ නැහැ. ඒ නිසා මං සමග විවාහ වෙනවා කියල විවාහ ගිවිසගැනීමක් වැනි දෙයක් ඇතිවුණොත්

http://sherlockholmesinvestigations.blogspot.com

නැහැ. ඇය මා ගැන ඇක්වූයේ, කාන්තාවක් පිරිමියෙකු කෙරෙහි දක්වන සාමාන්‍ය සැලකීම පමණයි. මං ඒ ගැන ඇයට දොස් කියන්නේ නැහැ. නමුත් මං මගේ මුළු හදින්ම ඇයට ආදරය කළා. නමුත් ඇයගෙන් මට ලැබුණේ, හිතවත්කමක්, සහෝදර බැඳීමක් පමණයි. අපේ නැව සවුතැම්ටන් වරායට සේන්දු වුණු දවසේ අපි වෙන්වුණා. එදා ඇය මගෙන් සමුගෙන ගියේ නිදහස් තරුණියක විදියට. නමුත් එදා සිට මගේ සිතට නම් කිසිම නිදහසක් තිබුණේ නැහැ.

අපේ නැව යළිත් ඔස්ට්‍රේලියාවට ගියා. ඒ මුහුදු ගමන සම්පූර්ණ කර ආපහු එංගලන්තයට ආවම මට අහන්න ලැබුණා, මේරි ෆ්‍රේසර් විවාහ වී ඇති බව. ඔව්. ඇය කැමැති කෙනෙක් එක්ක විවාහ වෙන්න ඇයට සම්පූර්ණ අයිතියක් තිබෙනවා. ඒකට විරුද්ධ වෙන්න මට තියෙන අයිතිය මොකක්ද? ඉහළ ප්‍රභූ පවුලක, ගෞරව නම්බු නාම, මිල මුදල් ආදී හැම දෙයක්ම ලබන්න, ඇය වාසනාවන්ත වීම පුදුමයක් නෑ. ඉතාමත් ශෝභාසම්පන්න කාන්තාවක් වෙලා, ඇය උපතින්ම ඒ වාසනාවට උරුමකම් කීවා. ඒකෙ ඇති වැරැද්ද මොකක්ද? ඇගේ විවාහය ගැන මම දුක්වුණේ නෑ. මං ඒ වගේ ඊර්ෂ්‍යාකාර දුෂ්ටයෙක් නෙමෙයි. මං වගේ අතේ පැන්සයක් නැති නාවිකයෙකුගේ අත නොගත්තාට, වාසනාව ඇය සොයාගෙන ආවා. ඇගේ වාසනාව ගැන මම අවංකවම සතුටුවුණා මහත්මයා. මං මේරි ෆ්‍රේසර්ට ආදරය කළේ අන්න ඒ විදියටයි.

ඉතින් මගේ ජීවිතේට ඇයව කවදාවත් මුණගැහෙන්න මගේ කිසි බලාපොරොත්තුවක් තිබුණේ නෑ. නමුත් පහුගිය ගමනෙන් පස්සේ මට කපිතාන් තනතුරට උසස්වීමක් ලැබුණා. මට භාරගන්න තිබූ අලුත් නැව මුහුදුගමනට තවමත් සූදානම්ව තිබුණේ නෑ. ඉතින් මං මාස කීපයක් සිඩ්න්හැම් වල, මගේ ඥාතීන් සමග කාලය ගතකළා. එක දවසක් මං සිඩ්න්හැම් නගරයේ පාරක ඇවිද යද්දී කවුද මට ඉස්සරහට හම්බවුණේ? තෙරේසා රයිට් - මේරිගේ සේවිකාව.

මේරි ෆ්‍රේසර් ගැනත්, ඇගේ ස්වාමියා ගැනත්, ඔවුන් ගෙවන ජීවිතය ගැනත් තෙරේසා මට හැම දෙයක්ම හෙළිකළා. ඔබට කියන්න මහත්වරුනි, මේ කථාවල් අහල මං කෝපයෙන් වියරු

http://sherlockholmesinvestigations.blogspot.com

වුණා. ඇගේ සපත්තුවක් ලෙවකන්න හොඹටිනා මේ බේබදු බල්ලා, ඇයට පහර දෙන දරුණුකම ගැන අහලා, මගේ සිහි විකල් නොවුණා විතරයි. ඊට පස්සේ වරක් දෙවරක් මට මේරි හමුවෙන්න අවස්ථාව සැලසුණා. ඊට පස්සේ ඇය මට හමුවෙන්න කැමැතිවුණේ නැහැ.

මේ අතරේ මට නැව් සමාගමෙන් දැනුම් දුන්නා, නැව යාත්‍රා කිරීමට සුදුසු තත්ත්වයේ තිබෙන බව. ඒ නිසා, සතියක් ඇතුළත පිටත් වී යන්න සූදානමෙන් ඉන්න ලෙස. මෙහෙන් පිටත් වෙලා යන්න කලින්, තව එක සැරයක් මේරිව දැකලා යන්න මං තීරණය කළා. තෙරේසා මට හැමදාමත් උදව් කළ මගේ මිතුරිය. ඇය මේරිට හරි ආදරෙයි. මේරිට වධහිංසා කළ අර බේබද්දාට, තෙරේසාත් මා වගේ වෛර කළා.

ගෙදර පහළ තට්ටුවේ, මේරිටම වෙන්වුණු කුඩා කාමරයක් තිබුණා. ඇය පුරුද්දක් හැටියට නුඹක් රෑ වෙනතුරු, මේ කාමරයට වී පොත්පත් කියෙව්වා. මං හෙමින්ම ඒ ගෙදරට ළඟාවෙලා, ඇගේ ජනේලය හෙමින් සීරුවා. ජනේලය අරින්න ඇය මුලින් කැමැති වුණේ නැහැ. නමුත් ඇයට මං මුණගැසීමට ආදරේ බව මේරි දැන හිටියා. එදා හිම වැටෙන අධික ශීතල රාත්‍රියක්. අධික ශීතලේ මට වෙවුලමින් එළියේ ඉන්න ඉඩහරින්න ඇයට පුළුවන් කමක් තිබුණේ නෑ. ඇය ජනේලය ළඟට ඇවිත් මට කොඳුරලා කිව්වා, කෑම කාමරයේ උස ජනේලයක් ඇති බවත්, ගේ වටෙන් ඇවිත් ඒ ජනේලයෙන් ගෙට ඇතුළුවිය හැකි බවත්.

ජනේලය ළඟට ආ මට, ඒහි අගුළු විවෘත බව දැකගන්න ලැබුණා. සර් යුස්ටස් කියන තිරිසනා ඇයට ඉතාම කෘෘර විධියට සැලකූ ආකාරය ඇගේ කටින්ම මට අහන්න ලැබුණා. මං මේ තරම් ආදරය කළ කාන්තාවට ඒ බේබද්දා සැලකූ හැටි ගැන අහලා, මගේ ඇඟේ ලේ කකියන්න පටන් ගත්තා. ඔහුට ශාප කරනවා ඇරෙන්න මං වෙන මොනවා කරන්නද? මං ජනේලයෙන් ඇතුළු පැත්තේ ඇය සමග කථා කරමින් සිටියා පමණයි. එක්වරම අර යක්ෂයා එතැනට කඩාවැදුණා. ගැහැනියකට අපහාස කරන්න පුළුවන් අන්තිම නරක වචන කියලා, ඔහු ඇයට නින්දා අපහාස කළා. ශාප කළා. ඔහු අතේ තිබුණු පොල්ලකින් ඔහු ඇයගේ හිසට දරුණු පහරක් එල්ල කළා. එය වැදුණේ ඇගේ මුහුණට.

http://sherlockholmesinvestigations.blogspot.com

මට මගේ කෝපය ඉවසාගන්න බැරිවුණා. මං එක්වරම ගිනිඅඟුරු අල්ලන යකඩ අඬුවගන්න එතැනට පැන්නා. නමුත් ඔහුත් ඒකට පැන්නා. ඒක උදුරාගන්න අපි දෙන්නා හරිහරියට පොර බැදුවා. නමුත් එය අහුවුණේ ඔහුට. ඔහු ඒකෙන් මට පහරක් එල්ල කළා. ඒක වැදුණේ මගේ අතට. මේ බලන්න. මෙන්න මෙතැනට. නමුත් පහර කාගෙනම ඒ යකඩ අඬුව මං ඔහුගේ අතෙන් උදුරා ගත්තා. ඊළඟට යකඩ අඬුවෙන් පහරක් ඔහුට එල්ල කළේ මම. ඒ පහර වැදුණේ කුණු වුණු පුහුල් ගෙඩියකට වගෙයි මට තේරුණේ. ඔබ හිතනවද මගේ හිතේ කණගාටුවක් ඇතිවුණා කියල? කොහොමටවත් නෑ මහත්වරුනි.

ඒ වෙලාවෙ ඔහු දමගෙ මුම කළ සටන, මට ජීවිතයත් මරණයත් අතර සටනක් වුණා. මගේ විතරක් නෙමෙයි ඇයගේත් ජීවිතය හා මරණය පිළිබඳ තීරණාත්මක සටනක් වුණා. කෝපයෙන් වියරු වැටුණු, බේබදු උන්මත්තකයෙකුගේ ග්‍රහණයට ඇයව අහුවෙන්න, මං කොහොමද මහත්වරුනි ඉඩහරින්නෙ? අන්න එහෙමයි මං ඔහුව මරාදැම්මෙ. මං කළ වැඩේ හරිද වැරැදිද? මං පත්වුණු තත්ත්වයට ඔබත් පත්වුණා නම්, ඔබ කොහොමද ඒ අවස්ථාවෙ ක්‍රියා කරන්නෙ?

ඔහු අතේ තිබුණු මුගුරෙන් ඇයට පහර දුන් වෙලේ ඇය විලාප නැඟුවා. ඒ ශබ්දය ඇහිලා තෙරේසා, ඇගේ කාමරයේ ඉඳල පහළට දුව ඇවිත් හිටියේ. වීදුරු අල්මාරියක වයින් බෝතලයක් තිබුණා. මං ඒක විවෘත කරලා මේරිට එයින් ටිකක් පෙව්වා. ඒ මොකද සැමියාගේ මරණය නිසා ඇතිවුණු කම්පනය හා භීතිය නිසා, ඇය බාගෙට මැරිලා වගේ හිටියේ. ඊට පස්සේ මමත් වයින් ටිකක් බිව්වා. තෙරේසාට හිණක් වත් තිබුණේ නැහැ. මේක හොරුන් විසින් කළ අපරාධයක් බව හඟවන්න සැලසුම් කළේ තෙරේසායි, මමයි දෙදෙනාම. මේරි විසින් දිය යුතු සාක්ෂිය, තෙරේසා ඇගේ ස්වාමි දුවට නැවත නැවතත් කියා දුන්නා. මේ අතරේ මම උඩුත් පඩියෙන් බිත්ති කණ්ඩිය උඩට නැගලා, අර සීනුවට සවිකර තිබූ ලණුව කපාගත්තා. ඊට පස්සේ මේරිව අර ඔක් පුටුවට තබා බැඳ දැම්මා. ලනුව කැපුවෙ නැතුව කඩාගත් බව පෙන්වන්න, එහි කෙළවර මම පිහියෙන් ලිහා, කොහුකර

http://sherlockholmesinvestigations.blogspot.com

දැම්මා. ඊට පස්සේ ගෙට ආ හොරුන් විසින් මංකොල්ල*කෑ බව පෙන්වන්න රිදී පිඟන් ටිකක් අරගෙන ගෙයින් පිටවුණා. මං ගිහින් පැය කාලක්වත් යනතුරු අනෙක් සේවකයන්ට දැනුම් නොදෙන ලෙසට මං උපදෙස් දුන්නා. රිදී පිඟන් ටික වත්තේ පොකුණට විසිකර දමලා, මං සිඩ්න්හැම් වෙත පැන ආවා. මං එල්ලුම් ගස් ගියත් මට කියන්න තියෙන කථාව ඕකයි හෝම්ස් මහත්මයා. සම්පූර්ණ සහතික ඇත්ත එයයි!"

හෝම්ස් මද වේලාවක් නිහඬව සිටියේය. මීළඟට ඔහු කාමරය හරහා ගොස් අපේ අමුත්තාගේ සුරතෙහි අල්ලා සෙලෙව්වේය.

"මටත් හිතෙනවා ඔබ සම්පූර්ණ සත්‍යයම හෙළිකළා කියලා. මෙතැනදී ඔබ කිව් හැම දෙයක්ම වගේ මං කලින් සොයාගෙන තිබුණා. බිත්ති කණ්ඩිය උඩ සිට ලී බ්‍රැකට්ටුවට දණහිස තබා, ඉහළට නැගීම ඉතාම දුෂ්කර වැඩක්. ඒක කරන්න පුළුවන් වෙන්නේ සර්කස්කරුවෙකුට නැත්නම් නාවිකයෙකුට පමණයි. ඊළඟට ආර්යාව පුටුවට තබා බැඳ දමද්දී ඔබ යොදා තිබුණේ නාවිකයනටම සුවිශේෂ ගැට. මෙම කාන්තාවට නාවිකයෙක් හමුවීමට ඉඩක් සැලසුණේ එකම අවස්ථාවකදී පමණයි. ඒ ඇය ඕස්ට්‍රේලියාවේ සිට එංගලන්තයට ආ මුහුදු ගමනේදී. ඇය මේ පුද්ගලයා ආරක්ෂා කරන්න දැඩි උත්සාහයක් දැරුවා. එයින් මං වටහාගත්තා, ඔහුත් ඇයගේ සමාජ මට්ටමේ කෙනෙකු බව සහ ඇය ඔහුට ආදරය කළ බව. නිවැරදි මඟට පිවිසුණාට පස්සේ ඔබව අල්ලාගැනීම මට කොතරම් පහසු වුණාද කියල පෙනෙනවා නේද?"

"මම නම් හිතුවේ අප කළ ප්‍රයෝගය පොලීසියට කවදාවත් හොයාගන්න බැරිවේවි කියලයි."

"ඔව්. පොලීසියට හොයාගන්න බැරිවුණා. මං හිතන්නෙ නෑ ඒ ප්‍රයෝගය පොලීසියට කවදාවත් හොයාගන්න හැකිවේවි කියලත්. ඉතින් මේක අහන්න කපිතාන් ක්‍රොකර්. මේක මහා බරපතල කාරණයක්. මම නම් මෙන්න මේ කරුණ පිළිගන්නවා. මොකක්ද, ඔබට මෙවැනි දෙයක් කරන්න සිදුවුණේ, බලවත් මානසික කම්පනයට පත්වීමෙන් ඇතිවුණු ක්ෂණික කෝපය නිසා කියල. ඔබේ ආත්මාරක්ෂාවට ඔබ කළ දේ නීති විරෝධීයි කියල මම හිතන්නේ නැහැ. නමුත් උසාවියේදී ඒක තීරණය කරන්නේ බ්‍රිතාන්‍ය ජූරි

http://sherlockholmesinvestigations.blogspot.com

සහාවක් මගින්. ඇත්තටම මගේ සිතේ ඔබ ගැන තියෙන්නේ ලොකු අනුකම්පාවක්. ඒ නිසා, ඊළඟ පැය විසිහතර ඇතුළත ඔබ එංගලන්තයෙන් අතුරුදහන් වෙන්න තීරණය කළොත්, ඔබට ඒකට කාගෙන්වත් අවහිරයක් නැති බවට මං සහතික වෙන්නම්."

"ඒ කියන්නේ ඊට පස්සේ ඔබ සත්‍යය හෙළිකරනවා?"

"සත්තකින්ම ඔව්. ඇත්ත එළිවේවි."

අපේ අමුත්තා තදින්ම කෝපයට පත්වූ බව පෙනිණ.

"ඔබ කරන්නේ නියම මහත්මයෙකු විසින් ක්‍රියාවට නැගිය හැකි යෝජනාවක්ද? නීතිය ගැන මටත් යම්කිසි දැනුමක් තියෙනවා. මං පැන ගියත්, මිනීමැරීමට ආධාර හා අනුබල දීම යටතේ මේරිට විරුද්ධව චෝදනා එල්ල වේවි. ඔබ හිතන්නේ මේරිට තනියම ඒවට මුහුණදෙන්න ඉඩ සලස්වලා, මං හෙමිහිට ලිස්සලා යාවි කියලද? නැහැ මහත්මයා. ඔවුනට ඕනෙ නම් මට මරණ දඬුවම වුණත් දීපුවාවෙ. ඒකට කමක් නෑ. නමුත් හෝම්ස් මහත්මයා, දෙයියන්ගෙ නාමෙන් මගේ අසරණ මේරි උසාවිය ඉදිරියට නොයවන්න විධියක් සලස්වල දෙන්න."

හෝම්ස් තම සුරත ඉදිරියට දිගුකොට, නාවිකයාට දෙවැනි වරටත් අතට අත දුන්නේය.

"මං එහෙම කිව්වේ ඔබේ අවංක බව සෝදිසි කරන්නයි මහත්මයා. ඔබ නියම මහත්මයෙකු බව දිගින් දිගටම ඔප්පු වෙනවා. හොඳයි. මං ඒක භාරගන්නවා. මං මේ භාරගන්නේ විශාල වගකීමක්. මං හොප්කින්ස්ට යම්කිසි හෝඩුවාවක් සිහිපයක් දුන්නා. ඒකෙන් ඔහුට මොකුත් හොයාගන්න බැරිනම් මට කරන්න දෙයක් නෑ.

මේ බලන්න කපිතාන් ක්‍රොකර්. අපි මේක උසාවියේ කරන අයුරින්ම යුක්තිය විසඳා බලමු. ඔබ විත්තිකාරයා. වොට්සන් ඔබයි ජූරිය. සාධාරණ අයුරින් යුක්තිය විසඳීමට ඒ තරම් අනර්ඝ, අවංක කෙනෙක් මට ජීවිතේට හමුවෙලා නැහැ. මං තමයි විනිශ්චයකාරයා.

ජූරි සභාවේ මහත්වරුනි. ඔබ සියලු සාක්ෂි වලට සවන් දුන්නා. මෙම විත්තිකාරයා වැරදිකාරයා ද නිවැරදිකාරයාද?"

"ස්වාමීනි ඔහු නිවැරදිකාරයා!"

http://sherlockholmesinvestigations.blogspot.com

"මහජන මතයෙනුත් ඔබ නිර්දෝෂී බව තහවුරු වෙනවා. ඔබ සියලුම චෝදනා වලින් නිදහස් කපිතාන් ක්‍රොකර්. පොලිසියෙන් මේ මිනීමැරුමට සම්පූර්ණ අහිංසකයෙක් එල්ලුම් ගස් යැවීමට සූදානම් වුවොත් මිස, මගෙන් ඔබට හිරිහැරයක් නෑ. තව අවුරුද්දකින් යළිත් මේ කාන්තාව හමුවෙන්න එන්න. ඇවිත් අප මේ රාත්‍රියේ දුන් තීන්දුව නිවැරදි එකක් බව ඔප්පු කිරීමට, ඔබෙත් ඇගෙත් අනාගතය දීප්තිමත් එකක් කරගන්න.

- නිමි -

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

ආතර් කොනන් ඩොයිල්ගේ

# මහ රෑ ආ මාරයා

- බේදජනක සාක්ෂිය
- ත්‍රී ගේබල්ස් වික්‍රමය
- අද්භූත සිදුවීමක්
- රගර් ක්‍රීඩකයාගේ කථාන්තරය
- චාල්ස් ඔගස්ටස් මිල්වටන්
- අතිදක්ෂ යක්ෂයා
- මහ රෑ ආ මාරයා



ISBN 955-96828-6-5

9 789559 682868

මිල රු. 275/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන